sinhalaebooks.com

# විස්මිත අවබෝධය

## පටිච්ච සමුප්පාදය



පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ

sinhalaebooks.com

# විස්මිත අවබෝධය!

## (පටිච්ච සමුප්පාදය)

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද
ස්වාමීන් වහන්සේ

www.mahamevna.org
www.mahamevnawa.blogspot.com

sinhalaebooks.com



*සියලු ලොව එළිය කළ*
*විස්මිත ප්‍රඥාවෙන් යුතු වූ*
*මහාකාරුණික වූ*
*භාග්‍යවත් බුදුරජාණන් වහන්ස,*
*ඔබ වහන්සේට*
*මාගේ නමස්කාරය වේවා!*

sinhalaebooks.com



මේ ගෞතම බුද්ධ ශාසනයේදී ම
සංසාර දුකෙන් නිදහස් වීම පිණිස
තමන්ගේ චින්තනය
ශ්‍රී සද්ධර්මය ඔස්සේ
මෙහෙයවා ගත හැකි බුද්ධියෙන් යුතු
පින්වත් ස්වාමීන් වහන්සේලා උදෙසාත්
පින්වත් සැදැහැවතුන් සැදැහැවතියන් උදෙසාත්
සාදර ගෞරවයෙන් යුතුව
මේ උතුම් ග්‍රන්ථ රත්නය පිළිගන්වමි.

සාධු! සාධු! සාධු!

sinhalaebooks.com

# අප ගේ ශාස්තෘන් වහන්සේ මැනවින් වදාරණ ලද ශ්‍රී සද්ධර්මය ගැන...

අප ගේ ශාස්තෘන් වහන්සේ වනාහි කෙලෙස් සහිත කෙනෙක් නොවේ. උන්වහන්සේ කෙලෙස් රහිත උතුමෙකි. රහතන් වහන්සේ නමකි (අරහං). එමෙන්ම උන්වහන්සේ අවබෝධ කර ගත්තේ බාහිර දෙවියකු ගෙන් හෝ ගුරුවරයෙකු ගෙන් ඉගෙන ගත් ධර්මයක් නොවේ. උන්වහන්සේට ගුරුවරයෙක් නො සිටියේ ය. අනුන් ගෙන් අසා දැනගත් සුතමය ඤාණයක් උන්වහන්සේට නැත. උන්වහන්සේට තිබුනේ ස්වයම්භූ ඤාණයෙකි. එනම් තමන් ගේ උත්සාහයෙන් ම, යෝනිසෝ මනසිකාරය තුළින් උපදවා ගත් ඤාණයකි.

සාමාන්‍යයෙන් ඕනෑම කෙනෙකුට කවර හෝ අවබෝධයක් පිණිස බාහිර සහයෝගයක් අවශ්‍ය වේ. තමා බාහිරින් ලබන සහයෝගය ඔස්සේ චින්තනය මෙහෙයවීම යි ලෝකයේ තිබෙන්නේ. අප ගේ ශාස්තෘන් වහන්සේ ගේ ජීවිතය තුළ සිදු වූයේ ඊට හාත්පසින් ම වෙනස් අතිශයින් ම විස්මිත වූ සිදුවීමකි. එතරම් පුදුම සහගත සිදුවීමක් ලෝකයේ තවමත් සිදු වී නොමැත. ටාජ් මහල්, චීන මහා ප්‍රාකාරය, පීසාහි ඇලවෙන කුළුණ ආදි ය සාමාන්‍ය ජනතාවට පෙනෙන්නේ පුදුම සහගත දේවල් ලෙස ය. ඒවායේ කිසිම පුදුම සහගත දෙයක් නැත. මිනිසුන්ව තළා පෙළා ඔවුන් ගේ ලෙයින් කඳුළින් ඩහදියෙන් ඔවැනි ගොඩනැගිලි ඕනෑ තරම් අනාගතේ දී ත් ගොඩ නැගෙනු ඇත. එවැනි ගොඩනැගිලි දෙස බලා ජීවිතයකට ඇති කර ගත හැකි අවබෝධයක් තිබේ ද? කිසිසේත් නැත.

ලෝකයේ පවතින්නේ එකම එක පුදුම සහගත දෙයකි. එනම් මිනිස් මව් කුසකින් ලොවට බිහි වී මනුෂ්‍යයෙකු ලෙස හැදී වැඩී තමන් ගේ ඒ මිනිස් සිත, බාහිර කෙනෙකු ගේ උපකාරයෙකින් තොරව තමන් ගේ බුද්ධිය පමණක් මෙහෙයවා උත්තරීතර තත්වයට පත්වීම ය. ඒ අසිරිමත් අවබෝධය ඇති කර ගත හැකි වූයේ අප ගේ ශාස්තෘන්

sinhalaebooks.com



වහන්සේ වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට පමණි. උන්වහන්සේ අවබෝධ කළ ශ්‍රී සද්ධර්මය තුළ කියැවෙන්නේ මිනිසුන්ගේ ජීවිත ගැන පමණක් නොවේ. ලෝකයේ සියලු දෙවිවරුන්, බ්‍රහ්මයින්, මාරයින්, ප්‍රේතයින්, තිරිසන් සතුන්, නිරිසතුන් ආදී අනන්ත සත්වයින් ගේ ඉරණම සකස් වී ඇති ආකාරය අතිශයින් ම විද්‍යාත්මක න්‍යායන් ඔස්සේ හෙළිදරව් කර දෙයි. උන්වහන්සේ ගේ විස්මිත අවබෝධයට හසු නොවූ ක්ෂේත්‍රයක් නැත. උන්වහන්සේ දියුණු කරන ලද්දේ භෞතික උපකරණ තුළින් ලොව දකින ක්‍රම නොවේ. උන්වහන්සේ ගේ විද්‍යාගාරය වූයේ භාවනාව යි. උපකරණය වූයේ දියුණු කරන ලද ප්‍රඥාව යි. ඒ ප්‍රඥාව අඳුර නසාලන සූර්යාලෝකය ද පරදවයි. සූර්යයාගෙන් විහිදෙන එළිය ඉතාමත් සීමාසහිත වේ. හිරු එළියකින් සිතක ක්‍රියාකාරිත්වය දැක්ක නොහැකිය. ලෝකයේ එක් පැත්තකට හිරු එළිය ලැබෙන විට අනිත් පැත්ත අඳුරු ය. එහෙත් අපගේ ශාස්තෘන් වහන්සේ උපදවාගත් ප්‍රඥාලෝකය එවැනි සීමාසහිත දෙයක් නොවේ. එක් නිමේෂයෙකින් උන්වහන්සේ ගේ ප්‍රඥාව ඕනෑම දිසාවකට යොමු කළ හැකි ය. උන්වහන්සේ ලොව ජයගත්තේ ප්‍රඥා මහිමයෙන් ය.

ඒ අසිරිමත් ප්‍රඥා මහිමය, ඒ විස්මිත අවබෝධය කුමක් දැ'යි අපට තේරුම් ගත හැකි වන්නේ උන්වහන්සේ අප වෙත දායාද කළ ශ්‍රී සද්ධර්මය තුළින් ය.

මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගෙන් පැවිදි බව ලද මිහිඳු මාහිමියන්ට අවුරුදු තුනක් වැනි සුළු කාලයක් තුළ දී අරහත්වයට පත්වීමට හැකි විය. එමෙන් ම ප්‍රථම ධර්මසංගායනාවේ දී මහරහතන් වහන්සේලා ආරක්ෂා කර ගත් බුදුරජාණන් වහන්සේ වදාළ ධර්ම - විනය ඒ අයුරින්ම ධාරණය කරගන්නටත් මිහිඳු මහරහතන් වහන්සේ සමත් වූහ. උන්වහන්සේ ලංකාවට වැඩම කළේ අතරින් පතර ඉගෙන ගත් ධර්ම පාඨ කීපයක් මතක තබා ගෙන, ධර්මයේ සැක සහිතව නොවේ. සද්ධර්මය පිළිබඳ ව නිසැක භාවයට පත් ව, පරිපූර්ණ වශයෙන් ධර්ම - විනය දරා ගත් නුවණකුත් සහිතව ය. සීල, සමාධි,

sinhalaebooks.com



ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඤාන දර්ශන සහිතව ය. එම නිසා ලංකාවේ දී සිංහල ජනතාවට ශ්‍රී සද්ධර්මය මනා ලෙස ඉගැන්වූ උන්වහන්සේ ලාංකික සැදැහැවතුන් පැවිදි කොට ධර්ම - විනය පාළි භාෂාවෙන් ම උගන්වා වදාළ සේක. ඒ ධර්ම - විනය පිළිබඳ අර්ථ විස්තර පමණක් සිංහලෙන් තෝරා දුන් සේක. අටුවා වශයෙන් හඳුන්වන්නේ ඒවා ය. එම අටුවාවල අභ්‍යන්තර විස්තර ලංකාවේ කථාන්දර ද එකතු වෙමින්, යම් යම් මතිමතාන්තර ද එකතු වෙමින් එහෙත් ශාසනික මතයන්ට හානි නොවී ස්වාධීනව වැඩුනි. සිංහලෙන් ලියැවුන ඒ අටුවා ගැන දඹදිවවාසී භික්ෂූන්ට දැන ගන්නට ලැබුනි.

ඒ සිංහල අටුවා පාළි භාෂාවට පරිවර්තනය කිරීම පිණිස ය බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ ලංකාවට වැඩියේ. එසේ නැතිව උන් වහන්සේ සිංහලෙන් තිබුන සූත්‍ර දේශනා පාළි භාෂාවට හැරවූයේ නැත. කොටින් ම ධර්ම - විනය තිබුනේ සිංහලෙන් නො වේ. පාළි භාෂාවෙනි. බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ අතින් පාළි භාෂාවෙන් තිබුන බුද්ධ භාෂිත ධර්ම - විනය ට අල්ප මාත්‍ර වෙනසක් වී නැත. මේ බව නො දන්නා නූගත් ගිහි - පැවිදි පින්වතුන් මේ ධර්ම - විනය පවා බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ ගේ අතින් වෙනස් වී ඇතැයි කියමින් හෑල්ලුවට ලක් කරති.

වර්තමානයේ ඇතැම් ගිහි - පැවිදි පිරිස් බුද්ධ දේශනාවේ වචන තම තමන්ට රිසි පරිදි අර්ථ වෙනස් කරමින්, තම තමන්ට රිසි පරිදි පද බෙදමින්, කඩමින් බිඳිමින් ධර්මය කණපිට හරව හරවා තෝරනු දක්නට ලැබේ. මෙය බුද්ධ ශාසනයේ චිරස්ථිතියට ඉතාම බරපතළ හානි පමුණුවන දෙයකි. ඒ තුළින් සිදුවන්නේ චතුරාර්ය සත්‍යය සැඟවී යාම ය. නිවන් මග අතුරුදහන් වීම ය. ශ්‍රී සද්ධර්මය විකෘති වීම ය. වාද විවාද හට ගැනීම ය. තම තමන් ගේ හිතුවක්කාර ධර්ම විවරණයන්ට අවනත කර ගත් කණ්ඩායම් බිහි වීම ය. කාලාම සූත්‍රයත් සතර මහාපදේශත් වරදවා ඉදිරිපත් කරගෙන තම තමන් ගේ අභිමතය පරිදි ධර්මය විකෘති කිරීමට ගිය හොත්, ඒ තැනැත්තා හෝ තැනැත්තිය යළි උපදින ජීවිතයක දී ශ්‍රී සද්ධර්මය යාන්තමින් වත් අසන්නට නො ලැබෙන අඳුරු ලෝකයකට ඇද වැටෙනු ඇත.

sinhalaebooks.com



කිසිදිනක අප අතින් එවැනි අවාසනාවන්ත දෙයක් සිදු නො වීමට වග බලා ගත යුතු ය. එවැනි භයානක තත්වයන්ට හවුල් නො විය යුතු ය.

සමහර ගිහි පැවිදි පිරිස් පවසන්නේ අපූරු කථාවන් ය. “ඔපමණ සූත්‍ර දේශනා කුමට ද? එකක් වුනත් ප්‍රමාණවත් නොවේ ද? ඒ කාලයේ ධර්මය දැක්කේ ඔවැනි සූත්‍ර රාශියක් ඉගෙනීමෙන් නො වේ” යයි පවසමින් ධර්මය හැදෑරීම පවා ගරහති. ඒ තුළින් ඔවුන් ගේ ශ්‍රද්ධාවේ තරමත්, ඔවුන්ගේ ධර්මඥානයේ තරමත්, බුද්ධ වචන කෙරෙහි ඔවුන්ගේ ආකල්පයත් සිතා ගත හැකිය. එවැනි පුද්ගලයන් ව දුරින් ම දුරු කළ යුතු ය.

සමහර ගිහි - පැවිදි පිරිස් අගය කරන්නේ අප ගේ ශාස්තෘන් වහන්සේ ගේ ශ්‍රී සද්ධර්මය නො වේ. ඔවුනට එය යල් පැන ගිය දෙයකි. ඔවුන් නිතරම අගය කරන්නේ මහායාන සූත්‍රයන් ය. මහායාන සූත්‍ර යනු බුද්ධ වචනයේ මූලික පරමාර්ථයන්ට විරුද්ධව, චතුරාර්ය සත්‍යාවබෝධය ප්‍රමාද කරවන, සංසාරයේ භය නැති කරවන, දාර්ශනික යැයි කියා ගන්නා මති මතාන්තරවලින් අලංකාර කරන ලද, වාද විවාදවලින් ම කරුණු මතු කරවන අධර්මයකි. මුල් කාලයේ ශ්‍රී ලාංකික තෙරවරු සම්මා සම්බුද්ධ ශාසනය කෙරෙහි අප්‍රමාණ ගෞරවයෙන් යුක්තව මහායාන මතයන්ට මෙරටට ඇතුළු වීමට ඉඩ නුදුන්හ. මහායාන මතයන් ගේ මාතෘභූමිය වූ ඉන්දියාවට අත් වූ ඉරණම කුමක් ද? පළමුව බුදුන් වදාළ ශ්‍රී සද්ධර්මය විකෘති වී ගියේ ය. දෙවනුව වාද විවාද කරමින් ඒ නිවන් මග හීනයානයක් ලෙස ගැරහීම නිසා ජනතාව අතරින් බැහැර වී ගියේ ය. හතු පිපෙනවාටත් වඩා වේගයෙන් ඊනියා බෝසත්වරුන් පහළ විය. නොයෙකුත් ඇදහීම් ඇති විය. බුද්ධ ශාසනය නාම ශේෂෝපගත ව අතුරුදන් වී ගියේ ය. ලංකාවටත් ඒ ඉරණම අයිති වීමට අනාගතයේ ඉඩ තිබේ. ඊට හේතුව මහායාන පොත් පත්, මහායාන සූත්‍ර අගය කරන ඊනියා බෞද්ධ ගිහි - පැවිදි පිරිස් බිහි වී තිබීම ය. ඔවුන් නිතර අගය කරන මහායාන සූත්‍ර තිබේ. එනම් ලංකාවතාර සූත්‍රය, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය, තථාගත ගුහ්‍ය

sinhalaebooks.com



සූත්‍රය, ගණ්ඩව්‍යූහ සූත්‍රය, සූරංගම සූත්‍රය, ප්‍රඥාපාරමිතා සූත්‍ර ආදියයි. මේවා දුරින් ම දුරු කළ යුතු ය. මේවා බුද්ධ වචන නො වේ. තථාගත ධර්ම විනය නො වේ. ශාස්තෘ ශාසනය නො වේ. මේවා බෙදන කියන ගිහි පැවිදි පිරිස් දුරින් ම දුරු කළ යුතු ය.

අප ගේ ශාස්තෘන් වහන්සේ විසින් දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මය, ඒකාන්තයෙන් ම මනාකොට දේශනා කරන ලද්දේ ම ය (ස්වාක්ඛාතෝ). ඒ ශ්‍රී සද්ධර්මයේ ආරම්භය වූ සීලයත් සුන්දර ය (ආදි කළ්‍යාණං). මැද වූ සමාධියත් සුන්දර ය (මජ්ඣේ කළ්‍යාණං). අවසානය වූ ප්‍රඥාවත් සුන්දර ය (පරියෝසාන කළ්‍යාණං). ඉතාම පිරිසිදු අර්ථවලින් යුක්ත ය (සාත්ථං). ඉතාම පැහැදිලි ප්‍රකාශන මාධ්‍යයෙන් ද යුක්ත ය (සබ්‍යඤ්ජනං). මුළුමනින්ම පරිපූර්ණ වූ පාරිශුද්ධ වූ අරහත්වය දක්වා දියුණු කළ හැකි ජීවිතය ගැන කියා දෙයි (කේවල පරිපුණ්ණං, පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති). අන්න ඒ ධර්මය යි ශ්‍රී සද්ධර්මය!

ඒ ශ්‍රී සද්ධර්මය අප ඉගෙන ගත යුත්තේ වාද විවාද පිණිස නො වේ. තර්ක විතර්ක කරමින් කල් ගෙවන්නට නො වේ. අප ඒ ශ්‍රී සද්ධර්මය ඉගෙන ගත යුත්තේ අවබෝධ කර ගැනීම පිණිස ය. කායික මානසික දුක් දොම්නස්වලින් නිදහස් වීම පිණිසය. යථාර්ථය අවබෝධ කර ගැනීම පිණිසය. සදාකාලික ශාන්තිය උදා කර ගැනීම පිණිස ය.

අප කවුරුත් නිතර සජ්ඣායනා කරන රතන සූත්‍රයේ සද්ධර්මය ගැන කියවෙන මේ ගාථාව දෙස බලන්න.

**"ඛයං විරාගං අමතං පණීතං**

**යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ**

**න තේන ධම්මේන සමත්ථි කිංචි**

**ඉදම්පි ධම්මේ රතනං පණීතං**

**ඒතේන සච්චේන සුවත්ථි හෝතු!"**

"ඛයං = රාග ද්වේෂ මෝහ ක්ෂය වී යන්නා වූ, විරාගං = සංසාරයේ නො ඇල්ම ඇති කරන්නා වූ, අමතං = අමරණීය වූ, පණීතං = උතුම් වූ, යං = යම් ශ්‍රී සද්ධර්මයක්, සමාහිතෝ

sinhalaebooks.com



= සමාහිත සිත් ඇති, සක්‍යමුනි = ශාක්‍යමුනීන්‍ද්‍රයන් වහන්සේ, අජ්ඣගා = වදාළ සේක් ද, තෙන ධම්මේන සමං = ඒ ශ්‍රී සද්ධර්මයට සමාන කළ හැකි, කිංචි = කිසිවක්, න අත්ථි = නොමැත්තේ ය. ඉදම්පි = මෙය ද, ධම්මේ = ශ්‍රී සද්ධර්මය තුළ පවතින, පණීතං රතනං = උතුම් ම මැණිකකි. ඒතේන සච්චේන = මේ සත්‍යානුභාවයෙන්, සුවත්ථි හෝතු = යහපතක් සැලසේවා!"

එමෙන් ම "බුද්ධං සරණං ගච්ඡාමි" කියා "බුදුරජාණන් වහන්සේ සරණ යමි" යනුවෙන් ප්‍රතිඥා දෙන්නේ ඉතිපි සො භගවා... යන උතුම් ගුණවලින් යුතු බුදුරජාණන් වහන්සේ ගැන ය. එවැනි පරමශුද්ධෝත්තම මුනිරජාණන් වහන්සේ නමක් සරණ ගිය පසු ලාභ සත්කාරයක් උදෙසා හෝ, වෙනත් අපේක්ෂාවක් උදෙසා හෝ, විවාහ ගණුදෙනුවක් වශයෙන් හෝ සරණ බිඳ ගැනීම නොහොබිනා වැඩකි. එය අප ගේ ජීවිත වලට කිසිසේත් හිත සුව පිණිස පවතින්නක් නොවේ. එය වනාහී රන් රිදී මිණි මුතුවලින් යුතු ආභරණයක් ඉවත ලා කොස් කොළවලින් ගෙතූ මාලයක් කරේ දමා ගත්තා වැනි ක්‍රියාවකි. තමන් සරණ ගිය ශාස්තෘන් වහන්සේ ගේ ගුණ කදම්බයෙන් බිඳක් හෝ ඉගෙන ගෙන ඒ සම්බුදු ගුණ මෙනෙහි කරමින් තමන් ලද මේ උතුම් ලාභය ගැන මහත් සන්තෝෂයෙන්, කල් ගෙවිය යුතු ය.

"ධම්මං සරණං ගච්ඡාමි" යනුවෙන් අප සරණ යන්නේ අප ගේ ශාස්තෘන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය පමණි. වෙනත් කිසිම යානයකට අයත් ධර්මයක් හෝ, යන්ත්‍ර මන්ත්‍ර හෝ, වර්තමානයේ ලිත්වල දැක්වෙන හූනන් ඇඟවැටීමේ පලාපල හෝ, රිට්ටාවන් හෝ රාහු කාලය හෝ කේන්දර හෝ වෙනත් අධර්මයන් අපි සරණ නොයමු. උතුම් වූ සීලයත්, සමාධියත්, ප්‍රඥාවත් ගැන කතා කරන, ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැන කථා කරන, චතුරාර්ය සත්‍යය, කර්මය, පටිච්චසමුප්පාදය ආදී ආශ්චර්යවත් ධර්මයන් ගැන කථා කරන ශ්‍රී සද්ධර්මය පමණි අපි සරණ යන්නේ. ලෝකයේ අන්‍යාගම්කාර පිරිසට ඒ භාග්‍යය නැත. අසත්‍ය වූ මතවාදයන් සත්‍ය ධර්මයක් ලෙස සිතා

sinhalaebooks.com



ගෙන සිටින ඒ අසරණයින්ට ද මේ උතුම් සරණ ලබා දීමට තරම් අප කාරුණික විය යුතු ය. එය දෙව් මිනිස් ලෝකයාට ම හිතසුව පිණිස පවතී. එම නිසා "ධම්මං සරණං ගච්ඡාමි" කියා ප්‍රතිඥා දුන් අපි වෙන කිසිම බාහිර ධර්මයක් කවර හේතුවක් නිසාවත් සරණ නො යමු. සදහම් කිළිටි කර නො ගනිමු.

එමෙන්ම ශ්‍රාවක සඟ පිරිස ද අප සරණ යන්නේ "සංඝං සරණං ගච්ඡාමි" යයි ප්‍රතිඥා දීමෙනි. ඒ උතුම් සඟ පිරිස ගැන විස්තර "සුපටිපන්නෝ භගවතෝ..." යන ධර්ම පාඨයෙන් ඉගෙන ගත හැකි ය. ඒ උතුම් මහා සංඝරත්නය සමන්විත වන්නේ මාර්ගඵල ලාභී උත්තමයන් වහන්සේලා ගෙනි. ඒ නිසා මාර්ග ඵල නො ලද භික්ෂූන් ගේ අඩුපාඩු දුටු විට "අනේ අප සරණ යන්නේ මේ උදවිය නේදැ" යි කිසිසේත් නො සිතිය යුතු ය. ඒ උදවිය අපි සරණ නො යමු. යම් දවසක ඒ ස්වාමීන් වහන්සේලා ද භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළ සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාව තුළ වැඩෙන ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කරත් නම් අපි උන්වහන්සේලාව සරණ යමු. එය අප ගේ පරමාදර්ශය වේ.

මේ සඳහා අපට උපකාරී වන්නේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය පිළිබඳ ව අප ගේ ඤාණයයි. ඒ ධර්මඤාණය නිරාකූල ව පැහැදිලි ලෙස ඇති කරගත් විට, සද්ධර්මය කෙරෙහි අප ගේ සැකය අඩුවෙන්ට පටන් ගනී. තෙරුවන් කෙරෙහි ඇති ශ්‍රද්ධාව ටිකෙන් ටික ස්ථාවර වන්නට පටන් ගනී. එවිට මේ බුද්ධ ශාසනය තුළ අපගේ ශ්‍රාවකත්වය මුල් බැස ගනී.

එවිට අපට මෙලොව ජීවිතය ගැන ද බිය වෙන්නට කරුණක් නැත. පරලොව ජීවිතය ගැන ද බිය වෙන්නට කරුණක් නැත. ස්ථිර වශයෙන් ම දුක් බිය රහිත ජීවිතයක් මේ ජීවිතයේ දී ම උදාකර ගත හැකි ය. එනිසා ම ය පරලොව ජීවිතය සුගතිගාමී වන්නේ. මේ ධර්ම මාර්ගය ඒ ජීවිතයේ දී ත් දියුණු කරගෙන මේ සංසාර දුක් අවසන් කරගත්, ඒ අමා නිවන් සුව අවබෝධ කරගත් භාග්‍යවන්තයින් බවට අපට පත් විය හැකි ය.

ඒ නිසා අප ගේ ශාස්තෘන් වහන්සේ ගේ විස්මිත

sinhalaebooks.com



අවබෝධයෙන් බිඳක් කියැවෙන පටිච්චසමුප්පාදය හෙවත් සංසාර දුක පිණිස හේතු - ඵල දහම සකස් වන ආකාරය අවබෝධ කර ගැනීම පිණිස මේ උතුම් ග්‍රන්ථයේ ඇති ධර්ම කරුණු හොඳින් මතක තබා ගන්න. අවබෝධය පිණිස නුවණ මෙහෙයවන්න. ඉබේ අවබෝධ වන තුරු බලා සිටින්න එපා!

පින්වත් ඔබට ධර්මදානය ලබා දීම පිණිස අපව දිරිගන්වන, සහයෝගය දෙන, ඇල්ලේ කුසල ඤාණ, හපුරුදෙනියේ පියදස්සන, ගම්පහ පාසාදික යන පින්වත් ස්වාමීන් වහන්සේලා ප්‍රධාන මහමෙව්නාවේ වැඩ වසන සියලු ස්වාමීන් වහන්සේලාට වහ වහා මේ ශ්‍රී සද්ධර්මය ම අවබෝධ වේවා!

මේ උතුම් සදහම් සේවාවේ දී ඉතා ගෞරවාදරයෙන් අපට සහයෝගය දෙන අප කළ්‍යාණමිත්‍ර පින්වත් දයාවංශ ජයකොඩි මහතාටත්, එම මැතිණියටත්, දයාවංශ ජයකොඩි සමාගමේ කාර්ය මණ්ඩලයටත් වහ වහා මේ ශ්‍රී සද්ධර්මය ම අවබෝධ වේවා!

විශේෂයෙන් අප ගේ උතුම් සදහම් සේවාවට අත හිත දෙන සියලු දෙනාටත්, මේ සදහම් සේවාව අනුමෝදන් වන සියලු දෙනාටත් වහ වහා මේ ශ්‍රී සද්ධර්මය ම අවබෝධ වේවා!

හැම දෙනාට ම තෙරුවන් සරණ වේවා!

කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

මහමෙව්නා භාවනා අසපුව
වඩුවාව ,
යටිගල්ඔලුව ,
පොල්ගහවෙල.

දුර:- 037-2244602
www.mahamevna.org

sinhalaebooks.com

` `

## ඔබ බුද්ධිමත් නොවුනොත්...?

ඔබ බුද්ධිමත් නොවුනොත් නොයෙක් කරදරවල වැටෙන්න පුළුවන්. ඔබ සමහර විට තවම නොදන්නවා විය හැකි ය. නොයෙකුත් දේශපාලන පක්ෂ ඔබේ ඡන්දය දෙස මහත් කැදරකමකින් බලා සිටී. නොයෙකුත් වෙළඳ සමාගම් තම තමන් ගේ නිෂ්පාදනවලට දැනටමත් ඔබ පාරිභෝගිකයකු බවට පත් කර ගෙන ඇති. ඒ ආකාරයෙන් ම නොයෙකුත් ආගම් ඔබ ව බිලී බාගන්නට මාන බලමින් ඉන්නවා වෙන්න පුළුවනි. ඔය අතර බෞද්ධ නාමයෙන් ම නොයෙක් ඇදහිලි මතවාද පැතිර යමින් තිබේ. මේ සියලු දේ මැදින් ඔබ බුද්ධිමත් ව සිත හැසිරවිය යුතු ය.

ජීවිතය ගැන මොහොතක් සිතා බලන්න. ඔබ පාසැල් ගියා. ඉගෙන ගත්තා. විභාග පාස් වුනා. රැකියාවක් කළා. කසාදයක් බැඳ ගත්තා. දරුවන් ලැබුණා. ගේ දොර හැදුවා. කෑවා. බිව්වා. විනෝද වුනා. ටිකෙන් ටික වයසට ගියා. ටිකෙන් ටික තනි වුනා. ලෙඩ දුක් හැදුනා. මරණයට පත් වුනා. ඔච්චර ද ජීවිතය කියන්නෙ? වයස හැට හැත්තෑවක කාල පරිච්ඡේදයක් තුළ ඔබගේ ජීවිතය මොන තරම් වෙනස් කම්වලට භාජනය වෙනවා ද?

ඔය අතරේ නරක මිත්‍රයන් ගේ ආශ්‍රයටත් වැටෙන්න ඉඩ තියෙනවා. ඕනෑම හොඳ කෙනෙක් පාපමිත්‍ර ආශ්‍රයෙන් නොමග යන්න පුළුවන්. වරක් දේවදත්ත හිමියන් තමන් ගේ පාලනයට භික්ෂූන් වහන්සේලා නතු කර ගැනීමට කදිම උපායක් යෙදුවා. කෙනෙකු බැලූ බැල්මට පහදින ආකාරයට නීති පහක් හදා ගත්තා. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ළඟට ගිය දේවදත්ත හිමියන් සසුන් ගත වූ සියලුම භික්ෂූන් වහන්සේලාට අනිවාර්ය නීතියක් ලෙස ඒවා පණවන්නැ'යි ඉල්ලා සිටියා. දේවදත්ත හිමියන් හොඳාකාරව ම දන්නවා ඒ තුළින් තමන්ටත් පිරිසක් කඩා ගන්න පුළුවන් බව. ඒ නිසා ජීවිතාන්තය දක්වාම භික්ෂූන් නිර්මාංශව සිටිය යුතු බවත්,

sinhalaebooks.com



පිණ්ඩපාතයෙන් ම ජීවත් විය යුතු බවත්, තුන් සිවුරකින් වාසය කළ යුතු බවත්, ඒ සිවුරු පාංශුකූල වස්ත්‍ර ම විය යුතු බවත්, ආරණ්‍යයේ ම වාසය කළ යුතු බවත් අනිවාර්ය කරන්නැ'යි ඉල්ලා සිටියා. බුදුරජාණන් වහන්සේ මෙයට එකඟ වූයේ නැහැ. ඒ අවසරයෙන් සඟ මැදට පැමිණි දේවදත්තයන් තමන් ව හඳුන්වා දුන්නේ අර අංග පස තමන් සමාදන් වී සිටින බවත් ඉක්මණින් නිවන් අවබෝධ කිරීමට කැමති ස්වාමීන් වහන්සේලා තමන් තෝරා ගත් මේ කඩිනම් වැඩ පිළිවෙළ අනුගමනය කරන ලෙසත් ය. බැලූ බැල්මට දේවදත්තයන් පෙනෙන්නේ බුදුරජාණන් වහන්සේටත් වඩා නිවැරදි කෙනෙක් ලෙසට ය. අලුත පැවිදි වූ භික්ෂූන් වහන්සේලා පන්සිය නමක් දේවදත්තයන් ගේ උගුලට හසුවුනා. බුදුරජාණන් වහන්සේ ව අතහැර දැමූ ඒ භික්ෂූන් වහන්සේලා දේවදත්ත හිමියන් නිවැරදි බවත්, දේවදත්තයන් ගේ උපදෙස් පරිදි නිවන් මග ලබා ගත හැකි බවත් සිතා දේවදත්තයන් පසුපසින් පිටත් වුනා. පාපමිත්‍රයන් ගේ ඇසුරේ භයානක කම අප ගේ ශාස්තෘන් වහන්සේ ඉතා හොඳින් දන්නවා. උන්වහන්සේ වහාම සැරියුත් - මුගලන් මහරහතන් වහන්සේ දෙනම කැඳවා මෙසේ පැවසුවා.

"දේවදත්තයන් අලුත පැවිදි බව ලැබූ, ශාසනය හරියාකාර ලෙස හඳුනා නො ගත් භික්ෂූන් පන්සියයක් රැගෙන ගයා ශීර්ෂය බලා පිටත් වුනා. ඒ පිරිසට හානියක් වෙන්න පළමු ඔබ දෙදෙන වහා එහි යන්න! ඒ පිරිස කෙරෙහි අනුකම්පාවෙන් ඒ පිරිස බේරාගන්න!" යි පවසා වහා ගයා ශීර්ෂයට පිටත් කළා.

මේ ගැන විස්තර දැන ගැනීමට කැමති නම් මහාවග්ග පාළි නම් විනය ග්‍රන්ථයේ සංඝභේදක්ඛන්ධකය කියවන්න.

එකල භාග්‍යවතුන් වහන්සේත්, සැරියුත් - මුගලන් වැනි මහෝත්තම ස්වාමීන් වහන්සේලාත් වැඩ සිටි නිසා ඒ භික්ෂු පිරිස බේරුනා. එසේ නම් අද දවසේ අප වඩ වඩාත් බුද්ධිමත් විය යුතු යි නේද?

යාළු මිත්‍රයන් ගේ වේශයෙන් නොයෙක් දෙනා අප ගේ

sinhalaebooks.com



ආශ්‍රයට පැමිණෙත්. සමහර විට තමන් ගේ ඇසුරට පත් වෙන්නා අන්‍ය ආගමික කොන්ත්‍රාත්කරුවෙකු වෙන්නත් පුළුවනි. සමහර විට ඔබේ බුද්ධිය මොට කරවන මෙලොව පරලොව විශ්වාසය ඔබෙන් බැහැර කරවන භෞතිකවාදියෙක් වෙන්නටත් පුළුවනි. එසේත් නැතිනම් ඔබව අන්ධ විශ්වාසයන්ට ඇද දමා ඔබේ මානසිකත්වය පහතට ඇද දමන භක්තිවාදියෙක් ඔබේ මිතුරා වෙන්නට පුළුවන්. එසේත් නැතිනම් බුද්ධ වචනය වෙනස් කරමින් ධර්මයට ගර්හා කරන අමුතුම මාදිලියේ කෙනෙක් ඔබේ මිත්‍රයා වීමට පුළුවනි. එහෙත් ඔබ බුද්ධිමත් නම් ඒ සියලු මතවාද අතරේ ඒ කිසි ම මතයක් ග්‍රහණය කර නො ගෙන බුද්ධ දේශනාවන් මනා කොට තෝරා බේරා ගැනීමේ හැකියාව ඔබට ලබා ගත හැකි ය.

විශේෂයෙන් ආගම ධර්මය සම්බන්ධයෙන් ඔබ බුද්ධිමත් විය යුතු ම ය. එය ඔබේ ජීවිතයට බලපාන ප්‍රබලතම සාධකයක් බැවිනි. එහෙත් සාමාන්‍ය ජීවිතයේ දී අන්‍යාගමික මතයක ඇති බලපෑම ඔබ නො දැන සිටින්නට පුළුවනි.

## ගැටළු අබියස...?

ජීවිතයට නොයෙකුත් ආර්ථික ප්‍රශ්න පැමිණේ. ආර්ථික ප්‍රශ්න විසඳා ගතහොත් ජීවිතයේ දුක් කරදර අවසන් වෙලා යයි කියා සිතෙන වාර අනන්තයි. ඒ නිසා ම නේද අඹු - සැමියන් ගෙන් වෙන්වී, දූ-දරුවන් ගෙන් හිතමිතුරන් ගෙන් වෙන් වී පිටරටවල ගොස් නොයෙක් රැකියාවන් කරන්නේ. පිළිවෙලකට කෑම බීමක් පවා නැතිව, ඉඳුම් හිටුම් පවා නැතිව දුක් විඳිමින් කිසිවක් හරි හම්බ කරගන්නට වෙහෙසෙන ජීවිත කොතෙක් ද? ඇතැම් කෙනෙක් තම තමන් ජාතිය ආගම හෝ පාවා දී සැප සම්පත් ලබා ගන්නට පෙළඹී සිටිනු අපට දකින්නට ලැබේ. ජීවිතයේ ඒකායන පැතුම ඉන්ද්‍රියන් පිණවීම යයි සිතා ගතහොත් අප ගේ බුද්ධිමය හැකියාව මතු කර ගත නො හැකි වේ. ජීවිතයකට මිළ මුදල් අවශ්‍යයි. විනෝදාස්වාදයක් සෙවීම ජීවිතයක තිබෙන සාධාරණ ලක්ෂණයකි. කිසියම් දැන උගත්කමක්, සමාජ තත්වයක් ඇතිව සිටීමට කවුරුත් කැමතියි. එහෙත් ජීවිතය කියන්නේ

sinhalaebooks.com



එය පමණක් නොවේ. තවත් පැතිකඩවල් තියෙනවා.

## ප්‍රචණ්ඩත්වය හඳුනාගන්න!

අප ජීවත්වන සමාජ පරිසරයේ විවිධාකාර ආගමික මතිමතාන්තර දකින්නට ලැබේ. විවිධාකාර දේශපාලන මතිමතාන්තර දක්නට ලැබේ. එක් එක් දේශපාලන කණ්ඩායම් උත්සාහ කරන්නේ තම තමන්ගේ දේශපාලන මතවලට අපව නම්මා ගෙන රටේ බලය අල්ලා ගැනීම පමණි. මනුෂ්‍ය වර්ගයා කෙරෙහි කරුණාවක් මෛත්‍රියක් ඔවුන් තුළ තිබෙන බවක් මේ දක්වා ඔප්පු වී නැත. අප බුද්ධිමත් නොවී සිටින තරමට වාසිය ඔවුන්ට යි. වරින් වර ඔවුන් බලය ලබා ගත්තේ අපගේ ඇස්වලට වැලි ගැසීමෙනි. බොරු පොරොන්දු දෙමින් සාමාන්‍ය ජනතාව රැවටීමෙනි. දසක ගණනාවක් තිස්සේ ඔවුන් විසින් කරන ලද මේ හානිය නිසා බුද්ධි හීන ජනතාවක් බිහි වී තිබේ. මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට නොයෙකුත් ආගමික කණ්ඩායම් හතු පිපෙන්නාක් මෙන් බිහිවී තිබේ.

සාමාන්‍ය ජනතාව දුස්සීල වීම, සුරාපානයට ඇබ්බැහි වී සිටීම, ආර්ථික අවශ්‍යතාවන්ට පහසුවෙන් නම්මා ගත හැකි වීම ඔවුන් ගේ බොර දිය වේ. බොර දියේ මාළු බාන්නට නොහැකි කාටද? බූවල්ලකු තමන් ගේ සියලු අඩු විහිදා සතෙකු ග්‍රහණය කරගන්නා සේ නොයෙක් ආගමික කණ්ඩායම් මේ සමාජය වේගයෙන් ආක්‍රමණය කරමින් සිටී. අප බුද්ධිමත් නොවුන හොත් ඕනෑම මොහොතක ඒ ආගමික මතවාදයන් අපව ආක්‍රමණය කරන්නට පුළුවනි. ආක්‍රමණයේ ස්වභාවය දුර්වලයාව බලවතා විසින් ග්‍රහණය කර ගැනීමයි. ධනපතියා විසින් දිළින්දාව ආක්‍රමණය කරනු ලැබේ. උගතා විසින් නූගතාව ආක්‍රමණය කරනු ලැබේ. අහිංසකයාව හිංසකයා විසින් ආක්‍රමණය කරනු ලැබේ. දක්ෂයා විසින් අදක්ෂයාව ආක්‍රමණය කරනු ලැබේ. කපටියා විසින් දැනුමින් තොර කෙනාව ආක්‍රමණය කරනු ලැබේ. මානව ඉතිහාසය පුරාම සිදු වී ඇති මේ ආක්‍රමණ ආගම් නාමයෙන් ද පැවතී තිබීම මෙහි ඇති ශෝචනීය තත්වයයි. එබඳු ආගම් ඉතිහාසයේ

sinhalaebooks.com



සටහන් වී තිබෙන්නේ කඩුවෙන්, කිණිස්සෙන්, ලේ කඳුළු ඔස්සේ ප්‍රචණ්ඩත්වය මුල් කොට ප්‍රචාරය කළ ආගම් වශයෙනි. දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් මානව වර්ගයාට සිදු වී ඇති හානිය අතිවිශාලය. ඊටත් වඩා හානියක් ආගමික ප්‍රචණ්ඩත්වය තුළින් ද මානව වර්ගයාට සිදු වී ඇත. වටිනා ධර්ම ග්‍රන්ථ, ශාස්ත්‍රීය ග්‍රන්ථ, සිල්වත් ගුණවත් උතුමන් මානව සමාජයට අහිමි වී තිබෙන්නේ ආගමික ප්‍රචණ්ඩත්වය හේතුවෙනි.

ආගමික ප්‍රචණ්ඩත්වයෙන් නැගුණ ගිනිසිළුවලින් නාලන්දා විශ්ව විද්‍යාලයේ පමණක් දැවී ගිය පිරිසිදු ජීවිත දහස් ගණනකි. පොත් පත්වල ගණන පවා කිව නොහැකි තරම් විශාලය. මානව වර්ගයා ගේ ප්‍රඥා ධනය අපට අහිමි වූයේ ආගමික උම්මත්තකයින් ගෙනි. මේ නිසා කුරුස යුද්ධ වේවා, වෙනත් ශුද්ධ යුද්ධ වේවා, මොන නාමයෙන් කතා කළ ද එයින් කියැවෙන්නේ ම්ලේච්ඡ වූ ප්‍රචණ්ඩත්වයයි. හිංසාවත්, ප්‍රචණ්ඩත්වයත් ආගම් ප්‍රචාරයේ මාධ්‍යයක් කර ගත් විට ඒකාන්තයෙන් ම සිදුවන්නේ මහත් විනාශයෙකි. සාමයේ නාමයෙන්, අනුකම්පාව නාමයෙන්, මානව දයාව නාමයෙන්, දේව කැමැත්තේ නාමයෙන් ඕනෑම අපරාධයක් කිරීමට සමහර ආගම්වලට පුළුවනි. මෙයට හේතුව තම තමන් ගේ ආගමික මතවාදයන් මොන අපරාධයක් තුළින් හෝ මොන වංචාවකින් හෝ මොන උපක්‍රමයකින් හෝ පතුරවා, තමන් ගේ පැත්තට අනිකාව ඇද ගැනීමට තිබෙන උමතු ආශාවයි!

## ඇත්ත මේකයි!

එහෙත් සත්‍ය තත්වය මීට හාත්පසින් ම වෙනස් ය. එනම් කිසිම මනුෂ්‍යයෙක් උපතකින් කිසිම ආගමකට අයිති නැත. කිසිම භාෂාවකට ද අයිති නැත. කිසිම ජාතියකට අයිති නැත. කිසිම කුල ගෝත්‍රයකට අයිති නැත. හැඬීමත්, හිනා වීමත්, කිරි බීමත් හැර වෙන කිසිවක් ඒ කිරි දරුවා නොදනී. තමන් සිටින ඉරියව්වේම මළ පහකරන, මුත්‍රා කරන ඒ සිඟිත්තා ආගමක් අදහන්නේ කෙසේ ද? භාෂාවක් කතා කරන්නේ කෙසේ ද? කුලයකට, ගෝත්‍රයකට,

sinhalaebooks.com



ජාතියකට අයත් වන්නේ කෙසේ ද? එය නොවිය හැකි දෙයකි.

වැඩිහිටි පිරිස කරන්නේ තමන් ගේ ලෝකයේ තිබෙන හොඳ හෝ වේවා නරක හෝ වේවා ඒ ලෝකයට දරුවාව හුරු කිරීමයි. සිහිත්තෙක් බහ තෝරන හැකියාවත් තනියම ඇවිදීමත් පුරුදු වූ විට ඉතාම වේගයෙන් අත්දැකීම් ලබාගන්නට පටන් ගනී. හැම දෙයක් ම ටිකෙන් ටික ඉගෙන ගන්නට පටන් ගනී. දරුවා තුළ මානව දයාව ඇති වීම හෝ සමාජය කෙරෙහි දරුණු ගති ඇති වීම හෝ සකස් වීම ඇති වන්නේ ඉන් පසුවයි. කලක් යන විට යහළු මිත්‍රයන් ගේ ආශ්‍රයෙන් ද, පොත් පත් බැලීමෙන් ද, රූපවාහිනී ගුවන් විදුලි ආදී ජනමාධ්‍ය මගින් ද, පාසල් අධ්‍යාපනයෙන් ද, වැඩිහිටි ආශ්‍රයෙන් ද දරුවාගේ ජීවිතය හැඩ ගැසෙන්නට පටන් ගනී. වැඩිහිටියන් සකස් කරගෙන තිබෙන නොයෙකුත් සමාජ රාමු ඔස්සේ දරුවා හැඩ ගැසෙන්නට පටන් ගනී. කලක් යන විට කිසිම වග විභාගයකින් තොරව ජාතිවලට බෙදී ගිය මානසිකත්වයක් ඔවුන් තුළ හටගනී. කුල ගෝත්‍ර ඔස්සේ බෙදී ගිය, භාෂා ඔස්සේ බෙදී ගිය, සිරිත් විරිත් ඔස්සේ බෙදී ගිය, ආගම් ඔස්සේ බෙදී ගිය මානසිකත්වයක් ඔවුන් තුළ හටගනී. මේ තුළින් කණ්ඩායම් වාද, කල්ලිවාද හටගනී. තම තමන් දරා ගෙන සිටින මතයන්ම තර්කයන් ඔස්සේ ගලපමින් ඒවාම ග්‍රහණය කරගන්නට ය ඔවුන් හික්මෙන්නේ. එවිට සත්‍ය අසත්‍ය නුවණින් විමසා බැලීමේ බුද්ධිමය හැකියාව ඔවුන්ට අහිමි වී යයි.

බුද්ධිය හැසිරවීමේ හැකියාව අහිමි කරගත් තැනැත්තා පවතින සමාජ ක්‍රමයේ ගොදුරක් මිස නිදහස් පුද්ගලයෙක් නොවේ. දේශපාලන බළල් අතක් වශයෙන් ද ආගමික බළල් අතක් වශයෙන් ද ඔහුව පාවිච්චි කළ හැකිය. ඉන්පසු ඔහු රූකඩයකි. මෙය සිදුවන්නේ අන්ධ භක්තියෙන් යුතු, බුද්ධිය හැසිරවීමේ හැකියාවෙන් තොර පුද්ගලයන්ට ය. එහෙත් යමෙක් මෙය තේරුම් ගෙන අන්ධ භක්තියෙන් තොරව බුද්ධිය හසුරවන්නට පටන් ගත් විට මානව සමාජයට ඉතාමත් හිතානුකම්පී ව තම චින්තනය මෙහෙය විය හැකි ය.

sinhalaebooks.com



## සුදු බුදුවරු... ?

විශේෂයෙන් වර්තමාන සමාජයේ බොහෝ දෙනෙක් බටහිර ර්නියා විද්‍යාත්මක චින්තනයට හසු වී එහි ගොදුරු බවට පත් වී සිටිති. ඔවුන් සිතන පිළිවෙලට සියල්ලම අවබෝධ වී තිබෙන්නේ සුද්දන්ට ය. සුද්දන් ගේ ඤාණයට හසු නොවූ දෙයක් නැති බව යි ඔවුන්ගේ අදහස. මනස ගැනත්, ජීවිත ගැනත්, මෙලොව හා පරලොව ගැනත් සියලු තොරතුරු දන්නේ සුද්දන් පමණි. මේ මානසික වහල් භාවයේ සිටිනා තුරු ඔවුන්ට ගැලවීමක් නැත. බටහිර සමාජය විසින් විවිධ උපක්‍රම ඔස්සේ ලෝකයාව දමනය කරගෙන සිටින්නේ ඒ ආකාරයෙනි. මුළු ලෝකයාව ම අල්ලේ නටවන්නට සුද්දන්ට පුළුවන් යයි සුද්දෝ සිතාගෙන සිටිති. එහෙත් බටහිර ජාතීන් අතර පවා බුද්ධිමය මංකොල්ලයකට හසුවීමකට අකැමැති නිදහස්ව චින්තනය මෙහෙයවාලිය හැකි බුද්ධිමත් මිනිස්සු කොතෙකුත් සිටිති. එවැනි බුද්ධිමත් මිනිස්සු ආගමක් තෝරා ගැනීමට පළමු ඉතා හොඳින් එම ආගම් බිහි කළ ආගමික කර්තෘවරුන් ව අධ්‍යයන කරති.

## නිවැරදිව හඳුනාගන්න!

යම්කිසි ආගමික කර්තෘවරයෙක් පවසන්නේ නම් තමන් ගේ ආගම මිනිසුන් ගේ යහපත උදෙසා සකස් වී තිබේ යයි, එහි ඇති ඓතිහාසික සත්‍යතාව විමසිය යුතුය. එම ආගමේ කර්තෘවරුන් ගේ ආගමික ග්‍රන්ථ අපක්ෂපාතව අධ්‍යයනය කළ යුතු ය. එවිට ඉතාම පැහැදිලිව පෙනී යන්නේ මැවුම්කාරවාදය ගැන කතා කරන ආගම් සියල්ල ම ඍජුව ම මනුෂ්‍ය ඝාතනවලට අනුබල දී තිබෙන බවයි. ප්‍රචණ්ඩත්වය ආගම් ප්‍රචාරක මාධ්‍යයක් කර ගෙන තිබේ. මනුෂ්‍ය වර්ගයා කෙරෙහි කරුණාවක් ඒ ආගම් කර්තෘවරුන්ට තිබුනේ නම් ඔවුන් කිසිදාක හිංසාව තම ආගම් ප්‍රචාරයට නොයොදනු ඇත.

එම නිසා අප ඉතාම බුද්ධිමත්ව විමසා බැලිය යුතු ය. මානව ඉතිහාසයේ මිනිසුන්ට බුද්ධියත්, නිදහසත්, සැනසිලිදායක ජීවිතයත් සැබැවට ම ප්‍රදානය කළේ කවුරුන් විසින් දැයි විමසා බැලිය යුතු ය. මිනිස් වර්ගයා තුළ කරුණා මෛත්‍රිය සැබැවට පතුරවා හැරියේ

sinhalaebooks.com



කවුරුන් විසින් දැ'යි විමසා බැලිය යුතු ය. මනුෂ්‍යත්වයට උපරිම ගෞරවය ලබා දුන් ආධ්‍යාත්මික ගුරුවරයාණන් කවුරුන් දැ'යි විමසා බැලිය යුතු ය.

ඕනෑම දෙයක් අන්ධ භක්තියෙන් පිළිගැනීම අප නොකළ යුතු දෙයකි. අන්ධ භක්තිය තුළ වඩාත්ම බලපවත්වන්නේ භය, පක්ෂපාතිත්වය හා පටු ආගම්වාදය යි. එවැනි ආගම් සමාජයට ආගමික අබිං සපයයි. අප කිසිසේත් ඒ තත්වයට පත් නොවිය යුතු ය.

ඉතාම මධ්‍යස්ථව, බුද්ධිමත්ව හරි - වැරැද්ද හඳුනාගෙන නිවැරදි දේ තෝරා ගැනීමේ හැකියාව අපට තිබිය යුතු ය. මානසික වහල් භාවයෙන් නිදහස් වී නිවහල් චින්තනයක් ඔස්සේ බුද්ධිය දියුණු කරගත හැකි මං මාවත් ඇති ආගමක් ය අප තෝරා ගත යුත්තේ.

ඒ වෙනුවෙන් ආදර්ශයෙන්, උපදේශයෙන් පරම පවිත්‍ර ජීවිතයක් ගත කළ සැබෑම මුනිවරයෙක්ව අප තෝරා ගත යුතු ය. අප එලෙසින් තෝරා ගන්නා ආධ්‍යාත්ම ගුරුවරයා මනුෂ්‍ය බුද්ධිය දියුණු කිරීමේ ඓතිහාසික කාර්ය භාරය පරිපූර්ණ ලෙස කරන ලද කෙනෙක් විය යුතු ය. මොනම හේතුවක් නිසා හෝ තමන් ගේ මහාකරුණාව වෙනස් නොකරගත් කෙනෙක් විය යුතු ය.

සමස්ත ආගමික ඉතිහාසයේත්, මානව වර්ගයා ගේ වාර්තාගත ඉතිහාසයේත් අපට එවන් අමිල නිමල ගුණයෙන් පිරිපුන් වූ එකම එක මුනිවරයෙක්ව හමුවෙයි!

## අසිරිමත් මුනිවරයා!

හේ විටෙක හුදෙකලාවේ ඇවිද ගෙන යයි. විටෙක දහස් සංඛ්‍යාත පිරිස් පිරිවරා චාරිකාවක යෙදී සිටී. දූවිලි පිරුනු මං මාවත් ඔස්සේ පාවහන් යුගළක් වත් නොමැතිව ය හේ ඇවිද යන්නේ. කාටවත් බරක් වීමට හෙතෙම අකැමැති ය. තම සිවුර දිරා ගිය විට අමුසොහොනට ගොස් මිනී ඔතා තිබෙන වස්ත්‍ර කැබිලි සොයා ගෙන ඒවා සෝදා මසා පඬු ගසා සිවුරක් සකසා ගෙන පොරවා ගනී. ගෙපිළිවෙළින් පිඬු සිඟා වැඩම කොට තම පාත්‍රයට ලද කිසිවකින්

sinhalaebooks.com



කුසගින්න නිවා ගැනීම උන්වහන්සේ ගේ සාමාන්‍ය සිරිතයි. එතුමන් දවස ගෙවන්නේ ප්‍රබෝධමත් වූ නිදහස් සිතකින් ය. රුක් සෙවනක වාඩි වී භාවනා කිරීම උන්වහන්සේට ඉතා ප්‍රිය දෙයකි. ශෝකය, කඳුල, වේදනාව, ආශාව, බලාපොරොත්තුව, තැති ගැනීම, බිය, සාංකාව, අවිශ්වාසය, ආදී කිසිවක් උන්වහන්සේ ගේ ජීවිතයට සම්බන්ධ නැත. ඒ වෙනුවට ශාන්ත භාවයත්, ප්‍රීතියත්, මධ්‍යස්ථ භාවයත්, අකම්පිත බවත්, අධිෂ්ඨානයත්, පිවිතුරු හුදෙකලාවේ රසයත්, දයානුකම්පාවත්, විස්මිත බුද්ධියත් ඒ ජීවිතය තුළ පිරී ඉතිරී තිබුනි.

මේ අසහාය මනුෂ්‍ය රත්නය උපත ලැබුවේ හිම කඳු අසල පිහිටි සුන්දර කපිල වස්තු නගරයේ ශාක්‍ය වංශයට අයත් රාජකීය පවුලක ය. මේ රාජකීය පවුලේ ඔටුන්න හිමි කුමාරයා වූ මෙතුමන් ගේ ගිහි නම සිද්ධාර්ථ ය. "යහපත උදා කරන තැනැත්තා" යනු ඒ නමෙහි තේරුමයි. රජ පවුලේ සිරිත අනුව නව යොවුන් වියේ දී සුරූපී යසෝදරා කුමරිය හා සිද්ධාර්ථ කුමරු විවාහ විය. වයස විසිනවය වන විට සිද්ධාර්ථයන් ගේ සියලු සිතුම් පැතුම් මුළුමනින් ම වෙනස් වී ගියේ ය. ජීවිතයේ යථාර්ථය කුමක් දැ යි කුතුහලයෙන් ඒ සිත වෙළී ගියේ ය.

## සැබෑම අබිනික්මන

සැබෑම වූ මානසික විමුක්තියක් මේ ජීවිතයේදී උදාකර ගත හැකි බව එතුමා තරයේ ම සිතාගෙන සිටියේ ය. උන්වහන්සේ ගේ සිහිනය වූයේ සියල්ලෙන් වෙන් වී හුදෙකලා අසපුවක භාවනා කිරීම ය. මේ ගුණවත් යොවුන් කුමරා ගේ චින්තනයට වැට කඩුළු බැඳ තිබුනේ රජමැඳුරෙන් ම ය. එහෙත් කිසිම රාජකීය බන්ධනයකට කුමරුන්ව සිරගත කළ නොහැකි විය. නිදහස සොයා යන කුරුල්ලෙක් කැදැල්ල අතහැර පියඹා යන්නා සේ සිද්ධාර්ථයන් ද රජමැඳුර හැරදා මහ රෑ පිටත්ව ගියේ ය. තමන්ට දාව බිළිඳු රාහුලයන් උපන් දිනය සාමාන්‍යයෙන් පිය කෙනෙකුට බලවත් බන්ධයක් ම ය. එහෙත් ඒ හැඟීමට ඉඩ නොදී එදින ම අභිනික්මන් කිරීමට එතුමා තුළ මොන තරම් මානසික ශක්තියක් තිබෙන්නට ඇත් ද?

sinhalaebooks.com



බුදුවසින් විසි හයවන සියවසේ කාම පිපාසාවෙන් මෝහනයට පත් වී සිටින ආත්මාර්ථකාමී මිනිසුන් ගේ සිත්වලට නො ඉවසිය හැකි වරදක් සේ මෙය පෙනෙන්නට ඉඩ තිබේ.

එහෙත් රුපියල් සත උදෙසා තම කිරිදරුවන් පවා අතහැර පිටරටවල දුප්පත් රැකියාවන් සොයා යන මව් වරුන් කොතෙක් ද? අඹු දරුවන් අතහැර දුර රටවල අනන්ත දුක් විඳිමින් රැකියාවල් කරන පියවරු මොන තරම් සිටිත් ද? ඒ ගැන කණගස්සලු වෙන්නට කිසිවෙක් නැත. එකම එක පවුලක් උදෙසා ඔවුහු අනන්ත දුක් අනුභව කරමින් සිටිති. හරි හම්බකරගත් දෙයින් සමහර කෙනෙකුට ප්‍රයෝජන ලබාගන්නට ද වාසනාවක් නැත.

එහෙත් සිද්ධාර්ථ කුමරු ගේ දොර හැර ගියේ පිටරටක රැකියාවක් සොයන්නට නොවේ. වනාන්තරයේ මැණික් තිබෙන තැන් හෝ නිධන් තිබෙන තැන් සොයන්නට නොවේ. එසේත් නැතිනම් වනාන්තරයේ තිබෙන සුවිසල් රුක් ගොමු, දිය ඇලි, වනසතුන් බල බලා සතුටු වෙන්නට නොවේ. ඊනියා උගතුන් සොයා බලන විශ්ව ශක්තීන් සොයන්නටත් නොවේ.

## සොයා යන පුද්ගලයා

ඔබට මතක ද සිතීමේ හැකියාවෙන් යුතු අයිසෙක් නිව්ටන් නම් මිනිසා ගැන. හේ දිනක් ගසක් යට සිටින විට ඒ ගසින් ගෙඩියක් වැටුනේ ය. ගෙඩිය අහසේ නොරැඳී බිමට වැටුනේ ඇයි දැ'යි ඔහුට මහා ප්‍රහේලිකාවක් ඇති විය. අන්තිමේ ඒ ප්‍රහේලිකාව විසඳා ගන්නට හේ සමත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ගුරුත්වාකර්ෂණය සොයා ගති. එහෙත් ඔහු එය සොයා නොගත්තා නම් ඉතිහාසගත වන්නේ පිස්සකු ලෙස ය. ඔහු ට ඇති වූ ප්‍රශ්නය බොහෝ දෙනෙකුට ඇති වූයේ නැත. නමුත් ඒ ප්‍රශ්නය වෙනුවෙන් ඔහු සොයා ගත් විසඳුම හැම දෙනාට ම ප්‍රයෝජනවත් විය.

පරිමාව කුමක් දැ'යි සොයා ගැනීම පිණිස බලවත් ලෙස සිත මෙහෙයවමින් සිටි ආකිමිඩිස් නෑම පිණිස ජලටැංකියකට බැස ගත්තේ

sinhalaebooks.com



ය. ඒ සැණින් ටැංකියේ ජලය උතුරා ගියේ ය. ඔහුට පරිමාව කුමක් දැ'යි එතැනදීම අවබෝධ විය. හේ නිම්හිම් නැති ප්‍රීතියට පත් විය. තමා නිරුවත් ව සිටින බව වත් ඔහුට අමතක විය. "යුරේකා!! යුරේකා!! (සොයා ගත්තා! සොයා ගත්තා!!) යයි කෑ ගසමින් රජ මැදුර තෙක් දිව ගියේය. පරිමාව සොයා ගත් ආකිමිඩිස් ගේ සතුට ඒ අයුරු විය.

කිසිම ගුරුවරයෙකු ගේ කිසිම ආචාර්ය වාදයක, කිසිම ආගමික ග්‍රන්ථයක සහයෝගයෙන් තොරව තමන් ම සමාධිය දියුණු කරගෙන, ප්‍රඥාව දියුණු කරගෙන ජීවිතයේ සැබෑ තත්වය පරිපූර්ණ වශයෙන් අවබෝධ කරගත්, පරම විමුක්තිය ලද සිද්ධාර්ථ ගෞතම බුදු රජුන් ගේ සිතේ ඇති වූ ලෝකෝත්තර සතුට ගැන උන්වහන්සේට කුමක් සිතෙන්නට ඇත්ද?

## නිදහස් මාවතක් කරා

ලොව කිසිම කෙනෙකුට නො තිබුණ ප්‍රහේලිකාවකි සිද්ධාර්ථයන්ට තිබුනේ. මනුෂ්‍ය වර්ගයා ගේ ජීවිත මහලු වීම ඉදිරියේ අසරණ භාවයට පත්වීම, රෝග පීඩා වැළඳීම ඉදිරියේ අසරණ භාවයට පත්වීම, මරණය ඉදිරියේ අසරණභාවයට පත්වීම, නොයෙකුත් ප්‍රශ්න ඉදිරියේ හඬමින් වැලපෙමින් ශෝක වීම සදහට ම නවතාලිය හැකි දෙයක් සොයා යාමයි උන්වහන්සේගේ ඒකායන අභිප්‍රාය වූයේ. ඒ වන විට සාම්ප්‍රදායික බ්‍රාහ්මණ ආගම ඉගැන්වූයේ ලෝකයේ මැවුම්කරුවකු ගේ කැමැත්තට අනුව ජීවිතයට සැප දුක ලැබෙන බවයි. ආගම දඬමීමා කරගෙන සමාජ ආධිපත්‍ය පවත්වා ගැනීමත් ඒ ආගමික සිරිත් විරිත් නොකඩ කොට ගෙන යාමත් පිණිස බ්‍රාහ්මණ ජනතාව සැදී පැහැදී සිටියහ. ඒ ලෝක නිර්මාපක දෙවිඳුන්ව සතුටු කිරීමට කළ යුත්තේ දහස් ගණන් සතුන් මරා ඒ මස් පුළුස්සා එයින් නැගෙන පුළුටු ගඳ දෙවිඳුන්ට පූජා කිරීම යි. එමෙන් ම එම යාග ඔස්සේ මිනිසුන්ව ද බිලි දී දෙවියන්ව සතුටු කරන යාග සකස් වී තිබුනි. ජනතාව ගේ නිදහස් චින්තනය සිර කොට තැබුවේ මැවුම්කාර දෙවිඳුන් ගේ නාමයෙන් තනා ගත් යකඩ දම්වැල් තුළිනි. පූජක පන්තිය ජනතාවගේ බුද්ධිය සූරා කන්නට පටන් ගත්තේ දේව

sinhalaebooks.com



මැවිල්ලේ නාමයෙනි.

එහෙත් ඒ සම්ප්‍රදායික මතයන්ට එරෙහි ව, නිදහස් වූත්, ස්වාධීන වූත් නොයෙකුත් ශ්‍රමණ කණ්ඩායම් නැගී සිටියේ ය. බ්‍රාහ්මණ මතිමතාන්තර සම්පූර්ණයෙන් ම බැහැර කළ ඒ ශ්‍රමණ පිරිස් නොයෙකුත් ගුරු කුල බිහිකර ගනිමින් සංචාරක ජීවිත ගෙවන්නට පටන් ගත්හ.

සිද්ධාර්ථයන් ද තෝරා ගත්තේ ඒ නිදහස් මාවත යි. ශ්‍රමණයෙකු බවට පත් වූ සිද්ධාර්ථයන් වනාන්තරයෙන් වනාන්තරයට ඇවිද ගියේ ය. සියලු මනුෂ්‍යයන්ට එකසේ බෙදා හදාගත හැකි සුවපත් වූ ජීවිතයකි උන්වහන්සේ සොයා ගෙන ගියේ. ජීවිතවලට මුළාවී දුක් කම්කටොළු පස්සේ ම හඹා යන ජනතාව ට සැබම වූ ක්ෂේමභූමියක් ය උන්වහන්සේ සොයාගෙන ගියේ. උන්වහන්සේ ගේ අරමුණ, ඉලක්කය බලා වේගයෙන් ගමන් කරන ඊතලයක් මෙන් විය. කිසිදා පසු නොබසින අසාමාන්‍ය වීරියක් උන්වහන්සේ සතු විය. කිසිවෙකුට හෝ වසඟ කර ගත නොහැකි, මං මුළාවට පත් කළ නොහැකි වහා වැටහෙන අතිශයින්ම තීක්ෂණ නුවණක් උන්වහන්සේ සතුවිය. විමුක්තිය සොයා යන මේ ගමනේ දී සිද්ධාර්ථයන් ගේ සිත ඇදී ගියේ වනගත අසපුවල භාවනා උගන්වමින් සිටි ගුරුවරුන් දෙදෙනෙකු ගැන පමණි. සිද්ධාර්ථ ශ්‍රමණ තෙමේ ඒ අසපුවල නැවතුනේ ය. ඒ ගුරුවරු දෙදෙනා වන ආලාරකාලාමයන්ටත්, උද්දකරාමපුත්‍රයන්ටත් සවන් දුනි. ඔවුන් උගන්වන දේ නිමේෂයකින් ඉගෙන ගති. එහි පරතෙරට ම ඉගෙන ගති. සිද්ධාර්ථයන් සොයා යන ක්ෂේමභූමිය ඔවුන් ගේ ඉගැන්වීම්වලින් සොයා ගත නොහැකි විය. අන්තිමේ හේ ඒ ගුරුවරුන් ව අත්හැරියේ ය. ඒ ඉගැන්වීම් ද අත්හැරියේ ය. ඒ අසපුවලින් ද නික්මී ගියේය. කාගෙන්වත් ඇසීමෙන් පලක් නොවන බව දත් හෙතෙමේ වනාන්තරයේ රුක් ගොමු සෙවනේත්, ගිරි ගුහාවලත් නිදහසේ හැසිරුණේ ය. තමා සොයා යන දෙය තමාට ම සොයා ගත හැකි බව උන්වහන්සේ ට ඉවෙන් මෙන් වැටහෙන්ට විය. තමා තුළ සුදුසු කම් නොමැතිව හිතුවක්කාර ලෙස ඇති කරගත් තීරණයක් ඒ අදහස තුළ

sinhalaebooks.com



නො තිබුනි. අසාමාන්‍ය බුද්ධි බලයෙකින් උන්වහන්සේ ගේ විමසුම් නුවණ නිර්මිත වී තිබුණි. තමන් ගේ ම පර්යේෂණ ක්‍රම විද්‍යාවක් සොයා ගන්නට ද උන්වහන්සේ යොමු වී සිටියහ.

## සාමාන්‍ය ජීවිතය

අද මෙන් ම එදත් බහුතර ජනතාව ජීවිතය ගැන ගැඹුරින් සිතුවේ නැත. එදිනෙදා ජීවිතය සැපසේ වාසය කිරීම ජීවිතයේ ඒකායන වැඩ පිළිවෙල බවට පත්කර ගෙන සිටියෝ ය. කුඩා අවදියේ ගුරුගෙදරට ගියෝ ය. හරක බාන ඇති කරගෙන වතුපිටි වවාගෙන ගොවිතැන් බත් කිරීම දෛනික ජීවිතය විය. යොවුන් විය පැමිණෙන විට පෙම්බස් දොඩන්නට පටන් ගත්හ. කාන්තාවෝ ඇඟපත සැරසීමටත්, දරුවන් වැදීමටත්, බත් මාළු පිසීමටත් සැදී පැහැදී සිටියෝ ය. රජවරු සිටුවරු තම තමන් ගේ අටුකොටු පුරවමින් සිටියෝ ය. ගණිකාවන් බෙදා ගත නොහැකිව සල්ලාලයෝ ඇණ කොටා ගත්හ.

රන් රිදී අබරණවලින් ඔවුන් ගේ සිරුරු සරසා තිබුණ ද, සිනිඳු කසී සලුවලින් ඔවුන් ගේ ගත වැසී ගිය ද, ඔවුන් නෙත් වල අඳුන් ගා, වරලසෙහි මල් ගසා, සුවඳ ගල්වා තිබුණ ද, ඔවුන් ගේ සිත්වල පැවතුනේ අද පවතින දේවල්ම ය. ඔවුන් ගේ සිත් පුරා තිබුණේ කාමාශාවත්, ඉරිසියාවත්, වෛරයත්, එකටෙක කිරීමත්, පළිගැනීමත්, මුරණ්ඩුකමත්, පාරට්ටු කරගැනීමත්, භීතියත්, සැකයත්, තැතිගැනීමත්, අසරණකමත් පමණි. ඒ සියල්ලෙන් නිදහස් වූ ශාන්ත සුවයක් සිතක ඇති කරගැනීම ගැන සිතන්නටවත් ඔවුන්ට වේලාවක් නැත! එකිනෙකා බෙදෙමින් ඇණකොටා ගනිමින් තම තමන් ගේ ජීවිත ගැන පමණක් සිතමින් සිටිද්දී ඔවුන් ගේ ජීවිත සදහටම සුවපත් කර දීමට සිතමින් සිටියේ එකම එක් කෙනෙකි. හෙතෙමේ රාජකීය ඔටුන්න අතහැර ශ්‍රමණ ජීවිතයට බැසගත්තේ ඒ නිසා ම ය. මහා වනාන්තරවල භාවනානුයෝගීව සිටි ඒ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ තමන් ගේ මුළු ජීවිතයම කැප කළේ ඒ නිසා ම ය.

sinhalaebooks.com



## නුවණින් සපිරි උතුමා

වනගත කුටියක භාවනා කොට ඍද්ධි බල උපදවාගෙන ජනයා විස්මයට පත් කරවීම උන්වහන්සේ කිසිසේත් අනුමත නොකළහ. හුරතල් බස් තෙපළමින් ජනතාව රැවටීමට උන්වහන්සේ කැමති නැත. පමණ කළ නොහැකි අතිශයින්ම ආධ්‍යාත්මික බලයක් ඇති කර ගැනීමට තරම් උන්වහන්සේ භාග්‍ය සම්පන්න වූ නමුත් නිතරම කල් ගෙව්වේ සාමාන්‍ය මනුෂ්‍යයන් ගේ කාරුණික මිත්‍රයෙක් හැටියට ය. ඊට ප්‍රධානතම හේතුව වූයේ සියලු තරාතිරම් වල සිටින මනුෂ්‍ය වර්ගයා ගේ දැවෙන ප්‍රශ්නය මනාකොට තේරුම් ගෙන සිටීම ය. ඕනෑම දරුණු පීඩනයකට හසුව දුක් විඳින ඕනෑම මනුෂ්‍යයෙකුට උන්වහන්සේ හමුවට ගොස් තමා ගේ දුකට විසඳුම ලබාගත හැකි ය. එයට කිසිම බාධාවක් නැත. උන්වහන්සේ ඒ සඳහා නිතරම සැදී පැහැදී සිටිති.

## සත්‍ය උදෙසා දුක් විඳී!

එහෙත් උන්වහන්සේ ජීවිතයට ක්ෂේමභූමියක් සොයමින් ගතකළ කාල පරිච්ඡේදය අතිශයින්ම කටුක විය. අතිශයින්ම දුෂ්කර විය.

තමන් අනුභව කරන ආහාර මානසික දියුණුවට බලපාන බව ආහාරයෙන් පිරිසිදු බව පතන උදවිය පවසති. එකල උන්වහන්සේ තුළ ද මේ මතය තිබුණි. ප්‍රණීත ආහාර වැළඳීම පවා සම්පූර්ණයෙන් ම අත් හැරියේය. විමුක්තිය පිණිස ආහාරය උපකාර වන්නේය යන හැඟීම තුළ ලදරු වසු පැටියන් ගේ ගොම පවා අනුභව කරන්නට පටන් ගති. දැඩි රූක්ෂ ප්‍රතිපත්තියකට බැසගත් උන්වහන්සේ ක්‍රම ක්‍රමයෙන් ආහාර අඩු කරන්නට පටන් ගත්හ. අන්තිමේ දී උන්වහන්සේ ගේ දවසේ ආහාරය වූයේ එකම එක මුං ඇටයකි! පුද්ගලයකු ගේ චිත්ත පාරිශුද්ධියට ඔහු අනුභව කරන ආහාර බල නොපාන බව උන්වහන්සේට අවබෝධ වී ගියේ ය. ඉන්පසු ආහාරයෙන් පාරිශුද්ධියට පත්වන්නේ ය යන මතය උන්වහන්සේ අත් හැර දැමූහ.

sinhalaebooks.com



එය තමන් වහන්සේ ගේ ම පරීක්ෂණයක ප්‍රතිඵලයකි!

කා සමඟවත් කතාබස් නොකොට කිසිවෙකු ගේ දෑසට නොපෙනී වනාන්තරයේ හුදෙකලාවේ සිටීමෙන් චිත්ත පාරිශුද්ධිය ඇතිවන්නේ ය යන මතය එකල උන්වහන්සේ තුළ තිබුනි. උන්වහන්සේ මහා වනාන්තරයේ රුක් ගොමු අතරේ සැඟවී ගියහ. මිනිස් ඡායාව දකින විටම සැඟවෙන ගෝනුන් මුවන් මෙන් උන්වහන්සේ ද මිනිස් ඡායාව දකින විටම වනයෙන් වනයට සැඟවී ගියහ. මනුෂ්‍යයින් ගේ නේත්‍ර පථයට හසු නොවී ජීවත් වූ පමණින්, මුවින් වචන පිට නොකළ පමණින් චිත්ත පාරිශුද්ධියක් ඇති නොවන බව උන්වහන්සේට අවබෝධ වී ගියේ ය. ඒ මතය උන්වහන්සේ අත්හැර දැමුවේ තමන් වහන්සේ ගේ ම පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙනි.

නිරුවත්ව සිටීමත්, නොනා සිටීමත්, තල් ඇට දෙකකින් තද කොට කෙස් රැවුල් උදුරා දැමීමත්, ඇඟේ තැවරෙන දූවිලි නොසේදීමත් චිත්ත පාරිශුද්ධියට උපකාරි වන්නේ ය යන මතය උන්වහන්සේ තුළ තිබුනි. සිද්ධාර්ථ ශ්‍රමණ තෙමේ ද නිරුවත්ව සිටියේ ය. ඇඟපත සේදීම නවතා දැමීය. කෙස් රැවුල් උදුරන්නට පටන් ගති. එහෙත් ඒ කිසිවක් චිත්තපාරිශුද්ධියට අදාළ නැති බව උන්වහන්සේට අවබෝධ වී ගියේ ය. ඒ මතය ද උන්වහන්සේ අත්හැර දැමුවේ තමන් වහන්සේ ගේ ම පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙනි!

අධික පීඩා ඇති කරගනිමින් ශරීරයට දුක් දීම චිත්ත පාරිශුද්ධියට උපකාරී වන්නේ ය යන මතය උන්වහන්සේ තුළ ද තිබුණි. අධික ශීතල තිබෙන හිම වැටෙන කාලයේ ගංගාවේ බසින උන්වහන්සේ සීතල දියේ කිමිදී සිටිති. මහා රාත්‍රියේ දියේ ගිලෙන උන්වහන්සේ ගේ ශරීරය අධික සීතලෙන් බලවත් පීඩාවට පත් වෙයි. ඉඩෝර කාලයේ මධ්‍යාහ්නයේ රත් වූ ගල්තලා මත හිඳිමින් සිරුර දවයි. තවයි. අන්තිමේදී උන්වහන්සේට අවබෝධ වූයේ එය විමුක්තියට අදාළ නැති බවයි. ඒ මතය ද උන්වහන්සේ අත්හැර දැමුවේ තමන් වහන්සේ ගේ ම පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙනි!

එමෙන්ම ආශ්වාස ප්‍රශ්වාස පාලනය කිරීමෙන්

sinhalaebooks.com



චිත්තපාරිශුද්ධිය ලබා ගත හැකි වන්නේ ය යන මතය ද උන්වහන්සේ තුළ තිබුනි. එතැන දී කරන්නේ ඉහළට ගත් හුස්ම පහළට නොහෙළා හැකි තාක් හුස්ම රඳවා ගෙන සිටීමයි. එය හඳුන්වන්නේ අප්‍රාණක ධ්‍යාන නමින් ය. උන්වහන්සේ ද අප්‍රාණක ධ්‍යානය ප්‍රගුණ කරන්නට පටන් ගත්හ. ඉහළට ගත් හුස්ම රඳවා ගෙන පෙණහැලි තුළ සිර කරගෙන පැය ගණන් සිටින්නට වෑයම් කරද්දී හිස පිපිරී යන්නාක් මෙන් වේදනාව බලවත් වෙයි. "හෝස් හෝස්" යන හඬින් යුතුව ඒ හුස්ම කන්වලින් පිටවෙන්නාක් මෙන් දැනෙයි. බඩවැල් ඇඹරී ගොස් තියුණු ආයුධයෙකින් කුස කපා දමන්නාක් මෙන් දැනෙයි. උන්වහන්සේ නොවේ අත හැරියේ. ඒ අසමසම වීර්යයෙන් යුක්තව අප්‍රාණක ධ්‍යානය වඩද්දී උන්වහන්සේ සිහිසුන්ව ඇද වැටුන අවස්ථා තිබේ. සිරුරට වධවේදනා දෙමින් චිත්ත පාරිශුද්ධිය සෙවීම නිරර්ථක දෙයක් බව උන්වහන්සේට අවබෝධ වී ගියේ ය. උන්වහන්සේ එම දුෂ්කර ක්‍රියාව ද අත හැරියේ තමන් වහන්සේ ගේ ම පරීක්ෂණයක ප්‍රතිඵල වශයෙනි!

ගුරුවරයෙකුගෙන් නො අසා, පොතකින් පතකින් නොබලා ලෝකයේ කිසිවෙකුත් ඒ වන විට නොදැන සිටි සැබෑම ජීවිත විමුක්තිය සෙවීම පිණිස සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ ගත් මෙම වීර්යය අතිශයින් ම ආශ්චර්යවත් ය. ලෝක ඉතිහාසයේ, තම අභිමතාර්ථය මුදුන් පමුණුවා ගන්නා තෙක් නොපසුබට වීර්යයෙන් යුක්තව කටයුතු කළ ප්‍රථම පුරුෂයා උන්වහන්සේ ය. සය වසරක අතිශයින් ම දුෂ්කර කාල පරිච්ඡේදයක් අවසන් කොට ජයග්‍රහණය ලබාගන්නට අන්තිමේ දී උන්වහන්සේ සමත් වූහ!

උන්වහන්සේ ගේ ජීවිතය තුළ පැහැදිලිව ම එක දෙයක් පෙනේ. එනම් යමක් දෙස ඉතාමත් කල්පනාකාරීව විමසා බලන්නට උන්වහන්සේ තුළ තිබූ අතිශයින් දක්ෂ බවයි. ඒ සුවිශේෂී හැකියාව නිසාම ඉතාම නිවැරදි ලෙසත් ඉතාම සූක්ෂ්ම ලෙසත් විමුක්තිය පිණිස ප්‍රගුණ කළ යුතු මාර්ගය සොයා ගන්නට උන්වහන්සේ සමත් වූහ.

sinhalaebooks.com



## අන්තය අත හැරීම

උන්වහන්සේ පළමුවෙන් ම කළේ ඉන්ද්‍රියන් පිණවීම නමැති ක්‍රියාවලියකට ජීවිතය මුළුමනින්ම හසුවී ඇති බව හඳුනා ගැනීමයි. ඉන්ද්‍රියන් පිණවීමට වසඟ වූ ජීවිතය රෝග පීඩා හමුවේ, ජරා ජීර්ණ වීම ඉදිරියේ, මරණය ඉදිරියේ හඬා වැටෙනා අයුරු උන්වහන්සේ දුටහ. අවසන් හුස්ම පොද පිටවී යන තෙක්ම එය අත්හළ නොහැකිව දුක්විඳින ජීවිත උන්වහන්සේ දුටහ. එය මනාකොට හඳුනා ගත් උන්වහන්සේ එය අත්හැර දැම්මේ "අන්තයක් බැහැර කිරීම" වශයෙන් හඳුන්වමිනි. ඒ අන්තය කාමසුඛල්ලිකානුයෝගී අන්තයයි. ඒ අන්තය හීන වූ ළාමක වූ පෘථග්ජන මිනිසුන්ට අයත් වූ, උසස් නොවූ, අයහපත පිණිස හේතු වන අන්තයක් වශයෙන් උන්වහන්සේ හඳුන්වා දුන්නේ ඉන්ද්‍රියන් පිණවීමට වසඟ වූ මිනිසුන් ගැන අමනාපයක් නිසා නොවේ. ඉන්ද්‍රියන් පිණවීමට වසඟ වූ මිනිසුන් නිසා ය සෑම දුෂ්චරිතයක් ම හටගන්නේ. බොහෝ අපරාධ හටගන්නේ.

කාම සුඛයෙහි ඇලී ගැලී වාසය කළ සිද්ධාර්ථයන් ඒ අන්තය අතහැර ශ්‍රමණ ජීවිතයට පත් වූ පසු වැටුනේ අනික් අන්තයට ය. තමාව පීඩාවට පත් කරවා ගැනීමේ ඉතාම කර්කශ වූත් දුෂ්කර වූත් වැඩ පිළිවෙළකි එය. උන්වහන්සේ එය ද හඳුනා ගත්තේ අන්තයක් වශයෙනි. උන්වහන්සේ ඒ අන්තය අපට පෙන්වා දුන්නේ "අත්තකිලමථානුයෝගී අන්තය" වශයෙනි. එය දුක් සහිත දෙයකි. උත්තම නොවන දෙයකි. අයහපත පිණිස පවතින දෙයකි. ඒ තුළින් ද චිත්ත පාරිශුද්ධියක් ලැබිය නොහැකි බව ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කර ගැනීමෙන් පසුව ය උන්වහන්සේ ඒ අන්තයත් අත හැරියේ. ලේඛණාරූඪ මානව ඉතිහාසයේ ඉතාම ප්‍රායෝගිකව මේ අන්ත දෙකම හඳුනා ගෙන ඒවා බැහැර කොට මධ්‍යම ප්‍රතිපදාව ඉතා ම නිවැරදිව හඳුනා ගත් පළමු බුද්ධිමත් මනුෂ්‍යයා උන්වහන්සේ ය!

sinhalaebooks.com



## අසිරිමත් ජයග්‍රහණය!

තමන් වහන්සේ විසින් ම සොයා ගත් ඒ මධ්‍යම ප්‍රතිපදාව ප්‍රගුණ කිරීමෙන් උපරිම ඵල නෙලාගන්නටත් මනුෂ්‍ය ජීවිතයක දී ළඟා විය හැකි ඒ උතුම් ක්ෂේම භූමියට පැමිණෙන්ටත් උන්වහන්සේ සමත් වූහ. ඒ මධ්‍යම ප්‍රතිපදාව ප්‍රගුණ කිරීමෙන් දහම් ඇස ලබාදෙයි. අවබෝධ ඥාණය ලබා දෙයි. කෙළෙස් සංසිඳුවාලයි. විශේෂ ඥාණය ඇති වෙයි. සත්‍යාවබෝධය ඇතිවෙයි. අමා නිවනට ද ඒ තුළින් පත්විය හැකි බව උන්වහන්සේ එකහෙළාම පවසා සිටියහ. ඒ මධ්‍යම ප්‍රතිපදාව උන්වහන්සේ විසින් ම අපට හඳුන්වා දුන්නේ "අංග අටකින් සමන්විත ආර්ය මාර්ගය" වශයෙනි.

ඒ උතුම් වූ ආර්ය මාර්ගයේ අංග අට උන්වහන්සේ පැහැදිලි කොට තිබෙන්නේ මේ ආකාරයට ය.

I. සම්මා දිට්ඨිය = මෙයින් අදහස් කරන්නේ චතුරාර්ය සත්‍ය පිළිබඳ අවබෝධ ඥාණය යි. එනම් ජීවිතයේ අවබෝධ කළ යුතු දුක පිළිබඳ අවබෝධ ඥාණය යි. දුකට මුල් වූ ප්‍රහාණය කළයුතු වූ හේතුව පිළිබඳ අවබෝධ ඥාණය යි. එම හේතුව ප්‍රහාණය වූ බව සාක්ෂාත් කිරීමෙන් දැන ගත යුතු බවට ඇති අවබෝධ ඥාණය යි. ඒ සඳහා ප්‍රගුණ කළ යුතු වැඩ පිළිවෙළ ගැන තිබෙන අවබෝධ ඥාණය යි. එහෙත් බොහෝ දෙනෙක් කියවීමට පහසුව පිණිස දෝ පුරුදු වී තිබෙන්නේ "සම්මා දිට්ඨිය" යන පදයට "හරි දැක්ම" යන්න භාවිතා කිරීමට ය. එහෙත් "හරි දැක්ම" යන වචනවලින් ඉහත පෙන්නා දුන් අර්ථය ගත නොහැකි ය.

II. සම්මා සංකප්ප = මෙයින් අදහස් කරන්නේ "හරි කල්පනාව" නොවේ. සත්‍යාවබෝධය පිණිස හේතුවන ආකාරයට, රූප, ශබ්ද, ගන්ධ, රස, පහස යන කාම අරමුණුවලින් වෙන්වීමේ කල්පනාව වන නෙක්ඛම්ම කල්පනාවන් ය. හිංසාවෙන් වෙන්වීමේ කල්පනාව වන

sinhalaebooks.com



අවිහිංසා කල්පනාවන් ය. ව්‍යාපාදයෙන් වෙන්වීමේ කල්පනාව වන අව්‍යාපාද කල්පනාවන් ය. "හරි කල්පනාව" කියූ පමණින් එය පැහැදිලි නොවේ.

III. සම්මා වාචා = මෙයින් අදහස් කරන්නේ ධර්ම මාර්ගයේ ගමන් කරන්නා වචන පාවිච්චි කළ යුතු ආකාරය යි. එනම් තමන් කතා කරන වචන බොරුවක් නොවිය යුතු ය. කේළමක් නොවිය යුතු ය. එරුස වචනයක් නොවිය යුතු ය. වැඩකට නැති වචන නොවිය යුතු ය. තමාටත් අනුන්ටත් හිත සුව පිණිස පවතින වචන විය යුතුයි.

IV. සම්මා කම්මන්ත = මෙයින් අදහස් කරන්නේ තමන් අත පය හසුරවා කරනු ලබන වැඩ කටයුතු කුමන ආකාර විය යුතු ද යන්නයි. එනම් තමන් ගේ වැඩකටයුතු තුළින් ප්‍රාණඝාතයක් නොවිය යුතුයි. සොරකමක් නොවිය යුතුයි. වැරදි ලෙස කාම සේවනයක් නොවිය යුතුයි. සුරාපානය වැනි මත්ද්‍රව්‍ය භාවිතයක් නොවිය යුතුයි. ඒවායින් වැළකී ජීවත් වන කෙනා ගේ කටයුතුවලින් තමාටත් අනුන්ටත් හානියක් ඇති නොවේ.

V. සම්මා ආජීව = බොරුවෙන්, වංචාවෙන්, කපටිකමෙන්, මායාවෙන් තොරව හිතට එකඟව අවංකව ජීවිතය පවත්වාගෙන යාම මෙයින් අදහස් කෙරේ.

VI. සම්මා වායාම = මේ තුළ අදහස් කරන්නේ අකුසල් දුරු කරමින් කුසල් දහම් දියුණු කරගැනීමේ මානසික වීර්යය යි. එනම් නූපන් කුසල් උපදවා ගැනීමේ වීර්යයත්, උපන් කුසල් දියුණු කර ගැනීමේ වීර්යයත්, නූපන් අකුසල් නූපදවාලීමේ වීර්යයත්, උපන් අකුසල් ප්‍රහාණය කිරීමේ වීර්යයත් ය. මේ වීර්යය ඉතාමත් වෙහෙස මහන්සියෙන් ඇති කරගත යුතු ශක්තියකි.

VII. සම්මා සති = මෙහි දී අදහස් කරන්නේ සිහිය හෙවත් මනා අවධානයෙන් යුතුව පැවැතිය යුතු සතිපට්ඨානය ගැන ය. එනම් කය ගැනත්, සැප-දුක් හා දුක්සැප රහිත

sinhalaebooks.com



විඳීම් ගැනත්, සිත ගැනත්, නීවරණ ධර්ම ගැනත්, ඇස් කන් ආදී ආයතන ඔස්සේ සාංසාරික බන්ධන ඇතිවීම හා නැතිවීම ගැනත්, බොජ්ඣංග ධර්ම ගැනත්, චතුරාර්ය සත්‍ය ගැනත් සිත පිහිටුවා ගැනීම "සති" ය ට අයත් වේ.

VIII. සම්මා සමාධි = මෙයින් අදහස් කළේ වර්තමානයේ ඇතැම් සම්ප්‍රදායන් කතා කරන ක්‍ෂණික සමාධිය නම් වූ දෙයක් ගැන නොවේ. පඤ්ච නීවරණ යටපත් කොට සමාධිය තම අභිමතය පරිදි පවත්වා ගෙන යාමේ හැකියාව ය. එය ගැඹුරට දියුණු කළ හැකිය. එය හඳුන්වන්නේ ධ්‍යාන නමින් ය. පළවෙනි, දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි ධ්‍යාන සම්මා සමාධියට අයත් වේ.

ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගය පරිපූර්ණ වශයෙන් ප්‍රගුණ කර ගැනීම පිණිස වැඩ පිළිවෙළ ආරම්භ කරන්නේ සීල, සමාධි, ප්‍රඥා තුළ ය. සීල, සමාධි, ප්‍රඥා දියුණු වූ පසු සිත විමුක්තියට පත් වේ. විමුක්තිය පිණිස සමාධියත් ප්‍රඥාවත් බලවත්ව උපකාර වේ. දුකින් නිදහස් වී විමුක්තියට පත් වූ තැනැත්තා හට ඒ පිළිබඳ ඉතාම පැහැදිලි අවබෝධ ඥාණයක් පවතී. එය විමුක්ති ඥාණ දර්ශනය යි. සීල – සමාධි – ප්‍රඥා – විමුක්ති – විමුක්ති ඥාණ දර්ශන වශයෙන් සද්ධර්මය තුළ මෙය මනා පිළිවෙළකින් හඳුන්වා තිබේ.

ආර්ය අෂ්ටාංගික මාර්ගය ප්‍රගුණ කොට විජ්ජා විමුක්ති සාක්‍ෂාත් කිරීම සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ අසමසම ජයග්‍රහණයකි! ඉන්පසු තමන්වහන්සේ "සම්මා සම්බුද්ධත්වයට" පත් වූ කෙනෙක් වශයෙන් සමස්ත ලෝකය හමුවේ හෙළි දරව් කර සිටියහ. මේ විජයග්‍රහණය ආගමික ඉතිහාසයේ පමණක් නොව සමස්ත මානව ඉතිහාසයේ ම යහපත පිණිස සිදු වූ එකම එක ආශ්චර්යවත් සිදුවීම ය. ලෝකයේ තිබෙන සියලුම යහපත් දේ උන්වහන්සේ තුළ ඒකරාශී වී තිබුනි, අන්තිමේ දී එය බුද්ධිමය විප්ලවයක උත්තරීතර ඵලය බවට පත් විය.

sinhalaebooks.com



## ඔව්! එය බුද්ධ රාජ්‍යයකි!

එය අවිද්‍යාන්ධකාරය වනසා දැමූ ආලෝකවත් රාජ්‍යයකි. එය බුද්ධ රාජ්‍යය යි. බුද්ධ රාජ්‍යයේ සුවිසල් ප්‍රාකාරය ශීලයෙන් නිර්මිත ය. එහි මාළිගා සමාධියෙන් නිර්මිත ය. එහි ප්‍රඥාවෙන් කළ කොත් පළඳවා තිබේ. ඒවායින් නිරතුරු විහිදෙන්නේ ධර්ම විමුක්ති රශ්මිය යි. එම රාජ්‍යයේ අනුත්තර වූ ධර්මරාජයාණෝ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ය. ඒ අසිරිමත් බුද්ධ රාජ්‍යයේ සදහම් සෙන්පතිවරයෙක් ද සිටී. ඒ වනාහී උන්වහන්සේ ගේ ප්‍රධානතම ශ්‍රාවකයාණෝ වන සැරියුත් තෙරණුවෝ ය.

## උත්තරීතර නායකත්වය මෙයයි!

ඒ ධර්ම රාජයාණන් විසින් පවත්වන ආඥා චක්‍රය ධර්මයෙන් නිර්මිත ය. එනම් ධර්මචක්‍රයයි. ඒ බුද්ධ රාජ්‍ය තුළ අසහාය නායකයාණන් ලෙස හතලිස් පස් වසරක් පුරා උන්වහන්සේ වැඩ සිටියහ.

උන්වහන්සේ පිරිනිවන් පෑමට පෙර තමන්වහන්සේ විසින් මෙසා දීර්ඝ කාලයක් මුළුල්ලේ දේශනා කරන ලද පණවන ලද ධර්ම - විනය බුද්ධ රාජ්‍යයේ නායකත්වයට පත් කළ සේක. අප ගේ ආධ්‍යාත්මික රජාණන් ද උන්වහන්සේ ය. එනිසා අපි ද උන්වහන්සේව “භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ” යයි ආදරයෙන් හඳුන්වමු. උන්වහන්සේ එදා බුද්ධ රාජ්‍යයේ නායකත්වයට පත් කළ ඒ ධර්ම - විනය අදත් ඉතාම නිර්මලව පවතී. ඒ ධර්ම - විනය මනා කොට හඳුනාගෙන ශීල, සමාධි, ප්‍රඥා තුළින්ආර්ය අෂ්ටාංගික මාර්ගය ප්‍රගුණ කරගන්නා භාග්‍යවන්තයින් හට අදත් උන්වහන්සේ ගේ අසිරිමත් ධර්ම ශරීරය ජීවමානව දැක්ක හැකි ය.

එය වනාහී කෙලෙස්වලින් කිළිටි වී ගිය අහංකාර නායකත්වයක් නොවේ. එය වනාහී නිකෙලෙස් වූ පරම පිවිතුරු වූ නිරහංකාරී නායකත්වයකි. ජීවිතය සුවපත් කරවන ලොව්තුරු නායකත්වයකි. ලෝකයේ ඉතාම පූජනීය නිර්මල නායකත්වයක්

sinhalaebooks.com



තිබෙන්නේ බෞද්ධයන්ට පමණි. පුද්ගලවාදයෙන් දූෂණය නොවූ නායකත්වයක් තිබෙන්නේ ද බෞද්ධයන්ට පමණි!

## ලොවේ සිල්වත් මුනිඳා!

ශ්‍රමණ ජීවිතයකට පත් වූ සිද්ධාර්ථ ගෞතම බුදුරජුන් ගේ ආධ්‍යාත්මික ගමන් මග ක්‍රම ක්‍රමයෙන් පිළිවෙලකට සකස් වූ දෙයකි. උන්වහන්සේ තම ශ්‍රමණ ජීවිතය මෙතරම් ශ්‍රේෂ්ඨත්වයට පත් කරගත්තේ තමන් වහන්සේ ගේ ප්‍රඥා මහිමය නිසා ම ය. සම්මා සම්බුද්ධත්වය දක්වා ම තම ප්‍රඥාව තීක්ෂණ ලෙස හසුරුවා ගත් මේ උදාර මනුෂ්‍ය රත්නය පාලනය කරගත්තේ තමන් ගේ සිත පමණක් නොවේ. දක්ෂ රියැදුරෙක් වාහනයක් මනාකොට හසුරවන්නාක් මෙන් තමන් ගේ සියලු ඉන්ද්‍රියන් ක්‍රමානුකූල පාලනයකට පත් කරගත්තේ ය. තමන් ගේ කය හා වචනය හසුරුවා ඇති ආකාරය පුදුම සහගත ය.

## අසිරිමත් ය ඒ වදන්!

කියන්නන් වාලේ වචන කථා කිරිමේ සිරිතක් උන්වහන්සේට නො තිබුණේය. ජනතාව හිනා ගැන්වීම පිණිස විහිළු කථා කිරීමේ සිරිත උන්වහන්සේ ගේ වචන තුළ නැත. නිෂ්ප්‍රයෝජන බොළඳ කතා බස්වලට උන්වහන්සේ කැමති නැත. උන්වහන්සේ ගේ වචනවල එකම එක අසත්‍ය වචනයක් වත් මිශ්‍ර වී නැත. කේළාම් කීමට භාවිතා කරන වචන එහි දක්නට නැත. අසභ්‍ය වචන හෝ පරුෂ වචන උන්වහන්සේ ගේ භාෂාවට අයිති නැත. එසේ නම් ඒ වචන තුළ තිබෙන්නේ කුමක් ද?

උන්වහන්සේ මුවින් පිට කළ සෑම වචනයක ම තිබෙන්නේ සදාකාලික සත්‍යයකි. අකාලික ධර්මයකි. දෙවියන් බඹුන් මරුන් සහිත ලෝකයේ ශ්‍රමණ - බ්‍රාහ්මණයන් ගෙන් යුතු දෙව් මිනිස් ප්‍රජාව තුළ ඒ වචන අවලංගු කළ හැකි කිසිවෙක් නැත. මේ ලෝකයේ ඕනෑම ආගමකට අයිති හෝ වේවා, ඕනෑම ජාතියකට අයිති හෝ වේවා, ඕනෑම කුලයකට අයිති හෝ වේවා, ඕනෑම කෙනෙකුට සදාකාලික

sinhalaebooks.com



සත්‍ය යනු කුමක් දැ'යි දැන ගැනීමට අවශ්‍ය නම් උන්වහන්සේ වදාළ වචන ඔස්සේ පමණි එය දැනගත හැක්කේ. උන්වහන්සේ ගේ මුවින් පිට වූ සෑම වචනයකම තිබෙන අම්ල නිමල වටිනාකම නිසාම අපි ඒ වචන හඳුන්වන්නේ "ශ්‍රී සද්ධර්මය" නාමයෙනි. ඒ වචන අවිද්‍යාන්ධකාරය වනසා දමා ප්‍රඥාලෝකය උදාකර දීමේ ශක්තියෙන් අනූනය. එතරම් පිවිතුරු ලෙස භාෂාව හැසිරවූ වෙන කෙනෙක් ලෝකයේ නැත. වචනය තුළ උන්වහන්සේ දක්වන ලද මේ අසාමාන්‍ය අද්විතීය කුසලතාව වචනය පිළිවඳ ව උන්වහන්සේ ගේ ශීලයයි!

## අසිරිමත් ය ඒ මගත්!

උන්වහන්සේ තම ඉරියව් පවා හසුරවා තිබෙන්නේ පුදුමාකාර ශාන්ත භාවයකිනි. මොනම හේතුවක් නිසාවත් කිසිවෙකු දෙස ඇස් ඔරවා, රවා, බැම හකුළුවා බලා නැත. සියලු දෙනා කෙරෙහි ම එක හා සමානව බලන්නට ඒ ශාන්ත දෙනුවන් වලට පුළුවනි. උන්වහන්සේ සම්බුද්ධත්වයට පත් වූ දිනයේ දී චිත්තාභ්‍යන්තරයේ සැඟවී තමාටත් හොරෙන් මතුවන සියලු කෙලෙස් ඒ බෝධි මූලයේදී සදහට ම නිමාවට පත් විය. එනිසා ම රසවත් ආහාරපාන සොයමින් උන්වහන්සේ හැසිරුනේ නැත. ලද ආහාරයකින් සතුටු වීමට උන්වහන්සේට පුළුවනි. ආහාරපාන වෙනුවෙන් අල්ප මාත්‍ර හෝ කිලුටක් ඇති කර ගැනීමට උන්වහන්සේ කැමති වූයේ නැත.

වරක් හිමිදිරි උදෑසන අවදි වූ බුදුරජාණන් වහන්සේ මහාකරුණා සමාපත්තියෙන් යුතුව ලොව බැලූ සේක. එදින ධර්මාවබෝධ කරගැනීමේ භාග්‍යවන්තයාව උන්වහන්සේට දැක ගන්නට ලැබුනි. ඔහු ගේ නම කසීභාරද්වාජ ය. අද දවසේ තම ජීවිතයේ පරම සත්‍යය අවබෝධ කරගන්නා මගට බසින්නේ යයි කසීභාරද්වාජ සිහිනෙන්වත් සිතුවේ නැත. තමන් ගේ විශාල වෙල්යාය අස්වද්දන්නට ය හේ කල්පනා කරමින් සිටියේ. එදින දහවල් ආහාර ගන්නා වේලාවේ දී තමන් කුඹුරු අස්වද්දන තැනට ශ්‍රමණයන් වහන්සේ නමක් පිඩු සිඟා වැඩියහ. තමන් වෙතට පිඩු සිඟා පැමිණි මේ ශ්‍රමණයාට හරි හම්බකරගෙන අනුභව කළ යුතු ආකාරය කියා දිය යුතු

sinhalaebooks.com



යැයි සිතූ කසී භාරද්වාජයන් බුදුරජාණන් වහන්සේට අවවාද කරන්නට පටන් ගති. උන්වහන්සේ ගේ පිළිතුරුවලින් ඒ අවවාදය ධර්ම කථාවක් බවට පත් විය. එයට පැහැදුනු කසීභාරද්වාජ තෙමේ කිරිබත් බඳුනක් ගෙන උන්වහන්සේ ගේ පාත්‍රයට බෙදන්නට සූදානම් විය. එහෙත් ආහාරයේ තෘෂ්ණාව ප්‍රහීණ කළ, කුසගින්න පාලනය කොට සිටි බුදුරජුන් ගේ සිරිත අනුන් පහදවා ගෙන බොජුන් ලැබීම නොවේ. කසීභාරද්වාජයනට උන්වහන්සේ අපූරු දෙයකි වදාළේ. “පින්වත, දහම් කවි පවසා ලත් බොජුන් වැළඳීම අප ගේ සිරිත නොවේ. මෙය බුදුවරුන් ගේ ස්වභාවයක් බව දැන ගන්න” යි වදාළ උන්වහන්සේ එදින පුරාම සතුටින් වැඩ සිටියේ නිරාහාරව ය. උන්වහන්සේ ගේ උත්සාහය සාර්ථක විය. කසීභාරද්වාජ ගොවිතැන අත්හැරියේ ය. හේ බුදු රජුන් ගේ ශ්‍රාවක ශ්‍රමණයෙක් බවට පත්විය. ඔහු ද ඉතා සුළු කලකදී අරහත්වයට පත්විය!

## අසිරිමත් ය ඒ කයත්!

උන්වහන්සේ ගත කළේ පරම පිවිතුරු බ්‍රහ්මචාරී ජීවිතයකි. ඒ උදාර පාරිශුද්ධ ජීවිතය පිළිබඳ සලකුණු තම සිරිපතුල් යට පවා සටහන් වී තිබින. තමන් වහන්සේ විසින් නිර්මාණය කරණ ලද බුද්ධ රාජ්‍යය පරම පිරිසිදු සීලවන්තයින් ගේ රාජ්‍යයකි. එහි පරිපූර්ණ ආධ්‍යාත්ම ශාන්තිය ලබාගත හැක්කේ පාරිශුද්ධ ජීවියක් තුළින් පමණි. සල්ලාල ජීවිතයකට උන්වහන්සේ ගේ රාජ්‍යයේ ඉඩක් නැත. නොමගට වැටුන කෙනෙකුට යළි සුමගට පැමිණීමෙන් පමණි එහි දියුණුවක් ලබාගත හැක්කේ. පාරිශුද්ධ වූ ශ්‍රමණ ජීවිතයකට ප්‍රතිඥා දුන් තම ශ්‍රාවකයින් යම් හෙයකින් තමන් ගේ උතුම් බඹසර කෙළෙසා ගත්තොත් ඒ සැණින් උන්වහන්සේ ගේ රාජ්‍යය තුළ ඔහුට ඇති හිමිකම අහිමි වෙයි. සාමාජිකත්වය අහෝසි වෙයි. ඔවුන්ට යළිත් බුද්ධ රාජ්‍යයට ඇතුළු වීමට අවසර ඇත්තේ බඹසර සුරකින ශ්‍රාවකයෙකු ඉදිරියේ යළිත් බඹසර ජීවිතයකට ප්‍රතිඥා කොට තමන් ගේ අලුත් වීම පිණිස ඒ පිරිසිදු ශ්‍රාවකයා ගෙන් ශ්‍රමණ භාවය ලබා ගැනීම තුළින් පමණි. දුශ්චරිතවලින් ගහණ දේශපාලන චරිත රඟපෑමට බුද්ධ රාජ්‍ය

sinhalaebooks.com



තුළ අවසර නැත.

## උතුරා යන සෙනෙහස!

කුරා කුහුඹියෙකුට වත් උන්වහන්සේ ගේ ජීවිතයෙන් හිංසාවක් ලැබී නැත. මොන ම ආකාරයේ හෝ හිංසාවක් උන්වහන්සේ අනුමත නොකරති. විශේෂයෙන් ම මනුෂ්‍ය වර්ගයා කෙරෙහි උන්වහන්සේ තුළ වූයේ අසාමාන්‍ය ගෞරවයකි. මනුෂ්‍යයන් ජාති වශයෙන් කුල වශයෙන් ගෝත්‍ර වශයෙන් භාෂා වශයෙන් බෙදී සිටීම ගැන උන්වහන්සේ දැඩි ලෙස විරුද්ධ වූ හ. මනුෂ්‍යයා තවත් මනුෂ්‍යයෙකුට සෙනෙහෙවන්ත විය යුතු බව උන්වහන්සේ එකහෙළාම කියා සිටියහ. මනුෂ්‍ය ජීවිතයට මොන යම් හෝ හානියක් සිදුවීම උන්වහන්සේ අනුමත නො කළහ. තමන් වහන්සේ ගේ රාජ්‍යය තුළ උපසම්පදා ශ්‍රමණ භාවය ලබාගත් ශ්‍රාවකයෙක් යම් හෙයකින් මිනිස් මව්කුසක කලල බීජයක් හෝ විනාශ කරන්නට චේතනාත්මක ව යන්තමින් හෝ අනුබලයක් දුනහොත්, ඒ අනුබලයෙන් ඒ මනුෂ්‍ය ජීවිතය විනාශ වුවහොත් ඒ සැණින් ම බුද්ධ රාජ්‍ය තුළ ඔහු ගේ සාමාජිකත්වය අහෝසි වී යයි.

## සැමට රැකවරණ!

අනුන් සතු දෙයක් සොරකම් කිරීම උන්වහන්සේ පිළිකුල් කළ දෙයකි. සොර සිතින් තොරව ජීවත්වීමට ය උන්වහන්සේ තම ශ්‍රාවකයන් හික්මවූයේ. තමන් ගේ දෑතට පිළි නොගැන්නූ දෙයක් නොවළඳන්නැ'යි උන්වහන්සේ නීතියක් ද පැණවූහ. මනුෂ්‍යයන් සතු දේපළ අරණ්‍යයේ හෝ වේවා ගමේ හෝ වේවා ඒවා ඔවුන් සතු වී තිබිය යුතු ය. තමන්ට නුදුන් කිසිවක් කිසි විටකත් නොගත යුතු ය. යම් හෙයකින් තම ශ්‍රාවක ශ්‍රමණයන් වහන්සේ නමක් චේතනාත්මකව සොරකමක් කළහොත් ඒ සැණින් ඔහුට ඇති ශාසනික හිමිකම අහෝසි වෙයි. ශ්‍රමණභාවය නැති වී යයි.

sinhalaebooks.com



## බොරුවට ඉඩ නැත!

එමෙන් ම හොර සිල් පෙන්වීම උන්වහන්සේ දැඩි ලෙස පිළිකුල් කළ, හෙළා දුටු දෙයකි. මනුෂ්‍යයන්ගේ ගෞරවයත් ලාභ සත්කාරත් කීර්ති ප්‍රශංසාත් අපේක්ෂාවෙන් මාර්ග ඵල ලාභී කෙනෙක් වශයෙන්, ධ්‍යාන අභිඥා ලාභී කෙනෙක් වශයෙන් බොරුවට ඇඟවීම අධම සොරකමක් යැයි උන්වහන්සේ නින්දා කළහ. එය නින්දනීය අපරාධයක් වශයෙන් හෙළා දුටහ. යම් ශ්‍රාවක ශ්‍රමණයන් වහන්සේ නමක් තමා තුළ නොමැති ඒ මාර්ග ඵල, ධ්‍යාන, අභිඥා ආදිය තිබෙන ආකාරයට රඟපාන්නේ වේ ද කටින් පවසන්නේ වේ ද ඒ සැණින් ඔහු ගේ ශ්‍රමණභාවය අවලංගු වී යයි.

බුදුරජාණන් වහන්සේ ශීලය වශයෙන් තෝරා ගත්තේ මොන තරම් පිවිතුරු ජීවිතයක් දැ'යි මේ තුළින් අපට සිතාගත හැකි ය.

## සිහිමුළාවක් නොමැත!

එමෙන් ම සුරා පානය උන්වහන්සේ පිළිකුල් කළ දෙයකි. තමන් වහන්සේව සරණ යන ගිහි ශ්‍රාවකයින් ගෙන් උන්වහන්සේ අපේක්ෂා කරන ලද්දේ සුරාපානය නො කරන පිරිසකි. මොන ම හේතුවක් නිසාවත් සුරාව විකිණීම, අනුන්ට සුරා පානය කරවීම නොකරන්නැ'යි උන්වහන්සේ ඉල්ලා සිටියහ. සුරාපානය තුළින් මනුෂ්‍ය ජීවිතවලට වන බරපතල හානිය උන්වහන්සේ ඉතා හොඳින් දනිති. මිනිසුන් කෙරෙහි ඇති පිරිසිදු සෙනෙහෙවන්ත භාවය නිසාම ය උන්වහන්සේ සුරා පානයට මෙතරම් විරුද්ධ වූයේ.

## වෙහෙස මහන්සි වෙන්න! වැරදි දේ දුරලන්න!

ජීවත් වීම පිණිස කවුරුත් යම් කිසි වෙහෙසක් දැරිය යුතු ය. එහෙත් සමහරු වංචා මගින් ප්‍රයෝග මගින් හිංසා වැඩ කටයුතු වලින් යමක් හරි හම්බ කර ගැනීමට පෙළෙඹෙති. බුදුරජාණන් වහන්සේ වදාළේ එය කිසිසේත් නො කළ යුතු බවයි. භයානක අවි ආයුධ වෙළඳාම් කිරීම කිසිසේත් නොකළ යුතු යයි උන්වහන්සේ එක හෙළා

sinhalaebooks.com



කියා සිටියහ. අවි ජාවාරමේ හානිය මොනතරම් අමානුෂික ද, මොනතරම් හානිකර ද, මොනතරම් වේදනාකාරී දැ'යි ඉතිහාසයේ කවරදාටත් වඩා පීඩාකාරී ලෙස දැන් අපි දනිමු. අවි ආයුධ ගණුදෙනුව මිනිසුන් අතරේ නොතිබිය යුතු යයි උන්වහන්සේ වදාළේ මක් නිසා දැ'යි වෙනදාටත් වඩා හොඳින් අප තේරුම් ගත යුතු ය.

මාරාන්තික වස විෂ වෙළඳාම තෙරුවන් සරණ ගිය ශ්‍රාවක පිරිස නො කළ යුතු යයි උන්වහන්සේ පැවසූහ. ගොවිතැන් පිණිස කවරදාවත් බෞද්ධ සමාජය වස විෂ භාවිතා නොකළේ ය. කුඹුරු යායේ කෘමීන් එළවා දැම්මේ පිරිත් පැන් ඉසීමෙනි. එය සත්ව ඝාතනයට අකැමැති ලාංකික බෞද්ධයන් ගේ අහිංසක පිළිවෙතකි. එහෙත් දැන් අස්වැන්න ලබා ගැනීම පිණිස වස විෂ භාවිතා කරති. සියලුම කුඹුරු ගොවිතැනටත් එළවළු පළතුරු වගාවටත් වස විෂ යොදති. කුඩා මාළුන්, කෘමීන්, ගෙම්බන්, පණුවන් වැනි සතුන් ගේ ජීවිතවලින් වන්දි ගෙවිය යුතු ගොවිතැනක් අපට දැන් උරුම වී තිබෙන්නේ වස විෂ වෙළඳාමට අප හසු වූ නිසා නොවේ ද?

එමෙන් ම මස් පිණිස සතුන් ඇති කිරීම නො කළ යුතු දෙයකි. මස් පිණිස සතුන් වෙළඳාම් කිරීම නොකළ යුතු දෙයකි. සත්ව ඝාතනය උන්වහන්සේ කිසිසේත් අනුමත නො කළේය. තිරිසන් ලෝකය කෙරෙහි ද කරුණාව දැක්විය යුතු යයි උන්වහන්සේ පවසා සිටියහ.

එමෙන් ම වහල් වෙළඳාම උන්වහන්සේ පිළිකුල් කළ දෙයකි. මනුෂ්‍යාත්වයට නිගා දෙන වහල් වෙළඳාම කිසිසේත් නො කළ යුතු යයි උන්වහන්සේ කියා සිටියහ. බෞද්ධ සමාජය තුළ කිසිදාක වහල් වෙළඳාම තිබී නැත. එහෙත් බටහිර ඊනියා දියුණු රටවල මෑතක් වෙනතුරුම වහල් වෙළඳාම ජයට කෙරුනි. ඉතාම සුළු මුදලකට මිනිසුන් විකිණීමේ අමානුෂික ජාවාරම ලෝකයේ තවමත් පවතින්නේ මනුෂ්‍යාත්වයේ අගය කතා නොකරන නිසාම ය.

එමෙන්ම අල්ලස් ගැනීම, හොර ගණුදෙනු කිරීම, සාධාරණ මිළ ඉක්මවා වැඩි මිළට බඩු විකිණීම, තරාදියෙන්, මිම්මෙන් වංචා කිරීම උන්වහන්සේ කිසිසේත් අනුමත නොකළහ.

sinhalaebooks.com



## උත්සාහය සාර්ථකයි!

දූවිලි පිරී ගිය මං මාවත් ඔස්සේ ඇවිද යමින්, වැස්සෙන් පින්නෙන් වන පීඩා ඉවසමින්, සීතල, උණුසුම ගැන නොසලකමින් මිනිසුන් කරා වැඩිය භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මහත් වෙහෙසක් දැරුවේ මනුෂයත්වය අගයන සාධාරණ සමාජයක් බිහිකිරීමට ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ සමාජය ඉතා ම සශ්‍රීකව පැවැති කාලවල මනුෂ්‍යයාටත් තිරිසන් සතුන්ටත් මහත් සැපයක් ඇති විය. ස්වභාව ධර්මයට අයත් ගහ කොළ ඇල දොල වැව් පොකුණු මනාව ආරක්ෂා වුනි. ජීවිත තුළ සහනය පිරී පැවතුනි.

එහෙත් මනුෂ්‍යත්වයේ අගය නුදුටු බටහිර සමාජය ඇති කළා යයි පවසන මේ සියක් වසරක ඊනියා දියුණුව හමුවේ සියලු ම මනුෂ්‍ය වර්ගයා මිහිතලයෙන් වඳ වී යන තරමේ භයානක අවි ආයුධ නිර්මාණය වී ඇත. හුස්ම ගන්නා වාතය පවා විවිධාකාර විෂ දුමාරයන් ගෙන් දූෂණය වී ඇත. රසායනික වස විෂ ගොවිතැනට භාවිතා කිරීම නිසා පෘථිවි රසය අතුරුදහන් වෙමින් පවතී. ගස් කොළන් ඇල දොළ වැව් පොකුණු බලවත් විකෘතීන්ට භාජනය වෙමින් පවතී. පරම පාරිශුද්ධ සිල්වත් මුනිවරයෙකු ගේ ධර්මය නො ලද සමාජයේ ඉරණම කුමක් වේ ද?

එහෙත් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගේ සිල්වත් ජීවිතයේ සෙවන ලද සමාජයට මේ මිහිතලය මත බොහෝ කලක් සුවසේ ජීවත්වීමේ භාග්‍යය ලැබෙනු ඇත. කොතරම් අපක්ෂපාතීව විමසා බැලුව ද මෙතරම් සිල්වත් මනුෂ්‍ය රත්නයක් මෙතරම් සිල්වත් ජීවිතයක් මේ දෙව් මිනිස් ලෝකයේ කිසි ලෙසකිනුත් සොයා ගත නොහැකි ය. ඒකාන්තයෙන් ම අපගේ ශාස්තෘ වූ ඒ භාග්‍යවත් බුදුජාණන් වහන්සේ පමණ නො කළ හැකි පිවිතුරු ශීලයෙකින් සමන්විත වන සේක!

sinhalaebooks.com



## නොසැලෙන සිත් ඇති මුනිවරයාණෙනි!

බැලූ බැල්මට මේ සිත නම් දමනය කළ හැකි දෙයක් ලෙස නො පෙනේ. එනිසාම සියලු දෙනාම පාහේ සිතට වසඟ වෙති. සිතේ නැඟෙන නොයෙකුත් හැඟීම් ඉදිරියේ රූකඩ බවට පත් වෙති. සිතේ මායාවට මුළා වෙති.

එහෙත් හුදෙකලා ජීවිතයක් ගෙවමින් ශ්‍රමණයන් වහන්සේ නමක් බවට පත් වූ භාග්‍යවතුන් වහන්සේ සිතේ මායාවට නො කැමති කෙනෙකි. හේ දවසේ වැඩි කාලයක් මානසික අභ්‍යාසයන් පුරුදු කළේ ය. දෛනික ජීවිතයේ අංගයක් වශයෙන් භාවනාව යොදා ගෙන තිබුනි.

එකම වැඩ පිළිවෙලකට සිත යොමු කොට ඒ කෙරෙහිම සිත රඳවා ගන්නට උන්වහන්සේ සමත් වූහ. ඒ වැඩ පිළිවෙල සිතේ ශාන්තිය ඇති කරවන, ජීවිතාවබෝධයට උපකාරී වන දෙයක් විය යුතු ය.

කෙනකුට ලාමක අකුසල ධර්මයන් ගැන ද සිත යොමු කොට ඒ කෙරෙහිම සිහිය රඳවා ගෙන සිටිය හැකි ය. එතැන තිබෙන්නේ අයහපත පිණිස යෙදවූ සිහියත්, මුළා වූ චිත්තේග්‍රතාවත් ය. එය හඳුන්වන්නේ මිච්ඡා සති, මිච්ඡා සමාධි වශයෙනි. ඒ තුළින් කිසිදා සැනසීමක් ඇති කර ගත නොහැකි ය. අසහනය ම ය වර්ධනය වන්නේ. එය දහම් මග නොවේ.

## සිතේ කොඩිවිනය බැහැර කරයි!

සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ සිත හැසිරවූයේ ඉතා හොඳ නුවණක් ද භාවිතා කරමිනි. චිත්ත දමනයටත්, සංසිඳීමටත්, ශාන්ත භාවයටත් වින කරන මානසික දුබලතා උන්වහන්සේ විසින් පළමුවෙන් ම හඳුනා ගන්නා ලදී. ඉතාමත් ක්‍රමානුකූල අභ්‍යාස මගින් ඒ මානසික දියුණුවට බාධා පමුණුවන කරුණු ඉවත් කර දැමීමයි ඊ ළඟට කළ යුත්තේ. මහා ප්‍රඥාවන්ත වූ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ භාවනාවේ දියුණුව අවුරාළන ප්‍රධාන කරුණු පහක් පවතින බව සොයා ගෙන පෙන්වා දුන්හ. උන්වහන්සේ ඒවා හඳුන්වා දුන්නේ

sinhalaebooks.com



නීවරණ යන නාමයෙනි. බලවත් උත්සාහයෙන් සිහිය පිහිටුවා ගැනීමේ හැකියාව ඇති කෙනෙකුට මේ නීවරණ පස බැහැර කොට චිත්තේකාග්‍රතාව හෙවත් සමාධිය උපදවා ගත හැකි ය. විශේෂයෙන් ම සිතේ සංසිඳීමට බාධා පමුණුවන ඒ කරුණු පහ අප කවුරුත් දැන සිටිය යුතු ය.

## මෙන්න ඒ කොඩිවිනය!

I. තමන් ගේ සිත බැඳී ගිය රූප – ශබ්ද – ගන්ධ – රස – පහස යන අරමුණු යළි යළිත් සිහිපත් වෙන ස්වභාවයක් සිතේ පවතී. එලෙසට සිතට එන කාම අරමූණු ගැන සිත සිතා සිටීමේ කැමැත්තක් ඕනෑම සිතක පවතී. එසේ සිතේ පවතින කැමැත්තට ඉඩ දුන් විට භාවනා අරමුණක සිත රඳවා ගත නොහැකි ය. එවිට කාම අරමුණු ගැන සිතේ ඇති කැමැත්ත නීවරණයක් වශයෙන් භාවනාවට බලපායි. එය කාමච්ඡන්ද නීවරණය නම් වේ.

II. තමන් ගේ සිතේ තරහක්, අමනාපයක්, ගැටීමක් ඇති කරවන රූප, ශබ්ද, ගන්ධ, රස, පහස යන අරමුණු යළි යළිත් සිහිපත් වීම පවා වධයකි. එවිට සිත ඒ අරමුණු සමඟ ගැටේ. ඒ තරහට ම සිත ඇදී ගිය විට භාවනාවක් කර ගැනීම පිණිස සිත සකස් නොවේ. භාවනා කරන්නට ගිය ද සිතේ ද්වේෂය මතු වේ. භාවනාව කඩාකප්පල් වේ. එවිට භාවනාවට වින කරන්නේ සිතේ හටගත් ඒ තරහ මිස වෙන දෙයක් නොවේ. ඒ නිසා එය හඳුන්වන්නේ ව්‍යාපාද නීවරණය වශයෙනි.

III. බාහිර අරමුණු ඔස්සේ නොයෙක් වැඩපළවලට හැසිර වූ ජීවිතයක් භාවනාවකට නැඹුරු කරගැනීම කොතරම් අසීරු දැ'යි දන්නේ භාවනා කරන්නට පටන් ගත් විට ය. හිනාවෙන්, කථාවෙන්, කල්ගෙවන විට කිසි නිදිමතක්, කිසි කම්මැලිකමක් නැත. එහෙත් භාවනාවක් කරන්නට දෑස පියාගත් නොබෝ වේලාවකින් නිදිමත ඇති වේ. කම්මැලිකම

sinhalaebooks.com



ඇති වේ. වෙන වැඩක් කරන්නට සිතේ. එවිට උත්සාහය, වීරිය, සිහිය පවත්වා ගැනීම අසීරු වේ. කායිකව මානසිකව අලස ගතියක් ඇති වේ. සිත දමනය කරගන්නට අවශ්‍ය නම් ස්ථිර වශයෙන් ම මේ දුර්වලකම ද ජයගත යුතු යයි බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්හ. නිදිමත හා අලස බව සිතේ දියුණුවට බාධා පමුණුවන හෙයින් එය හඳුවන්නේ ථිනමිද්ධ නීවරණය නමින් ය.

IV. කෙනෙකුට ථිනමිද්ධයෙන් බාධාවක් ඇති නොවන්නට පුළුවනි. එහෙත් භාවනා කරන්නට පටන් ගත් මොහොතේ පටන් එක එක අරමුණු ඔස්සේ සිත විසිරෙන්නට පටන් ගනී. භාවනා අරමුණේ සිත එකඟ නොවීම ගැන කිසියම් පසුතැවිල්ලක් ඒ විසිරීමත් සමඟ ඇතිවෙන්නට පටන් ගනී. එවිට සිතේ කිසි සතුටක් නැත. මහත් කළකිරීමක් ඇතිවේ. එහෙත් භාවනාව නම් අත් හරින්නට නොහැකි ය. කෙසේ හෝ සමාධියක් ඇති කර ගත යුතු ය. ඒ ගැන සිතන විට තව තවත් හිතට වේදනාවක් දැනේ. සිතේ සැපයක් නො දැනේ. එවිට සිදුවන්නේ යළි යළිත් සිත විසිර යාම පමණි. එවැනි තත්වයක් ඇති වූ විට එය හඳුන්වන්නේ උද්ධච්ච කුක්කුච්ච නීවරණය වශයෙනි.

මේ තත්වයෙන් සිත නිදහස් කර ගැනීමට නම් ඉවසීමත්, උපේක්ෂාවත් පුරුදු පුහුණු කළ යුතු ම ය. කිසිවකට පසුබට නොවී කවදා නමුත් සමාධිය ඇති වන තුරු උත්සාහය දිගට ම පවත්වා ගැනීමට අධිෂ්ඨානයකින් කටයුතු කළ යුතු ය. එවිට උද්දච්ච කුක්කුච්චය පරදවා සිත සමාධිගත කර ගත හැකි අවස්ථාවක් උදාවෙනු ඇත.

V. සිතේ විසිරීම පවතින විට, සමාධිය නොපවතින විට සිත එකලස් කරගෙන තම භාවනාව කරගත නොහැකි වේ. එවිට හේ තමා ගේ දුර්වලකම හඳුනා නොගත්තොත් භාවනාව ගැන සැක ඇති වේ. ඉන්පස් එක දිගට එකම භාවනාවක් විශ්වාසයකින් ප්‍රගුණ කළ නොහැකි තත්වයක් උදා වේ. මෙය

sinhalaebooks.com



භාවනාවට ඇති වන බාධාවකි. මෙය සද්ධර්මයේ හඳුන්වන්නේ විචිකිච්ඡා නීවරණය වශයෙනි.

විචිකිච්ඡාවෙන් නිදහස් වීමට පහසු දෙයක් තිබේ. ඒ සඳහා කළ යුත්තේ මනා කොට ශ්‍රී සද්ධර්මය ඉගෙන ගනිමින් ධර්මය ගැන ශ්‍රද්ධාව උපදවා ගැනීමයි. ධර්මයේ සැක රහිතභාවය ඇති කරගත් විට ක්‍රම ක්‍රමයෙන් භාවනාව දියුණු කරගත හැකි ය.

සමාධියට මෙන් ම සත්‍යාවබෝධයට ද මේවායින් හානි පැමිණෙන නිසා මේ පංච නීවරණ දුරින් ම දුරු කළ යුතු යයි බුදුරජාණන් වහන්සේ පවසා සිටියහ.

බාහිර කිසිම කෙනෙකු ගේ උපකාරයෙකින් තොරව ප්‍රඥාව දුර්වල කරන මේ නීවරණ ධර්මයන් සිතේ පවතින බවත් ඒවා දුරු කළ යුතු බවත් උන්වහන්සේට පැවසිය හැකි වූයේ මේ ගැන හොඳින් දැන ගත් නිසා ම ය. මේවා දුරු කොට සමාධිය උපදවා ගත් නිසා ම ය.

## සමාහිත සිත!

සමාධිය ඇති කර ගැනීම උන්වහන්සේට සුළු දෙයකි. බලවත් සිහියත්, වීර්යයත්, නුවණින් සිහිය හැසිරවීමේ හැකියාවත් උන්වහන්සේ තුළ තිබූන නිසා තම සිත නිමේෂයකින් සමාධිගත කර ගත හැකි ය. සුළඟ නැති තැනක නොසෙල්වී දිලෙන පහන් සිලක් සේ සිත එකඟ කොට තබා ගත හැකි ය.

ශ්‍රී සද්ධර්මයේ සඳහන් සියලු භාවනා ක්‍රම සොයා ගත්තේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් ම ය. එම කාලයේ හෝ ඒ කාලයට පෙර හෝ ලියැවුන වෙනත් කිසිම වේද ග්‍රන්ථයක, උපනිෂද් ග්‍රන්ථයක හෝ එම භාවනා ක්‍රම දක්නට නැත. පසු කාලීන ග්‍රන්ථ වන, පුරාණ නමින් හඳුන්වන ග්‍රන්ථවලත්, මහාභාරතයේත්, රාමායණයේත්, භගවත් ගීතාවේත් දක්නට ලැබෙන්නේ ශ්‍රී සද්ධර්මයන් සොරා ගත් ධර්මපාඨ මිස එම ගන්ථ ලියූ ලේඛකයින්

sinhalaebooks.com



අවබෝධ කරගත් දේවල් නොවේ.

විස්මිත අවබෝධය නම් වූ මෙම ග්‍රන්ථයේ කර්තෘ ස්වාමින් වහන්සේ ඉන්දියාවේ සිටිය දී තමන් ගේ මිතුරෙක්ව මුණගැසෙන්නට නිගණ්ඨනාථපුත්‍රගේ ශ්‍රාවකයකු ගේ ආශ්‍රමයකට ගියේ ය. නිරුවත් තවුසකු වන ඒ නිගණ්ඨ ශ්‍රාවකයා ගෙන් ජෛන ධර්මය දැන ගැනීමට තමා කැමැති නිසා ඒ ගැන කිසිවක් කියන්නැ'යි හේ ඉල්ලා සිටියේ ය. එවිට ඒ නිගණ්ඨ ශ්‍රාවකයා චතුරාර්ය සත්‍ය ගැනත් ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැනත් කියන්නට පටන් ගති. ඔහු ඒවා ඉගෙන ගෙන තිබෙන්නේ නිගණ්ඨනාථපුත්‍ර අවබෝධ කළ දේවල් ලෙස ය. බොහෝ පිරිස් තම තමන් ගේ ආගම්වලට බුදුන් වදාළ ධර්මය රිංගවා ඇති ආකාරය දැක උන්වහන්සේ පුදුමයට පත් විය! එහෙත් නිගණ්ඨනාථපුත්‍ර දෙවෙනි ධ්‍යානයවත් විශ්වාස නො කළ කෙනෙකි.

## සමාධියේ ධ්‍යානය!

සිත දමනය කර ගැනීමේ අභ්‍යාස ගැන බුදුරජාණන් වහන්සේ තරම් දන්නා කෙනෙක් ලෝකයේ තවත් නැත. සිත දමනය කොට සමාධිමත් කොට ඕනෑතරම් වේලාවක් උන්වහන්සේ ට සිටිය හැකි ය. උන්වහන්සේ පිළිවෙළින් පළවෙනි, දෙවෙනි, තුන්වන, හතරවෙනි ධ්‍යානවලට සමවදිති. එමෙන් ම අරහත් ඵල සමාපත්තියට ද සමවදිති. එමෙන් ම ආශ්වාස ප්‍රශ්වාස සම්පූර්ණයෙන් ම නවතා දමා, මානසික විතර්කයන් විචාරයන් නිරුද්ධ කොට, සියලු හැඟීම් සියලු විඳීම් නිරුද්ධ කොට, නිරෝධ සමාපත්තියට සමවැදී එක දිගට සතියක් ගත කිරීම උන්වහන්සේට සුළු දෙයකි. එමෙන් ම ඒ සියලු අත්දැකීම් ඒ ආකාරයෙන් ම ඇති කර ගන්නා හැටි තම ශ්‍රාවකයින්ට කරුණාවෙන් යුතුව කියා දුන්හ.

විවිධාකාර සමාධි මට්ටම් ගැන පුදුමාකාර අවබෝධයක් උන්වහන්සේට තිබුණි. මේ කයේ සම්බන්ධතාව තිබිය දී දියුණු කළ යුතු සමාධිය උන්වහන්සේ විසින් හඳුන්වා දුන්නේ රූපාවචර ධ්‍යාන නමින් ය. එමෙන් ම තවත් ධ්‍යාන විශේෂයක් උන්වහන්සේ හඳුන්වා දුන්හ. එය අරූපාවචර ධ්‍යාන නමින් හඳුන්වනු ලැබේ. තනිකර

sinhalaebooks.com



මනෝමය සමාධි මට්ටමක් තුළය මෙය දියුණු කළ හැකි වන්නේ. නිරෝධ සමාපත්තිය උන්වහන්සේ හඳුන්වා දුන් උත්තරීතර සමවතකි. එයට සමවැදිය හැක්කේ රූප අරූප ධ්‍යාන උපදවාගත්, අරහත්වය දක්වා ප්‍රඥාව දියුණු කළ භාග්‍යවන්තයින් හට ය. එමෙන් ම අනාගාමී තත්වයට පත් වූ, රූපාරූප ධ්‍යාන උපදවා ගත් උතුමන්ට නිරෝධ සමාපත්තිය ඇති කර ගත හැකි ය.

## අති උතුම් සමාධිය!

විශේෂයෙන් ම උන්වහන්සේ හඳුන්වා දුන් තවත් සමාධියක් තිබේ. එය හඳුන්වහන්නේ අරහත් ඵල සමාධිය නමින් ය. අවිද්‍යාව දුරු කිරීමෙන්, විද්‍යාව උපදවා ගැනීමෙන්, තණ්හාව ප්‍රහීණ වීම නිසා විමුක්තියට පත්වීමෙන් ප්‍රතක්‍ෂ කර ගත හැකි වන මූලික කරුණු දෙකකි. එනම් විද්‍යාවත් විමුක්තියත් ය. එය ආනන්තරික සමාධිය වශයෙන් ද හඳුන්වා තිබේ. අරහත් ඵල සමාධිය යනු කිසිවක් නොදන්නා කිසිවක් හඳුනා ගත නොහැකි සමාධි මට්ටමක් නොවේ.

පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර යන සියලු සංස්කාරයන් සංසිඳී ගිය, කෙලෙස් සහිත සියලු කර්ම බැහැර කළ, තණ්හාව ක්‍ෂය වී ගිය, තණ්හාව ම නිරුද්ධ වී ගිය, රාගයත් ද්වේෂයත් මොහයත් ක්‍ෂය වී ගිය බව ප්‍රත්‍යක්‍ෂ කර ගත් එම අරහත් ඵල සමාධිය ශාන්ත වූ දෙයක් වශයෙන් ප්‍රණීත වූ දෙයක් වශයෙන් හඳුනා ගැනීම එහි තිබේ!

ඒ සමාධිය හා සම කිරීමට ලෝකයේ කිසිවක් නැති බව උන්වහන්සේ වදාළ සේක. සිතක දියුණු කර ගත හැකි සියලුම සමාධි තම සිත තුළ දියුණු කරගන්නට උන්වහන්සේ සමත් වූහ.

## අකම්පිත සමාධිය!

එක දිනක් “ආතුමා” නම් නගරයේ වෙල් යායක් අසබඩ පිදුරු සෙවිළි කළ කුඩා කුටියක උන්වහන්සේ වාසය කළහ. එදා අහස කළු කරමින් මහා වැසි වසින්නට පටන් ගති. උන්වහන්සේ සුපුරුදු පරිදි

sinhalaebooks.com



සිත සමාධිමත් කර ගෙන භාවනා කරන්නට පටන් ගති. ඒ සිත ගැඹුරට ම සමාධිගත වී ගියෝය. අහස ගුගුරමින් හෙණ හඬ පිපිරෙමින් මහා ධාරාණිපාත වැස්සක් වහින්නට විය. උන්වහන්සේ භාවනා කළ කුටිය අසල ම කුඹුරේ සී සාමින් සිටි සහෝදර ගොවියන් දෙදෙනෙකුට ද ඔවුන් ගේ නගුල්වල බැඳ සිටි ගවයින් සතර දෙනාට ද හෙණ වැදින. ඒ හෙණ හඬින් මුළු පළාත ම ගිගුම් දුනි. එහෙත් උන්වහන්සේ ගේ සමාධිය යාන්තමින් වත් කම්පා කරවන්නට ඒ සා මහත් හෙණ හඬට පවා නොහැකි විය. උන්වහන්සේ ඉතා ම සුවසේ සමාධිගත වී සිටියහ.

මෙතරම් බලවත් ලෙස සමාධිය දියුණු කළ, සමාධියේ විවිධාකාර මට්ටම් හෙළිදරව් කළ එකම අසහාය මුනිඳාණෝ අපගේ භගවත් බුදු සමිඳාණෝ ය!

sinhalaebooks.com



# ආශ්චර්යවත් මානසික බලය!

ජීවිත විමුක්තිය පිණිස ජීවිතයේ සියලු දේ කැප කළ මේ අසහාය මුනිරජාණන් තමා වටේ පිරිස් තර කර ගැනීමේ අසහනයෙන් පෙලුණ කෙනෙක් නොවේ. උන්වහන්සේ ගේ සිත තුළ සමාධියත් ප්‍රඥාවත් විමුක්තියත් පරිපූර්ණව තිබුන නිසා ජනතාව එකතු කර ගනිමින් සතුටුවීමේ අවශ්‍යතාවක් උන්වහන්සේට නො තිබුණි.

## දේශනා කිරීමේ ප්‍රාතිහාර්යය!

ලෝකානුකම්පාව නිසාම ය උන්වහන්සේ දහම් දෙසන්නට පටන් ගත්තේ. ඒ ධර්මය මේ ජීවිතයේදීම අවබෝධ කර ගැනීමේ හැකියාව මෙන්ම අවශ්‍යතාව ද තිබෙණ පුණ්‍යවන්තයින් පිරිසක් උන්වහන්සේට මුණ ගැසින. ඒ පිරිසට ද තමන් වහන්සේ ගත කරන ශ්‍රමණ ජීවිතය ම ඇති කරගන්නා හැටි කියා දුන්හ. උන්වහන්සේ ගේ දේශනාවනට සවන් දුන් සමහර පිරිස් සවන් දෙන අතරේ ම ඒ ධර්මය අවබෝධ කරගන්නට සමත් වූහ. එයට බොහෝ සෙයින් බලපෑවේ උන්වහන්සේ ගේ විස්මිත දේශනා කෞශල්‍යය යි. යම් කිසි ධර්ම කොටසක් දේශනා කරන්නට පළමු ඒ දෙසුම අසන්නා ගේ මානසිකත්වය සම්පූර්ණයෙන් ම අධ්‍යයනය කරති. ඒ ඒ මනුෂ්‍යයන් ගේ සිත් තුළ ජීවිතාවබෝධය පිණිස පවතින හැකියාව උන්වහන්සේ වහා අවබෝධ කර ගනිති. ඔවුන් අවබෝධ කරන්නේ මෙන්න මේ ආකාරයේ ධර්මයකි. ඔවුන් මෙන්න මේ තත්වයට මේ දේශනාව තුළින් සිත දියුණු කර ගනිති'යි උන්වහන්සේ හොඳින් දනිති. සමහර භික්ෂූන් වහන්සේලා දුර බැහැර සිට උන්වහන්සේව බැහැ දකින්ට පැමිණෙති. ඔවුන් තමන් හමුවට පැමිණි පසු ඒ වැඩ සිටින ආසනයේ දී ම අරහත්වය දක්වා හිත දියුණු කිරීමේ හැකියාව තිබේ නම් ඊට ගැළපෙන දේශනයකි උන්වහන්සේ ගෙන් අසන්නට ලැබෙන්නේ. ඒ දේශනාවේ නිමාවත් සමඟ ඔවුන් ගේ සංසාරික දුක් දොම්නස් ද නිමාවී

sinhalaebooks.com



යයි.

මේ විස්මිත හැකියාව සැබැවින් ම දේශනාව පිළිබඳ ප්‍රාතිහාර්යයකි. එනිසාම එය අනුශාසනා ප්‍රාතිහාර්ය වශයෙන් හඳුන්වනු ලැබේ. තමන් ගේ ශ්‍රාවකත්වයට පැමිණෙන ශඨකපට නොවූ මායා රහිත අවංක ශ්‍රාවකයා ගේ ආධ්‍යාත්මික දියුණුව උදෙසා මුළුමණින්ම කැපවීම උන්වහන්සේ ගේ ජීවිතය පුරා ම දක්නට ලැබේ.

## ඍද්ධි ප්‍රාතිහාර්යය!

එක්තරා අවස්ථාවක උන්වහන්සේ ගේ ප්‍රධාන ශ්‍රාවකයෙක් වන මොග්ගල්ලාන තෙරණුවෝ භාවනා පුහුණුවේ දුර්වල ව සිටියහ. හුදෙකලාව භාවනා කරමින් සිටි ඒ රාත්‍රියේ දී උන්වහන්සේට භාවනා කරගත නොහැකි විය. භාවනාවේ දී නිදි කිරා වැටෙන්නට විය. සමාධිය ඉතා ඉහළට ම දියුණු කර ගැනීමේ හැකියාව තිබුණේ මොග්ගල්ලාන තෙරුන්ට බව හඳුනා ගෙන තිබුනේ බුදුරජාණන් වහන්සේ පමණි. එදා රාත්‍රී උන්වහන්සේ තමන් ගේ දිව්‍යමය නේත්‍ර බලයෙන් මොග්ගල්ලානයන් දෙස බලද්දී නිදි කිරා වැටෙමින් සිටිනු දක්නට ලැබුනි. උන්වහන්සේ වහා ඍද්ධි බලයෙන් එතැනට වැඩම කළ සේක. පංච නීවරණ සම්පූර්ණයෙන් ම පරදවා සමාධිමත් සිත බලවත් කර ගන්නා තුරුම උපදෙස් දුන්හ. තම ශ්‍රාවකයින් ගේ ආධ්‍යාත්ම දියුණුව ගැන උන්වහන්සේ සම්පූර්ණ අවධානයෙන් ම කැප වී සිටියහ.

උන්වහන්සේ පිරිනිවන් පානා මොහොතේ පවා පූර්ණ අවධානය යොමු කොට සිටියේ ශ්‍රාවකයින් ගේ යහපත ගැන ය. ඒ අවසන් මොහොතේ ජීවිතාවබෝධය නො කළ දෙව් මිනිස් කැල ශෝකයෙන් හඬමින් සිටියදී උන්වහන්සේ අපමණ සංසිඳීමෙකින් යුතුව සැතපී සිටියහ. ඒ මොහොතේ සුභද්‍ර නම් තාපසයෙක් මහත් කලබලයෙකින් සෙනඟ පීරාගෙන උන්වහන්සේ වෙතට පැමිණෙමින් සිටියේය. මේ කලබලකාරී තාපසයා ගේ ගමන වළක්වන්නට ආනන්ද තෙරණුවෝ ඉදිරිපත් වූහ. එසේ කළේ භාග්‍යවතුන් වහන්සේට අපහසුවක් වෙති' යි සිතීමෙනි. එහෙත් ඒ වන විට බුදුරජාණන්

sinhalaebooks.com



වහන්සේ සුභද්‍රව මනාකොට හඳුනාගෙන හමාරය. උන්වහන්සේ පැවසුයේ "පින්වත් ආනන්ද, ඔය සුභද්‍රට එන්න ඉඩ දෙන්න. සුභද්‍ර පැමිණ තිබෙන්නේ හිතට එන්නන් වාලේ එන ප්‍රශ්න අසන්නට නොවේ. සැබෑවට ධර්මය දැන ගන්නටයි."

ඒ අවසන් මොහොතේ දී උන්වහන්සේ කිසිම කලබලයකින් තොරව සුභද්‍රට දහම් දෙසූහ.

## සිතට සිතින් කථාකරයි!

වරක් උන්වහන්සේ මොග්ගල්ලාන තෙරුන් සමඟ අමුතුම මාදිලියක ධර්ම සාකච්ඡාවක් පැවැත්වූහ. ඔවුනොවුන් වැඩ සිටියේ ඉතාම දුරස්ථව ය. එහෙත් ධර්ම සාකච්ඡාවට එය කිසිම බාධාවක් නොවී ය. තනිකරම චිත්ත තරංග හුවමාරු කර ගනිමින් ය එම ධර්ම සාකච්ඡාව පැවැත්වූයේ.

## කරුණාවයි! හාස්කමයි!

බඹලොව සිටින එක්තරා බ්‍රහ්මරාජයෙකුට මෙවැනි ආකල්පයක් ඇති විය. එනම් තමා නිත්‍ය බවත්, සනාතන බවත්, සදාකාලික ජීවනය ලද බවත්, තමා ගේ වසඟයෙහි ලෝකයාව පැවැත්විය හැකි බවත් ය. එස් කළ හැක්කේ තමා තුළ නො නැසෙන ආත්මයක් තිබෙන නිසා යයි හේ සිතාගෙන සිටියේය. ඒ මොහොත බුදුරජාණන් වහන්සේ සුභග නම් සල් ගසක් සෙවනේ භාවනා කරමින් සිටි වෙලාව යි. එක් එක් සත්වයන් ජීවිතය ගැන තම තමන් දරන ආකල්ප ජීවිතවලට බලපාන ආකාරය විමසමින් සිටි වෙලාවයි ඒ. බඹලොව සිටින නිත්‍ය සංකල්පයෙක වෙළී සිටින ඒ බ්‍රහ්මයා ගේ සිතිවලි උන්වහන්සේට ඒ මොහොතේ දැක ගන්නට ලැබුනි. මේ බ්‍රහ්මයා ගේ කල්පනාව ඔහුට පමණක් නොව බොහෝ දෙනෙකුට අහිත පිණිස පවතින බව දැන උන්වහන්සේ තුළ බලවත් අනුකම්පාවක් ඇති විය. නිමේෂයකින් බුදුරජාණෝ තමන් සිටි තැනින් නොපෙනී ගියහ. බ්‍රහ්ම ලෝකයේ අර බ්‍රහ්මයා ඉදිරිපිට පහළ වූහ.

sinhalaebooks.com



උන්වහන්සේව දුටු බ්‍රහ්මයා ආඩම්බරයෙන් මෙසේ කියන්නට විය. "හා! පින්වත් ශ්‍රමණය, මා ගත කරන්නේ නිත්‍ය වූ අමරණීය ජීවිතයකි. ඔබ ගේ මෙහි පැමිණීම ස්වාගතයකි!"

ඔහු සිතා ගෙන සිටියේ අසත්‍යයක් බවත් එබඳු අමරණීය ආත්මයක් කවර ලෝකයකවත් නැති බවත්, ඒ බ්‍රහ්මයා පවා ඊට කලින් ජීවත් වූයේ අභිභූ නම් වූ ලෝකයේ බවත්, එයින් චුත වී එම උපත ලබා තිබෙන බවත්, ආයුෂයා ගේ දීර්ඝ බව නිසා ඇති වී තිබෙන මුළාවක් මිස ඒ නිත්‍ය සංකල්පයේ කිසිඳු සත්‍යතාවක් නැතැ'යි උන්වහන්සේ පෙන්වා දුන්හ.

එවිට ඒ බ්‍රහ්මයා ලැජ්ජාවට පත් විය. මේ හිතුවක්කාර ශ්‍රමණයාට පාඩමක් ඉගැන්විය යුතු යැයි හේ සිතුවේය. හේ උන්වහන්සේට අභියෝග කළේ ය. "හොඳයි ශ්‍රමණය, ඔබ ඔය කතා කරන්නේ මාගේ මානසික බලය නො දැන ය. මම දැන් මෙතනින් නොපෙනී අතුරු දහන් වෙමි. හැකි නම් මා සිටින තැන සොයා ගනුව" යි.

බුදුරජාණෝ අභියෝගය භාර ගත්හ. "හොඳයි පින්වත් දෙවිඳ, හැකි නම් ඔබ නොපෙනී අතුරුදහන් වෙන්නැ" යි කීය.

එහෙත් සිදුවූයේ අපූරු දෙයකි. ඒ සා බලසම්පන්න බ්‍රහ්මරාජයාට සිටි තැනින් සෙලවෙන්නට නොහැකි බිය. දුරස්ථ පාලන යන්ත්‍රයකින් රූපවාහිනී වැඩසටහනක් නවත්වන්නාක් මෙන් බුදුරජුන් ගේ අධිමානසික බලයෙන් බ්‍රහ්මරාජයා ගේ හැකියාව ඒ මොහොතේ ක්‍රියා විරහිත විය.

ඉන්පසු බුදුරජාණෝ ද බ්‍රහ්මරාජයාට මෙසේ පැවසූහ. "හොඳයි පින්වත් බ්‍රහ්මය, මමත් නොපෙනී අතුරුදහන් වෙමි. හැකි නම් මා සිටිනා තැන සොයා ගන්නැ" යි. "හා! බලමු ශ්‍රමණය, මා ඔබටත් ඔතනින් අතුරුදහන් වෙන්නට ඉඩ නොදෙමි" යි ගුගුළේය. එහෙත් බුදුරජාණෝ සැණෙකින් නොපෙනී ගියහ. දැන් උන්වහන්සේ කොහේ සිටිත්දැ'යි කිසිවෙකුටත් දැක ගත නොහැකි ය. එහෙත් දෙවියන්ව පවා හුදෙක් ප්‍රාතිහාර්යයක් තුළ රඳවා තබන්නට උන්වහන්සේ නොකැමති වූහ. එනිසා තමන් වහන්සේ ගේ හඬ

sinhalaebooks.com



ඇසෙන්නට සලස්වා ඒ දෙවියන්ට ද ධර්මය ම පැවසූහ. සියලු කෙලෙසුන්ගෙන් නිදහස් වූ සිතේ පිවිතුරු බව පෙන්වා දුන්හ.

## සියලු ලොව විනිවිද පෙනේ!

බුදුරජුන් ගේ මේ ආශ්චර්යවත් මානසික බලය නිසාම සියලු ලෝක සමඟ ඉතාමත් ස්වාධීන ලෙස සම්බන්ධත් පැවැත්වූහ. දෙවියන් බඹුන් පවා උන්වහන්සේව පිළිගත්තේ තමන් ගේ ආධ්‍යාත්ම ගුරු දෙවිඳාණන් ලෙස ය. උන්වහන්සේ වදාළ ප්‍රථම ධර්මදේශනයට පවා සවන් දුන්නේ මිනිස් ලෝකය පමණක් නොවේ. දිව්‍ය බ්‍රහ්ම ලෝක විසිදෙකක ජනතාවක් එයට සවන් දුන්හ. ඒ සෑම ලෝකයක ම උන්වහන්සේ වදාළ ධර්මය අවබෝධ කර ගත හැකි ය. උන්වහන්සේ ගේ ශ්‍රාවක පිරිස් ඒ හැම තැන ම සිටිති. උන්වහන්සේ ගේ ප්‍රථම ධර්මදේශනාවට සවන් දුන් ලෝක විසිදෙක මෙසේය.

1. පෘථිවිය ඇසුරු කරගෙන සිටින දිව්‍ය ලෝකය
2. චාතුම්මහාරාජික දිව්‍ය ලෝකය
3. තාවතිංස දිව්‍ය ලෝකය
4. යාම දිව්‍ය ලෝකය
5. තුසිත දිව්‍ය ලෝකය
6. නිම්මානරතී දිව්‍ය ලෝකය
7. පරනිම්මිත වසවත්ති දිව්‍ය ලෝකය

   මේ දිව්‍ය ලෝක අයත් වන්නේ කාම භවයට බවත් මිනිස් ලෝකයේ සේ ම මේ ලෝකවල ද කාම සැප පවතින බවත් උන්වහන්සේ අපට පැවසූහ.

   රූප අරූප භවයන්ට අයත් ලෝකයන් මීට වඩා වෙනස් ය. එහි කාම සැපය පසු පස හඹා යාමක් නොමැත. පඤ්ච නීවරණ යටපත් කොට සමාධි බලය තුළ ධ්‍යාන උපදවා ගත් උදවිය පමණි එහි උපදින්නේ. යට සඳහන් සියලු ලෝකවල ද බුදුන් වදාළ ධර්මය අවබෝධ කර ගත හැකි ය. එනම්,

sinhalaebooks.com



8. බ්‍රහ්ම පාරිසජ්ජය
9. බ්‍රහ්ම පුරෝහිතය
10. මහා බ්‍රහ්ම
11. පරිත්තාභ
12. අප්පමාණාභ
13. ආභස්සර
14. පරිත්තසුභ
15. අප්පමාණ සුභ
16. සුභකිණ්හ
17. වේහප්ඵල
18. අවිහ
19. අතප්ප
20. සුදස්ස
21. සුදස්සී
22. අකනිට්ඨ

## නූතන විද්‍යාවට චිත්ත දියුණුවක් නැත!

වර්තමානයේ තරම් මානව වර්ගයා ගේ දියුණුවක් ලෝකයේ කිසිදාක තිබුණේ නැතැ'යි වහසි බස් දොඩන ඊනියා විද්‍යාත්මක ඤාණයට තවමත් එකම දිව්‍ය ලෝකයක් සමඟ හෝ සම්බන්ධ වන්නට නොහැකි විය. පංච නීවරණ යටපත් කොට දියුණු කරන ලද සමාධිමත් බලයෙන් මිස වෙනත් උපකරණ ඔස්සේ දිව්‍ය ලෝක සමඟ සම්බන්ධ වන්නට සිතීම සිහිනයක් පමණි.

දැන් බටහිර රටවලට ද බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය පැතිරී ඇති නිසා ඒ සදහම් උපදෙස් මත අනාගතයේ ඔවුන් ද පංච නීවරණ යටපත් කොට සමාධිය උපදවා ගනු ඇත. ධ්‍යාන ඇති කර ගැනීමට සමර්ථ වනු ඇත. ඒ තුළින් දිව්‍ය ලෝක හා සම්බන්ධ වීමේ හැකියාව ද ලබාගනු ඇත. එදාට මුළු මහත් ලෝකයට ම බුදුරජුන් ගේ

sinhalaebooks.com



ආශ්චර්යවත් මානසික බලය ගැන මවිත වීම හැර වෙන කළ හැකි කිසිවක් නැත.

## විලාසිතා හාස්කම් නැත!

ඕනෑම තැනක ඕනෑම කෙනෙක් කතාබස් කරන දේ පමණක් නොවේ සිතන දෙය පවා උන්වහන්සේට අවශ්‍ය නම් සැණෙකින් දැන ගත හැකි ය. ජලය මත ගමන් කිරීම, ආහාර පාන මැවීම ආදී දේවල් උන්වහන්සේ යන්තමින් වත් ගණන් නොගන්නා ඉතාමත් සුළු දේවල් ය. කොටින් ම ඍද්ධි ප්‍රාතිහාර්ය පෑම සියලු දෙනාටම කළ නොහැකි බව උන්වහන්සේ දනිති. එහෙත් ඒ තුළින් සියලු දෙනා ම විස්මයට පත් කරවිය හැකි බව උන්වහන්සේ දනිති. එනිසා ම උන්වහන්සේ තම ශ්‍රාවකයින්ට ඍද්ධි ප්‍රාතිහාර්ය පෑම පවා තහනම් කළ අවස්ථා තිබේ. ඍද්ධි ප්‍රාතිහාර්ය ප්‍රදර්ශනය කිරීම ගැන උන්වහන්සේ වදාළේ අපූරු උපමාවකි. එය වනාහී රුපියල් සත වෙනුවෙන් සල්ලාල ජනයා ඉදිරියේ කාන්තාවක් තම සළුපිළි ගලවා දැමීමක් බඳු යයි සිනහවට ලක් කළහ. උන්වහන්සේට අවශ්‍ය වූයේ මනුෂ්‍යයන් බුද්ධිමත් කරන්නට මිස අන්ධ භක්තිකයන් කරන්නට නොවේ. එදා උන්වහන්සේ ගත් බුද්ධිමත් තීරණය නිසා අද දක්වා ම ඒ පිවිතුරු ශ්‍රී සද්ධර්මය අප අතර ඉතිරි වී තිබේ. යම්හෙයකින් ප්‍රාතිහාර්ය පෑම උන්වහන්සේ අගය කළාහු නම් සමහර විට අද අපට ධර්මයේ නාමයෙන් ඉතිරි වන්නේ විජ්ජා පෙන්වන ක්‍රම ටිකක් පමණි!

සංසාරික ජීවිතය දුකින් නිදහස් කර ගැනීම ම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගේ ඒකායන අපේක්ෂාව විය. එනිසා ම ලෝකයේ පවතින සියලු සත්ව ලෝකයන් ගැන සෙවීම පිණිස උන්වහන්සේ ගේ සමාධිමත් ඥාණය යොදවන්නට සමත් වූහ. ලෝකයේ නොයෙක් ස්වභාවයෙන් සැප දුක් විඳින සත්වයන් උන්වහන්සේ කොටස් නවයකට බෙදා වෙන් කළහ. උන්වහන්සේ ඒවා අපට හඳුන්වා දුන්නේ සත්තාවාස නමින් ය. "සත්තාවාස" යන වචනයේ තේරුම සත්වයන් ගේ වාසස්ථානයන් ය. එනම්,

sinhalaebooks.com



## සත්ව ලෝකය විස්මිතයි!

1. ශරීරවලින් ද වෙනස් වූ හැඳිනීම්වලින් ද වෙනස් වූ සත්වයෝ සිටිති. (නානත්ත කායා නානත්ත සඤ්ඤිනෝ). ඔවුන් වනාහි මිනිස්සු, දෙවියෝ, ඇතැම් විනිපාතිකයෝ බඳු සත්තු වෙත් නම් එබඳු ය.
2. ශරීරවලින් වෙනස් වූ හැඳිනීම්වලින් එක ම ආකාර වූ සත්වයෝ සිටිති. (නානත්තකායා ඒකත්තසඤ්ඤිනෝ). ඔවුන් වනාහී පළමු බඹලොව උපත ලද බ්‍රහ්මකායික දෙවියෝ වෙත් නම් එබඳු ය.
3. ශරීරවලින් එක ස්වභාවයෙන් යුතු හැඳිනීම්වලින් වෙනස් වූ සත්වයෝ සිටිති. (ඒකත්තකායා නානත්ත සඤ්ඤිනෝ). ඔවුන් වනාහී ආභස්සර දෙවියන් බඳු වෙති.
4. ශරීරවලින් ද එක ම ස්වභාවයෙන් යුතු හැඳිනීම්වලින් ද එක ම ස්වභාවයෙන් යුතු සත්වයෝ සිටිති. සුභකිණ්හ දෙවියන් යම් බඳු ද, ඔවුන් වනාහී එබඳු සත්වයෝ ය. (ඒකත්තකායා ඒකත්ත සඤ්ඤී).
5. විඳීමක් නොතේරෙන හඳුනා ගැනීමක් ද කරගත නොහැකි සත්වයෝ සිටිති. අසඤ්ඤසත්ත දෙවියන් යම් බඳු ද ඔවුන් වනාහී එබඳු සත්වයෝ ය.
6. රූපය පිළිබඳ සියලු හැඳිනීම් ඉක්මවා ගිය සිතින් කරනු ලබන හඳුනා ගැනීම් නැති වී ගිය, නොයෙක් ආකාර වූ හඳුනා ගැනීම් මෙනෙහි නොකිරීමෙන් "අනන්ත වූ ආකාශය" යයි ධ්‍යාන වඩා ආකාසානඤ්චායතනයට පැමිණි සත්වයෝ සිටිති.
7. ආකාසානඤ්චායතනය සියලු ආකාරයෙන් ම ඉක්මවා ගොස් "අනන්ත වූ විඤ්ඤාණය" යයි ධ්‍යාන වඩා විඤ්ඤානඤ්චායතනයට පැමිණි සත්වයෝ සිටිති.
8. විඤ්ඤායඤ්චායතනය සියලු ආකාරයෙන් ම ඉක්මවා ගොස් කිසිවක් නැති බව ධ්‍යාන වශයෙන් වඩා ආකිඤ්චඤ්ඤායතනයට පැමිණි සත්වයෝ සිටිති.

sinhalaebooks.com



9. ආකිඤ්චඤ්ඤායතනය සියලු ආකාරයෙන් ම ඉක්මවා ගොස් නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණි සත්වයෝ සිටිති.

මේ ආකාරයෙන් සත්වයන් ගේ පැවැත්ම තිබෙන බව බුදුරජාණන් වහන්සේට සොයා ගත හැකි වූයේ ඒ අසිරිමත් මානසික බල මහිමයෙනි. මේ කොයි ජීවිතය තුළත් පවතින්නේ අස්ථිර වූ පැවැත්මක් බව උන්වහන්සේ ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කරගෙන සිටියහ. අනන්ත දුක් විඳින ලෝක ගැනත් අනන්ත සැප විඳින ලෝක ගැනත් උන්වහන්සේ හොඳින් දනිති.

## දුක් විඳින සත්ව ලෝක

නිරය නමින් ලෝකයක් පවතින බවත්, එහි අනන්ත සත්ව පිරිසක් අප්‍රමාණ දුක් දොම්නස් විඳින බවත් උන්වහන්සේ අපට පැවසූහ. සමහර ලෝක පවතින්නේ තනිකර ම ඝනාන්ධකාරයේ ය. එහි සත්වයෝ උපදිති. දිරා යති. මැරී යති. අන්ධකාරයේ ම දුක් විඳිති.

ඇතැම් සත්ව ලෝකවල නිරතුරුව ම පවතින්නේ පිපාසයත් කුසගින්නත් ය. ඒ ලෝකය ප්‍රේත ලෝකය වශයෙන් අපට හඳුන්වා දුන්හ. මිනිස් ලෝකය ආශ්‍රය කරගෙන බොහෝ ප්‍රේතයෝ ජීවත් වෙති.

එමෙන්ම තිරිසන් ලෝක ගැන ද උන්වහන්සේ ඉතා ම පැහැදිලිව දේශනා කොට තිබේ. තිරිසන් ලෝකයේ තිබෙන එකම දෙය ඔවුනොවුන් කා කොටා ගැනීමත්, බලවතා ගේ ගොදුර බවට දුර්වලයා පත්වීම බවත් උන්වහන්සේ පවසා සිටියහ. මේ දුක් විඳින ලෝක උන්වහන්සේ හඳුන්වා දුන්නේ "අපාය" වශයෙනි.

උපන් සත්වයා කවදා නමුත් ඒකාන්තයෙන් ම මිය යන්නේ ම ය. එය වළක්වාලිය හැකි කෙනෙක් ලෝකයේ නැත. එහෙත් ප්‍රශ්නය එය පමණක් නොවේ. යළි යළිත් ඉපදීම ය. යළි යළිත් ඉපදෙන නිසා යළි යළිත් මිය යන්නට සිදුවේ. සත්වයන් ගේ මේ අද්භූත සංසාර චක්‍රය උන්වහන්සේට අවබෝධ කර ගත හැකි වූයේ "චුතූපපාත ඤාණය" නම් වූ මානසික බලය තුළින් ය.

sinhalaebooks.com



## කන්ද උඩට පෙනේ!

කන්දක් උඩට නැග ගත් මනුෂ්‍යයෙක් කන්ද මුදුනේ සිට බිම බලන විට කන්ද පහළ ඇතට විහිදී යන තෙක් හොඳින් පෙනෙන්නේ ය. මං මාවත් ද පෙනෙයි. ගෙවල් දොරවල් ද පෙනෙයි. ඒවායේ වාසය කරන සත්වයන් ඒ වාසස්ථානවලින් පිටතට එන ආකාරයත් පෙනෙයි. යළි ඇතුලට යන ආකාරයත් පෙනේ. පාරේ ඇවිද ඇවිද සිටින ආකාරයත් පෙනේ. බුදු රජුන් තුළ පැවති චුතූපපාත ඤාණයත් අන්න ඒ ආකාර වේ. කන්ද මුදුනට නැගගත් මනුෂ්‍යයා යම්සේ ද උන්වහන්සේ ද එසේ ය. තමන් ගේ ඒ ඤාණ මහිමය තුළින් ලෝකය දෙස බලන විට ය උන් වහන්සේ සත්‍ය තත්වය දැක ගත්තේ. එනම් මේ ලෝකය හෝ සත්වයා දේව මැවිල්ලක් නොවේ. යක්ෂයා ගේ නිර්මාණයක් ද නොවේ. ජීවිතයේ යථා ස්වභාවය නොදන්නා කම නිසා ය මේ සංසාර ප්‍රහේලිකාව සකස් වී තිබෙන්නේ. මේ සත්‍ය තත්වය දුටු නිසාය උන්වහන්සේ තුළ මේ සා මහත් කරුණාවක් ලෝක සත්වයන් ගැන ඇතිවී තිබෙන්නේ. ඉන් පසු උන්වහන්සේ තම නුවණ මෙහෙයවන්නට පටන් ගත්තේ සත්වයන් ගේ මේ දුක් විඳින ජීවිත සදාකාලික අවසානයක් කරා ගෙන යන්නට ය. ඒ සඳහා තමන් ගේ අවබෝධය උන්වහන්සේ හසුරවා ඇති ආකාරය අතිශයින් ම විස්මය ජනක ය. සම්මා සම්බුද්ධත්වය දක්වා ම තමන් ගේ අවබෝධය පරිපූර්ණ කර ගත හැකි වූයේ ඒ නිසා ම ය.

සම්මා සම්බුද්ධත්වය ට පත්වීමත් සමඟ මේ පෘථිවියේ පමණක් නොව සමස්ත සෞරග්‍රහ මණ්ඩලය තුළ උන්වහන්සේ අනභිභවනීය පුද්ගලයා බවට පත් වූහ. එමෙන් ම ඒ ක්ෂණයෙහි ම සියලුම කෙලෙස්වලින්, සියලුම මායාමෝහවලින් සදහට ම නිදහස් වී ගියේ ය, උන්වහන්සේ දහම් දෙසන්නට පටන් ගත්තේ ඒ අසිරිමත් ප්‍රඥාවෙන් බිඳක් අපටත් ලබා දී අපවත් මේ සංසාර චක්‍රයෙන් නිදහස් කරවීම පිණිස පමණි. එහි වෙනත් සැඟවුණ ඉලක්ක නැත!

sinhalaebooks.com



# ඒ සඳහා ඔබේ සුදුසුකම

බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කොට තිබෙන්නේ අප සඳහා ම ය. උන්වහන්සේ පිරිනිවන්පාන කාල පරිච්ඡේදය වන විට ඒ අසිරිමත් ප්‍රඥාව තුළින් ජීවිතාලෝකය ලබා ගත් අපමණ ශ්‍රාවක පිරිසක් බිහි වී සිටියහ. තමන් වහන්සේ අවබෝධ කළ ධර්මය ඒ ආකාරයෙන් ම අන්‍යයන්ට ද අවබෝධ කරදීම පිණිස උන්වහන්සේ තුළ තිබුනේ අපූරු දක්‍ෂකමකි. ඒ නිසා ම අරහත්වයට පත් වූ අතිවිශාල ශ්‍රාවක පිරිසක් උන්වහන්සේට සිටියහ. ඒ රහතුන් වහන්සේලා තුළ තමන් ප්‍රයෝජන ලබා ගත් ඒ ශ්‍රී සද්ධර්මය කෙරෙහි වූයේ අප්‍රමාණ ගෞරවයකි. භක්තියකි.

## මෙන්න නියම ශ්‍රාවකයෝ!

බුදුරජාණන් වහන්සේ ගේ පිරිනිවන් පෑමෙන් පසු රහතුන් වහන්සේලා කල්පනා කළේ තම ශාස්තෲන් වහන්සේ ගේ ධාතූන් තැන්පත් කොට ස්ථූප හැදීමට නොවේ. ඒවා ගිහි පිරිසට භාර කළහ. මහා කාශ්‍යප රහතුන් වහන්සේ ප්‍රමුඛ මහ රහත් සඟ පිරිස කෙළින්ම වැඩියේ රජගහ නුවර ට ය. ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ධර්ම - විනය ආරක්‍ෂා කර ගැනීමේ වැඩ පිළිවෙල වෙනුවෙනි. එකල ඕනෑ තරම් ලිවීමේ පහසු කම් තිබුනි. එහෙත් ශ්‍රී සද්ධර්මය ලේඛනගත කිරීම උන්වහන්සේලා සැලකුවේ අගෞරවයක් වශයෙනි. ශ්‍රී සද්ධර්මය රඳවා ගත යුතු භාජනය විය යුත්තේ මිනිස් හදවත බවයි උන්වහන්සේලා ගේ අදහස වූයේ. එනිසා ම එම ධර්ම විනය සංගායනා කොට තම තමන් ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවන්ට ශ්‍රී සද්ධර්මය නොනැසී ආරක්‍ෂා කිරීමේ ඓතිහාසික කාර්යය භාර කළහ. ලංකාවේ දී මිහිඳු මහරහතන් වහන්සේ අපට පුරුදු කරවූයේ එම ක්‍රමය ම යි. මේ ධර්මය ග්‍රන්ථාරූඪ කරන්නට භික්ෂූන් වහන්සේලා පෙළඹුනේ භික්ෂූන් ගේ ජීවිත පවා අනතුරේ වැටී

sinhalaebooks.com



තිබුන දුර්දශාපන්න කාල පරිච්ඡේදයක දී ය.

## දුරදිග බලා වැඩ කිරීම

ශ්‍රී සද්ධර්මය ග්‍රන්ථාරූඪ කර ගත්තේ අනාගත පරම්පරාව උදෙසා මේ දුර්ලභ වාසනාව උදා කරදෙනු පිණිස ම ය. එකල මේ ධර්මය කටපාඩම් කර ගැනීමට තරම්වත් ශරීර ශක්තිය ඇති කරගත නොහැකි වූ දුර්භික්ෂ කාලයකි. ධර්ම ගෞරවය ඇති ඒ උතුම් සඟ රුවන මුහුදු තීරයට පැමිණ වැටකෙයියා කොළ ඉස්ම වළඳමින්ය මේ ධර්මය ධාරණය කර ගත්තේ. උන්වහන්සේලා ගේ අදහස සර්වප්‍රකාරයෙන් ම ඉෂ්ට විය. එහි ප්‍රතිඵලයක් වශයෙනි අද අපගේ අතට ශ්‍රී සද්ධර්මය ලැබී තිබෙන්නේ. බුදුරජාණන් වහන්සේ ජීවමානව අප අතර නැති නමුත් ධර්මයෙන් අපට කිසි ම අඩුපාඩුවක් නැත. සූත්‍ර දේශනාවල් තුළ ඉතා ම පැහැදිලි ලෙස නිවන් මග වාර්තා වී තිබේ. එම ධර්මයේ ජීවමාන බව පරිපූර්ණව තිබේ. එහෙත් අපට තිබෙන ලොකු ම අඩුව ඒ ධර්මය පිළිබඳ දැනුම බොහෝ දෙනෙක් තුළ නොතිබීම යි. ඒ නිසාම ධර්මයේ නාමයෙන් තම තමන් ගේ මතවාද කථා කරති. තම තමන්ට රුචි වූ අර්ථවලින් ධර්මය විස්තර කරති. ඒ සියලු දෙනා තුළ ධර්ම ගෞරවයක් හෝ ධර්මය ගැන ශ්‍රද්ධාවක් නැති කමයි පැහැදිලිව පෙනෙන්නේ. අනෙක් අය පැහැදිලි ධර්මඥානයක් ඇති කර ගැනීම ගැන සමහර පිරිස් අකැමැති ය. සමාජය ධර්මය නොදන්නා තාක් තම තමන්ට අභිමත පරිදි නැටවිය හැකි ය. ධර්ම ඥාණයක් ඇති කර ගත් පිරිස සමඟ එසේ කිරීම අපහසු ය. එනිසා ම එයට බාධා කරත්.

## මේ හොඳම වේලාවයි!

ජීවිතය ගැන යමක් තේරුම් කරගැනීමේ හැකියාවෙන් යුතු අප කිසිසේත් ම ඒ අවාසනාවන්ත ඉරණමට ගොදුරු නොවිය යුතු ය. මිනිස් ජීවිතය අප ලබා ගත්තේ අපගේ ම පුණ්‍ය විපාකයන් නිසා ය. දැන් අපට බුද්ධිය තිබේ. ඉතා හොඳින් කල්පනා කිරීමේ හැකියාව තිබේ. සත්‍යාසත්‍ය භාවය තෝරා බේරා ගැනීමේ හැකියාව තිබේ. ඒ

sinhalaebooks.com



මානසික කුසලතාව අපි හැකිතාක් දියුණු කර ගනිමු. අප ගේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ අප තුළ තිබෙන එම හැකියාව හඳුන්වා තිබෙන්නේ යෝනිසෝ මනසිකාරය වශයෙනි. ශ්‍රී සද්ධර්මය තේරුම් ගැනීම පිණිස යෝනිසෝ මනසිකාරය අත්‍යාවශ්‍ය දෙයකි. අවබෝධය පිණිස තමාගේ චින්තනය හැසිරවීමේ හැකියාව යෝනිසෝ මනසිකාරය වේ. මේ හැකියාව ඇති තැනැත්තා ව්‍යඤ්ජනයේ රසය වහා හඳුනාගන්නා දිවක් වැන්න.

## පරම පිරිසිදු සදහම්!

ඊ ළඟට අවශ්‍ය වන්නේ ශ්‍රී සද්ධර්මය යි. අර්ථ වශයෙන් විකෘතියට පත් නොවූ පැහැදිලි වචන තුළින් තේරුම් කර දීමේ ස්වභාවය ධර්මයේ ලක්ෂණය යි. අර්ථ පැටලී ගිය විට ධර්මය අවුල් වේ. ධර්මයේ සඳහන් වචන පැහැදිලි ලෙස තෝරා නොගන්නා විට ද ධර්මය අවුල් වේ. අවුල් වී ගිය දෙයකින් වාද විවාද මිස අවබෝධයක් ඇති නොවේ.

අවුල් වියවුල් රහිත වූ පිරිසිදු ශ්‍රී සද්ධර්මය ම ධර්මය නාමයෙන් ඇසිය යුතු ය. එම ධර්මයේ සඳහන් වන්නේ මේ ජීවිතයේදීම චතුරාර්ය සත්‍යාවබෝධ කිරීම ගැන ය. එනම් අවබෝධ කරගත යුතු වූ දහම් කොටස වූ දුක නම් වූ ආර්ය සත්‍යය ගැන ය. ප්‍රහාණය කළ යුතු දහම් කොටස වන දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය ගැන ය. සාක්ෂාත් කළ යුතු වූ දහම් කොටස වන දුකේ නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය ගැන ය. ඒ සඳහා ප්‍රගුණ කළ යුතු දහම් කොටස වන දුකේ නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය ය. ඒ චතුරාර්ය සත්‍ය පිළිබඳ අවබෝධ ඤාණයක් ඇති කර ගැනීම ආර්ය ශ්‍රාවකයා ගේ සම්මා දිට්ඨියයි. සම්මා දිට්ඨිය ඉබේ ඇති නොවේ. සම්මා දිට්ඨිය පිණිස කරුණු දෙකක් මහෝපකාරී වේ. එනම් චතුරාර්ය සත්‍යය ගැන කියැවෙන ශ්‍රී සද්ධර්මය අසන්නට ලැබිය යුතු ය. තමා තුළ යෝනිසෝ මනසිකාරය තිබිය යුතු ය.

sinhalaebooks.com



## සද්ධර්මයයි! යෝනිසෝ මනසිකාරයයි!

ඒ ඇසූ ධර්මයට අනුකූලව යෝනිසෝ මනසිකාරයේ යෙදිය යුතුයි. තමා අසන ධර්මය තුළ චතුරාර්ය සත්‍යය ගැන පැහැදිලි ලෙස සඳහන් වී තිබිය යුතු ම ය.

බුදුජාණන් වහන්සේ ගේ ධර්මය බුද්ධ වර්ෂ විසිභයවන සියවසේ දීත් ඒ අයුරින් ම ඉගෙනීමේ වාසනාව අපට අදටත් උරුම වී තිබීම ගැන අප අපමණ සතුටු විය යුතුයි. මනුෂ්‍ය ජීවිතය පරිපූර්ණත්වයට පත් කළ ඒ ශ්‍රී සද්ධර්මය අප ඉගෙන ගත යුත්තේ බලවත්ව උපදවා ගත් ශ්‍රද්ධා ගෞරවයෙන් යුක්තව ය. සිතේ හොඳින් ධාරණය වන තුරු හොඳින් ඉගෙන ගත යුතු ය. අප සරණ යන්නේ අපගේ බුද්ධිය නොවේ. "බුදුන් සරණ යාම යනු තමන්ගේ බුද්ධිය සරණ යාම" ය යනුවෙන් නිවන් මග විකෘති කරන උදවිය ගෙන් ප්‍රවේශම් වෙමින් පිරිසිදු ධර්මය ම ශ්‍රවණය කළ යුතු ය. "කෝටි සංඛ්‍යාත ජනතාවක් සදාකාලික ශාන්තිය උදා කරගත් උත්තම වූ ධර්මයක් නේ ද මෙය" කියා ධර්ම ගෞරවයෙන් එය හදාරණ විට ශ්‍රද්ධාව ඇති වේ. සිතේ දරා ගැනීමේ ආශාව ඇති වේ. සිතට සැපය ඇති වේ. නුවණින් තේරුම් ගන්නට මහන්සි ගනිද්දී වඩ වඩාත් පැහැදිලි ලෙස ධර්මය වැටහෙන්නට පටන් ගනී.

## සද්ධාවෙන් පටන්ගන්න!

එවිට බුදුරජාණන් වහන්සේ යනු ඒකාන්තයෙන් ම සම්මා සම්බුදු වූ මුනිඳාණන් වහන්සේ යයි බලවත් ශ්‍රද්ධාවක් සිතේ පිහිටයි. ශ්‍රී සද්ධර්මය කෙරෙහි ද බලවත්ව සිතේ පැහැදීම ඇති වෙයි. ඒ ධර්මය අනුගමනය කළ ශ්‍රාවක සඟ පිරිස කෙරෙහිත් බලවත්ව සිත පහදියි. ඒ පින්වත් තැනැත්තා අවබෝධයෙන් ඇති කරගත් ශ්‍රද්ධාවෙන් යුක්තව ආර්ය මාර්ගයේ ගමන් කිරීමට කැමැත්ත ඇති කරගනී. මොහු ගැන සද්ධර්මයේ සඳහන් වෙන්නේ "සද්ධානුසාරී" නමින් ය. "සද්ධානුසාරී" ශ්‍රාවකයා ශ්‍රද්ධාව මුල් කර ගෙන අධර්මය බැහැර කරයි. ධර්මය ම පිළිගනී. ධර්මයේ ම යළි යළිත් පිහිටයි. ඔහු ගේ ශ්‍රද්ධාව අන්ධ භක්තියක් නොවේ. අන්ධ භක්තියට බුදුන් වදාළ

sinhalaebooks.com



ධර්මයේ තැනක් නැත. අන්ධ භක්තිය තුළ සත්‍යයට ඉඩක් නැත.

අන්ධ භක්තියේ ස්වරූපය ගැන තේරුම් ගත හැකි බොහෝ සිද්ධීන් දැන ගත හැක්කේ බටහිර ඉතිහාසයේ මධ්‍යතන යුගයේ ආදානග්‍රාහී කතෝලික යුගය තුළින් ය.

එක්තරා පාදිලිවරුන් පිරිසක් දේව රහසක් සෙවීම පිණිස මහා සම්මන්ත්‍රණයක් පැවැත්වූහ. මහත් වෑයමෙන් තමන් ගේ ආගමික ග්‍රන්ථ පෙරළමින් ඔවුන් සොයන රහස ඔවුන්ට මහා බරපතළ දෙයක් විය. එනම් දේව මැවිල්ලේ දී දෙවියන් වහන්සේ අශ්වයෙකු ගේ මුඛයේ දත් කීයක් සවි කළේ දැයි සොයා ගැනීම ය. එතැන නිදහස් මතධාරී තරුණ පාදිලි වරයෙක් විය. ඔහු මේ ගැන බරපතළ ලෙස නොසිතුවේ ය. ඔහු මෙසේ යෝජනාවක් කළේ ය.

"පාදිලිවරුනි, අපි අශ්වයෙක් කැඳවා ගෙන එමු. ඉන් පසු උගේ මුඛය විවෘත කොට දත් ටික ගණන් කර බලමු. එවිට අපිට අශ්වයා ගේ දත් ගණන දැන ගන්නට පුළුවන් නොවේ දැ?"

මුළු සම්මන්ත්‍රණ ශාලාව ම මේ හිතුවක්කාර යෝජනාවට කැළඹී ගියේ ය. දෙබරයකට ගල් ගැසූ කලක් මෙන් විය. පාදිලිවරු කෝපයෙන් දිලිහෙමින් මහ හඬින් ගුගුරන්නට පටන් ගත්හ.

"හා! මේකා යක්ෂයාට අහු වුණා. දේව මැවිල්ලට මේකා අභියෝග කළා. වහාම මේකාව පුළුස්සා මරණු!" අර බුද්ධිමත් තරුණ පාදිලිවරයා අන්ධ භක්තිකයන් ගෙන් මැරුම් කෑවේ ය. අන්ධ භක්තියේ තරම මෙයින් සිතා ගත හැකිය!

ශ්‍රී සද්ධර්මය තුළ කවරදාකවත් මේ ආකාර අන්ධ භක්තික උම්මත්තකයින් බිහි නොවේ. සද්ධර්මයෙන් කෙරෙන්නේ අන්ධ භක්තිය බැහැර කොට වීමංසන බුද්ධිය දියුණු කිරීම යි.

## සද්ධාවෙන් බුද්ධිය කරා

ශ්‍රද්ධාවන්ත ශ්‍රාවකයා වීමංසන බුද්ධිය දියුණු කරගන්නේ යෝනිසෝ මනසිකාරය තුළින් ය. ලෝකයේ තිබෙන පරම සත්‍ය වන චතුරාර්ය සත්‍ය ගැන කියැවෙන සද්ධර්මය අසා දැන ගත් හේ ඒ

sinhalaebooks.com



ධර්මය අවබෝධ කර ගැනීම පිණිස තමන් ගේ චින්තනය මෙහෙයවයි. චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධ ඤාණයක් ලබාගැනීම පිණිස චින්තනය මෙහෙයවන ඒ ශ්‍රාවකයාව ඊ් ළඟට හඳුන්වන්නේ “ධම්මානුසාරී” නමින් ය.

## බුද්ධිමතා ධර්මය දකී!

මේ “ධම්මානුසාරී” ශ්‍රාවකයා ටිකෙන් ටික චතුරාර්ය සත්‍ය පිළිබඳව තමා ගේ ම ඤාණයක් පිණිස සමථ - විදර්ශනා වශයෙන් පුහුණු වෙන නිසා සෝතාපත්ති ඵලය පිණිස ආර්ය මාර්ගයේ ගමන් කරන පුද්ගලයෙක් බවට පත් වෙයි. බුදුරජාණන් වහන්සේ ඔහු ගැන හඳුන්වා තිබෙන්නේ “සෝතාපත්ති ඵල සච්ඡකිරියාය පටිපන්නෝ” වශයෙනි. එනම් “සෝතාපත්ති ඵලය සාක්ෂාත් කිරීම පිණිස පිළිපන් තැනැත්තා” වශයෙනි.

## සම්මා දිට්ඨිය

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රථම මාර්ගාංගය හෙවත් සම්මා දිට්ඨිය ඇති වීම ජීවිතයට සත්‍යාවබෝධයේ අරුණාලෝකය උදාවීමක් වැනි යැයි උන්වහන්සේ පවසා සිටියහ. ආර්ය මාර්ගයේ සම්මා දිට්ඨිය යනු චතුරාර්ය සත්‍ය පිළිබඳ අවබෝධ ඤාණය යි. එනම් “දුක” වශයෙන් අවබෝධ කළ යුතු ආර්ය සත්‍යයක් ඇති බවට තමා තුළ ඇති ඤාණය යි. “දුකේ හේතුව වශයෙන් පවතින දෙය” ප්‍රහාණය කළ යුතු ආර්ය සත්‍යයක් බවට තමා තුළ හටගත් අවබෝධ ඤාණය යි. “දුකේ හේතුව නැති වීම” සාක්ෂාත් කළ යුතු ආර්ය සත්‍යයක් බවට තමා තුළ හටගත් අවබෝධ ඤාණය යි. “දුකේ හේතුව නැති වීම පිණිස ඇති මාර්ගය” ප්‍රගුණ කළ යුතු ආර්ය සත්‍යයක් බවට තමා තුළ ඇති අවබෝධ ඤාණය යි. මෙය යි සම්මා දිට්ඨිය. මේ සම්මා දිට්ඨිය ඇති වීමත් සමඟ ම “සක්කාය දිට්ඨි” ය හෙවත් තමා ගේ වසඟයෙහි යමක් පවත්වා ගත හැකි ය වශයෙන් සිතේ මුල් බැසගෙන තිබුන ආත්ම දෘෂ්ටිය ප්‍රහීණ වෙයි. තෙරුවන් කෙරෙහි සියලු සැක ප්‍රහීණ වෙයි. අර්ථශූන්‍ය නොයෙක් ශීලව්‍රත අනුගමනය කිරීමේ මානසිකත්වය

sinhalaebooks.com



ප්‍රහීණ වෙයි. එවිට කිසිදා නොසෙල්වෙන ලෙස තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සිතේ පිහිටයි. අවබෝධයෙකින් යුතුව සිල් රකින කෙනෙක් බවට පත් වේ. ස්ථිරව ම ආර්ය අෂ්ටාංගික මාර්ගයට බැස ගත් කෙනෙක් බවට පත් වේ. ඔහු ගේ ජීවිතයේ අභ්‍යන්තරික අංග වශයෙන් සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන අංග පිහිටයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණි තැනැත්තා යන තේරුමෙන් මේ ශ්‍රාවකයා "සෝතාපන්න" යන නාමයෙන් බුදුරජාණෝ හඳුන්වා දුන්හ. එතැන් සිට ඔහු නිවන් අවබෝධ කරන තෙක් ම නොනවතින චිත්ත දියුණුවක යෙදෙන්නේ ය. හේ කිසිදා අපා දුකට නොවැටේ. සාංසාරික ජීවිත හතකින් මෙපිට ස්ථිරව ම භව ගමන අවසන් කරනු ඇත!

## භාග්‍යවන්ත ශ්‍රාවකයා!

සම්මා සම්බුද්ධ ශාසනයක් තුළ තම ජීවිතය ස්ථිරව පිහිටුවා ගත් මේ ශ්‍රාවකයා මිහිතලය මත සිටින අතිශයින් ම භාග්‍යවන්ත කෙනෙකි. ඔහු ගේ ඒ ශ්‍රද්ධාව තැරැව් කාරයන් අතර ගණුදෙනු වන වෙළඳ භාණ්ඩයක් බවට පත් නොවේ. හීන දීන වී බයාදු වී ගිය බියසුළු යදින්නෙක් බවට පත් නොවේ. රැකියාවක් වෙනුවෙන්, කසාදයක් වෙනුවෙන්, බඩ වියත වෙනුවෙන් ඒ ශ්‍රද්ධාව පාවා නොදෙයි. ඔහු ජීවිතය පරදුවට තබා ඒ ශ්‍රද්ධාව රැකගනී. මහා පොළොව කැඩී වැනසී ගිය ද මහ සයුර සිඳී වියළී ගිය ද ඔහු ගේ ශ්‍රද්ධාව අචල ය. නිසල ය. නිමල ය. පිවිතුරු ය. ප්‍රභාස්වර ය. අකම්පිත ය.

ඔබ දන්නා ඕනෑම කෙනෙකුට ඒ උතුම් ශ්‍රද්ධාව ඇති කර ගැනීමට උපකාරී වන්න. එසේ නැතිව ලාභය උදෙසා ගණුදෙනු කරන වෙළඳ භාණ්ඩයක් බවට ආගම පත් කර ගන්න ඉඩ දෙන්න එපා! මේ මනුෂ්‍ය ජීවිතයේ දී අපට ලබා ගත හැකි මේ උත්තරීතර අවස්ථාව මග හැරෙන්න ඉඩ දෙන්න **එපා!**

sinhalaebooks.com



# විස්මිත අවබෝධය

ශ්‍රීමත් බුද්ධ වර්ෂ විසිහයවන සියවසේ ජීවත් වන අපට දැන් බොහෝ පහසුකම් තිබේ. විද්‍යාගාර තුළ නොයෙකුත් මාදිලියේ පර්යේෂණ කරති. නොයෙකුත් මාදිලියේ අමුතු වූ හිතුවක්කාර සොයා ගැනීම් කරත්. එමෙන් ම පැය කීපයක් ඇතුළත රටකින් රටකට වේගවත් වාහනවලින් ගමන් කිරීමටත් අපි පහසුකම් සදා ගෙන සිටිමු. ලෝකයේ ඕනෑම අස්සකට මුල්ලකට මොහොතකින් කථා කිරීමටත් අපට පුළුවන් වී ඇත. ලෝකයේ බොහෝ සිදුවීම් වහාම දැන ගැනීමේ අවස්ථාව ද අපි ඇති කරගෙන සිටිමු. එහෙත් මනුෂ්‍යත්වය ස්ථාපිත කර ගැනීමට අපි ඉතා ම අදක්ෂ වෙමු. මේ ඊනියා දියුණුවෙන් මනුෂ්‍යයා ගේ ප්‍රශ්න අවසන් වී තිබේ ද?

## සැබෑ දහම නොමැති වරද

කවරදාටත් වඩා අනතුරුදායක ලෙස භයානක අවි ආයුධ එක් රැස් කරති. නවීන අත්හදා බැලීම් කර

මින් සත්ව වර්ගයා ගේ පැවැත්මට හානිකර වූ අවි ආයුධ තව තවත් නිපදවති. මනස විකෘති කරවන විවිධාකාර වූ මත්ද්‍රව්‍ය හා මත් දියර වර්ග හැම තැන ම බෙදා හරිති. ජාතීන් මෙන් ම රටවල් ද බලවත් ජාතීන් විසින් සූරාකෑමටත් පීඩනයකටත් ලක් කර සිටිති. අමුතුම මාදිලියේ මාරාන්තික වූ විකෘති රෝගයන් බෝ වෙමින් තිබේ. කාමාශාව විකෘති කොට උම්මත්තක කරවන චිත්‍රපටි ද පොත් පත් ද විවිධ තාක්ෂණික නිපදවීම් ද අතින් අත හුවමාරු වේ. කාම උන්මාදයටත්, බල අරගලයටත්, ප්‍රචණ්ඩත්වයටත්, ත්‍රස්තවාදයටත් හැමදාම ගොදුරු වන්නේ සාමාන්‍ය අසරණ ජනතාව ය. මෙයට හේතුව ජීවිතය ගැන යථාර්ථයෙන් දකින මහා කරුණාවෙන් යුතු ශාන්ත ධර්මයක් ඊනියා විද්‍යාඥයින්ට හමු නොවීමයි. දුෂ්ටකමත්, මායාවත්, චාටු බස් දෙඩීමත් වෙනුව ට අවංකව කරුණාවත් ප්‍රඥාවත් යෙදවිය හැකි ධාර්මික නායකත්වයක් වර්තමාන මිනිසුන් අතර

sinhalaebooks.com



පෙනෙන තෙක් මානයේ වත් නොමැත.

## මුළාවූ සත්වයා

සමහර දේව නිර්මාණ වාදී ආගම්වල ඒකායන ප්‍රාර්ථනය දේව නිර්මාණය නොපිළිගන්නා මානව හිතවාදී ආගම වන ශ්‍රී සද්ධර්මය මහපොළොවෙන් අතුගා දැමීමට ය. දේව මැවිල්ල නම් වූ අන්ධ භක්තිය ඉදිරියේ ඔවුන් පුදුමාකාර ආගමික වෛරයෙන් පසුවෙති. මහාකාරුණික බුදු සමිඳුන් ගේ ශාන්ත දෙනුවන් යුතු බුද්ධ ප්‍රතිමාවන් තුළින් ඔවුන් දකින්ට හදන්නේ දේවමැවිල්ලට හතුරු වූ යක්ෂයෙක්ව ය. ඔවුන් ධර්මය පවා හඳුන්වන්නේ යක්ෂයා ගේ ආගම වශයෙනි. බෞද්ධ ජනතාව ඔවුන්ට පෙනෙන්නේ යක්ෂයා ගේ සේනාව වශයෙනි. බෞද්ධයන් ඉදිරියේ ඔවුන් මූනිච්ඡාවට කරන්නේ රඟපෑමකි. සූකිරි වැනි මිහිරි වචන කියමින් ධර්මය කෙරෙහි ශ්‍රද්ධාව නැති බෞද්ධයින් ව රවටති. බොරු ආදරයක් පෙන්වති. ඔවුන් ගේ එකම අදහස බෞද්ධයන් බුද්ධි මාර්ගයෙන් මුදවා දේව මැවිල්ල කෙරෙහි අන්ධ විශ්වාසය ඇති කරවීම යි. ඒ සඳහා කළ හැකි සෑම නොපණත් කමක් ම කරන්නට අන්ධ භක්තියෙන් අන්ධකාර වූ ඔවුහු පෙළඹී සිටිති. චිත්‍රපටි ඔස්සේ, ගී සින්දු ඔස්සේ, නළු නිළියන් ඔස්සේ, ව්‍යාපාරිකයන් ඔස්සේ, අධ්‍යාපනය ඔස්සේ, දේශපාලනය ඔස්සේ ඔවුන් ජයට ම දේව මැවිල්ල ගැන මිථ්‍යා විශ්වාසය ජනතාව ගේ සිත් තුළට රිංගවති. අප ගේ මහාකාරුණික ශාස්තෘන් වහන්සේ වන භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට නින්දා කරති. ඒ ශ්‍රී සද්ධර්මයට නින්දා කරති. භික්ෂූන් වහන්සේ ගේ පිළිගැනීම හෑල්ලු කරවා, සමාජ නායකත්වයෙන් ඔවුන්ව බැහැර කරවති. අන්‍යාගමික පූජක පැලැන්තිය ටිකෙන් ටික සමාජ නායකත්වයට ප්‍රවේශ කරවති.

## කූට උපක්‍රම

මෙහි තිබෙන ඉතා ම නින්දනීය තත්වය නම් බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවක වූ බෞද්ධ ජනතාව ගේ අභිමානවත් ජීවිතය විනාශ කොට ඔවුන් ගේ කොඳු කඩා දැමීමයි. ඔවුන් නිවට නියාලු නීච

sinhalaebooks.com



පුද්ගලයන් බවට පත් කරවීමයි. ඔවුන් පැතිර වූ කතාව නම් බෞද්ධ ජනතාව නිරන්තරයෙන් දුගී දුප්පත් කමින් පීඩා විඳින බවයි. කිසිම ආර්ථික දියුණුවක් නොමැති අඟ හිඟ කමින් පෙළෙන බවයි. මේ මිථ්‍යා දෘෂ්ටිය පිළිගත්, මේ ඇමය ගිළගත් ගිහි - පැවිදි බෞද්ධ ජනතාව දැන් තමන් ගේ කටින් ම ඒ මිථ්‍යා දෘෂ්ටිය පතුරවමින් සිය කැමැත්තෙන් ම තම තමන් ගේ කොඳු කඩා ගනිති. මානසිකව බෙලහීනත්වයට පත් වූ ඕනෑම කෙනෙක්ව ඉතා ම පහසුවෙන් වෙනත් ආගමකට හැරවිය හැකිය. මේ වන විට බෞද්ධ ජනතාව බොහෝ දෙනෙක් මානසිකව බෙලහීනත්වයෙන් පෙළෙත්. බුදු සසුනේ විනාශයේ මුල මෙයයි.

## මෙන්න ඇත්ත!

එහෙත් බෞද්ධයාගේ සත්‍ය තත්වය මීට හාත්පසින් ම වෙනස් ය. අවබෝධයෙකින් යුක්තව තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයා ආධ්‍යාත්මික ධනවතෙකි. සිල්වත් කෙනෙකු වීමේ, සිත සමාධිමත් කර ගැනීමේ, ප්‍රඥාව දියුණු කර ගැනීමේ භාග්‍යවන්තයා වන්නේ ඔහු ය. ජීවිත සැණසුම සැබෑ ලෙස උදාකර ගැනීමේ පුණ්‍යවන්තයා ඔහු ය. කෑමෙන් බීමෙන් අඟ හිඟ වූ පමණින් මනුෂ්‍යයෙක් දිළින්දෙක් බවට පත් නොවේ. ඔහු ගේ මානසික දිළිඳු බව නිසාම ය ඔහු දුර්වල වෙන්නේ.

## හොඳම ශ්‍රාවකයා!

ශ්‍රී සද්ධර්මය පූර්ණ වශයෙන් අවබෝධ කර ගත් රහතන් වහන්සේලා ගැන බුදුරජාණන් වහන්සේ වරක් පවසා සිටියේ අසිරිමත් කථාවකි. එනම් තමන් ගේ ශ්‍රාවක වූ ඒ රහතන් වහන්සේලා ගත කරන්නේ අතිශයින් ම සරල ජීවිතයකි. උන්වහන්සේලා සතුව තිබුනේ පාත්‍රයත් සිව්රු තුනත් පමණි. සමහර දිනවල දානය පවා නොලැබේ. රාත්‍රිය ගෙවන්නට සිදුවන්නේ එළිමහනේ ගසක් යට ය. එහෙත් ඔවුන් තුළ පිරිපුන් සතුටත්, තෘප්තියත්, සංසිඳීමත් උතුරා ගොස් තිබුනි.

මිළ මුදලින් පමණක් ධනවත් වූ ඥාතීහු ද ඔවුන්ට සිටිති. ඒ

sinhalaebooks.com



ඥාතීන් එකතු වී රහතන් වහන්සේ නමක් තම නිවසට කැඳවා ගෙන ගොස් ඒ රහත්නම ගේ උස ප්‍රමාණයට රත්‍රන් කන්දක් ගොඩ ගසා, ඇස් කඩා හැලෙන රූප සොභාවෙන් යුතු ලලනාවියක් පෙන්වා, විශාල මාළිගයක් පෙන්වා කිවොත් "ඔබ මෙහි පැමිණ සැප විඳින්න. ඔය දුක් සහිත ජීවිතය අත් හරින්න" කියා. ඒ රහතන් වහන්සේ කිසි දිනක දෑස ඔසවා ඒ දෙස නොබලත්. ජීවිතයේ සැප දුක් ගැන උන්වහන්සේ හොඳින් දන්නා නිසා ය. මේ ගැන විස්තර මජ්ඣිම නිකායේ රට්ඨපාල සූත්‍රයෙන් දැන ගත හැකි ය.

## සැබෑම ධනය!

එමෙන් ම ජීවිතය කුමක් දැ'යි යථාර්ථයෙන් අවබෝධය ඇති කරගත් තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයා දුප්පත් නැත. උත්සාහයත්, ධෛර්යයත්, අවංක භාවයත්, පසුබට නොවීමත්, මානසික බලයත් ඔහු තුළ හොඳින් පිහිටා තිබේ. ඒ නිසා ඔහු අන්‍යාගමිකයින් ගේ කුමන්ත්‍රණවලට හසු නොවේ. ආධ්‍යාත්මික බෙලෙහීනතාවෙන් පසු නොවේ. 'අනේ බුදු සසුනට නායකත්වයක් නැතැ' යි විළාප නොනගයි. ඊනියා විද්‍යාත්මක සොයා ගැනීම් වලට මුළා නොවෙයි. තමන් සරණ ගිය බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද ආශ්චර්යවත් පර්යේෂණය ගැන, ඒ ආශ්චර්යවත් සොයා ගැනීම ගැන සිත සිතා සතුටු වෙයි.

පහසුකම් නාමයෙන් දැන් තිබෙන්නා වූ කිසි ම දෙයක් උන්වහන්සේට තිබුනේ නැත. උන්වහන්සේ මහා වනාන්තරයේ කුටියක හුදෙකලාව ය වැඩ සිටියේ. උන්වහන්සේ කළේ භාවනා කිරීම ම ය. දියුණු කරන ලද බලවත් සමාධියකින් යුතු වීමංසන බුද්ධිය උන්වහන්සේ ගේ සුවිශේෂී උපකරණය විය. ඒ තුළින් ජීවිතයක ලබා ගත හැකි පරම පිවිතුරු උත්තරීතර විමුක්තිය සොයා ගන්නට තරම් මෙතුමාණෝ අතිශයින් ම දක්ෂ වූහ. තමන් ගේ පරීක්ෂණ ක්‍රියාවලිය අවසන් වන විට එතුමාණෝ සියලුම ලෝකවලින් නිදහස් වූ අපමණ මානසික බලයක් උදාකරගත් "සම්මා සම්බුදු" කෙනෙක් බවට පත් වී

sinhalaebooks.com



සිටියහ.

## ධාර්මික ඉලක්කය

අතිශයින් ම නවීන යයි කිව යුතු ඒ පර්යේෂණ ක්‍රියාවලිය අනිකුත් බුද්ධිමතුන්ට කියාදෙන්නට උන්වහන්සේට හැකි විය. වසරක් දෙකක් නොව වසර හතළිස් පහක් ම උන්වහන්සේ ඒ උත්තරීතර කාර්යභාරය ඉෂ්ට කළහ. එහි අරමුණ වූයේ තමන් ගේ ම යයි තනා ගත් බලවත් පිරිසක් එකතු කොට අනික් ආගම් අනික් ඇදහිලි, ඒවා අදහන මිනිසුන් සුනු විසුනු කොට ආගමික අධිරාජ්‍යයක් ගොඩ නැංවීම නොවේ. එහි එකම අරමුණ මිනිසුන්ට පවිත්‍ර වූ නුවණක් උපදවා ගන්නා හැටි කියා දීම පමණි. ඒ නුවණ තුළින් නිදහස් ලෙස ලෝකය දෙස බලන හැටි කියා දීම පමණි. ඒ දැකීම තුළින් සියල්ලෙන් ම නිදහස් වෙන හැටි කියා දීම පමණි. ඒ නිදහස තුළින් පරම පිවිතුරු ශාන්ත භාවය භුක්ති විඳින ආකාරය කියා දීම පමණි. වර්තමානයේ එය හඳුන්වන්නේ "බුද්ධ ධර්මය" නමින් ය. අප විසින් එය හඳුන්වන්නේ "ශ්‍රී සද්ධර්මය" නමින් ය.

ශ්‍රී සද්ධර්මය තුළ පවතින්නේ බුදුරජාණන් වහන්සේ ගේ විස්මිත අවබෝධය යි. ඒ ධර්මයෙන් ජීවිතය ගැන ඉතාමත් ගැඹුරට කථා කරයි. බුද්ධිමත් මිනිසාව වඩාත් තීක්ෂණ වූ විමසිලි සහිත මගකට යොමු කරයි. සරල ලෙසත් පැහැදිලි ලෙසත් පිළිවෙලින් පිළිවෙලට විමසන ආකාරය උගන්වයි.

## සංකීර්ණ ප්‍රහේලිකාව!

ජීවිත තුළ ඉතාමත් සංකීර්ණ ප්‍රහේලිකාවක්ව පවතින වඩාත් සංවේදී ප්‍රශ්නය උන්වහන්සේ පළමුව තෝරා ගති. ඊට හේතුව ඒ ප්‍රශ්නය නිසා ලෝක සත්වයා අනන්ත අසරණ භාවයට පත්වීම යි. වඩාත් දුක්ඛිත තත්වයට පත්වීම යි. ඒ ප්‍රශ්නය නම් "මරණය යි!" මරණය යනු ජීවිතයේ තීරණාත්මක අවස්ථාවකි. එය වනාහී උපන් මොහොතේ සිට ම සත්ව ජීවිතයට උරුම දෙයකි. කොතරම් පරෙස්සමින් සිටිය ද ක්‍රම ක්‍රමයෙන් ජරාවට පත් වී නියත වශයෙන් ම

sinhalaebooks.com



මරණයට පත් වනු ඇත. මරණයේ දී හඬා වැළපීම හැර ඊට වඩා දෙයක් ගැන සාමාන්‍ය ජනතාව කිසිදා නොසිතුවේ ය. ඇතමෙක් පැවසුවේ සිනහ උපදවන කථාවකි. 'දෙවියන් වහන්සේ තමා ජීවිතය දුන්නේ. දේව කැමැත්තට අනුව මරණය සිදු වේ. ඒ ගැන අපට කරන්නට තිබෙන්නේ මරණයට පත් තැනැත්තාව දෙවියන් ළඟට කැඳවා ගන්නැ'යි යාඥා කිරීම පමණි. ජීවිතයේ මේ සා සංකීර්ණ ගැටළුවකට අත ගසා විසඳුමක් සොයන්නට ඉදිරිපත් වූ තැනැත්තා බුදුරජාණන් වහන්සේ පමණි. ජීවිතයේ යථාර්ථය සොයා විමසා බලමින් එදා බෝධි මූලයේ භාවනානුයෝගීව වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේට එදින රාත්‍රී මධ්‍යම යාමයෙහි සුවිශේෂී ඥාණයක් පහළ විය. උන්වහන්සේ විසින් එය හඳුන්වා තිබෙන්නේ චුතූපපාත ඥාණය වශයෙනි. එනම් සත්වයන් ගේ චුත වීමත් ඉපදීමත් ඒ ආකාරයෙන් ම දැකිය හැකි ඥාණය යි. එදිනම රාත්‍රී පළමු යාමයේ දී උන්වහන්සේට ලැබුනේ පුබ්බේනිවාස ඥාණය යි. එනම් සත්වයන් ගේ අතීත ජන්මයන් ගැන ඒ ආකාරයෙන් ම දැන ගත හැකි ඥාණය යි. මේ ඥාණයන් ලැබීමත් සමඟම ජීවිතය ගැන උන්වහන්සේ ගේ අවබෝධය අතිශයින් ම පළල් වී ගියේ ය. "මරණය" යනු එක ජීවිතයක පමණක් සිදු වී නිමාවට පත් වන දෙයක් නොවන බව උන්වහන්සේට අවබෝධ විය. එය සෑම උපතක් සමඟ ම අත්වැල් බැඳගෙන තිබේ. යම්තාක් උපදී ද ඒ තාක් මරණය උරුම වේ. උන්වහන්සේ ගේ මහාකරුණාවට පාදක වූයේ උන්වහන්සේ ගේ ඒ යථාර්ථාවබෝධය යි. ජීවිතයකට අත්‍යවශ්‍ය වූ ඒකායන විසඳුම මෙය බව උන්වහන්සේ සනිටුහන් කොට හමාර ය. ලෝක සත්වයා විඳින්නා වූ මේ දුක ස්ථිර වශයෙන් ම විසඳාලීමට තරම් බලවත් සංවේගයක් උන්වහන්සේ ගේ හදවතෙහි විය.

## එකම විසඳුම සොයයි!

"අහෝ! මේ ලෝක සත්වයා ඒකාන්තයෙන් ම මහත් දුකකට වැටී තිබේ. ඔවුන්ට ඉපදීමට සිදු වී තිබ්. මරණයට පත් වීමට සිදු වී තිබේ. චුත වීමට සිදු වී තිබේ. ආයෙමත් ඉපදීමට සිදු වී තිබේ. ජරා

sinhalaebooks.com



මරණයෙන් යුතු මේ දුකින් ලෝක සත්වයා නිදහස් වන්නේ කවදා ද?”

(ගෝතම සුත්තං – සං. නි. 2)

ඊනියා විද්‍යාත්මක ලෝකය ජීවත් වන අපට කොපමණ යාන වාහන තිබුණ ද, කොපමණ කෑම බීම වර්ග හා විටමින් වර්ග තිබුණ ද, කොපමණ බෙහෙත් වර්ග තිබුණ ද ජරාවට පත්වීම වැළැක්විය හැකි කිසිවෙක් නැත. මරණයේ අනතුරු වැඩිවීමක් මිසක් අඩුවීමක් නැත. කෘත්‍රිම පිළිවෙලකින් එයින් පැනගන්නට ක්‍රමයක් මොන ම ලෝකයකවත් නැත. ජීවිතයේ යථාර්ථයට අප මුහුණ දිය යුතු ම ය. බුදුරජාණන් වහන්සේ තුළ ඒ ගැන තිබුනේ ඉතා ම පැහැදිලි තේරුම් ගැනීමකි.

“ සැබැවින් ම මේ දිවිය ටික කලයි තිබෙන්නේ
වසර සියයකට පෙර බොහෝ අය මැරෙන්නේ
යන්තමින් ඊට වැඩි කලක් නම් ගෙවන්නේ
ජරාවෙන් දුකට පත්වෙලා ඔහු මැරෙන්නේ”

(ජරා සුත්ත – සුත්ත නිපාතය)

දේව නිර්මාණවාදී ආගම් මේ ප්‍රශ්නයෙන් ලිස්සා යන්නේ අන්ධ භක්තිකයන් ගේ ඇස්වලට තවත් වැලි අහුරක් ගසමිනි. මිනිසුන්ට පමණි ජරා මරණ තිබෙන්නේ. දෙවියන්ට ජරාමරණ නැත. දෙවියන් ගැන ඇදහීම ඇති තැනැත්තා පමණක් දෙවියන් අසල ජරා රහිතව මරණ රහිතව ඉපදෙනු ඇත! ඉපදීම තිබෙන තැන ජරා මරණ ස්ථිර වශයෙන්ම තිබෙන බව තේරුම් ගැනීමට තරම් ඤාණයක් ඔවුන්ට නැත. දෙවියන් ගේ ආයුෂ කල්පයක් තිබුණ ද දේවත්වයේ උපන් දා සිට ඒ දිව්‍ය ආයුෂ ද ගෙවී අවසන් වී යන බව ශ්‍රී සද්ධර්මයේ සඳහන් වේ. එසේ නම් ජරා මරණ යනු සමස්ත ලෝක සත්වයාව ම වෙළා ගත් යථාර්ථයකි.

sinhalaebooks.com



## සක් දෙව්ඳුටත් සම්බුදු සරණ!

එක්තරා අවස්ථාවක ශක්‍ර දෙවියන් බුදුරජුන් බැහැ දැක උන්වහන්සේ මහා කරුණාවෙන් පවසන ශ්‍රී සද්ධර්මයට සවන් දෙමින් සිටියේ ය. ඒ දෙසුම නිමාවෙද්දී සක් දෙවිඳු බුදුරජුන් ගේ සෝතාපන්න ශ්‍රාවකයෙක් බවට පත් විය. ඒ මොහොත වන විට සක් දෙවිඳුන් ගේ ආයුෂ සම්පූර්ණයෙන් ම අවසන් වී තිබුණි. "ආයුනෝ සංඛානි" ආයුෂ ගෙවී යාම අයිති වන්නේ ජරාවට ය. ජරාවට පත් සක් දෙවිඳු බුදු රජුන් ඉදිරියේ ම මරණයට පත් ව එතැන දී ම ඒ සැණින් යළිත් සක් දෙවිඳු ලෙස ඕපපාතිකව ඉපදුනි. තම ජීවිතය නරක පැත්තට නොවැටී යළිත් සුවපත්ව ආරක්‍ෂා වුනේ සෝතාපන්නව සිටි නිසා ය. ඒ ගැන අපමණ සතුටට පත් වූ සක් දෙවිඳු බුදුරජාණන් වහන්සේට ගාථාවෙකින් මෙ කරුණ පවසා සිටියේය.

"දුක් රහිත වූ මුනීන්‍ද්‍රයාණනි, දිව්‍ය ජීවිතයක් ගෙවන මා විසින් මෙහි ම සිටිය දී මෙහි දී ම දැන් චුත වී මෙහි දී ම ඉපදී යළිත් ආයුෂ ලබන ලදී."

(සක්කපඤ්හ සුත්තං – දී. නි. 02)

## දුකට හඬන කිඹුල් කඳුළු නැත!

"ජරාවට පත්වීම" යනුවෙන් බුදුරජාණන් වහන්සේ අදහස් කළ දෙය අප ද ඒ ආකාරයෙන් ම දැන ගත යුතු ය. නුවණින් තේරුම් ගත යුතු ය. එසේ නැත්තම් ජරා මරණ ගැන කථා කරන විට තැති ගනී. "අයියෝ, බුද්ධ ධර්මයේ කථා කරන්නේ දුක ගැනම නේ. සැප ගැන කථා නොකරන්නේ මන්දැ" යි කියමින් ශ්‍රී සද්ධර්මයට නින්දා කරයි. ඒ තැනැත්තාට නුවණින් විමසා තේරුම් ගැනීමේ හැකියාව නැත.

එහෙත් ශ්‍රී සද්ධර්මයේ දුක ගැන කථා කරන්නේ හඬ හඬා සිටින්නට නොවේ. "ජීවිතය දුකකි. ඒ ගැන අපට කළ හැකි දෙයක් නැත. දැන් ඉතින් දුක් විඳපල්ලා!" යයි කීවොත් එය මහා අසාධාරණ කථාවකි. එබඳු දෙයක් ඒකාන්තයෙන් ම බැහැර කළ යුතු ය.

sinhalaebooks.com



සමහර දේශපාලන ව්‍යාපාර ජනතාව රවටන්නේ ජනතාව ගේ දුක ගැන කථා කරමිනි. ඔවුන් වේදිකාවලට නැග ජනතාව කුසගින්නෙන් පෙළෙතැ'යි හඬා වැලපෙති. 'ජනතාවට කෑම බීම නැත. ගෙවල් දොරවල් නැත. රැකියා නැත. හොඳ පඩියක් නැත. ඒ නිසා ජනතාව පසුවන්නේ අනන්ත දුකින්. එහෙත් අපි බලයට පැමිණි පසු ඒ සියල්ල නැති කර දමා ප්‍රීතියෙන් කුල්මත් වූ ලෝකයක් පහළ කර දෙන්නෙමු'යි කියමින් ජනතාව රවටති. මුසා බස් දොඩති. අසරණ ජනතාව හැම දා ම ඔවුන් ගේ බොරු විශ්වාස කරති. හැම දා ම රැවටෙති. දේශපාලකයෝ ජනතාව ගසා කන්නේ දුක ගැන කථා කරමින් ය. දේශපාලකයින් කලක් තිස්සේ ජනතාව ගසා කමින් ජනතාවට නාස් ලණුව දමන බව තේරුම් ගන්නට බුද්ධියක් නැති උදවිය "බුද්ධ ධර්මයේ කථා කරන්නේ දුක ගැන පමණක් නේදැ" යි කියමින් දුකත්, දුකට හේතුවත්, ඒ හේතුව නැති කොට දුකින් නිදහස් වීමත්, ඒ සඳහා පැහැදිලි මගකුත් පෙන්වා තිබෙන ශ්‍රී සද්ධර්මයට නින්දා කරත්. එයින් පෙනෙන්නේ බුදුන් වදාළ ධර්මය ගැන අල්පමාත්‍ර දැනුමක් වත් ඔවුන්ට නැති බවයි. එහෙත් අවංකව ම සත්‍ය කුමක් දැ'යි අවබෝධ කර ගනු කැමති නුවණැති කෙනෙකුට ඒ සඳහා මුණ ගැසෙන්නේ ශ්‍රී සද්ධර්මය පමණි. ශ්‍රී සද්ධර්යෙන් ඉගැන්වෙන්නේ සත්‍යයක් ගැන ය. අකාලික වූ සත්‍යයක් ගැන ය. එම සත්‍යය ඉතා ම මිහිරි දෙයකි. සත්‍යවාදියාට සත්‍යය මිහිරි වේ. අසත්‍යය කටුක වේ. වංචනිකයාට සත්‍යය කටුක වේ. අසත්‍යය මිහිරි වේ. ලෝකයේ තිබෙන පරම පිවිතුරු මිහිරි සත්‍යය චතුරාර්ය සත්‍යයයි. එම සත්‍යය වනාහී අදටත් අවබෝධ කර ගත හැකි ජීවමාන ධර්මයකි!

## අකාලික සත්‍යය!

"ජරාව" යන වචනයේ තේරුම බුදුරජාණන් වහන්සේ විසින් ඉතා පැහැදිලි ලෙස අපට තේරුම් කර දෙන ලදී.

"ජරාව යනු කුමක් ද පින්වත් මහණෙනි, ඒ ඒ සත්ව ලෝකවල ජීවත් වන්නා වූ, ඒ ඒ සත්වයින් ගේ ජීවිතවල යම් ජරාජීර්ණ වීමක් තිබේ ද, ජරා ජීර්ණ වීමට පත්වන්නා වූ ස්වභාවයක් තිබේ ද, දත්

sinhalaebooks.com



ආදියේ කැඩී බිඳී වැටී යාමක් වේ ද, කෙස් ආදිය පැසී ඉදී වැටී යාමක් වේ ද, ඇඟේ පතේ රැළි වැටී හැකිළී එල්ලා වැටීමක් වේ ද, ආයුෂ පිරිහී අවසන් වීමක් වේ ද, ඇස් කන් ආදී ඉන්ද්‍රියයන් මෝරා ගොරෝසු බවට පත් වීමක් වේ ද, මෙයට යි “ජරාව” කියා කියන්නේ”

(විභංග සුත්ත. සං. නි. 2)

මේ දහම් කොටසින් විස්තර වන්නේ ජීවිතයක් මුහුණ දිය යුතු ඒකාන්ත සත්‍යයකි. ඔය සත්‍යය අපට නම් අදාළ නැතැයි කිසිවෙකුටත් අවංකව පැවසිය නොහැකි ය. මේ ජරා දුක සමස්ත සත්ව ලෝකය පුරා ම වෙනසක් නොමැතිව දකින්නට ලැබෙන සත්‍යය කි. කාලයකට පමණක් වලංගු නොවන අකාලික සත්‍යය කි. ජරාව යනු සැපක් නොව දුකක් ම බව නුවණින් විමසා බලන කෙනෙකුට පැහැදිලි ව දැක්ක හැකි සත්‍යය කි.

## ජරා මරණ! ජරා මරණ!

ජරාවට පත්වන ජීවිතය මරණයෙන් නිමා වේ. අවිද්‍යාවෙන් වැසුණු සිත් ඇති උදවිය සිතන්නේ මරණය යනු සුන්දර දෙයක් බව ය. ඔවුන් ගේ අවිද්‍යාවේ තරම එයින් සිතා ගත හැකි ය. සමහරුන් මිනිස් ජීවිතයෙන් සමුගෙන මරණයට පත් වෙන්නට ඉතා කැමති ය. ඒ නොපෙනෙන ලෝකයේ සිටින තමන් ගේ නෑදැයන් මුණ ගැසෙන්නට ය. මේ මිථ්‍යා දෘෂ්ටියෙන් ඔවුන්ට නිදහස් විය හැකි වන්නේ මරණයේත් ඉපදීමේත් යථාර්ථය ශ්‍රී සද්ධර්මය තුළින් සැබෑ ලෙස දැන ගන්නට ලැබුණු දවසට ය. බුදුරජාණන් වහන්සේ අපට වදාළේ මරණයත් ඉපදීමත් දෙකම අවබෝධ කළ යුතු “දුක” නම් වූ ආර්ය සත්‍යයට අයිති බවයි. උන්වහන්සේ පවසා සිටියේ සියලු සත්වයෝ මරණයට බියපත් වන බවයි. (සබ්බේ භායන්ති මච්චුනෝ). සංසාරගත සත්වයා ගේ මරණය දුක් සහිත බව උන්වහන්සේ හොඳින් ම දන්නා සේක.

මරණය ඉදිරියේ සත්වයා ජීවිතය ඉල්ලා හඬා වැටේ. අන්ත අසරණ භාවයට පත් වේ. උන්වහන්සේ මරණ දුක ගැන අපට විස්තර

sinhalaebooks.com



වශයෙන් කියා දුන් සේක.

"පින්වත් මහණෙනි, මරණය යනු කුමක් ද? ඒ ඒ සත්ව ලෝකවල ජීවත් වන්නා වූ, ඒ ඒ සත්වයින් ගේ ජීවිතවලින් යම් චුත වීමක් වේ ද, චුත වී යන ස්වභාවයක් වේ ද, ජීවිතයේ බිඳී යන ස්වභාවයක් වේ ද, (ජීවිතය නොපෙනී ගොස්) අතුරුදහන් වීමක් වේ ද, මරණයට පත් වීමක් වේ ද, කලුරිය කිරීමක් වේ ද, රූප – වේදනා – සඤ්ඤා – සංඛාර – විඤ්ඤාණ යන ස්කන්ධයන් ගේ බිඳී යාමක් වේ ද, ශරීරය අත් හැර දැමීමක් වේ ද, මෙයට ය මරණය කියා කියන්නේ.

(විභංග සූත්ත – සං. නි. 2)

## "මම"ත් මැරෙයි!

මරණයට පත් වන ජීවිතයක් ගෙවන අප කවුරුත් කළ යුත්තේ ජීවිතය අවබෝධ කර ගැනීම ම ය. මම, මම කියමින් හැමදාම කල් ගෙව්වොත් මරණයෙන් පෙළෙමින් සංසාරයේ ම ගත කරන්නට සිදු වේ. එනිසා බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

" සිතා සිටිය ද කෙනෙක් මම මගේ යයි කියා
මරණයෙ දි ඒ කෙනා එයම දාලා ගියා
නැණවතුන් මේ කරුණ හොඳින් හිත තුළ තියා
කිසි දිනෙක නොම ඇලේ මම ය මාගේ කියා "

(ජරා සූත්ත – සුත්ත නිපාතය)

"මරණය" යනු ජීවිතයේ තීරණාත්මක වූත් මූසල වූත් භයානක වූත් අත්දැකීමක් බවට පත් වන්නේ අධාර්මිකව ජීවිත ගෙවන අයට ය. අප කොතරම් සැඟවී පළා යන්නට වෙර දැරුවත් මරණයෙන් නම් ගැලවීමක් නොමැත. ජීවත් වීම මහා වධයක් වන අවස්ථා අපට උදාවෙයි. එවිට අපට සිතෙන්නේ මැරිලා ගියා නම් මේ ඔක්කොම වධ වේදනා අවසන් වී යයි කියා ය. එහෙත් මරණය මුණ ගැසුන විට සිතෙන්නේ, 'අනේ! තව මොහොතක් හෝ ජීවත් වෙන්නට ඇත්නම් කොතරම් හොඳ දැ'යි කියා ය. සැබවින් ම අපට

sinhalaebooks.com



ජීවිතය ලැබී තිබෙන්නේ ඉතා ම සුළු කාලයකට ය. ජීවිතයත් සමඟ ම අත්වැල් බැඳ ගෙන තිබෙන්නේ මරණය යි. එය අපට අවබෝධ කර ගත හැක්කේ මෙවැනි දෙසුමන් නුවණින් සලකන විට ය.

## මරණීය ලෝකය!

"පින්වත් මහණෙනි, මැරී යන ස්වභාවයට ය (ධර්මතාවයට ය) මේ සියල්ල අයත් වන්නේ. මැරී යන ස්වභාවයට අයිති වූ සියල්ල නම් කුමක් ද ?"

"පින්වත් මහණෙනි, 'ඇස' යනු මැරී යන ස්වභාවයට අයිති දෙයකි. 'ඇසට පෙනෙන රූප' යනු මැරී යන ස්වභාවයට අයිති දෙයකි. 'ඇසේ හටගන්නා විඤ්ඤාණය' යනු මැරී යන ස්වභාවයට අයිති දෙයකි. 'ඇසත් – රූපත් – විඤ්ඤාණයත් එක්වීම නම් වූ ඇසේ ස්පර්ශය' යනු මැරී යන ස්වභාවයට අයිති දෙයකි. ඇසේ ස්පර්ශයෙන් හටගන්නා වූ යම් සැපක් හෝ දුකක් හෝ සැපදුක් රහිත බවක් හෝ විඳීමෙන් දත යුතු වේ ද, එයත් මැරී යන ස්වභාවයට අයිති දෙයකි."

(මරණධම්ම සුත්ත – සං. නි. 4)

මෙය ඇසට පමණක් අදාළ ධර්මතාවක් නොවේ. කණට ද, නාසයට ද, දිවට ද, කය ට ද, මනසට ද අදාළ වන්නේ මෙම ධර්මතාව ම ය. ලෝකයේ යම් තාක් ඇස් තිබේ ද, ඒ සියල්ල ම මැරී යන ස්වභාවයට අයිති වේ. ලෝකයේ යම්තාක් කන්, නාසා, දිව, කය, හා මනස් තිබේ ද, ඒ සියල්ල ම මැරී යන ස්වභාවයට අයිති වේ. එමෙන් ම ලෝකයේ යම්තාක් රූප, ශබ්ද, ගන්ධ, රස, පහස හා මනස්වල ඇතිවන අරමුණු වේ ද ඒ සියල්ල මැරී යන ස්වභාවයට අයිති වේ. එමෙන් ම ලෝකයේ යම්තාක් ඇසේ ස්පර්ශ, කනේ ස්පර්ශ, නාසයේ ස්පර්ශ, දිවේ ස්පර්ශ, කයේ ස්පර්ශ, මනසේ ස්පර්ශ වෙ ද, ඒ සියල්ල ම මැරී යන ස්වභාවයට අයිති වේ. එමෙන් ම ඒ ඒ ස්පර්ශයන් ගෙන් හටගත්තා වූ ඒ ඒ සැප හෝ දුක් හෝ දුක්සැප රහිත වූ හෝ විඳින්නා වූ යමක් ඇත් ද, ඒ සියල්ල ම මැරී යන ස්වභාවයට අයිති වේ.

එහෙත් මැරී යන ස්වභාවයට අයිති මේ දේවල් එසේ

sinhalaebooks.com



නොවේවා! කියමින් සත්වයෝ නොමැරී පවත්වන්නට කැමැති වෙති. එය පවා අයත් වන්නේ දුකට යි.

## කැමති නමුත් නොලැබේ!

"පින්වත් මහණෙනි, තමා කැමැති දේ නොලැබීමේ දුක කුමක් ද ?"

මැරී යන ස්වභාවයට අයිති වන සත්වයන් හට මේ ආකාරයේ ආශාවක් හටගනී.

"අනේ අපි මැරී යන ස්වභාවයට අයත් නොවෙමු නම්! ඒකාන්තයෙන් ම මරණය අප වෙත නො එන්නේ නම්!" මෙය වනාහී කැමති දේ නොලැබීමේ දුකයි.

(මහාසතිපට්ඨාන සූත්ත – දී. නි. 2)

## අසත්‍යයක් ද මෙය...?

මෙසේ ජරා මරණ ඉදිරියේ සත්වයින්ගේ හඬා වැළපීම, සෝ සුසුම් හෙළීම ගැන පැවසීම අසත්‍යයක් ද?

උපන් සත්වයාට ජරා මරණ උරුම වී තිබීම ඒකාන්තයෙන් ම දුක්ඛිත වූ ඉරණමකි. ජරා මරණයන් ගේ යථා ස්වභාවය අවබෝධ කර ගත නොහැකි සියලු දෙනා අන්ත අසරණ භාවයට පත් වූහ. කිසියම් බලසම්පන්න මැවුම්කාර දෙවි කෙනෙකු ගේ කැමැත්තෙන් සිදුවන දෙයක් වශයෙන් සිතා ගත් අය ජරා මරණයෙන් තමන් ව මුදා ගන්නැ'යි අපේක්ෂා සහිතව දෙවියන් ගෙන් ඉල්ලා සිටියහ. සමහරුන් සිතා සිටියේ අභ්‍යාවකාශයේ සැරිසරන යම් යම් ග්‍රහ වස්තූන් ගෙන් ඇති වෙන බලපෑම අනුව ජරා මරණ සිදුවෙන බවත්, ඒ බලපෑම වළක්වන්නට යම් යම් පුද පූජා කළ විට ජරා මරණයෙන් නිදහස් විය හැකි බවත් ය. සමහරුන් පැවසුවේ මේ වනාහී සොබා දහම ය. සොබා දහමේ නියමයන්ට ඉඩ දීම පමණි අපට කළ හැක්කේ, වශයෙන් ය. සමහරුන් පැවසුවේ මේ වනාහී කර්මය යි. සියල්ල සිදු වන්නේ කර්මයට අනුව ය. ඒ නිසා අපට ඒ ගැන කළ හැකි දෙයක් නැත.

sinhalaebooks.com



## හේතුව විමසමු!

එහෙත් අසිරිමත් ප්‍රඥාවකින් යුක්ත වූ අප ගේ ශාස්තෘන් වහන්සේ ජරා මරණ ගැන දැරුවේ මීට හාත්පසින් ම වෙනස් මතයකි. උන්වහන්සේ පළමුවෙන්ම කළේ ජරා මරණයන් අයිති දේවල්වල තිබෙන සැබෑ තත්වය විමසීමයි. එසේ විමසීමේ දී උන්වහන්සේට අවබෝධ වූයේ අනිත්‍යභාවය නිසා ම මේ ජරා මරණ සකස් වෙන බවයි. අනිත්‍ය වූ යමක් හටගන්නේ ද එම හේතුව නිසාම ජරාවටත් මරණයටත් පත් වන්නේ ම ය. මෙසේ නුවණින් විමසන විට ඒ ප්‍රශ්නය සදහට ම විසඳී ගියේ ය.

## මරණයේ හේතුව ඉපදීම වේ.

එනම්,

“ඉපදීම තිබෙන කල්හි ජරා, මරණ තිබෙන්නේ ම ය. ඉපදීම හේතු කොට ගෙන ය ජරා, මරණ හටගන්නේ”

(ගෝතම සුත්ත – සං. නි. 2)

“ඉපදීම” යන වචනය පවා උන්වහන්සේ අපට විස්තර වශයෙන් කියා දුන් සේක.

“පින්වත් මහණෙනි, ඉපදීම යයි කියන්නේ කුමක් ද ?”

“ඒ ඒ සත්ව ලෝකවල, ඒ ඒ සත්වයින් ගේ යම් ඉපදීමක් වේ ද, යම් හට ගැනීමක් වේ ද, යම් බැස ගැනීමක් වේ ද, යම් පහළ වීමක් වේ ද, විශේෂයෙන් ඉපදීමක් වේ ද, රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංච උපාදානස්කන්ධයා ගේ යම් පහළ වීමක් වේ ද, ඇස, කණ, නාසය, දිව, කය, මනස යන ආයතනයන් ගේ ලැබීමක් වේ ද, මෙයට ය ඉපදීම කියා කියන්නේ.”

(විභංග සුත්ත – සං. නි. 2)

sinhalaebooks.com



## දුකත් සමඟ අත්වැල් බැඳ...!

ඉපදීමත් සමඟ දුකත් ඉපදෙන බව බුදු රජාණන් වහන්සේ ඉතාම පැහැදිලි ලෙස මෙසේ වදාළ සේක.

"පින්වත් මහණෙනි, රූපයේ, වේදනාවේ, සඤ්ඤාවේ, සංස්කාරයන් ගේ විඤ්ඤාණයේ යම් ඉපදීමක්, යම් පැවැත්මක්, යම් විශේෂ උපතක්, යම් පහළවීමක් වේ ද, එය වනාහී දුකෙහි ඉපදීම වේ. එය වනාහී රෝගයන් ගේ පැවැත්ම වේ. එය වනාහී ජරා මරණයේ පහළවීම වේ."

(උප්පාද සුත්ත – සං. නි. 3)

ජරා මරණයට පත් වන්නේ ඉපදුන දෙයක් ම ය. හටගත් දෙයක් ම ය. යමක හට ගැනීමක් නැති නම් ජරා මරණයක් නැත. යමක හට ගැනීමක් තිබේ නම් ජරා මරණයන් තිබේ ම ය. ජරා මරණයන්ට හේතුව "ඉපදීම" බව බුදුරජාණන් වහන්සේ අවබෝධ කර ගත්තේ යෝනිසෝ මනසිකාරය තුළින් ය.

## ඉපදීම යනු අහඹු සිදුවීමක් ද?

ඉපදීම යනු අනපේක්ෂිතව සිදුවන අහඹු සිද්ධියක් නොවේ. සුළුවෙන් සලකා බැහැර කළ යුතු දෙයක් ද නොවේ. ජීවිත දෙකක් ජීව විද්‍යානුකූල සංසර්ගයක් ඇති කර ගැනීම නිසා පමණක් ඇති වූ දෙයක් ද නොවේ. දේව කැමැත්තකට අනුව මව් කුසකට "ආත්මයක්" රිංගවීමෙන් ඇති වූ දෙයක් ද නොවේ. ඉබේ හටගත් දෙයක් ද නොවේ.

"ඉපදීම" යනු සමස්ත සත්ව සංහතියේ ම ශෝචනීය කථාන්දරයයි. ලෝකය තුළ විවිධාකාරයෙන් සත්වයන් බිහිවන බව අවබෝධ ඤාණයෙන් දැන ගත්තේ බුදුරජාණන් වහන්සේ පමණි. සත්වයන් ගේ බිහිවීම ආකාර සතරකින් සිදුවන බව උන්වහන්සේ අපට පැවසූ සේක. උන්වහන්සේ ඒ ආකාර සතර අපට හඳුන්වා දුන්නේ "යෝනි" වශයෙනි. මෙතැන දී "යෝනි" යන වචනයේ තේරුම "උපතකට මුල් වන දෙය" යන්න ය.

sinhalaebooks.com



## උපදින ආකාර සතරකි.

"යෝනි" හෙවත් උපතකට මුල් වන දේවල් සතරක් තිබේ. එනම් අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික වශයෙනි.

(සංගීති සුත්ත – දී. නි. 3)

1. **අණ්ඩජ** :- මෙයින් අදහස් කරන්නේ බිත්තරයක් තුළ සකස් වූ සත්වයෙකු ගේ බිහිවීම ය. බිත්තරයක් තුළ ඉපදීම සකස් වන අනන්ත සත්ව සංඛ්‍යාවක් සිටිති. එනම් කුකුළන්, කුරුල්ලන්, කෘමීන්, මකුළුවන්, කබරයන්, තලගොයින්, කිඹුලන්, සර්පයන්, මාළුන් ආදී සතුන් බිහිවීමට සකස් වෙන්නේ බිත්තර ඇතුලේ ය.
2. **ජලාබුජ** :- මෙයින් අදහස් කරන්නේ මාතෘ ගර්භාෂයක් තුළ කළලයක් සකස් වී එය වර්ධනය වී සත්වයෙකු බිහිවීම ය. මව් කුසවල් තිබෙන්නේ මනුෂ්‍යයන්ට පමණක් නොවේ. ගවයින්, එළුවන්, සුනඛයින්, බළලුන්, ඌරන්, කොටළුවන්, අශ්වයින්, අලියන්, සිංහයින්, මුවන් ආදී අනන්ත තිරිසන් සතුන් ගේ උපත ද මාතෘ ගර්භාෂයකින් සකස් වේ.
3. **සංසේදජ** :- තෙත් පරිසරයක, කුණු මසක, පල් වූ වතුර තිබෙන තැනක යම් සත්වයෙකු ගේ උපත සකස් වේ නම්, ඔවුන් අයත් වන්නේ සංසේදජ ගණයට ය. පණුවන් මදුරුවන් ආදී සතුන්ට තිබෙන්නේ සංසේදජ උපතයි.
4. **ඕපපාතික** :- ඕපපාතික උපතක් සිදුවන ආකාරය දැක ගත හැක්කේ සත්වයන් ගේ චුත වීමත් ඉපදීමත් ගැන "චුතූපපාත ඤාණය" උපදවා ගත් කෙනෙකුට පමණි. දැනට මිනිසා විසින් භෞතිකව නිර්මාණය කර ගෙන තිබෙන විද්‍යාත්මක උපකරණවලට ඕපපාතික උපතක් දැක ගැනීමේ හැකියාවක් නැත. ඕපපාතික උපත පිළිබඳව අපට බොහෝ ප්‍රශ්න පැන නගින්නේ එය අපට ඇස් දෙකින් දැක ගත නොහැකි නිසා ය.

   ඕපපාතික උපතක් යනු බිත්තරයකින් ඉපදීම නොවේ. මව්

sinhalaebooks.com



කුසකින් ඉපදීම නොවේ. තෙත් පරිසරයකින් ඉපදීම ද නොවේ. චිත්‍රපට රාමුවක පින්තූරයක් මැවෙන්නා සේ අංග සම්පූර්ණ උපතක් කර්මානුරූපව පහළවීම යි.

ඒ ආකාරයේ ඕපපාතික උපත් හිමිවන්නේ කවර සත්වයින්ට දැ'යි බුදුරජාණන් වහන්සේ අපට පවසා තිබේ. එනම් දෙවියන්, බ්‍රහ්මයින්, ප්‍රේතයින් හා නිරිසතුන් ය. ඇතැම් මිනිසුන් ද ඕපපාතිකව ඉපදෙන බව දක්වා තිබේ.

## වාදයේ අවාසිය!

සමහරුන් මිනිසුන් ගේ ඕපපාතික උපත ගැන වාද කිරීම තමන් ගේ ජීවිතයේ බරපතළ ගැටළුව බවට පත් කර ගත්හ. ඒ ගැන ඔවුහු නොයෙක් නොයෙක් තර්ක ගොඩ නගන්නට පටන් ගත්හ. ඉන්පසු ඔවුහු ඒ ගැන වාද විවාද කරන්නට පටන් ගත්හ. ඒ වාදයන් නිසා ඉපදීම දුකක් බව අවබෝධ කරගන්නට ඔවුන් අසමත් වීම එහි ප්‍රතිඵලය විය. එය මහත් අවාසනාවකි!

මහානිදාන සූත්‍රයේ දී අපගේ ශාස්තෘන් වහන්සේ වදාළ කරුණක් තර්කානුකූලව ඕපපාතික උපතකට ගළපන්නට යි ඔවුන් මහන්සි ගෙන තිබෙන්නේ. විඤ්ඤාණයක් මව් කුසක බැස ගෙන තිබී පසුව ඒ විඤ්ඤාණය ඉවත් වෙයි. එවිට වෙන විඤ්ඤාණයක් මව් කුසට අතුළු වෙයි. ඕපපාතික මිනිසුන් ගේ උපත එය බවට තර්ක ගලපන ඇතැම් ශාසන භ්‍රෂ්ටයෝ ද සිටිති.

## ඉඩ දෙන්න සැදැහවත් බුද්ධියට!

සීමාසහිත අත්දැකීම් රාමුවක සිටිනා අප විසින් ශ්‍රී සද්ධර්මය අවබෝධ කරන එක ම උපකරණය තර්කය නොවන බව තේරුම් ගත යුතුයි. තර්කය යනු අසත්‍යය සත්‍ය වශයෙන් ද පෙන්විය හැකි සත්‍ය අසත්‍ය වශයෙන් ද පෙන්විය හැකි එක්තරා ආයුධයකි. යෝනිසෝ මනසිකාරය යනු තර්කය නොවේ. ශ්‍රද්ධාව මුල් කරගත් වීමංසන බුද්ධිය යි. ශ්‍රී සද්ධර්මය අවබෝධයෙන් ම දේශනා කළේ සාමාන්‍ය මනුෂ්‍යයෙක් නොවේ. සම්මා සම්බුද්ධත්වයට පත් උත්තරීතර මනුෂ්‍ය

sinhalaebooks.com



රත්නයකි! සර්ව සම්පූර්ණ ඥාණයෙකින් හෙබි මුනිවරයෙකි! ඕපපාතික උපතක් තිබෙන නිරය ගැනත්, දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝක ගැනත් බොහෝ විස්තර භාග්‍යවතුන් වහන්සේ අපට කියා දී තිබේ. ඇතැම් නාගයින්ට මෙන් ම ගුරුළන්ට ද ඕපපාතික උපත් තිබෙන බවයි උන්වහන්සේ පවසා සිටියේ. එම නිසා සාමාන්‍යයෙන් මනුෂ්‍යයෙක් මැරුණ සැණින් කුමන උපතක් ලබන්නේ දැ'යි එක එල්ලේ ම අපට කිව නොහැකි ය.

## වැරදුණොත් අනතුරේ!

සමහර විට කෙනෙක් චුත වන විට ම අණ්ඩජ උපතක් කරා යා හැකි ය. එසේ නැති නම් ජලාබුජ උපතක් කරා යා හැකි ය. නැතිනම් සංසේදජව හෝ එසේත් නැති නම් ඕපපාතිකව හෝ උපතක් ලැබෙන්නේ ම ය. මව් කුසක සත්වයෙක් පිළිසිඳ ගැනීම ගැන භාග්‍යවතුන් වහන්සේ මෙසේ පෙන්වා දී තිබේ.

"පින්වත් මහණෙන්, කරුණු තුනක් එකතු වීමෙන් ගැබ් ගැනීම සිදු වේ."

මෙකරුණෙහි ලා මව්පියන් එකතු වූයේ නමුත් මව් ද ඔසප් නොවන කෙනෙක් වෙයි නම්, ගන්ධබ්බයා ද නොපැමිණියේ නම් ඒ තාක් මව් කුසක ගැබ් ගැනීමක් නොවන්නේ ය.

මෙ කරුණෙහි ලා මව් පියන් එකතු වූයේ නමුත් මව් ඔසප් වන තැනැත්තියක් ද වන නමුත් ගන්ධබ්බයා නො පැමිණියේ නම්, ඒ තාක් මව් කුසක ගැබ් ගැනීමක් නොවන්නේ ය.

## මව් කුසක උපතකට

එහෙත් පින්වත් මහණෙනි,

යම් කලෙක මව්පියන් ගේ එකතු වීමකුත් වූයේ වේ ද, එම මවත් ඔසප් වන තැනැත්තියක් වන්නී වේ ද, ගන්ධබ්බයා ද පැමිණියේ වේ ද මේ කරුණු තුන එකතු වීමෙන් මව් කුසක ගැබ් ගැනීම සිදු වේ.

(මහාතණ්හා සංඛය සූත්ත – ම. නි. 01)

sinhalaebooks.com



## මව්කුසේ ඉපදීම ආකාර සතරකින්

එමෙන්ම මව් කුසක ගැබ් ගැනීම ආකාර සතරකින් සිදුවන බව ශ්‍රී සද්ධර්මයේ සඳහන්ව තිබේ.

I. “පින්වත් ආයුෂ්මතුනි, මෙ කරුණෙහි ලා ඇතැම් කෙනෙක් කිසිවක් නොදැන ම මව් කුසේ බැස ගනී. කිසිවක් නොදැන ම මව් කුසේ සිටී. කිසිවක් නොදැන ම මව් කුසින් බිහි වෙයි.

II. මෙ කරුණෙහිලා ඇතැම් කෙනෙක් දැනගෙන මව් කුසේ බැස ගනී. කිසිවක් නො දැන මව් කුසේ සිටී. කිසිවක් නොදැන මව් කුසින් බිහිවෙයි.

III. මෙ කරුණෙහිලා ඇතැම් කෙනෙක් දැනගෙන මව් කුසේ බැසගනී. දැන ගෙන මව් කුසේ සිටී. එහෙත් කිසිවක් නො දැන මව් කුසින් බිහිවෙයි.

IV. මෙ කරුණෙහිලා ඇතැම් කෙනෙක් දැනගෙන මව් කුසේ බැස ගනී. දැන ගෙන මව් කුසේ සිටී. එමෙන් ම දැනගෙන මව් කුසින් බිහිවෙයි.”

(සංගීති සුත්ත – දී. නි. 3)

අවිද්‍යාවෙන් වැසී ගිය තෘෂ්ණාවෙන් බැඳී ගිය විඥ්ඤාණයක පූර්ණ ක්‍රියාකාරිත්වයක් තුළින් ය, උපතක් සකස් වන්නේ. ඒ කෙලෙස් සහිත විඥ්ඤාණය නාම-රූප සමඟ අන්‍යොන්‍ය උපකාරයෙන් ඉපදීම සකස් වෙන බව අවබෝධ කරගෙන සිටියේ බුදුරජාණන් වහන්සේ පමණි. විඥ්ඤාණයේ ක්‍රියාකාරීත්වය අවබෝධ කළ නිසාම ය උන්වහන්සේට මේ රහස් සොයා ගත හැකි වූයේ.

විඥ්ඤාණයත් නාම-රූපත් ඔවුනොවුන්ට උපකාරීව පවතින ආකාරය පැහැදිලි කිරීමට උන්වහන්සේ මෙසේ වදාළහ.

## මව්කුසේ ඉපදීම

“පින්වත් ආනන්ද, විඥ්ඤාණයක් මව් කුසකට නොබැස ගන්නේ නම් මව් කුසක නාම-රූපයක් සකස් වන්නේ ද?”

sinhalaebooks.com



"ස්වාමීනි, එය නොවන්නේ ම ය"

"පින්වත් ආනන්ද, මව් කුසකට බැස ගත් විඤ්ඤාණය යළි බැහැරට යන්නේ නම් ජීවිතයක් බිහි වීම පිණිස නාම-රූප සකස් වන්නේ ද ?"

"ස්වාමීනි, එය නොවන්නේ ය"

(මෙයින් අදහස් වන්නේ මව් කුසේ දී දරුවා මරණයට පත් වීම ගැනයි. සමහර අවස්ථාවල දී මව් කුසේ මාසෙන් දෙකෙන් දරුවන් මිය යති. සමහර අවස්ථාවල දී ගබ්සා කෙරේ. එවිට මව් කුසේ බැසගත් විඤ්ඤාණය බැහැර වෙයි. එවිට දරුවෙක් බිහි නොවේ.)

"පින්වත් ආනන්ද, ඉතා ළදරු වියේ ගත කරන්නා වූ දරුවෙකු ගේ හෝ දැරියක ගේ විඤ්ඤාණය සිඳී ගියොත්, නාම-රූප වැඩීමක් හෝ විශේෂ වැඩීමක් හෝ මහත් බවට පත් වීමක් හෝ වන්නේ ද?"

"ස්වාමීනි, එය නොවන්නේ ය"

"එහෙයින් පින්වත් ආනන්දය, මෙය ම ය හේතුව. මෙය ම ය මූලික කාරණය, මෙය ම ය හට ගැනීම, මෙය ම ය නාම-රූපයට උපකාර වන ධර්මය. එනම් විඤ්ඤාණයයි"

(මහානිදාන සූත්ත – දී. නි. 02)

## විඤ්ඤාණ + නාමරූප + නාමරූප + විඤ්ඤාණ

නාමරූපයට විඤ්ඤාණය උපකාර වන්නේ යම් ආකාරයෙන් ද ඒ ආකාරයෙන් ම විඤ්ඤාණයටත් නාම-රූප උපකාර වේ යයි බුදුරජාණන් වහන්සේ මේ ආකාරයෙන් පෙන්වා දුන් සේක.

"පින්වත් ආනන්ද, විඤ්ඤාණයේ පැවැත්මට නාම-රූප ද උපකාර වන ධර්මයක් බව මෙසේ තේරුම් ගන්න.

පින්වත් ආනන්ද, නාම-රූපයේ පිහිටක් විඤ්ඤාණයේ පැවැත්මට නො ලැබෙන්නේ නම් ඉපදීමක්, ජරාජීර්ණ වීමක්, මරණයක්, දුක් දොම්නස්වල සකස් වීමක් හටගනී ද?"

"ස්වාමීනි, එය නොවන්නේ ය"

sinhalaebooks.com



"එහෙයින් පින්වත් ආනන්ද, මෙය ම ය හේතුව, මෙය ම ය මූලික කාරණය, මෙය ම ය විඤ්ඤාණයට උපකාරක ධර්මය. එනම් නාම-රූපය යි."

## මෙ පමණකින් ඉපදේ!

"පින්වත් ආනන්ද, මෙ පමණෙකින් උපදින්නේ ද වේ. දිරන්නේ ද වේ. මිය යන්නේ ද වේ. චුත වන්නේ ද වේ. යළිත් උපදින්නේ ද වේ. මෙ පමණකින් ම නම් ගොත් පවසන්නේ ද වේ. මෙ පමණකින් ම විස්තර කරන්නේ ද වේ. මෙ පමණකින් ම දැනීම ලබන්නේ ද වේ. මෙ පමණකින් ම ප්‍රඥාවේ හැසිරීම ද වේ. මෙ පමණකින් ම සංසාරය පවතින්නේ ද වේ. මෙ පමණකින් ම ජීවිත ගැන කතාබහ පවතින්නේ ද වේ. එනම් මේ නාම-රූපය විඤ්ඤාණය සමඟ එක්ව ඔවුනොවුන්ගේ උපකාරක ධර්මයන් ලෙස පවතින තාක් ය."

(මහානිදාන සූත්‍ර – දී. නි. 02)

සම්මා සම්බුදුරජාණන් වහන්සේලා තමන් වහන්සේලා ගේ මේ ආර්ය පර්යේෂණයන් ඔස්සේ විස්මිත අවබොධය පහළ කර ගන්නා ආකාරය මෙවැනි දෙසුම් තුළින් අපට ද යාන්තමින් තේරුම් ගත හැකි ය. නාම-රූප විඤ්ඤාණය හා එක්ව අන්‍යොන්‍ය සහයෝගයෙන් සාංසාරික දුක සකස් කරවන මේ අද්භූත රහස ලොව පහළ වූ වෙනත් කිසිම විද්‍යාවකට තව ම හසුකර ගත නොහැකි විය. බුදුරජාණන් වහන්සේ තුළ පැවතියේ කොතරම් ප්‍රත්‍යක්ෂ අවබෝධයක් දැ'යි අපට වටහා ගත හැකි වන්නේ මෙවැනි දේශනාවන් දැන ගන්නා විට ය.

## විඤ්ඤාණයට තිබෙන්නේ එකම ඉලක්කයයි!

"මේ විඤ්ඤාණය හැරී පවතින්නේ එකම පැත්තකට ය. නාම-රූපයෙන් බැහැරට නොයන්නේ ම ය. මෙපමණෙකින් උපදින්නේ හෝ වේ. දිරන්නේ හෝ වේ. චුත වන්නේ හෝ වේ. යළි උපදින්නේ හෝ වේ. එනම් නාම-රූප හේතුකොට ගෙන විඤ්ඤාණය පැවතීම ය.

sinhalaebooks.com



විඤ්ඤාණය හේතු කොට ගෙන නාම-රූප පැවතීම ය.”

(මහාපදාන සුත්තං – දී. නි. 02)

## නොදැන යන ගමන

මේ ධර්මය පිළිබඳ ව නුවණින් විමසන විට එක දෙයක් ඉතා හොඳින් පැහැදිලි වේ. සාමාන්‍ය මනුෂ්‍යා ගේ ඉපදීම යනු සාංසාරික ජීවිතයේ බරපතළ සකස් වීමකි. එහෙත් ඔහු ඉපදීමකට හේතු වූ අභ්‍යන්තරික පසුබිම කිසිසේත් නොදනී. හේතු - ඵල දහමක ක්‍රියාකාරිත්වයක් තුළින් ඉපදීම සිදුවෙන බව ඔහු නොදනී. බොහෝ විට ඔහුට ඉගෙන ගන්නට ලැබෙන්නේ සම්පූර්ණයෙන් ම අසත්‍යයකි. එනම් ලෝක නිර්මාපක දෙවි කෙනෙකු ගේ කැමැත්තට ඔහු ගේ ඉපදීම සිදුවී ඇති බවයි. එවිට ඔහු එය අන්ධ භක්තියෙන් අදහා ගෙන ඒ මැවුම්කාර දෙවියන්ට ස්තුති කරන්නට පටන් ගනී. තමන් ගේ දෛනික අවශ්‍යතා සපුරා දෙන්නැ’යි ඉල්ලන්නට පටන් ගනී. ඒ නිසා දේවවාදී ආගම්වල තිබෙන්නේ ස්තුති කිරීමත් ඉල්ලීමත් පමණි.

භෞතිකවාදී චින්තනයක් තිබෙන කෙනා සිතන්නේ ඊට හාත්පසින් වෙනස් විධියකට ය. ඔහුට “ඉපදීම” යනු දෙමාපිය සංසර්ගයෙන් හටගත් ජීව විද්‍යාත්මක ප්‍රතිඵලයක් පමණි. “ඉපදීම” නම් වූ සිදුවීමේ යථාර්ථය නොදැන හුදෙක් තර්කානුකූලව ගොඩ නගාගත් මතවාදයන් පමණි ඒවා.

“ඉපදීම” නම් වූ සිදුවීමට අයිති දේවල් ගැන බුදුරජාණන් වහන්සේ ඉතා ම පැහැදිලි ලෙස පවසා සිටියහ.

## දැනගත යුතුම දෙය!

“පින්වත් මහණෙනි, ඉපදීම නම් වූ ධර්මතාවයට අයිති වූ සියලු දේ මොනවා ද?

පින්වත් මහණෙනි, ඇස ඉපදෙන ධර්මතාවට අයිති දෙයකි. ඇසට පෙනෙන රූප ඉපදෙන ධර්මතාවට අයිති දේවල් ය. ඇසේ හටගන්නා වූ විඤ්ඤාණය ඉපදෙන ධර්මතාවට අයිති වූ දෙයකි. ඇසත්

sinhalaebooks.com



– රූපත් – චක්ඛු විඤ්ඤාණයත් එකතු වීම නම් වූ ඇසේ ස්පර්ශය ඉපදෙන ධර්මතාවට අයිති වූ දෙයකි. ඇසේ ස්පර්ශයෙන් හටගන්නා වූ සැප හෝ දුක් හෝ සැපදුක් රහිත හෝ විඳින්නා වූ යමක් ඇත් ද එයත් ඉපදෙන ධර්මතාවට අයිති දෙයකි.

කණ, නාසය, දිව, කය, මනස ඉපදෙන ධර්මතාවට අයිති දෙයකි. මනසට ඇති වන අරමුණු ද ඉපදෙන ධර්මතාවට අයිති දෙයකි. මනසේ හටගන්නා වූ විඤ්ඤාණය ඉපදෙන ධර්මතාවට අයිති දෙයකි. මනසත් – මනසට ඇති වන අරමුණුත් – මනෝ විඤ්ඤාණයත් යන තුනේ එකතු වීම නම් වූ ස්පර්ශයත් ඉපදෙන ධර්මතාවට අයිති දෙයකි. මනසේ ස්පර්ශයෙන් හටගත්තා වූ සැප හෝ දුක් හෝ සැප දුක් රහිත හෝ විඳින්නා වූ යමක් ඇත් ද එයත් ඉපදෙන ධර්මතාවට අයත් දෙයකි.

ඉපදෙන ධර්මතාවට අයිති දේවල්වල යථා ස්වභාවය අවබෝධ කරගන්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවකයා කිසිවකට නොඇලී සියල්ලෙන් ම නිදහස් වෙයි.

(ජාතිධම්ම සුත්ත – සං. නි. 4)

ඉපදෙන ආකාර සතර දැන් ඔබට මතක ඇති. එනම් 1. බිත්තරයකින් සත්වයන් බිහි වේ. 2. මව් කුසින් සත්වයන් බිහි වේ. 3. තෙත් පරිසරයෙන් සත්වයන් බිහි වේ. 4. ඕපපාතිකව සත්වයන් බිහි වේ. ඊට අමතරව පස්වෙනි ආකාරයක් නැත. මොන ජාන පිටපතකින් සත්වයන් උපද්දවන්නට හැදුවත් ඔය ආකාර හතරින් එකකින් ම උපදී.

## ඇයි සතුන් ඉපදෙන්නේ?

කලින් කියූ පරිදි ඉපදීම දේව මැවිල්ලක් ලෙස අදහා ගෙන සිටින තැනැත්තාට නම් කරන්නට තිබෙන්නේ කරුණු දෙකක් පමණි. ඉපදීම ගැන සතුටු වෙමින් තමාව මවන ලදැ'යි විශ්වාස කරන දෙවියන්ට ස්තුති කිරීම පළමුවැන්න ය. එහෙත් ඉපදීම හේතු කොට ජරා මරණ රෝග පීඩා දුක් දොම්නස් ආදී නිමක් නැති දුක් පැමිණෙන විට හේ තැති ගනී. කම්පා වෙයි. කලබල වෙයි. එවිට ඔහු තමාට උපත

sinhalaebooks.com



ලබා දුන්නා යයි සිතන දෙවියන්ට යාඥා කරන්නට පටන් ගනී. ජරා මරණයන් ගෙන් තමාව මුදවාගන්නැ'යි ඉල්ලන්නට පටන් ගනී. ඒ දෙවැන්න ය. මෙසේ ස්තුති කිරීමත් ඉල්ලා සිටීමත් හැර වෙන කිසි ම දෙයක් දේව නිර්මාණවාදී චින්තනයකට කළ නොහැකි ය. තමාව මවන ලද ඒ මැවුම්කාර දෙවියන් වහන්සේ තමා වෙත බැල්ම හෙලාගෙන සිටිතැ'යි අදහාගන්නා තැනැත්තාට කිසිදාක ජීවිතයේ යථාර්ථය අවබෝධ කරගත නොහැකි වේ!

තමා ගේ කැමැත්තෙන් නම් ඉපදී සිටින්නේ, එහෙත් නැතිනම් ඉබේ හටගත් දෙයක් නම් ඒත් කරන්නට තිබෙන්නේ සුළු දෙයකි. හැකිතාක් හොඳට කා - බී, හැඳ - පැළඳ රට ජාතිය හෝ පාවා දී හැකිතාක් ඉන්ද්‍රියයන් පිණවමින් ප්‍රීතියෙන් ජීවත් වන්නට ය. ඒ තැනැත්තා ජීවත් වන්නේ ඉන්ද්‍රියයන් පිණවීම පිණිස පමණි.

## මුළාවෙන් අත්මිදෙමු!

එහෙත් දියුණු කරගත් ශීල – සමාධි – ප්‍රඥා බලයෙන් ජීවිතයේ යථාර්ථය අවබෝධ කරගත් අපගේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ එවැනි ලාමක අදහසකට පැමිණියේ නැත. උන්වහන්සේ කරුණු විමසන්නට පටන් ගත්තේ අන්ධ භක්තියකින් නොවේ. නිදහස් බුද්ධියකින් උන්වහන්සේ විමසන්නට පටන් ගත්හ.

"කුමන කරුණක් ඇති කල්හි ද ඉපදීමක් ඇති වන්නේ? කුමක් හේතු කොට ගෙන ද උපදින්නේ?

(ගෝතම සූත්ත – සං. නි. 02)

## නිවැරදිම විසඳුම!

උන්වහන්සේ බුද්ධිය හසුරවන ක්‍රමය අතිශයින් ම සාර්ථක ය. ඒ තුළින් ඉපදීමට හේතු වූ සැබෑ තත්වය ඒ ආකාරයෙන් ම අවබෝධ කරගන්නට සමත් විය.

"ඉපදීම" වනාහී දේව මැවිල්ලක් නොවන බවත්, තමා ගේ කැමැත්තෙන් හදාගත් දෙයක් නොවන බවත්, ඉබේ හටගන්නා දෙයක්

sinhalaebooks.com



නොවන බවත්, සාධාරණ කරුණු සහිත ව හේතු සහිත ව හටගත් දෙයක් නොවන බවත්, සාධාරණ කරුණු සහිත ව හේතු සහිත ව හටගත් දෙයක් බවත් උන්වහන්සේට ප්‍රත්‍යක්ෂ විය.

“භවය ඇති කල්හි ය ඉපදීම ඇති වන්නේ. භවය හේතු කොට ගෙන ය උපදින්නේ”

(ගෝතම සූත්ත – සං. නි. 02)

සමස්ත මානව ඉතිහාසය ම චින්තන විප්ලවයකට පරිවර්තනය වූයේ බුදුරජාණන් වහන්සේ ගේ මේ සොයා ගැනීමත් සමඟ ය. මේ සොයා ගැනීමෙන් කියැවෙන්නේ ඇල්බට් අයින්ස්ටයින් සොයා ගත් භෞතික සාපේක්ෂතාවාදය නොවේ. මෙය වනාහී සමස්ත සත්ව වර්ගයා ගේ ජීවිත ඉරණම සදහට ම විසඳාගත හැක ප්‍රධානතම සාධකය සොයා ගැනීම වේ. සත්ව ජීවිත පුරා ශෝචනීය අන්දමින් බලපවත්වන අනන්ත දුක්ඛ දෝමනස්සයන්ට එරෙහි ව සදාකාලික විසඳුම සොයා ගැනීම වේ.

## භවය ද අන්තරාභවය ද?

ඉපදීම සිදුවන්නේ “භවය” හේතු කොට ගෙන බව අපි දැනටමත් ඉගෙන ගෙන සිටිමු. එය පාළි භාෂාවෙන් කියන්නේ “භව පච්චයා ජාති” යනුවෙනි. එනම් “භවය හේතු කොට ගෙන ඉපදීම වේ” යනුවෙනි. එමෙන්ම එහි නිරෝධය හෙවත් නැතිවීම ගැන බුදුරජාණන් වහන්සේ අපට පවසන්නේ ඉපදීම නැති වීමට නම් භවය නැති විය යුතුම ය කියා ය.

“භවේ ඛෝ අසති ජාති න හෝති. භව නිරෝධා ජාති නිරෝධෝ”

“භවය නැති කල්හි ඉපදීම නැත්තේ ය. භවය නිරුද්ධ වීමෙන් ය ඉපදීම නිරුද්ධ වන්නේ”

(ගෝතම සූත්ත – සං. නි. 02)

එසේ නම් “භවය” යනු ඉපදීම නොවේ. ඉපදීමට හේතු වන දේ ය. ඉපදීම ඵලය යි. භවය හේතුව යි. මෑත භාගයේ ධර්මය ගැන

sinhalaebooks.com



ලියැවෙන බොහෝ පොත් පත්වල භවය යන වචනය තෝරන්නේ "වීම" වශයෙනි. එය එක එල්ලේම පැහැදිලි අර්ථයක් තේරුම් ගත හැකි වචනයක් නොවේ. නොතේරෙන අඩුවක් පිරවීමට නම් ඒ වචනය හොඳ ය. එහෙත් ඉතාම පැහැදිලිව ධර්ම විස්තර තිබෙද්දී එබඳු අරුත් සැඟවුන වචන යෙදීමේ තේරුමක් නැත. "භවය" යන වචනය ගැන ඉතා ම පැහැදිලි ලෙස විස්තර කළ දේශනයක් අංගුත්තර නිකායේ තික නිපාතයේ සඳහන් ව තිබේ.

## මෙන්න ඇත්ත!

දිනක් භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණි ආනන්ද තෙරණුවෝ මෙකරුණ මෙසේ විමසූහ.

"ස්වාමීනි, භවය, භවය යනුවෙන් ධර්ම කරුණක් කියනු ලැවේ. "භවය" ඇති වන්නේ කුමන කරුණු පදනම් කර ගෙන ද?"

අනඳ තෙරුන් විමසන්නා වූ මේ ප්‍රශ්නය ඉතා ම පැහැදිලි ය. මේ ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේ ගෙන් ලැබෙන පිළිතුර ද ඉතාම පැහැදිලි ය.

"පින්වත් ආනන්ද, කාම ධාතුවෙහි විපාක වින්ද යුතු කර්මයක් සකස් වී නැති නම්, කාම භවයක් කියා දෙයක් ගැන කතාබස් කළ හැකි ද?"

"ස්වාමීනි, එසේ නොවන්නේ ම ය"

"මෙසේ පින්වත් ආනන්ද, කර්මය කුඹුර වේ (කම්මං ඛෙත්තං). විඤ්ඤාණය පැළවෙන දෙය වේ (විඤ්ඤාණං බීජං). තණ්හාව (කුඹුරේ පැළ හටගන්නට වුවමනා) ජලය වේ (තණ්හා සිනේහෝ). අවිද්‍යාවෙන් වැසී ගිය තණ්හාවෙන් බැඳි ගිය සත්වයන් ගේ විඤ්ඤාණය හීන ධාතුවෙහි පිහිටියේ ය. චේතනාව හීන ධාතුවෙහි පිහිටියේ ය. ප්‍රාර්ථනය හීන ධාතුවෙහි පිහිටියේ ය.

මේ ආකාරයට මත්තෙහි යළිත් භවයක් හේතුකොට ගෙන ය ඉපදීම සිදුවන්නේ"

sinhalaebooks.com



මෙතැන දී අපගේ ශාස්තෲන් වහන්සේ "හීන ධාතුව" වශයෙන් හඳුන්වන්නේ කාම භවය යි. (අංගුත්තර නිකායේ තික නිපාතය)

## භව තුනකි!

උන්වහන්සේ අපට භව තුනක් හඳුන්වා දී තිබේ.

"පින්වත් මහණෙනි, භව තුනක් තිබේ. එනම් කාම භවය, රූප භවය, අරූප භවය වශයෙනි."

(විභංග සූත්‍ත – සං. නි. 02)

භවය ගැන විස්තර කළ දෙසුමේ දී කාම භවය හීන ධාතුව වශයෙනුත්, රූප භවය මජ්ඣිමා ධාතු වශයෙනුත්, අරූප භවය පණීත ධාතු වශයෙනුත් හඳුන්වා දුන්හ. හැම භවයක් ගැන ම උන්වහන්සේ වදාළේ කර්මය කුඹුර බවයි. විඤ්ඤාණය පැළවෙන දෙය බවයි. තණ්හාව ජලය බවයි.

## භවය හඳුනා ගන්න!

කාම භවය ගැන උන්වහන්සේ වදාළේ කාම ධාතුවෙහි විපාක වින්ද යුතු කර්ම සකස් වීම කාම භවය වශයෙන් ය. රූප භවය ගැන වදාළේ රූප ධාතුවෙහි විපාක වින්ද යුතු කර්ම සකස් වීම රූප භවය වශයෙන් ය. අරූප භවය ගැන වදාළේ අරූප ධාතුවෙහි විපාක වින්ද යුතු කර්ම සකස් වීම අරූප භවය වශයෙන් ය.

එසේ නම් අපට එක කරුණක් ඉතා ම පැහැදිලි ය. එනම් කාම ධාතුවෙහි හෝ, රූප ධාතුවෙහි හෝ, අරූප ධාතුවෙහි හෝ විපාක වින්ද යුතු කර්ම සකස් නොවන්නේ නම් භවයක් නොමැති බවයි.

භවයක් නැතිනම් ඉපදීමක් නැත. භවයක් සැකසේ නම් ඒකාන්තයෙන් ම එතැන ඉපදීම තිබේ.

දිනක් මහා කොට්ඨිත තෙරණුවෝ සැරියුත් මාහිමියන් ගෙන් මේ ප්‍රශ්නය ඇසූහ.

"ප්‍රිය ආයුෂ්මතුනි, අනාගතයෙහි යළිත් භවයක් සකස් වීමෙන් ඉපදෙන්නේ කෙසේ ද?"

sinhalaebooks.com



එයට සැරියුත් මාහිමියන් ද වදාළේ ඉතාම පැහැදිලි පිළිතුරකි.

"ප්‍රිය ආයුෂ්මතුනි, අවිද්‍යාවෙන් වැසී ගිය, තණ්හාවෙන් බැඳී ගිය සත්වයන් හට උපනුපන් තැන සතුටින් පිළිගැනීම හේතුවෙන් මෙසේ අනාගතයෙහි යළිත් භවයක් සකස් වීමෙන් ඉපදීම සිදුවෙයි."

## මෙන්න භවය නැති වෙන හැටි!

ඉන් පසු කොට්ඨිත තෙරුන් විමසුවේ මේ ප්‍රශ්නයයි.

"ප්‍රිය ආයුෂ්මතුනි, අනාගතයෙහි යළිත් භවයක් සකස් නොවීමෙන් ඉපදීම ඇති නොවන්නේ කෙසේ ද?"

"ප්‍රිය ආයුෂ්මතුනි, අවිද්‍යාව දුරුවීමෙන් (උතුම් වූ අරහත් ඵලය නම් වූ) විද්‍යාව ඉපදීමෙන් තණ්හාව නිරුද්ධවීමෙන් මෙසේ අනාගතයට යළිත් භවයක් සකස් නොවීමෙන් ඉපදීම ඇති නොවේ."

(මහාවේදල්ල සූත්ත – ම. නි. 01)

දැන් අපට එක දෙයක් පැහැදිලි විය යුතු ය. භවය යනු ඉපදීම නොවේ. ඉපදීමට හේතුව වන්නේ භවය යි. "භවය" හැඳෙන්නේ විපාක වින්ද යුතු කර්ම සකස් වීමෙන් ය. අපි දැන් මිනිස් ලෝකයේ ඉපිද සිටිමු. මිනිස් ලෝකය අයිති වන්නේ කාම භවයට යි. කාම භවය යනු රූප, ශබ්ද, ගන්ධ, රස, පහස යන කාම අරමුණු ඔස්සේ සැප දුක් විඳීම පිණිස කර්මය සකස් වූ භවය යි. මීට කලින් ජීවිතයේ අප මරණයට පත් වන විට කාම භවයක් සකස් වී තිබුනේ ය. ඒ කාම භවයේ විපාක විඳීමට සුදුසු ලෙස කාම ලෝකයේ අප ගේ ඉපදීම සිදු විය. එසේ නම් ඉපදීම පිණිස සම්පූර්ණයෙන් ම බලපාන්නේ කර්මය යි. යම් භාග්‍යවන්තයෙකුට කර්මය ක්ෂය කරගත හැකි වුනොත් ඔහු පමණක් ඉපදීමෙන් නිදහස් වේ!

දිනක් සුභ නම් වූ තරුණයෙක් විවිධාකාර ස්වභාවයෙන් යුතු මේ සත්වයින් ගේ මේ වෙනස්කම් දකින්නට ලැබෙන්නේ කුමක් නිසා දැ'යි විමසූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ.

sinhalaebooks.com



## කර්මය! කර්මය!

"පින්වත් තරුණය, සත්වයෝ තමන් ගේ දෙය ලෙස කර්මය පිළිගෙන සිටිත්. කර්මය දායාද කොට සිටිත්. කර්මය උපදින ස්ථානය කොට සිටිත්. කර්මය නෑදෑයා කොට සිටිත්. කර්මය පිළිසරණ කොට සිටිත්. කර්මය සත්වයන්ව බෙදයි. මේ උස් පහත් ස්වභාවය පිණිස."

(චූල කම්ම විභංග සුත්ත – ම. නි. 03)

## අන්තරාභවය...?

එසේ නම් "භවය" යනු විපාක වින්ද යුතු කර්ම සකස් වීමයි. මේ ගැන නොවිමසා සාමාන්‍යයෙන් දැනට දසක කිපයක් තිස්සේ මේ රටේ පැතිර යන්නේ අමුතුම කතාවකි. එනම් අන්තරාභවයක් ගැන ය. එනම් භවයේ අතරක් ගැන ය. කාම භවයත් නොවන රූප භවයත් නොවන අරූප භවයත් නොවන භවයක් ගැන ය. ඔවුන් භවය වශයෙන් තේරුම් ගෙන තිබෙන්නේ මව් කුසක ඉපදීම ය.

දැන් යමෙක් මැරුණා යයි සිතමු. ඔහු මව් කුසකට යළි පැමිණියේ ද නැත. එසේ නම් ඒ අතර කාල පරිච්ඡේදයේ ඔහු කොහේ හෝ සිටිය යුතු ය. එනම් මරණයත් මව් කුසක යළි ඉපදීමත් අතර ඔහු කිසියම් කාල පරිච්ඡේදයක් භවයේ රැඳී සිටී. එයයි අන්තරාභවය වශයෙන් පටළවා ගෙන තිබෙන්නේ.

මෙවැනි ප්‍රශ්නයක් බුදුරජාණන් වහන්සේ ගෙන් ද ඇසූ තැනක් දක්නට ලැබේ. ඒ ප්‍රශ්නය ඇසුවේ වච්ඡගොත්ත නම් තාපසයෙක් විසිනි.

"භවත් ගෞතමයන් වහන්ස, යම් කලක මේ කය අත හැරියේත් වේ. සත්වයා ද වෙනත් කයකට නොපැමිණියේ ද වෙයි. භවත් ගෞතමයන් වහන්සේ මොහු ගේ උපාදානය හැටියට පණවන්නේ කුමක් ද?"

"පින්වත් වච්ඡ, යම් කලක මේ කය අත හැරියේත් වේ. සත්වයා ද වෙනත් කයකට නොපැමිණියේ ද වෙයි. එවිට ඔහුගේ උපාදානය තණ්හාව යයි මම කියමි. පින්වත් වච්ඡ, ඒ කාල

sinhalaebooks.com



පරිච්ඡේදයේ ඔහුගේ උපාදානය තණ්හාව වේ.”

(කුතුහලසාලා සුත්ත – සං. නි. 04)

භාග්‍යවතුන් වහන්සේ ද මරණයත්, මව්කුසක ඉපදීමත් අතර අවස්ථාවක් සත්වයන්ට තිබෙන බව පිළිගෙන තිබේ. එහි “අන්තරාභවය” යන අදහස නැත. එහි තිබෙන්නේ භවයේ අතරක් නොවේ. මරණයත් යළි මව් කුසක ඉපදීමත් අතර පරතරයකි. මව් කුසකට හෙවත් ජලාබුජ උපතකට නොපැමිණි ඒ කාලපරිච්ඡේදයේ පවතින්නේ ඕපපාතික උපතකි. එහි තණ්හාව තිබේ. උපාදාන තිබේ. උපාදාන තිබේ නම් භවයක් හෙවත් විපාක පිණිස කර්මයේ සකස් වීමක් තිබෙන්නේ ම ය. පටිච්චසමුප්පාද න්‍යායෙන් බැහැර වූ කෙළෙස් සහිත සත්වයෙක් සිටිය නොහැකි ය!

මරණයට පත්වන සියලු සත්වයන් යළිත් මව් කුසකට පැමිණීම පිණිස ගන්ධබ්බ අවස්ථාවේ සිටිතැ’යි සිතීම සම්පූර්ණ අසත්‍යයකි! එමෙන් ම එය අධර්මයකි! මරණයට පත්වන සියලු මනුෂ්‍යයන්ට ගන්ධබ්බ අවස්ථාවට සුදුසු පරිදි ඕපපාතික උපතක් ලැබෙන්නේ නැත. අන්තරාභවය ගැන සුරංගනා කතා ලියන කියන කවුරුත් කියවා බැලිය යුතු බුද්ධ දේශනා රාශියක් සංයුක්ත නිකායේ පස්වන කොටසේ මහාවර්ගයට අයත් සච්චසංයුත්තයේ සඳහන් වේ.

## ධර්මය හඳුනා ගන්න.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ තම නිය සිළ මත පස් බිඳක් රඳවා භික්ෂූන් ඇමතූහ.

“පින්වත් මහණෙනි, කුමක් ද ඔබ මේ ගැන සිතන්නේ. බොහෝ වැඩියෙන් පවතින්නේ කුමන කොටස ද? මා විසින් නිය පිට රඳවා ගත් මේ පස් ස්වල්පය ද, මෙ මහා පෘථිවිය ද?”

“ස්වාමීනි, මේ මහා පෘථිවියේ පස් ම බොහෝ වැඩි වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් නිය සිළ මත රඳවාගත් පස් නම් ඉතා ම ස්වල්පයකි. මහා පෘථිවිය සමඟ සසඳාලිය නොහැකි ම ය. ගණන් තැබීමට නොහැකි ම ය.”

sinhalaebooks.com



"පින්වත් මහණෙනි, අන්න ඒ ආකාරයෙන් ම මිනිස් ලෝකයෙන් චුත වන්නා වූ මේ සත්වයෝ යළිත් මිනිසුන් අතර උපදිත් නම්, එය ඉතාමත් ස්වල්පයකි. බොහෝ සත්වයෝ මිනිස් ලොවින් චුතව නිරයේ උපදිති... බොහෝ සත්වයෝ මිනිස් ලොවින් චුතව තිරිසන් ලෝකයේ උපදිති... බොහෝ සත්වයෝ මිනිස් ලොවින් චුතව ප්‍රේත ලෝකයේ උපදිති.

ඉතා ම ස්වල්පයක් සත්වයෝ මිනිස් ලොවින් චුතව දේව ලෝකයේ උපදිති... ඉතාමත් ස්වල්පයක් සත්වයෝ මිනිස් ලොවින් චුතව යළි මිනිස් ලොව පැමිණෙති".

(මනුස්ස චුති සුත්ත – දුතිය, තතිය, චතුත්ථ මනුස්සචුති සුත්ත – සං. නි. 5 II)

## අන්තරාභව සිහිනය...!

බොහෝ උදවිය සිතා ගෙන ඉන්නේ මරණින් මතු යළිත් මව් කුසක් ලැබෙන තුරු ගන්ධබ්බයන් ගේ ලෝකයේ තමන් ගේ පැරණි ඥාතීන් සමඟ සතුටින් සොම්නසින් කල් ගෙවන්නට ය. ඔවුන් ගේ අවිද්‍යාවේ තරම එයින් ම සිතාගත හැකි ය. ඔවුන් සිතාගෙන සිටින්නේ තමා ගේ වසඟයෙහි පැවැත්විය හැකි ආත්මයක් තිබේ කියා ය. හේතු ඵල දහමක් තුළ කර්මයේ දාසයන් බවට පත් ව සංසාරයේ ඇවිදින බව ඔවුහු නොදනිත්.

විපාක වින්ද යුතු කර්ම සකස් වීම "භවය" වශයෙන් දැන් අපි තේරුම් ගෙන සිටිමු. එසේ නම් "කර්මය" යනු සුළු පටු දෙයක් නොවේ. මෙයින් අදහස් කරන්නේ කර්මය නිත්‍ය දෙයක් කියා නොවේ. කර්මය අනිත්‍ය දෙයකි. හේතූන් නිසා සකස් වන දෙයකි. හේතූන් නැති වූ විට නැති වී යන දෙයකි. කර්මය සම්පූර්ණයෙන් ක්ෂය වීම යනු අරහත්වයට පත් වීම ය.

## කුමක් ද කර්මය?

කර්මය වශයෙන් අප තේරුම් ගත යුත්තේ විපාක පිණිස සකස් වන දෙයයි. "කර්මය" ගැන අපගේ බුදුරජාණන් වහන්සේ

sinhalaebooks.com



විසින් කරන ලද පැහැදිලි විවරණයක් අපි කවුරුත් දනිමු. එනම් "චේතනා'හං භික්ඛවේ කම්මං වදාමි" යනුවෙන් "පින්වත් මහණෙනි, මම චේතනාව කර්මය යයි පවසමි" කියා වදාළ සේක. "චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා" යනුවෙන් චේතනාවන් ඇති කරගෙන කයින් වචනයෙන් මනසින් කර්ම කරන බව ද පෙන්වා දුන්හ.

පංච උපාදානස්කන්ධය ගැන කථා කිරීමේ දී එහි සඳහන් සංස්කාරවලින් ද අදහස් කරන්නේ චේතනාව ම ය.

"පින්වත් මහණෙනි, සංස්කාර යනු කුමක් ද?"

"එනම් සය ආකාර වූ මේ චේතනාව ය. රූප සංචේතනාව, ශබ්ද සංචේතනාව, ගන්ධ සංචේතනාව, රස සංචේතනාව, ඵොට්ඨබ්බ සංචේතනාව, ධම්ම සංචේතනාව වශයෙනි."

(සත්තට්ඨාන සුත්ත – සං. නි. 03)

එසේ නම් චේතනාවක් හටගන්නේ රූප – ශබ්ද – ගන්ධ – රස – ස්පර්ශ හා මනසේ ඇති වන අරමුණු ඔස්සේ ය.

එසේ නම් චේතනාව හෙවත් කර්මය කුමක් හේතු කොට හටගත් දෙයක් ද?

## කර්මයත් සකස් වූ දෙයකි!

"පින්වත් මහණෙනි කර්මයන් ගේ හටගැනීමට හේතු වූ දෙය කුමක්ද?

පින්වත් මහණෙනි, කර්මයන් ගේ හටගැනීමට හේතු වූ දෙය ස්පර්ශයයි"

(නිබ්බේධික සුත්ත – අං. නි. 06)

"ස්පර්ශය" යනුවෙන් අදහස් කරන්නේ කරුණු තුනක එකතුවීමයි (තිණ්ණං සංගති ඵස්සෝ). ස්පර්ශය ද සය ආකාර වේ. ඇසේ ස්පර්ශය, කණේ ස්පර්ශය, නාසයේ ස්පර්ශය, දිවේ ස්පර්ශය, කයේ ස්පර්ශය, මනසේ ස්පර්ශය වශයෙනි.

sinhalaebooks.com



ඇසේ ස්පර්ශය යනු ඇසත්, රූපත්, විඤ්ඤාණයත් එකතු වීමයි... මනසේ ස්පර්ශය යනු මනසත්, මනසේ ඇතිවන අරමුණුත්, එය දැනගැනීම නම් වූ මනෝවිඤ්ඤාණයේත් එකතුවීමයි. මේ එකතු වීමෙන් තමා වේදනාව හටගන්නේ. මේ එකතු වීමෙන් ම යි සඤ්ඤාව හෙවත් හඳුනාගැනීම හටගන්නේ. එමෙන් ම මේ ස්පර්ශයෙන් ම ය චේතනාවත් හටගන්නේ. ස්පර්ශය හේතු කොට ගෙන වේදනා සඤ්ඤා චේතනා තුන ම හටගනී.

## කර්මයේ ස්වභාවය

කර්මය යනු සිතින් සිතා අවසන් කළ නොහැකි වැඩ පිළිවෙළක් ඇති දෙයකි. කර්මයේ විෂය ක්ෂේත්‍රය අචින්තනීය යයි බුදුරජාණෝ පෙන්වා දුන්හ. එමෙන්ම කර්මය යනු නැති කළ හැකි දෙයකි. නැති වී යන දෙයකි.

බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළේ කර්මය කුඹුරක් ලෙස සලකන ලෙස ය. කර්මය නමැති කුඹුරේ බිජුවට හෙවත් පැළවෙන දෙය විඤ්ඤාණය යි. එම විඤ්ඤාණය නම් වූ බීජය පැළවීමට අනුග්‍රහ ලැබෙන ජලය වන්නේ තණ්හාවයි.

කර්මය නම් වූ කුඹුරේ විඤ්ඤාණය වැඩෙන ආකාරය ඉතා ම පැහැදිලි ලෙස බුදුරජාණන් වහන්සේ අපට කියා දී තිබේ.

"අවිද්‍යාගත ව සිටින මේ පුද්ගලයා ඉදින් පුණ්‍ය වූ සංස්කාරයක් (කර්මයක්) සකස් කරන්නේ නම් විඤ්ඤාණය පිනට අනුව සකස් වේ. ඉදින් අපුණ්‍ය (පාපී) වූ සංස්කාරයක් (කර්මයක්) සකස් කරන්නේ නම්, විඤ්ඤාණය පවට අනුව සකස් වේ. ඉදින් ආනෙඤ්ජ (රූප අරූප ධ්‍යාන සංඛ්‍යාත – කර්මයක්) සකස් කරන්නේ නම් විඤ්ඤාණය ආනෙඤ්ජයට අනුව සකස් වේ.

(පරිවීමංසන සුත්ත – සං. නි. 02)

## පැළවෙන දුක!

පොළොවේ යමක් පැළවෙන්නේ කෙසේ ද? තෙතමනය ඇති පොළවක යමක් සිටවූ විට එම පැලයේ මුල් තිබෙන කොටස

sinhalaebooks.com



පොළොවේ ඇතුළට ඇදෙයි. ඒ මුල්වලින් තෙත පොළොවේ සාරය උරා ගනිමින් ගස වැඩෙයි.

විඤ්ඤාණයේ ක්‍රියාකාරිත්වය තුළ තිබෙන්නේ ද බීජයක් පැළවෙන ආකාරයේ ක්‍රියාකාරිත්වයක් බව බුදු රජාණන් වහන්සේ මෙසේ පැහැදිළි කර දෙති.

"පින්වත් මහණෙනි, සතර මහා භූතයන් ගෙන් හටගත් දේ (රූප), ස්පර්ශයෙන් හටගත් විඳීම (වේදනා), ස්පර්ශයෙන් හටගත් හඳුනාගැනීම (සඤ්ඤා), ස්පර්ශයෙන් හටගත් චේතනාව (සංඛාර) යන මේ හතර පොළොව වශයෙන් සැලකිය යුතු ය. පොළොවේ පැළවෙන දෙය වශයෙන් සැලකිය යුත්තේ විඤ්ඤාණය යි. පොළවත් පැලයත් තෙත් කරවන ජලය වශයෙන් සැලකිය යුත්තේ තණ්හාව යි.

පින්වත් මහණෙනි, යම් කෙනෙක් මෙසේ පවසන්නට පුළුවනි,

රූපයෙන් තොරව, වේදනාවෙන් තොරව, සඤ්ඤාවෙන් තොරව, සංස්කාරවලින් තොරව පැමිණෙන්නා වූ හෝ ගමන් කරන්නා වූ හෝ චුත වන්නා හෝ වර්ධනය වන්නා වූ හෝ විපුල බවට පත් වන්නා වූ හෝ විඤ්ඤාණයක් මම පණවන්නෙමි'යි කියා. එය කිසිසේත් ම සිදුවන දෙයක් නොවේ.

(බීජ සුත්ත – සං. නි. 03)

බුදුරජාණන් වහන්සේ පවා ධර්ම දේශනාවන් පවත්වන විට සාමාන්‍යයෙන් විඤ්ඤාණය යන වචනය පමණක් ගෙන කථා කරන අවස්ථාවන් කොතෙකුත් තිබේ. එහෙත් එතැන පවා කථා කරන්නේ රූප – වේදනා – සඤ්ඤා – සංඛාරවලින් යුතු විඤ්ඤාණයක් මිස හුදෙකලාව පවතින අමුතු විඤ්ඤාණයක් නොවේ. පොළොවක් නැති, ජලයක් නැති තැනක පැලයක් කොයින් ද?

මෙපමණ විස්තර අප දැන ගත්තේ "භවය" යන වචනය තේරුම් ගැනීම පිණිස ය. මෙපමණ ගැඹුරු තේරුමක් තිබෙන "භව" යන වචනයට "වීම"යනුවෙන් සිංහලට හැරවීමෙන් කිසි ම දිනක ඒ

sinhalaebooks.com



වචනය තේරුම් ගත නොහැකි ය. එහෙත් "භවය" යන වචනයට "විපාක විඳීම පිණිස කර්ම සකස් වීම" යන තේරුම ගත් විට "භව පච්චයා ජාති" භවය හේතු කොට ගෙන ඉපදීම සිදු වේ යන කරුණ පැහැදිලිව තේරුම් ගත හැකි ය. භවය හට ගැනීමෙන් ඉපදීම හටගනී. භවය නිරුද්ධවීමෙන් ඉපදීම නිරුද්ධ වේ. හේතුව ඇති වීමෙන් ඵලය ඇති වේ. හේතුව නැති වීමෙන් ඵලය නැති වේ.

## මන්ද මේ භවය හැදුනේ...?

ජීවිතයක අභ්‍යන්තරික ව සකස් වෙන මේ සංසාරය බැලූ බැල්මට කිසිසේත් දැක්ක නොහැකි ය. බුදුරජාණන් වහන්සේ ශීල සමාධි ප්‍රඥාවෙන් යුතු වැඩ පිළිවෙළක් ප්‍රගුණ කිරීම නිසා ය මෙය අවබෝධ කර ගත්තේ.

බුදුරජාණන් වහන්සේ ගෙන් පසු ලෝකයේ කිසි ම කෙනෙකු තවමත් මේ ආකාරයට ජීවිත ගැටළුව විසඳාගන්නා ක්‍රමයක් ඉදිරිපත් කර නැත. ක්‍රම ක්‍රමයෙන් සදහට ම මේ ජීවිත ගැටළුව විසඳී යන ආකාරයයි ශ්‍රී සද්ධර්මයෙන් කියා දෙන්නේ. අන්ධ භක්තියෙන් යාතිකා කොට අවබෝධ කර ගත යුතු දෙයක් ජීවිතය තුළ නැත. නුවණින් විමස විමසා බැලීමෙන් ම යි ජීවිතය අවබෝධ කර ගත යුත්තේ.

## ඉබේ හටගත් භවයක් නැත!

"භවය" යනු ඉබේ සකස් වූ දෙයක් නොවේ. හේතුවක් නිසා හටගත් ඵලයකි. හේතුව නැති වීමෙන් ඵලය ද නැති වී යන ධර්මතාවට අයත් දෙයකි. "භවය" හටගන්නා හේතු වූ කරුණ නුවණින් විමසන්නට පටන් ගත් බුදුරජාණන් වහන්සේ ඉතා ම නිවැරදි ලෙස හේතුව සොයා ගන්නට සමත් වූහ.

sinhalaebooks.com



## උපාදාන නිසා භවය ඇතිවේ!

"උපාදාන ඇති කල්හි භවය වේ. උපාදාන හේතුකොට ගෙන ය භවය සැකසෙන්නේ."

(ගෝතම සුත්ත – සං. නි. 02)

උපාදාන යන වචනය අපි පැහැදිලිව තේරුම් ගත යුතු ය. බොහෝ පොත් පත්වල එය තෝරා තිබෙන්නේ දැඩිව අල්ලා ගැනීම, තදින් ග්‍රහණය කර ගැනීම යන අදහසින් ය. නමුත් හේතු ඵල දහම තේරුම් ගැනීමේදී අප තේරුම් ගැනීමට උත්සාහ කළ යුත්තේ කර්තෘත්වයකින් තොරවයි. එයින් අදහස් කරන්නේ සත්වයන් පුද්ගලයන් නැත යන අදහස නොවේ. සත්වයෙක් නැත පුද්ගලයෙක් නැත කියා බුදුරජාණෝ කිසි දිනක නො පැවසූහ. උන්වහන්සේ වදාළේ ආත්මයක් නැති බව ය. සත්වයා පුද්ගලයා යන වචනය තුළ "ආත්මය" යන අදහස නැත. සත්ව, පුද්ගල, ආත්ම යන වචනවල තිබෙන්නේ එක ම අදහස නම් උන්වහන්සේ කිසිදිනක සඟ ගුණ පෙන්වා දෙන තැන "අට්ඨ පුරිස පුග්ගලා" වශයෙන් පුද්ගලයන් අට දෙනෙක් පෙන්නා නොදෙන සේක.

## නිවැරදිව තේරුම් ගන්න!

ජීව යන වචනයේ ආත්මය යන අර්ථය තිබේ. එහෙත් සත්වයා පුද්ගලයා යන වචනයේ ආත්මය යන අර්ථය නැත. එම වරද සිදුවූයේ බුද්ධ වචනයක සඳහන් නොවන අතීත ප්‍රත්‍යවේක්‍ෂාවක් භාවිතා කරන්නට පටන් ගැනීම නිසා ය.

එහි "සිව් පසස අනුභව කරන පුද්ගලයා ධාතු මාත්‍රයකි. නිස්සත්ව වූ නිජ්ජීව වූ ශූන්‍ය වු දෙයකි" වශයෙන් සත්ව යන වචනය ආත්ම සංඛ්‍යාවෙහි ලා විස්තර කරයි. කාලාන්තරයක් තිස්සේ පුරුදු කරගෙන පැමිණි ඒ වරද ඔස්සේ සිතන්නට පටන් ගත් කෙනාට "සත්වයෙක් පුද්ගලයෙක් සිටිනවා" යන වචනය ඇසූ පමණින් තැති ගනී. කලබල වෙයි. යළි යළිත් අප තේරුම් ගත යුත්තේ ආත්මය

sinhalaebooks.com



හෙවත් තමා ගේ වසඟයෙහි පැවැත්විය හැකි ස්ථිරසාර දෙයක් තිබේ යන අදහස සත්ව පුද්ගල යන වචන තුළ නැති බව ය.

## හේතු - ඵල දහම ඵලෙසින් තේරුම් ගැනීම

වරක් මෝලියඵග්ගුන තෙරණුවෝ බුදුරජාණන් වහන්සේ ගෙන් මෙසේ විමසූහ.

"ස්වාමීනි, උපාදාන කරන්නේ කවුද?"

මේ ප්‍රශ්නය තුළ තිබෙන්නේ ආත්ම දෘෂ්ටියයි. උපාදාන කරන්නා වූ ජීවයක් හෙවත් ආත්මයක් තිබේ යන්න එහි යටි අදහසයි. එනිසා භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු පැවසීමට පෙර ප්‍රශ්නය නිවැරදි කරති.

"උපාදාන කරන්නේ ය (තදින් ග්‍රහණය කරගන්නේ ය) යයි මම නො පවසමි. ඉදින් මම කියනවා නම්, තදින් අල්ලා ගන්නේ ය කියා උපාදාන කරන්නේ කවුරුන් දැයි ඇසීම සාධාරණ ය. එහෙත් මම එසේ නොකියමි. එසේ නොකියන්නා වූ මගෙන් මෙන්න මේ ආකාරයටයි ප්‍රශ්න ඇසිය යුත්තේ. "ස්වාමීනි උපාදානය හටගන්නේ කුමන හේතුවක් නිසා ද කියා ය. ඒ ප්‍රශ්නය මේ ධර්මයට අදාළ වේ. උපාදානය හටගන්නේ තෘෂ්ණාව හේතු කොට ගෙන ය."

(මෝළියඵග්ගුන සූත්ත – සං. නි. 02)

මෙයින් අප තේරුම් ගත යුත්තේ හේතු - ඵල දහම අවබෝධ කර ගැනීම පිණිස හේතු ඵල දහමට අනුව ම විමසිය යුතු බවයි.

"උපාදාන" යන වචනය ඉතාම පැහැදිලි තේරුමක් ඇති පදයකි. එහි තේරුම (දැඩි ලෙස හෝ සියුම් ලෙස හෝ) බැඳී යාම, ග්‍රහණය වීම යන අර්ථය යි.

උපාදානය යනු භවය පිණිස හේතු වූ කරුණ වේ. එසේ නම් එය ප්‍රබල හේතුවකි.

"පින්වත් වච්ඡ, මා උපතක් ගැන පවසන්නේ උපාදාන සහිත තැනැත්තාට ය. උපාදාන රහිත තැනැත්තාට නොවේ.

වච්ඡය, ගින්න දැල්වෙන්නේ උපාදාන සහිතව ම ය. උපාදාන

sinhalaebooks.com



රහිතව නොවේ. එලෙසින් ම පින්වත් වච්ඡ, මා උපතක් ගැන පවසන්නේ උපාදාන සහිත තැනැත්තාට ම ය. උපාදාන රහිත තැනැත්තාට නොවේ.”

(කුතුහලසාලා සුත්ත – සං. නි. 04)

## උපාදාන = ග්‍රහණය වීම

හවයක් සකස් වූයේ උපාදාන නිසා නම් විපාක වින්ද යුතු කර්ම සකස් වීමට හේතු වූයේ ග්‍රහණය වීම ය. ග්‍රහණය වීම් හෙවත් බැඳීම්යාම් සතරක් තිබෙන බව මහාප්‍රාඥ වූ අපගේ ශාස්තෘන් වහන්සේ සොයා ගත් සේක.

එනම්,

1. කාම අරමුණුවලට ග්‍රහණය වීම නම් වූ කාම උපාදානය.
2. අදහස්, ආකල්ප හා නොයෙක් මතවාදයන්ට ග්‍රහණය වීම නම් වූ දිට්ඨි උපාදානයයි.
3. නොයෙක් සීල ව්‍රතයන්ට ග්‍රහණය වීම නම් වූ සීලබ්බත උපාදානයයි.
4. මම ය, මාගේ ය, මාගේ ආත්මය ය යන දෘෂ්ටියට ග්‍රහණය වීම නම් වූ අත්තවාද උපාදානයයි.

මේ සතර ආකාර වූ ග්‍රහණය වීමට හසු වූ ජීවිතය තුළ සකස් වෙන්නේ සංසාරය යි. උපාදාන හේතු කොට ගෙන සකස් වන භවය නිසා සමහර සත්වයෝ නිරයේ උපදිත්. ඇතැම් සත්වයෝ ප්‍රේත ලෝකයේ උපදිත්. ඇතැම් සත්වයෝ තිරිසන් යෝනියේ උපදිත්. ඇතැම් සත්වයෝ මිනිස් ලෝකයේ උපදිත්. ඇතැම් සත්වයෝ දිව්‍ය ලෝකයේ උපදිත්. එසේ නම් මේ සියලුම උපත් සිදුවන්නේ උපාදාන හේතු කොට ගෙන නොවේ ද?

sinhalaebooks.com



## 1. කාම අරමුණුවලට ග්‍රහණය වීම (කාම උපාදාන)

කාම ලෝකයේ ඉපදී සිටින සමස්ත සත්ව වර්ගයා ම කාම අරමුණුවලට ම ග්‍රහණය වී සිටිති. රූප – ශබ්ද – ගන්ධ – රස – ස්පර්ශ යන කාම අරමුණුවලට ම වසඟ වී මුසපත් වී සිටිති. කාමයට ග්‍රහණය වූ සත්වයෝ මනුෂ්‍ය ඝාතන ඇතුළු සත්ව ඝාතන, සොරකම්, ස්ත්‍රී දූෂණ හා නොයෙකුත් අපචාර, සුරාපානය, බොරු කීම්, කේළාම් කීම්, එරුස වචන කීම්, හිස් වචන කීම්, අන්සතු දෙයට ඊර්ෂ්‍යා කිරීම, වෛර කිරීම ආදී සියලු ම අකුසල් සිදු කරති. මේ සියල්ල කාම උපාදානයේ ප්‍රතිඵල ය. "කාමය" යන වචනය නිවැරදි ලෙස තෝරා තිබෙන්නේ බුදුරජාණන් වහන්සේ පමණි.

## කුමක් ද කාමය?

"පින්වත් මහණෙනි, කාම ගුණයන් පහක් තිබේ. එනම් ඇසට දර්ශනය වන යහපත් වූ සුන්දර වූ ප්‍රියමනාප වූ ඇල්ම ඇතිවන්නා වූ සිත කිළිටි කරන්නා වූ රූපය. කණින් දැනගන්නා වූ ශබ්දයන් ය. නාසයෙන් දැනගන්නා වූ ගඳ සුවඳ ය. දිවෙන් දැනගන්නා වූ රසයන් ය. කයින් දැන ගන්නා වූ පහස ය. සැබැවින් ම පින්වත් මහණෙනි, මේවා කාමයන් නොවේ. සද්ධර්මය තුළ මේවාට කිව යුත්තේ "කාමගුණ" කියා ය.

සත්වයා ගේ කාමය වනාහී සංකල්පයකට ඇලීමකි. ලෝකයේ තිබෙන්නා වූ යම් විචිත්‍ර දේ වේ නම් ඒවා කාමය නොවේ. සත්වයා ගේ කාමය සංකල්පයකට ඇලීම ම ය. ලෝකයේ ඇති විචිත්‍ර දේවල් ඒ විදියට ම පවතී.

මෙ කරුණ දන්නා නුවණැති අය කාමයන් කෙරෙහි ඇති ඇල්ම දුරුකර දමත්."

(නිබ්බේධික සුත්ත – අං. නි. 06)

කාමය යනු කුමක්දැයි දැන් අපට පැහැදිලි ය. සිත ඇද බැඳ ගන්නා කාම අරමුණුවලට සරාගී වීම ම කාමය වේ. කාමයන් ගේ අභ්‍යන්තර ස්වභාවය බුදුරජාණන් වහන්සේ මොන තරම් ගැඹුරින්

sinhalaebooks.com



අධ්‍යයනය කොට තිබේ ද! එසේ නම් කාම උපාදානය යනු රූප – ශබ්ද – ගන්ධ – රස – පහස යන කාම අරමුණුවලට සංකල්පීය වශයෙන් ග්‍රහණය වීම ය.

## සැබෑම යකඩ දම්වැල!

සැවැත් නුවර පිඬු සිඟා වැඩි භික්ෂු පිරිසකට යකඩ දම්වැල් වලින් දැඩි ලෙස බඳින ලද සිරකරුවන් පිරිසක් දකින්නට ලැබුණි. ඒ දර්ශනයෙන් කම්පා වූ සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැළ කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ දුන්නේ කාගේත් ඇස් ඇරවෙන පිළිතුරකි.

"ඔය යකඩ දම්වැල්වලින්, දැවවලින්, කඹවලින් බඳින ලද බන්ධනය එතරම් දරුණු බන්ධනයක් ලෙස නුවණැත්තෝ නොදකිති. එහෙත් රන්රිදී මුතු මැණික් ගැන දූදරුවන් ගැන ස්වාමි භාර්යාවන් ගැන යම් අපේක්ෂාවක් තිබේ නම් මෙයයි දරුණුම බන්ධනය."

යළි යළිත් භවයට ම ඇද දමන්නා වූ, ඉතා සියුම් වූ, නිදහස් වීම අතිශයින් ම දුෂ්කර වූ, මේ බන්ධනයට යි නුවණැත්තන් බන්ධනය කියන්නේ.

(බන්ධන සුත්ත – සං. නි. 02)

## දුක පෙනෙන්නේ සැප ලෙසයි!

සාමාන්‍ය සත්වයා කාම සැපයන් ලබාගැනීම උදෙසා අනන්ත දුක් විඳිත්. එහෙත් ඔවුන් පුරුදු වී සිටින්නේ එහි ආශ්වාදය ගැන ම සිතන්නට ය. එයින් මිහිරක් ම විඳගන්නට ය. මේ නිසා ම ඔවුහු අනන්ත දුක් විඳිති. ඔවුන් ඒ දුක සම්පූර්ණයෙන් ම නොසලකා හරිති. ආශ්වාදය ම පසුපස දුව යති.

## ඇත්ත දකින්න!

බුදුරජාණන් වහන්සේ අපට පෙන්වා දී තිබෙන්නේ කාමයන් ගේ ආශ්වාදය ආශ්වාදය වශයෙනුත්, ආදීනවය ආදීනවය වශයෙනුත්,

sinhalaebooks.com



නිස්සරණය නිස්සරණය වශයෙනුත් අවබෝධ කරගත යුතු බවයි. නුවණ මඳ පිරිස මේ දෙසුම පවා වටහා ගෙන තිබෙන්නේ වැරදි පැත්තට ය. එනම් කාමයන් ගේ ආශ්වාදය දැන ගැනීමට නම් හැකිතාක් කාම සේවනයේ යෙදෙමින් ඉඳුරන් පිනවමින් කල් ගත කළ යුතු බවයි. එහෙත් ආදීනව – නිස්සරණ ගැන ඔවුන් ගේ කථාවක් නැත. මෙවැනි මිථ්‍යාදෘෂ්ටීන් අයත් වන්නේ කැමට වුවමනා විට කබරගොයාව ද තලගොයා කරගන්නා පිරිසට ය. නමුත් මධ්‍යස්ථ ව නුවණින් විමසා බලන කෙනෙකුට කාමයන් නිසා සත්වයා දුක් විඳින ආකාරය ඉතා පැහැදිලිව දැක ගත හැකි ය.

## කාමයේ සැබෑ තත්වය!

බුදුරජාණන් වහන්සේ කාමයන් ගැන වදාළේ කාමයන් වනාහී ඉතාම අල්ප වූ ආශ්වාදයකින් යුක්ත (අප්පස්සාදා කාමා), බොහෝ දුක් සහිත (බහු දුක්ඛා), බොහෝ කරදර සහිත (බහුපායාසා), බොහෝ ආදීනව තිබෙන (ආදීනවෝ එත්ථ භියෝ) දේවල් වශයෙන් ය.

භව බන්ධනයෙන් නිදහස් වනු කැමති ශ්‍රාවකයින් හට කාමයන් ගේ මේ ආදීනව හොඳින් විමසා බලා කාමයන් ගෙන් නිදහස් වන්නැ'යි උන්වහන්සේ පවසා සිටියහ.

"කාමයන් වනාහී බලු කුක්කෙකු ලෙව කමින් සිටින ඇට සැකිල්ලක් වැන්න. උකුස්සන් රංචුවකට මැදි වූ උකුස්සෙකු විසින් ඩැහැගෙන යනු ලබන මස් කුට්ටියක් වැන්න. තමා දෙසට හුළඟින් ගිනිදැල් පැමිණෙද්දීත් අල්ලා ගෙන සිටින ඇවිල ගත් හුලු අත්තක් වැන්න. ගිනි අඟුරු වලක් වැන්න. නින්දේ දුටු සිහිනයක් වැන්න. ණයට ඉල්ලා ගත් අනුන් අයත් දෙයක් වැන්න. යකඩ හුලක් වැන්න. විෂ ඝෝර සර්යෙකු ගේ හිස පැත්ත වැන්න"

(අලගද්දූපම සුත්ත – ම. නි. 01)

## කාමයෙන් අන්ධ වූ විට

අජාසත් රජු තම පියාණන් මරා ආනන්තරික කර්මය රැස් කරගත්තේ කාමයන්ට ගෘහණය වීම නිසා ය. දේවදත්තයන් ද එම

sinhalaebooks.com



පාපය ම රැස් කර ගත්තේ කාමයන්ට ග්‍රහණය වීම නිසා ය. මාගන්දියා බුදුරජුන්ට වෛර කොට පව් රැස්කර ගත්තේ කාමයන්ට ග්‍රහණය වීම නිසා ය. නන්ද මානවකයා උප්පලවන්නා රහත් තෙරණිය දූෂණය කොට අපා ගත වූයේ කාමයන්ට ග්‍රහණය වීම නිසා ය. චුන්ද සූකරිකයා තමා මැරී යන තුරු ම ඌරන් මරමින් දිවි ගෙවූයේ කාමයන්ට ග්‍රහණය වීම නිසා ය. කාමයන්ට ග්‍රහණය වී නෙත් අන්ධ වූ විට පින් පව් නොහඳුනති. හොඳ නරක නොදනිති. කුල සිරිත් නොදනිති. ලැජ්ජා බිය ද නොදනිති.

## කාමයෙන් අන්ධ නොවන්න

ඒ නිසා ම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මේ කාමයන් ගැන හඳුන්වා තිබෙන්නේ නින්දනීය නම්වලින් ය.

"පින්වත් මහණෙනි, 'භය' යනු කාමයන්ට කියන නාමයකි. 'දුක' යනු කාමයන්ට කියන නමකි. 'ලෙඩ ගොඩක්' යනු කාමයන්ට කියන නමකි. 'සැරව ගලන තුවාලයක්' යනු කාමයන්ට කියන නමකි. 'බන්ධනය' යනු කාමයන්ට කියන නමකි. 'මඩ ගොඩක්' යනු කාමයන්ට කියන නමකි."

(භය සුත්ත – අං. නි. 06)

"පින්වත් මහණෙනි, කාමයන් ගේ විපාකය කුමක් ද? පින්වත් මහණෙනි, කාමයන්ට කැමැත්තෙන්ම සිටින කෙනා හට ඒ ඒ ජීවිතයන් තුළ පිනට අනුව හෝ පවට අනුව හෝ ඉපදීම සකස් වෙයි."

(නිබ්බේධික සුත්ත – අං. නි. 06)

කාමයන් ගේ ආශ්වාදයට ග්‍රහණය වූ සත්වයන් ගේ ඉරණම සකස් වන්නේ භවයක් පිණිස ය. භවය නිසා ඉපදේ. ඒ නිසා ම සංසාර ගමග දීර්ඝ වෙයි.

sinhalaebooks.com



## 2. දෘෂ්ටිවලට ග්‍රහණය වීම = දිට්ඨි උපාදාන

**අදහස් ආකල්ප හා නොයෙක් මතවාදයන්ට ග්‍රහණය වීම (දිට්ඨි උපාදාන)**

අපට නොයෙක් අදහස්, නොයෙක් ආකල්ප, නොයෙක් මතවාද ගැන අසන්නට කියවන්නට ලැබේ. අරකත් හරි, බලාගෙන ගියාම මේකත් හරි කියමින් ඒ ඒ මතවාදයන්ට ග්‍රහණය වීමයි බොහෝ විට සිදුවන්නේ.

වරක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි "දීඝනඛ" නම් තාපසයෙක් අපූරු කථාවක් කීවේ ය.

"භවත් ගෞතමයන් වහන්ස, මම වනාහී මේ ආකාර වාද ඇති මේ ආකාර දෘෂ්ටි තිබෙන කෙනෙක්මි. එනම් සියලු දේ ගැන මගේ කැමැත්තක් නැත." එවිට බුදුරජාණන් වහන්සේ ඇසූ ප්‍රශ්නයෙන් ඔහු ගේ ඇස් ඇරුනේය.

"පින්වත් දීඝනඛ, සියලු දේ ගැන මගේ කැමැත්තක් නැත යන දෘෂ්ටියට ඔබ කැමතියි නේ ද?"

(දීඝනඛ සුත්ත – ම. නි. 01)

තම තමන්ට හිතුමනාපේ, හිතුවක්කාර තර්ක ක්‍රම ඔස්සේ නොයෙක් ආකාරයෙන් කල්පනා කොට බැසගත් නිගමනවලට ග්‍රහණය වන්නේ දිට්ඨි උපාදානය නිසා ය. මිථ්‍යා දෘෂ්ටිය හටගන්නේ ම දිට්ඨි උපාදානයෙනි.

## ඇත – නැත යන අන්තයට ග්‍රහණය වීම!

"පින්වත් කච්චාන, මේ ලෝක සත්වයා බොහෝ සෙයින් සිටින්නේ අන්ත දෙකක් තුළ ය. මේ ලෝක සත්වයා බොහෝ සෙයින් ම ඒ අන්ත දෙකේ බැස ගත්තේ වේ. එයට ම ග්‍රහණය වූයේ වේ. එහි ම ගිලුනේ වේ. බන්ධනයක් ම බවට පත් වූයේ වේ... එනම් "සියල්ල ඇත" යන මේ එක් අන්තයකි. "සියල්ල නැත" යන මෙය දෙවන

sinhalaebooks.com



අන්තයයි.

(කච්චාන ගොත්ත සූත්ත – සං. නි. 02)

"සියල්ල ඇත" යන අන්තය තුළින් හටගන්නේ ශාස්වත දෘෂ්ටිය යි. ශාස්වත දෘෂ්ටිය යනුවෙන් අදහස් කරන්නේ මරණින් මතු "සදාකාලික බවට පත් වන ආත්මයක්" තමා තුළ තිබේ යන මතවාදයයි. දේව කැමැත්තට අනුව හැදී තිබෙන ඒ ආත්මය, දේව කැමැත්තට අනුව ම මරණින් මතු නිරයේ හෝ ස්වර්ගයේ හෝ සදාකාලික ව තැන්පත් වේ. එය නිත්‍ය වේ. සනාතන වේ. සදහට ම පවතී. තනිකර ම අසත්‍යයක් වූ මෙම මතවාදයට පුද්ගලයෙක් බැඳී ගිය විට ඕනෑම දරුණු ක්‍රියාවක් කිරීමට ඒ මතය ගත් පුද්ගලයාට පුළුවනි.

## අර්ජුන ගේ යුද්ධය! කෘෂ්ණ ගේ ආත්මය!

"භගවත් ගීතාව" නම් හින්දු ආගමික ග්‍රන්ථයේ යුද්ධයක් ගැන සඳහන් වෙයි. කුරු ක්ෂේත්‍රයේ දී අර්ජුන නම් වූ කෙනෙකුට විරුද්ධව ඔහු ගේ ගුරුවරුන් මෙන්ම ලේ ඥාතීන් විශාල පිරිසක් යුධ භූමියට පැමිණෙත්. එහෙත් අර්ජුන ගේ පැත්තේ සිටින්නේ එකම එක් කෙනෙකි. ඔහු වනාහී තමන් ලෝක නිර්මාපක යයි කියා ගන්නා "කෘෂ්ණ" නම් දෙවියෙකි. කෘෂ්ණ දෙවියන් අර්ජුනට කියන්නේ ඥාතිකම් අත් හැර දමා විරුද්ධවාදීන් ඝාතනය කරන ලෙස ය. එහෙත් තමාට එය කළ නොහැකි යයි අර්ජුන බැගෑපත්ව කෘෂ්ණට කියයි. එවිට කෘෂ්ණ දෙවියා පවසන්නේ කෘෂ්ණ දෙවියන් ගේ කැමැත්ත පරිදි සියලු දෙනා තුළ ම ස්ථිර වූ ආත්මයක් මවා ඇති බවයි. එම නිසා දෙවරක් නොසිතා සියලු සතුරන් ඝාතනය කරන ලෙස කෘෂ්ණ දෙවියා උපදෙස් දෙයි. ඒ ඝාතනවලින් මිය යන්නේ ශරීර පමණක් බවත් ආත්මය මැරිය නොහැකි බවත් පවසයි!

## "ඇත" යන අන්තයට හසු වූ දේ

වර්තමාන එල්.ටී.ටී.ඊ. සංවිධානයේ තිබෙන්නේ ද මේ දෘෂ්ටියම ය. එමෙන්ම සියලු ම ආත්මවාදී ආගම්වල තිබෙන්නේ ද මේ

sinhalaebooks.com



දෘෂ්ටියම ය. දේව නිර්මාණවාදී ආගමික ඉතිහාස තුළ කුරුස යුද්ධයන් හට ගෙන තිබෙන්නේත්, ශුද්ධ යුද්ධ හටගෙන තිබෙන්නේත් මේ දෘෂ්ටි උපාදානය නිසා ය. මේ දෘෂ්ටි උපාදානයට හසු වූ ආගම් ලෙස හින්දු, කතෝලික, ක්‍රිස්තියානි, යුදෙව්, ඉස්ලාම් ආදී ආත්මවාදී, දේව නිර්මාණවාදී ආගම් හැඳින්විය හැකි ය. ඒ ආගම් අදහන පිරිසට ආගමේ නාමයෙන් මනුෂ්‍ය ඝාතනයක් කිරීම සුළු දෙයකි. ජෛන ආගමේ තිබෙන්නේ ද ආත්ම දෘෂ්ටියයි. එහි ඇති එකම වෙනස ඒ ආත්මය පීඩාකාරී තපස් ක්‍රමවලින් පිරිසිදු කරන්නට උපදෙස් දීම ය. එහි සත්ව ඝාතනය අනුමත නො කරයි. එහෙත් පවතින්නේ දෘෂ්ටි උපාදානයයි.

## "නැත" යන අන්තයට හසු වූ දේ

"සියල්ල නැත" යනු අනෙක් අන්තය වේ. මේ අන්තවාදී දෘෂ්ටියෙන් කියවෙන්නේ භෞතිකවාදී න්‍යායකි. එනම් යන්ත්‍රයක අවයව එකතු වූ විට ශක්තියක් උපදී. ඒ යන්ත්‍රයේ කොටස් ගළවා ඉවත් කළ විට ඒ ශක්තිය විසිරී යයි. ඒ ආකාරයට "සත්වයා" යනු ජෛව රසායනික ක්‍රියාකාරිත්වයේ එක්තරා ඵලයක් පමණි. එහි වෙන දෙයක් නැත. මෙහි කර්ම විපාකයන් ගේ සකස් වීමක්, මානසික ධර්මයන් ගේ බලපෑමක්, විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වයේ මුල් වීමක් ඔවුහු විශ්වාස නොකරති. ජීවිතය පවතින්නේ මරණය තෙක් පමණි. මරණයෙන් මතු ජීවිතයක් ගැන සිතීම පවා විහිළුවකි. ඒ නිසා ජීවිතයේ වින්ද යුතු යම් සැපක් සොම්නසක් ඇත්නම් ණයට හෝ කා - බී ඒ සියලු සැප මෙහිදී ම වින්ද යුතු ය. මරණයත් සමඟ සත්වයා අභාවයට පත් වේ. විනාශයට පත් වේ. මෙය "උච්ඡේද" දෘෂ්ටිය වශයෙන් හඳුන්වනු ලැබේ. බුද්ධකාලීන භාරතයේ පවා මේ දෘෂ්ටිය බලවත් ව තිබුනි.

මේ වෙනුවෙන් ම ආගමික නිකායක් පිහිටුවා ගෙන සිටි තැනැත්තෙක් එකල සිටියේ ය. ඔහු නමින් කේශකම්බල අජිත වේ. හිසකෙස්වලින් වියන ලද කම්බිලියක් ඇඟ දරාගෙන සිටි ඔහු උච්ඡේද වාදියෙකි. ඔහු පවසා සිටියේ පරලොවක් ගැන කිසිසේත් නොසිතිය

sinhalaebooks.com



යුතු බවයි. ගංගා නදියේ එහා කෙළවරේ සිට මෙහා කෙළවර දක්වා දානය ගොඩ ගසා පූජා කළ ද එයින් සිදුවන පිනක් නැත. එමෙන්ම ගංගා නදියේ මෙහා කෙළවරේ සිට එහා කෙළවර දක්වා මිනිසුන් මරා ගොඩ ගැසුව ද එයින් සිදුවන පවකුත් නැත. මව් පියන්ට සැලකීමට කිසිම හේතුවක් නැත. ඒ උදවිය සතුටක් විඳින්නට ගොස් දරුවන් බිහි වුණා මිස ඒ වෙනුවෙන් ඒ අයට ගරු කළ යුතු දෙයක් නැත. සිතක් දියුණු කිරීම, සිල් ගුණ දම් රැකීම විකාර දේවල් ය. භාවනා කිරීම මනස්ගාතයකි. එවැනි උදවිය කොහිද මේ මඟුල් සක්වල? ඕපපාතික උපතක් තිබේ යයි කාහට නම් ඔප්පු කළ හැකි ද? ඕපපාතික උපතක් කියා දෙයක් නැත්තේම ය. මෙයයි අජිත කේශකම්බිලියා ගේ දෘෂ්ටිය. අද පවා මේ දෘෂ්ටියට බැඳී ගිය අතිවිශාල පිරිසක් ආගම් භේදයකින් තොරව දක්නට ලැබේ. විශේෂයෙන් ම මේ උදවිය ආගම් අනුමත නොකරයි. යම් හෙයකින් මේ උදවිය තමන් ආගමකට ලැදි බවක් පෙන්නා සිටිය ද එය හුදෙක් තමා ගේ සමාජ තත්වය පිණිස වැනි ලාභ ප්‍රයෝජනයන් පිණිස ම ය. එසේ නැතිව ජීවිතය පිළිබඳ ව අවංකව යමක් අවබෝධ කර ගැනීමට නොවේ.

## ලෝකය හසුරුවන්නේ "නැත" යන අන්තයයි

විශේෂයෙන් ම මේ "සියල්ල නැත" යන උච්ඡේද දෘෂ්ටියට වර්තමාන ලෝකයේ සියලු ම දේශපාලන දර්ශනයන් හසුවී තිබේ. මාක්ස්වාදය, ධනවාදය, ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය ආදී මේ දේශපාලන වාදයන් සියල්ලම පාහේ බැඳී තිබෙන්නේ උච්ඡේද දෘෂ්ටියට ය. පින් පව් නොපිළිගන්නා එම දේශපාලන පක්ෂ මනුෂ්‍ය වර්ගයාව තළා පෙළා අධික සූරා කෑමකට භාජනය කර තිබේ. වර්ගවාදී, වර්ණවාදී, කළු සුදු වාදී මේ සියලු වාදයන් තුළින් තම තමන් ගේ දේශපාලනික අභිමතාර්ථයන් සපුරා ගැනීම පිණිස ඕනෑම අපරාධයක්, මනුෂ්‍ය ඝාතනයක්, ආයුධ සන්නද්ධ අරගලයක් කරන්නට පෙළඹී සිටින්නේ ද මේ දෘෂ්ටිය තුළින් ය.

sinhalaebooks.com



## යකාගේ කම්මල

මිථ්‍යා දෘෂ්ටිය මෙතැනින් නොනවතී. කේන්දර, ග්‍රහ අපල, සුභ නැකත්, සුභ නිමිති සෙවීම, නාඩි වාක්‍ය බැලීම, පොරොන්දම් බැලීම ආදී සියලු ගුප්ත දේවලට අන්ධ භක්තියක් ඇතිවෙන්නේ දෘෂ්ටි උපාදානයෙනි. එමෙන්ම අල්ලා, දෙවියන් වහන්සේ, ගනේෂ, ස්කන්ධ, පත්තිනි, සිද්ධ පත්තිනි, විභීෂණ, කාලි, මහාකාලි, භෛරව කාලි, ශිව, පාර්වතී, දුර්ගා, සරස්වතී ආදී දෙවිවරුන් හා කඩවර සත්කට්ටුව, මහාසෝනා, රීරි යකා ආදී නා නා නම්වලින් යුතු යක්ෂයන් අදහන්නේ ද, යන්ත්‍ර මන්ත්‍ර බලි තොවිල් දොළ පිදේනි තවු පුළුටු වැනි අභිචාර විධීන් හටගන්නේ ද දෘෂ්ටියකට බැඳී යාම නිසාය.

මේ ආකාර වූ දෘෂ්ටියකට බැඳී ගිය විට සත්‍යයක් දැක්ක නොහැකිය. යළි යළි එයට ම බැඳී යයි. එයින් නිදහස් නොවේ. එයින් නිදහස් වන්නට ශක්තියක් ද නැත.

එවිට සිදුවන්නේ අවාසනාවන්ත දෙයකි. එනම් යහපත් ජීවිතයක් ප්‍රායෝගිකව ගොඩ නඟා ගැනීමේ අවස්ථාව බැහැර කොට අද්භූත ලෙස විසඳුම් සොයන්නට පටන් ගැනීම යි.

දෘෂ්ටි උපාදානය යනු මොන තරම් භයානක දෙයක් දැයි ඔබට මේ තුළින් තේරුම් ගත හැකි ය. මේ දෘෂ්ටිවලට බැඳීයාම නිසා ම විපාක විඳින්නට කර්ම සකස් වේ.

## ඇත – නැත දෙකෙන් අත්මිදෙන්න!

මේ ලොකයේ දුක් කරදර පීඩා ඇති වීම පිණිස බොහෝ විට හේතු වී තිබෙන්නේ "ඇත – නැත" යන අන්ත දෙකට සමස්ත මානව වර්ගයා ම බැඳී සිටීම ය.

එම නිසා බුදුරජාණන් වහන්සේ වදාළේ "ඇත" යන ශාස්වතවාදයත්, "නැත" යන උච්ඡේද වාදයත් බැහැර කොට හේතුන් නිසා ඵල සකස්වන ආකාරය අවබෝධ කරගන්නා ලෙසයි. මේ නිසා ම බුදුන් වදාළ ධර්මයෙන් ඒකාන්තයෙන් ම පවසා සිටින්නේ සාමාන්‍ය ජීවිතයේ දී පවා සම්මා දිට්ඨිය ඇති කර ගැනීමේ අවශ්‍යතාවයයි. එසේ

sinhalaebooks.com



නැති වුවහොත් දෘෂ්ඨී උපාදානයට හසුවන සත්වයා අවිද්‍යා සහගතව කර්ම සකස් වීම තුළින් දුක කරා ම ගමන් කරන බව බුදුරජාණන් වහන්සේ ප්‍රත්‍යක්ෂ ඤාණයෙන් දුටු දෙයකි.

## 3. සීලබ්බත උපාදාන යනු සීල ව්‍රතවලට බැඳී යාමයි

තම තමන් ගේ යහපත උදෙසා උපකාර වන්නේ යයි සිතාගෙන විවිධාකාර ශීලයන්ට ව්‍රතයන්ට බැඳී යාම මෙහි ස්වභාවයයි. ශීලය ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ කයින් හා වචනයෙන් වන වැරදි වළක්වා ගෙන සාමකාමී සහනශීලී ජීවිතයක් උදාකර ගැනීම පමණි. එහි අද්භූත කිසිවක් නැත. අස්වාභාවික කිසිවක් නැත. එහි තිබෙන්නේ ඉන්ද්‍රිය දමනයත් ශාන්ත සංවරයත් ය.

ආයුධ සන්නද්ධ ව්‍යාපාරවලින් තොරව, මිනිසුන් කපා කොටා මැරීමේ ආකල්පයෙන් තොරව, මාරාන්තික වසවිෂ වර්ග, මත් ද්‍රව්‍ය, මත් වතුර ගණුදෙනුවලින් තොරව, චේතනාත්මකව ඇති කරන සත්ව ඝාතනවලින් තොරව, අනුන් ගේ වස්තුව බලහත්කාරයෙන් හෝ අල්ලස් මඟින් හෝ වෙනත් වංචා දූෂණ මඟින් හෝ සොරකම් කිරීමෙන් තොරව, ලෝක සම්මත සදාචාර සීමාවන් ඉක්මවා ගිය ලිංගික ගණුදෙනුවලින් තොරව, බොරුව, වංචාව, කේළම, නපුරු බස් ආදියෙන් තොරව වාසය කිරීම බුදු රජුන් ගේ ශ්‍රාවකයා ගේ ශීලයයි. සාමාන්‍ය ගිහි ශ්‍රාවකයා ගේ දෛනික ජීවිතයට සම්පූර්ණයෙන් ම මේ ශීලය අදාළ වේ.

## සීලය සුන්දර දෙයකි.

තමන් සුරකින මේ ශීලයට අමතර ව පොහෝ දවසට ඊට වඩා වැඩි දෙයක් කරයි. තමන් සරණ ගිය තෙරුවන් සිහි කරන ඔවුන් සද්ධර්මයේ උපරිම ඵල ප්‍රයෝජන ලබාගත් රහතන් වහන්සේලා ගේ ගුණ සිහි කරත්. සිත දියුණු කොට නිකෙලෙස් භාවයට පත් වූ ඒ උතුම් ශ්‍රාවක සංඝරත්නය අනුගමනය කිරීම පිණිස ය පොහෝ දින තෝරා ගන්නේ. ඒ වෙනුවෙන් සැදැහැවත් ශ්‍රාවකයා පොහෝ දින සැප පහසු

sinhalaebooks.com



ආසන පරිහරණයෙන් වෙන් වෙයි. රාත්‍රී භෝජනයෙන් වළකියි. ඇඟපත සැරසීම් සුවඳ ගැල්වීම් ආදියෙන් වළකියි. නැටුම් ගැයුම් වැයුම් ආදියෙන් වැළකී සිටී. මෙසේ ඔහු සිල්වත්ව වාසය කරන්නේ වෙන යම් ගුප්ත ආකර්ශනයක් පතා ගෙන නොවේ.

## සිල් හඳුනා නොගත් විට

බුද්ධ ශාසනයට අයත් මේ ආකාර වූ ශීල ව්‍රත හඳුනා නොගන්නා තැනැත්තා සිල්ව්‍රත නාමයෙන් නොයෙක් විකාර වලට බැඳී යයි. සමහරුන් සිල් හැටියට සලකන්නේ සුදු වස්ත්‍ර හෝ චාම් වස්ත්‍ර ඇඳීම ය. කොණ්ඩය කළු නොකිරීම නියපොතු පාට නොකිරීම වැනි දේවල් ය. ඔවුන් එසේ සැරසිලිවලින් වෙන්වී සිටිමින් අලංකාර ලෙස වාසය කරන කෙනාට නින්දා අපහාස කරති. එය ඒ තැනැත්තා සීලය ලෙස සිතාගෙන සිටින දෙය හුවා දක්වන අයුරු ය.

තවත් සමහරුන් සිල් රැකීම යයි සිතාගෙන සිටින්නේ නිර්මාංශ වීම ය. එතැනින් ඒ මතයට දැඩි ලෙස බැඳී ගොස් කරවල උම්බලකඩ අනුභව කරන අයට පවා සාප කරන්නටත් නින්දා අපහාස කරන්නටත් පටන් ගනිති. තමන් පරම අවිහිංසාවාදීන් ලෙස පෙනී සිටිත්. තමන් මහා ගුණවන්ත වූ කාරුණික කෙනෙක් බවට හුවා දක්වති. නිඝණ්ඨ නාථ පුත්‍ර ගේ ශ්‍රාවකයන් ගත කළේ ඒ ආකාර ජීවිතයන් ය.

බුද්ධ කාලීන සමාජයේ සිටි සමහර උදවිය ඉතා අන්තගාමී ලෙස ව්‍රතයන්ට බැඳී ගියහ. ඔවුහු ස්ත්‍රීන් පිසින ලද ආහාර නොවළඳති. ස්ත්‍රීන් පිළිගැන්වූ ආහාර නො වළඳති. මළ ගෙවල් වලින් ආහාර නො ගනිති. දැරියන් මල්වර වූ නිවෙස්වලින් ආහාර නො ගනිති. කිළිකුණු ඇතැයි කියා ආහාර නො ගනිති. සමහරු ආගමික ආශිර්වාද කළ බත් කති. දෙවියන්ට පිදූ ආහාර පාන අනුභව කරති.

ඊට අමතරව සමහරු සිකුරාදා දිනවල පළතුරු පමණක් කති. කිරි පමණක් බොති. එය ඔවුන් ගේ ව්‍රතයයි. සමහරු නැකතට ගෙපල් කපති. නැකතට විවෘත කරති. වර්තමානයේ දේශපාලකයෝ ද නැකත් බදාගෙන සිටිති. එහෙත් දේශපාලන බිඳ වැටීම්, හතුරු කම්,

sinhalaebooks.com



දුරාචාර, ප්‍රචණ්ඩ ක්‍රියාවල කිසි අඩුවක් නැත. නැකතට කිරි උතුරුවති. මෙය ද ව්‍රතයකි. සමහරු සුභ නැකතට වතුරට බැස නාගෙන පව් සෝදා හරිති. මෙය ද ව්‍රතයකි. සමහරු සුභ නැකතට හිසට කොහොඹ කොළ, පයට ඉඹුල් කොළ තබා නානු ගා නාගනිති. මෙය ද ව්‍රතයකි. සමහරු සුභ නැකතට වැඩ අල්ලති. ගණුදෙනු කරති. මෙය ද ව්‍රතයකි. සමහරු නැකතට ගිනි පාගති. ඇඟේ කටු ගසාගෙන යති. මෙය ද ව්‍රතයකි. සමහරු සූනන් ඇඟ වැටීමේ පලාපල බලති. මෙය ද ව්‍රතයකි. සමහරු අඟහරුවාදා සිකුරාදා මළකුණු නොදවති. මෙය ද ව්‍රතයකි. මේ පැවසූ සීලයන්ට හා ව්‍රතයන්ට හේතු වී තිබෙන්නේ මිථ්‍යා දෘෂ්ටිය යි. මෙහි දසවස්තුක සම්මා දිට්ඨිය වන ලෞකික සම්මා දිට්ඨියවත් නැත!

මෙවැනි මිථ්‍යා දෘෂ්ටියෙන් යුතු ශීල ව්‍රතයන්ට මුළා වී අන්තයට ම බැඳී ගිය විට බල්ලන් ලෙස හැසිරෙන අවස්ථා තිබේ. එය සුනඛ ව්‍රතයයි. එළුවන් මෙන් හැසිරෙන අවස්ථා තිබේ. එය අජ ව්‍රතයයි. ගවයින් මෙන් හැසිරෙන අවස්ථා තිබේ. එය ගෝ ව්‍රතයයි.

මෙවැනි සිල් ව්‍රතයන්ට බැඳී ගිය විට චේතනාත්මක ව රැස්වෙන්නේ අවිද්‍යා සහගත කර්මයන්ම ය. සීලබ්බත උපාදානයෙන් ද විපාක විඳින්නට කර්ම සකස් වේ (උපාදාන පච්චයා භවෝ).

## 4. අත්තවාද උපාදාන = ආත්ම දෘෂ්ටිය බැඳීයාම

මෙය ඉතා ම බලවත් උපාදානයකි. එනම් මම ය, මාගේ ය, මාගේ ආත්මය යයි සිතේ මුල් බැසගත් මතයන්ට බැඳී යාම ය. මේ තුළ බල පවත්වන්නේ තමා යයි සැලකිය හැකි, තමාට වුවමනා විදිහට පැවැත්විය හැකි, තමා ගේ යැයි පැවසිය හැකි යමක්, එනම් ස්ථිර වූ "ආත්මයක්" මේ ජීවිතය තුළ පවතින්නේ ය යන අදහස ය.

දස අතට මුල් පැතිරී ගිය අතුපතර විහිදී ගිය මහා නුගයක් විලසින් ය ජීවිතය පුරා මේ ආත්ම සංකල්පය බලපවත්වන්නේ. තනිකර ම සිතේ මැවී ගිය, එහෙත් බැලූ බැලූ අත සත්‍යයක් සේ පෙනෙන එම මතය මුලිනුපුටා දමන ලද්දේ රහතන් වහන්සේලා පමණි. අනෙක් සියලු සත්වයන් මේ ආත්මවාදයට දැඩි ලෙස හෝ

sinhalaebooks.com



සුළුවෙන් හෝ බැඳී සිටිති.

මේ සතර ආකාරයේ උපාදානයන් තිබෙන කල්හි භවය හෙවත් විපාක විඳින්නට කර්ම සකස් වීම සිදුවන්නේ ම ය. හේතුඵල ධර්මයන් ගේ ස්වභාවය නම් හේතුව සකස් වන විට ඵලය සකස් වීම යි. හේතුව නිරුද්ධ වන විට ඵලය නිරුද්ධ වීම යි.

## බුදු සසුනේ දී පමණයි!

## රහතන් වහන්සේලා පහළවහන්නේ

බුද්ධ ශාසනයේ උත්තරීතර ප්‍රඥාව ලබාගත් රහතන් වහන්සේට මේ සතර ආකාරයේ බැඳීයාම් නැත. සම්පූර්ණයෙන් ම ප්‍රහීන වී ඇත. උපාදාන නිරුද්ධ වී ඇති නිසා භවය ද නිරුද්ධ වී ඇත. භවය නිරුද්ධ වී ඇති නිසා ඉපදීම ද නිරුද්ධ වී ඇත. උපතින් නිදහස් වූ විට ජරා මරණ දුකින් සදහට ම නිදහස් වෙයි!

## අනාගාමී

බුදු රජුන් ගේ අනාගාමී ශ්‍රාවකයන් තුළ කාම උපාදාන නැත. දිට්ඨි උපාදාන නැත. සීලබ්බත උපාදාන නැත. අත්තවාද උපාදානයේ විසි ආකාර සක්කාය දිට්ඨිය ද නැත. එහෙත් මම ය මාගේ ය යන මතය අභ්‍යන්තරිකව අනුසහගතව බල පවත්වයි.

එය මේ ආකාර වේ. කිළිටි වස්ත්‍රයක් සබන් දමා සෝදා අලුත් කළ විට වස්ත්‍රය පිරිසුදු නමුත් සබන් ගඳ පවතී. එහෙත් සුවඳ කපුරු යෙදූ අල්මාරියක, ඒ වස්ත්‍රය නවා තැබූ කල්හි ඒ සබන් ගඳ ද නැති වී යයි.

අනාගාමී ශ්‍රාවකයින් ගේ මමත්වය, සේදූ වස්ත්‍රයේ සබන් ගඳ වැනි ය. ඔහු තුළ කාම උපදාන නොමැති නිසා කාම භවයක් සකස් නොවේ. එම නිසා කාම ලෝකයේ උපතක් නැත. එහෙත් අනුසහගත මමත්වය නිසා රූප ධාතුවේ හෝ අරූප ධාතුවේ විඤ්ඤාණය පිහිටයි. චේතනාව පිහිටයි. පැතුම පිහිටයි. එම නිසා රූප භවය හෝ අරූප භවය සකස් වේ. එවිට රූපාවචර බ්‍රහ්ම ලෝකවල හෝ අරූපාවචර

sinhalaebooks.com



බ්‍රහ්ම ලෝකවල උපත ලබයි. එහි දී මමත්වයෙන් සහමුලින් ම දුරු වී උපාදාන නැතිවීම නිසා භවය නැති වීමෙන් පිරිනිවන් පායි!

## සකදාගාමී

බුදුරජුන් ගේ සකදාගාමී ශ්‍රාවකයින් තුළ කාම උපාදානය බලවත්ව නොපවතී. එහෙත් කාම උපාදාන නැත්තට ම නැතිවී නැත. දිට්ඨි උපාදානයෙන් හා සීලබ්බත උපාදානයෙන් සම්පූර්ණයෙන් ම මිදී ඇත. විසි ආකාර ආත්ම දෘෂ්ටිය ද නැත. එහෙත් මම ය, මාගේ ය මාගේ ආත්මය යන අදහස ඔහු තුළ පවතී. එය අසත්‍යයක් බව හේ දනී. තමා ගේ සිත තුළ ගොඩ නැගෙන ඒ මායාකාරී හැඟීම අවිද්‍යාව නිසා පවතින බව ඔහු දනී. එනිසාම අවිද්‍යාව දුරු කර ගැනීම පිණිසත් විද්‍යාව උපදවා ගැනීම පිණිසත් ඔහු වැයම් කරයි. ඒ ශ්‍රාවකයා කාම උපාදානයට තරමක් බැඳී සිටින නිසා කාම භවය සකස් වේ. කාම භවය සකස් වෙන නිසා කාම ලෝකයේ උපදී. හේ එක් වරක් මිනිස් ලොව හෝ දෙව් ලොව ඉපිද දුක් අවසන් කරන්නේ වේ.

## සෝතාපන්න

බුදුරජුන් ගේ සෝතාපන්න ශ්‍රාවකයා ආර්ය අෂ්ටාංගික මාර්ගයට ආධ්‍යාත්මිකව පැමිණි පළමු තැනැත්තා ය. එම නිසා "සෝත" හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණි තැනැත්තා යන අර්ථයෙන් ඔහුට "සෝතාපන්න" යයි කියනු ලැබේ. සෝතාපන්න ශ්‍රාවකයාට කාම උපාදාන තිබේ. එහෙත් ඔහුට කාම උපාදානයේ ආශ්වාදය පමණක් නොව ආදීනව ද හඳුනාගත හැකි ය. නිස්සරණය හෙවත් කාමයන් කෙරෙහි ඇති ඡන්දරාගය දුරු කරගැනීමෙන් ලබන සැනසීම ද ඔහු යාන්තමින් තේරුම් ගෙන තිබේ. එමෙන් ම සෝතාපන්න ශ්‍රාවකයා තුළ දිට්ඨි උපාදාන නැත. සීලබ්බත උපාදාන නැත. විසි ආකාර ආත්මදෘෂ්ටිය හෙවත් සක්කාය දිට්ඨිය ද නැත. එහෙත් මම ය, මාගේ ය, මාගේ ආත්මය යන මුල් බැස ගත් මතය වරදක් බවත් අසත්‍යයක් බවත් හේ දනී. හේතූන් නිසා හටගන්නා වූ යම් දෙයක් ඇත් ද, ඒ සියල්ල ම හේතූන් නැති වීමෙන් නැතිව යන

sinhalaebooks.com



ධර්මතාවෙන් යුක්ත යයි (යං කිංචි සමුදය ධම්මං, සබ්බං තං නිරෝධ ධම්මං) තමා තුළින්ම ඇති වූ අවබෝධයෙන් දනී.

එහෙත් කාමයට බැඳී යාම තිබෙන නිසා කාමභෝගී ව අඹු දරුවන් ගේ කටයුතු ද කරමින් දැහැමින් සෙමින් සැනසිල්ලේ කල් ගෙවයි. දිට්ඨි උපාදාන, සීලබ්බත උපාදාන හා විසි ආකාර සක්කාය දිට්ඨිය ද ප්‍රහීණ වීම නිසා අපායගාමී කර්මයන් ප්‍රහීණ වී ඇත. නිරයේ හෝ ප්‍රේත ලෝකයේ හෝ තිරිසන් ලෝකයේ හෝ අපායේ හෝ ඉපදීම පිණිස කර්ම සකස් නොවේ. ඒ නිසා සෝතාපන්න ශ්‍රාවකයා හේ සිට රහතන් වහන්සේ දක්වා බුදුරජුන් ගේ ශ්‍රාවකයින් සියලු දෙනාම අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතිකව උපදින සියලුම අපා දුක්වලින් සදහට ම නිදහස් වී සිටිති.

සාංසාරික ජීවිතය “උපාදාන පච්චයා භවෝ” හෙවත් ග්‍රහණය වීමක් නිසා විපාක විඳින්නට කර්ම සකස් වීමෙන් නිර්මාණය වන දෙයක් වන බව ඉතා ම පැහැදිලිව අවබෝධ කරගත්තේ බුදුරජාණන් වහන්සේ ගේ විස්මිත අවබෝධය තුළින් ය.

## බැඳී ගිය දේ!

මේ ග්‍රහණය වීම හෙවත් බැඳීයාම ගැන උන්වහන්සේ මේ ආකාරයට ද පෙන්වා දුන්හ.

“පින්වත් මහණෙනි, බැඳීයාමට හේතුවන්නා වූ දේවල් ද බැඳීයාම ද දැන් ඔබට කියා දෙන්නෙමි.

පින්වත් මහණෙනි, බැඳීයාමට හේතුවන්නා වූ දේවල් මොනවා ද?

පින්වත් මහණෙනි, ඇස වනාහී බැඳීයාමට හේතු වූ දෙයකි. කණ ද බැඳී යාමට හේතු වූ දෙයකි. නාසය ද බැඳීයාමට හේතු වූ දෙයකි. දිව ද බැඳීයාමට හේතු වූ දෙයකි. කය ද බැඳීයාමට හේතු වූ දෙයකි. මනස ද බැඳීයාමට හේතු වූ දෙයකි.

sinhalaebooks.com



පින්වත් මහණෙනි, මේ දේවල් කෙරෙහි පවතින්නා වූ යම් ඡන්දරාගයක් වේ ද, "බැඳී යාම" කියන්නේ එයට ය"

(උපාදාන සූත්ත – සං. නි. 4)

## ඉතාම කෙටියෙන් නිවන් මග!

දිනක් බුදුසමිඳුන්ව බැහැදකින්නට පැමිණි භික්ෂුවක්, තමා හට දුකින් නිදහස් වීමට උපකාරී වන ධර්මයක් කියා දෙන්නැ'යි ඉල්ලා සිටියේ ය. එවිට බුදුරජාණෝ මෙසේ වදාළහ.

"පින්වත් භික්ෂුව, බැඳීයාමකට හසු වූ කල්හි මාරයාගේ තොණ්ඩුවට සිර වූයේ වෙයි. බැඳී යාමෙන් නිදහස් වූ කල්හි මාර තොණ්ඩුවෙන් නිදහස් වෙයි."

බුදු සමිඳුන් විසින් ඉතාම කෙටියෙන් පෙන්වා දෙන ලද මේ ධර්මය ඒ සැණෙකින් ම වටහාගන්නට ඒ පින්වත් භික්ෂුව සමර්ථ විය. ඉතා ප්‍රීතියට පත් වූ ඒ භික්ෂුව බුදු සමිඳාණන්ට මෙසේ පැවසීය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඒ ශ්‍රී සද්ධර්මය මට අවබෝධ වුනා! මහෝත්තම සුගතයන් වහන්ස, ඒ ශ්‍රී සද්ධර්මය මට අවබෝධ වුනා!"

"හොඳයි පින්වත් භික්ෂුව, මා විසින් ඉතාමත් සංක්ෂිප්තව පවසන ලද මේ ධර්මය ඔබ අවබෝධ කරගත්තේ කුමන ආකාරයෙන් ද?

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා විසින් මේ ශ්‍රී සද්ධර්මය වටහා ගන්නා ලද්දේ මේ ආකාරයෙන් ය.

එනම් සතර මහා භූතයන් ගෙන් හටගත් රූපයකට බැඳීගිය විට මාරයාගේ තොණ්ඩුවට සිරවූයේ වෙයි. රූපයට ඇති බැඳීමෙන් නිදහස් වූ විට මාරයා ගේ තොණ්ඩුවෙන් නිදහස් වූයේ වෙයි.

ස්පර්ශයෙන් හටගත් විඳීමකට බැඳීගිය විට මාරයා ගේ තොණ්ඩුවට සිරවූයේ වෙයි. විඳීම් කෙරෙහි ඇති බැඳීමෙන් නිදහස් වී ගිය විට මාර තොණ්ඩුවෙන් නිදහස් වූයේ වෙයි.

sinhalaebooks.com



ස්පර්ශයෙන් හටගත් හඳුනාගැනීමකට (සඤ්ඤාවකට) බැඳීගිය විට මාර තොණ්ඩුවට සිර වූයේ වෙයි. හඳුනාගැනීම කෙරෙහි ඇති බැඳීමෙන් නිදහස් වී ගිය විට මාර තොණ්ඩුවෙන් නිදහස් වූයේ වෙයි.

ස්පර්ශයෙන් හටගත් චේතනාවකට (සංඛාරයකට) බැඳී ගිය විට මාර තොණ්ඩුවට සිර වූයේ වේ. චේතනාව කෙරෙහි ඇති බැඳීමෙන් නිදහස් වී ගිය විට මාර තොණ්ඩුවෙන් නිදහස් වූයේ වෙයි.

නාම-රූපයෙන් හටගත් විඤ්ඤාණයට බැඳී ගිය විට මාර තොණ්ඩුවේ සිරවූයේ වෙයි. විඤ්ඤාණය කෙරෙහි ඇති බැඳීමෙන් නිදහස් වූ විට මාර තොණ්ඩුවෙන් නිදහස් වූයේ වෙයි.”

(උපාදාය සුත්ත – සං. නි. 03)

ඉතා ම කෙටියෙන් දුන් උපදේශය වඩාත් පැහැදිලි ලෙසත් අර්ථ පූර්ණ ලෙසත් වටහා ගැනීමට තරම් තම ශ්‍රාවකයා බුද්ධිමත් වීම ගැන භගවත් බුදු සම්ඳාණෝ ප්‍රශංසා කළ සේක. පරිපූර්ණ අවබෝධය දක්වා ම ඒ ධර්මය උපකාරී කර ගන්නැ’යි උන්වහන්සේ තවදුරටත් උපදෙස් දුන් සේක.

එම නිසා වර්තමානයේ පවතින ඊනියා විද්‍යාත්මක පොත පත කියවා ඒ පොත්පත්වල තිබෙන යම් යම් අසම්පූර්ණ සොයා ගැනීම් ගැන බුද්ධිමත් බෞද්ධ ශ්‍රාවකයින් කලබල විය යුතු නැත. එමෙන්ම ඒ ඊනියා විද්‍යාත්මක මතවාදයන් අසිරිමත් ප්‍රඥාවෙන් යුතු අපගේ ශාස්තෘන් වහන්සේ විසින් වදාරණ ලද ශ්‍රී සද්ධර්මය සමඟ ගලපන්නට යාම කිසිසේත් ම නො කළ යුතු ය. එමෙන් ම එය කළ හැක්කක් ද නොවේ. සංසාර ගත සත්වයාව ඒ සංසාරයෙන් සම්පූර්ණයෙන් ම නිදහස් කරවන මේ ශ්‍රී සද්ධර්මයට ගැළපීමට තරම් මේ හා සමාන ධර්මයක් ලෝකයේ කොයින් නම් සොයන්ට ද? යමෙක් එසේ සොයා ගතහොත් එය බුදුරජාණන් වහන්සේගේ ම ධර්මයක් විය යුතුයි. එසේ නැතිව මන්ද බුද්ධිකව කටයුතු කිරීම බෞද්ධයන්ට නොගැළපේ. එම නිසා ඊනියා විද්‍යාත්මක මතයක් දෙකක් පාඩම් කරගත් පමණින් විද්‍යාඥයන්ටත් වඩා විද්‍යාඥ වීමට තරම් ගැති වී සිටින උදවිය ගැන අප විසින් අනුකම්පාව ම උපදවා ගත යුතුයි.

sinhalaebooks.com



## සැබෑම මග පෙන්වීම

අපගේ ශාස්තෘ වූ බුදු සම්දුන් ගේ මේ විස්මිත සොයා ගැනීම හුදෙක් උන්වහන්සේ ගේ සැපයට පමණක් සීමා වූ පෞද්ගලිකව උන්වහන්සේට පමණක් අදාළ වූ සත්‍යයක් නොවේ. එමෙන්ම තමන් වහන්සේ විසින් දාර්ශනිකව ගොඩ නගන ලද කිසියම් ගුප්ත වූ සමීකරණයක් ද නොවේ. ජනතාව තමන් ගේ පැත්තට හරවා ගැනීම පිණිස කිසියම් බිය ගැන්වීමකින් කරන ලද ප්‍රයෝගයක් ද නොවේ. අන්‍ය මතයන්ට එරෙහි ව තර්කානුකූලව ගොඩනගා ගත් කිසියම් වාද ක්‍රමයක් ද නොවේ. උන්වහන්සේ අවබෝධ කර ගත් ධර්මය උන්වහන්සේ ගේ ශ්‍රාවකයන්ට ද ඒ අයුරින්ම අවබෝධ කරවීම පිණිස ම ය උන්වහන්සේ ගේ ජීවිතය කැප කරන ලද්දේ. තම ශ්‍රාවක භාවය ලබා ගත් පිරිස ගැන උන්වහන්සේ විශේෂ අවධානයකින් කටයුතු කළහ. වගාකිරීම පිණිස සාරවත් කුඹුර ම පළමුව තෝරා ගන්නා දක්ෂ ගොවියෙකු පරිද්දෙනි. උන්වහන්සේ ඉතාමත් උනන්දුවෙන් ය තම ශ්‍රාවකයින්ව දහම් මාවතේ හික්මවන්නේ. ඒ ශ්‍රාවක පිරිස ද පෙන්වා දෙන සදහම් මාවත ඔස්සේ ජීවිත හසුරුවා ගනිති. අවසානයේ දී ඒ ශ්‍රාවක පිරිස ද උන්වහන්සේ උපාදානයන් ගෙන් නිදහස් වන්නට සමර්ථ වූවාක් මෙන් සියලු උපාදානයන් ගෙන් නිදහස් වන්නට සමර්ථ වෙති. එය වනාහී කෝටි සංඛ්‍යාත දිව්‍ය – මනුෂ්‍ය ශ්‍රාවක සමූහයා ගේ සජීවී අත්දැකීමකි.

උපාදානයන් ගෙන් සදහටම නිදහස් වූ බුදුරජාණන් වහන්සේ උපාදානය හටගැනීමේ හේතුව ද අවබෝධයෙන් ම ප්‍රහීණ කළ සේක.

උපාදානය වනාහී දේව කැමැත්තකින් හටගත්තේ ය යන මිථ්‍යාවට ද අදාළ නැති බවත්, තමා විසින් කරන ලද්දක් ය යන මිථ්‍යාවට ද අදාළ නැති බවත් උන්වහන්සේ අපට හෙළිදරව් කළ සේක. එනම් උපාදානය වනාහී හේතුවක් නිසා හටගත් ඵලයකි.

sinhalaebooks.com



## කුමකින් සැදුනේ ද මේ උපාදානය?

විස්මිත අවබෝධයෙකින් හෙබියා වූ අපගේ ශාස්තෘන් වහන්සේ අතිශයින් ම සාර්ථක ලෙස මේ ගැටළුව විසඳාගත් සේක. එමෙන් ම දෙව් මිනිස් ලෝකයාට ද එය අනාවරණය කළ සේක. උපදානය හටගන්නේ කුමක් නිසා ද යන්න තව දුරටත් රහසක් නොවී ය. හේතු - ඵල සකස් වීම නමැති ග්‍රහ වළල්ලට මැදි වී තිබෙන ජීවිතයේ අංගෝපාංග දැන් ටිකෙන් ටික තේරුම් ගත හැකි ය.

"උපාදාන" හටගන්නේ තණ්හාව හෙවත් ආශාව ඇති කල්හි ය. ආශාව හේතු කොට ගෙන ය බැඳීයාම හටගන්නේ."

(ගෝතම සුත්ත – සං. නි. 02)

## ජීවිතයට විණ කරන අපලය?

සම්බුද්ධත්වයට පත් වීමෙන් පසු උන්වහන්සේ විසින් පවත්වන ලද ප්‍රථම දේශනයේ දී ම ජීවිත ගැටළුවේ මූලික හේතුව වශයෙන් හෙවත් දුක්ඛ සමුදය වශයෙන් උන්වහන්සේ පෙන්නා දුන්නේ මේ තණ්හාව ම ය.

"පින්වත මහණෙනි, ලෝකයේ කුමන පදනමක දී වුවත් වෙනස් නොවන්නා වූ, සනාතන සත්‍යයක් වශයෙන් පවතින්නා වූ, දුක්ඛ සමුදය හෙවත් දුකේ හේතුව කුමක් ද?

පින්වත් මහණෙනි, යළි යළිත් විපාක විඳින්නට කර්ම සකස් වීම ඇති කරවන (පෝනෝභවිකා), ආශ්වාදයෙන් ඇලෙන ස්වභාවයෙන් යුක්ත වූ (නන්දිරාග සහගතා), උපනුපන් ඕනෑම ජීවිතයක දී ඒ ඒ දෙය සතුටින් පිළිගන්නා වූ (තත්‍ර තත්‍රාභිනන්දනී) යම් මේ තණ්හාවක් ඇත් ද එයයි. ඒ කවර තණ්හාවක් ද යත්.

එනම්,

I. රූප – ශබ්ද – ගන්ධ – රස – පහස යන මේ කාම අරමුණුවලට ආශාව ඇති වීම කාම තණ්හාව වේ.

II. මම ය, මාගේ ය, මාගේ ආත්මය වශයෙන් පිළිගත් තම

sinhalaebooks.com



තමන් ගේ ජීවිත යළි යළිත් පවත්වා ගැනීමේ ආශාව භව තණ්හාව වේ.

III. සිත හෝ කය හෝ කිසිවක් නොපැවැත්ම පිණිස තමා ගේ හිතේ මුල් බැසගත් ආශාව විභව තණ්හාව වේ. (අරූප ලෝකයේ උපත පිණිසත් අසඤ්ඤ සත්ව ලෝකයේ උපත පිණිසත් හේතුවන්නේ මේ ආශාව මතු වී ගිය විට ය.)

(ධම්මචක්ක සුත්ත – සං. නි. 5 II)

ජීවිතයට පූර්ණ අස්වැසිල්ලක් ලබන්නට නම් මේ ත්‍රිවිධ තණ්හාව ම ප්‍රහාණය කළ යුතු බවට තණ්හාව ප්‍රහීණ කළ අප ගේ බුදු සමිඳාණෝ සහතික කොට පවසා සිටියහ.

## විමසන්නාට ම වැටහේ!

එහෙත් සාමාන්‍ය ජීවිතයක් ගත කරන කෙනෙකුට තමා තුළ මේ ත්‍රිවිධ ආකාරයේ ම තණ්හාව පවතින බව බැලූ බැල්මට නොපෙනේ. තණ්හාවේ වේගවත් ක්‍රියාකාරිත්වයට තමා මුළුමණින් ම හසුවී සිටින බව තේරුම් ගන්නේ කලාතුරකින් කෙනෙකි.

එයට ප්‍රධාන හේතුව ජීවිතයේ ගැඹුරින් අධ්‍යයන කළ යුතු විමසා බැලිය යුතු සත්‍ය වූ ධර්මයක් බොහෝ දෙනෙකුට අසන්නට නොලැබීම ය. ස්වභාවයෙන්ම ආශ්වාදයට ගිජු වී සිටින කෙනා ඒ ආශ්වාදය තමාට අහිමිව යනු ඇත යන බියෙන් නිතර පෙළෙයි. අවිද්‍යා සහගතව මමත්වයෙන් අඳුරු වී ගිය ජීවිතය අවබෝධයක් කරා යොමු කර ගැනීම පහසු නැත.

එහෙත් යමෙක් ජීවිතය තුළ පවතින තේරුම් ගැනීමේ හැකියාව සත්‍ය වූ ධර්මයක් ඔස්සේ යොමු කළොත් ඒ තැනැත්තා පමණක් ආර්ය සත්‍යයන් හඳුනා ගැනීමට දක්ෂ වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැන ධර්මය තුළ පෙන්වා දී ඇති ආකාරයට ම තේරුම් ගැනීමට දක්ෂ වේ. ඒ තැනැත්තා පමණක් ජීවිතයේ පරිපූර්ණ ශාන්තිය උදාකර ගනු ඇත.

sinhalaebooks.com



## ඇත්ත දුටුවොත් කළකිරේ!

සාමාන්‍යයෙන් බොහෝ දෙනෙකුට තණ්හාව නැති වීම යන අදහස සිතෙන විටත් බිය හටගනී. එහෙත් යම් කෙනෙක් තණ්හාවේ ස්වභාවයත්, තණ්හාව තුළින් ජීවිතවලට සිදු වී ඇති විපතත්, තණ්හාව නිසාම උපාදාන සකස් වී, උපාදානය නිසා භවය සකස් වී, භවය නිසා ඉපදීම සකස් වී සත්වයා සසර දුකට වැටෙන ආකාරය දුටුවේ නම් ඒ තැනැත්තා තණ්හාව පැවතීම ගැන කිසිසේත් කැමැති නොවන්නේ ම ය.

දිනක් එක්තරා දෙවි කෙනෙක් බුදුරජාණන් වහන්සේ සමීපයට පැමිණ උන්වහන්සේ ගෙන් මේ ප්‍රශ්නය විචාළේ ය.

"මේ සත්වයා ව ජනිත කළේ කවුරුන් ද?"

(කිංසු ජනේති පුරිසං)

බුදු සමිඳාණෝ ඉලක්කයට ම පිළිතුරු දුන් සේක.

"මේ සත්වයා ව ජනිත කළේ තණ්හාවයි."

(තණ්හා ජනේති පුරිසං)

උන්වහන්සේ මෙසේ පිළිතුරු සපයන්නේ කාගෙන් වත් අසා දැන ගත් දැනුමෙකින් හෙවත් සුතමය ඤාණයකින් නොවේ. බුදුරජාණන් වහන්සේට අනුන්ගෙන් අසා දැනගත් සුතමය ඤාණයක් නැත. උන්වහන්සේ ගේ ඤාණය "පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු" විය. එනම් තමන් ගේ ජීවිත කාලය තුළ කිසිවෙකු ගෙන් නො අසන ලද ධර්මයන් ගැන උන්වහන්සේට දහම් ඇස පහළවිය. ඤාණය පහළ විය. එනිසාම ය මේ සා විස්මිත අවබෝධයක් උන්වහන්සේ ට තිබුණේ.

## ආශාව ඇතිවේ

"පින්වත් මහණෙනි, ආශාව සය ආකාරයකින් පවතී. ඇසින් දකින රූපය කෙරෙහි ආශාව ඇති වේ. කණට ඇසෙන ශබ්ද කෙරෙහි ආශාව ඇති වේ. නාසයට දැනෙන ගඳ සුවඳ කෙරෙහි ආශාව ඇති වේ. දිවට දැනෙන රස කෙරෙහි ආශාව ඇති වේ. කයට දැනෙන පහස

sinhalaebooks.com



කෙරෙහි ආශාව ඇති වේ. සිතට සිතෙන දේ කෙරෙහි ආශාව ඇති වේ.

(විභංග සුත්ත – සං. නි. 2)

වරක් බුදුරජාණන් වහන්සේ ගෙන් මෙවැනි ප්‍රශ්නයක් අසන ලදී.

"ජීවිතය ඇතුළට ම බැසගෙන තිබෙන යකඩ හුල කුමක් ද?"

(කේන සල්ලේන ඔතිණ්ණෝ)

බුදු සමිඳාණෝ ඉතා ම පැහැදිලි ලෙස මෙසේ පිළිතුරු දුන්හ.

"ජීවිතය ඇතුලට ම බැස ගෙන තිබෙන්නේ තණ්හාව නම් වූ යකඩ හුල ය"

## ජීවිතයේ නවාතැන් පොළ

"පින්වත් මහණෙනි, දෙවියන් ද මිනිසුන් ද නවාතැන් පළ කර ගෙන සිටින්නේ ඇසට පෙනෙන රූපයන් ය. ඔවුහු රූපයට ඇලී සිටිති. රූපයෙන් ම සතුටු වෙති. ඒ රූපයන් ම වෙනස් වී යනවිට, ඒ රූපයන් කෙරෙහි ඇති ඇල්ම අතහැර ගන්නට සිදුවෙන විට, ඒ රූපයන් ගැන තිබෙන ඇල්ම නැති කර ගන්නට සිදුවන විට දෙවිවරුත් මිනිස්සුත් දුකසේ වාසය කරති."

## ඒ නිසාම දුක් විඳී

පින්වත් මහණෙනි, දෙවියන් ද මිනිසුන් ද නවාතැන් පළ කරගෙන සිටින්නේ කණට ඇසෙන ඇසෙන ශබ්දයන් ය. ඔවුහු ශබ්දයට ඇලී සිටිති. ශබ්දයෙන් ම සතුටු වෙති... නවාතැන් පළ කරගෙන සිටින්නේ නාසයට දැනෙන ගඳ සුවඳ ය. ඔවුහූ ගඳ සුවඳට ඇලී සිටිති. ගඳ සුවඳින් ම සතුටු වෙති... නවාතැන් පළ කරගෙන සිටින්නේ දිවට දැනෙන රසය යි. ඔවුහූ රසයට ම ඇලී සිටිති. රසයෙන් ම සතුටු වෙති... නවාතැන් පළ කරගෙන සිටින්නේ කයට දැනෙන පහස ය. ඔවුහු පහසට ඇලී සිටිති. පහසින් ම සතුටු වෙති... නවාතැන් පළ කරගෙන සිටින්නේ සිතට සිතෙන අරමුණු ය. ඔවුහූ සිතට සිතෙන අරමුණුවල ඇලී සිටිති. සිතට සිතෙන අරමුණුවලින් ම සතුටු වෙති.

sinhalaebooks.com



එහෙත් ඒ සිතට සිතෙන අරමුණු වෙනස් වන විට, ඒවා ගැන ඇල්ම අත්හරින්නට සිදුවන විට, ඒවා ගැන තිබෙන ඇල්ම නැති කරගන්නට සිදුවන විට දෙවිවරුත් මිනිස්සුත් දුකසේ වාසය කරත්.

(ගයිහ සුත්ත – සං. නි. 4)

සත්වයා දුක් විඳින්නේ ආශාව නිසා බව තේරුම් ගන්නට සමත් වන්නේ ජීවිතය ගැන ගැඹුරින් වටහා ගැනීමේ හැකියාව ඇති තැනැත්තා පමණි. ජීවිතය මුළුමනින් ම දුකක් කරා ගෙන යන්නට ආශාවට පුළුවන. ජීවිතය මුළුමණින්ම වනසාලන්නට ආශාවට පුළුවන.

## ජීවිතයේ අසාධ්‍ය රෝගය!

"පින්වත් මහණෙනි, ආශාව රෝගයකි. ආශාව සැරව ගලන තුවාලයකි. ආශාව යකඩ හුළකි. පින්වත් මහණෙනි, ආශාවෙන් යුතු හැඟීමක් පවත්වන්නේ වේ ද, තමා නම් වූ "ආත්මයක්" තිබෙන්නේ යයි ආශාවෙන් යුතු හැඟීමක් පවත්වන්නේ වේ ද, "තමාගේ ආත්මය" වශයෙන් යමක් තිබේ යයි ආශාවෙන් හඟින්නේ වේ ද, එසේ සිතාගත් දෙයට වඩා වෙනස් වූ දෙයක් ම ය සිදුවන්නේ. වෙනස් වන ස්වභාවයට අයත් භවයෙහි ඇලුණු ලෝක සත්වයා භවය ම සතුටින් පිළිගන්නේ වේ.

(දුතිය ඒජා සුත්ත – සං. නි. 4)

ලෞකික ජීවිතය පවතින්නේ ආශාව ම පදනම කොට ය. ඒ නිසාම දුර දිග කල්පනා කිරීමක් සාමාන්‍ය ජීවිතයක නැත. පටු සීමාවලට සිරවන ඔවුන් තුළ නොයෙක් කරදර කම්කටොළු, අඬදබර, කලකෝලාහල, මනුෂ්‍ය ඝාතන ආදී සියල්ල හට ගැනීමට ආශාව ම මුල් වන බව අපගේ බුදු සම්ඳාණෝ අවබෝධ කරගෙන සිටියහ.

## ආශාවෙන් හැදෙන පුරුක්!

"පින්වත් ආනන්දයෙනි, විඳීම හේතු කොට ගෙන ය ආශාවක් හටගන්නේ (වේදනං පටිච්ච තණ්හා). ආශාව හේතු කොට ගෙන ආශා කරන දේ සොයයි (තණ්හං පටිච්ච පරියේසනං). සෙවීම හේතු කොට

sinhalaebooks.com



ගෙන සම්භ වේ (පරියේසනං පටිච්ච ලාභෝ). සම්භ වූ දෙය හේතු කොට ගෙන වටිනාකම තීරණය කරයි (ලාභං පටිච්ච විනිච්ඡයං). වටිනාකම තීරණය කිරීම හේතු කොට ගෙන ඡන්දරාගය ඇති වේ (විනිච්ඡයං පටිච්ච ඡන්දරාගෝ). ඡන්දරාගය හේතු කොට ගෙන සිත එහි බැස ගනී (ඡන්දරාගං පටිච්ච අජකෙඩා්සානං). සිත එහි බැස ගැනීම හේතු කොට ගෙන එය තමා සතු කර ගනී (අජ්කෙඩා්සානං පටිච්ච පරිග්ගහෝ). එය තමා සතු කර ගැනීම හේතු කොට ගෙන තව කෙනෙකුට එය ලැබීම ගැන අකැමැති වේ (පරිග්ගහං පටිච්ච මච්ඡරියං). තව කෙනෙකුට එය ලැබීම ගැන ඇකැමැති බව හේතු කොට ගෙන එය රැක ගැනීමට වෙහෙසෙයි (මච්ඡරියං පටිච්ච ආරක්ඛං). රැක ගැනීම හේතු කොට ගෙන දඬු මුගුරු ගැනීම්, අවි ආයුධ ගැනීම්, කලිකලහ ඇතිවීම්, භේද භින්න වීම්, එකිනෙකාට ඇණුම් බැණුම් කීම්, කේළාම් කීම්, බොරුකීම් ආදී අනේක විධ ලාමක අකුසල ධර්මයන් හටගනිත්.”

(මහානිදාන සූත්ත – දී. නි. 02)

මෙවැනි දෙසුම් ගැන අප ඉගෙන ගන්නා විටයි තණ්හාවේ බරපතලකම යන්තමින් හෝ වටහා ගත හැක්කේ. තණ්හාව පවතින්නේ දස දිසාවට අක්මුල් පැතිරී ගිය පිළිකාවක් පරිද්දෙනි. ඒ තණ්හාව මුල් වීමෙන් දුක් දොම්නස් හටගන්නා හැටි උන්වහන්සේ විසින් සොයා ගන්නා ලද්දේ තමන් වහන්සේ ලත් විස්මිත අවබෝධය නිසා ම ය.

## සංසාර ගමනේ තණ්හා ආශා

“පින්වත් මහණෙනි, ඔබට තණ්හාව ගැන කියා දෙන්නෙමි. මේ තණ්හාව හෙවත් ආශාව වනාහී සත්වයාව භවයේ සිරකොට බැඳ තබන දැළක් වැන්න (ජාලිනී). භවය කරා වේගයෙන් රැගෙන යන සැඩ පහරක් (සරිතා) වැන්න. ජීවිතය පුරා එතී පැතිරී ගිය දෙයක් (විසටං) වැන්න. නිදහස් විය නොහැකි පරිද්දෙන් බැඳී ගිය දෙයක් වැන්න (විසත්තිකා).

sinhalaebooks.com



මේ ආශාවෙන් මුළු මහත් සත්ව ප්‍රජාව ම වෙලන ලද්දේ වේ. ආශාවෙන් ම යටත් කරන ලද්දේ වේ. අවුලෙන් අවුලට පත් වී ගිය නූල් කැටියක් මෙන් කරන ලද්දේ වේ. එනිසා ම මේ සත්වයෝ ඉතා ම දුක්ඛිත උපතින් යුතු අපායට වැටෙන සුළු සංසාරය ඉක්මවා ගත නොහැකිව සිටිති.

පින්වත් මහණෙනි, මෙවැනි ස්වභාවයෙන් යුතු ආශාව ජීවිතාභ්‍යන්තරයෙහි දහඅට ආකාරයකට ක්‍රියාත්මක වේ. බාහිර අරමුණු ඔස්සේ ද දහඅට ආකාරයකට ක්‍රියාත්මක වේ.”

## ජීවිතය බිළිගත් ආශාවේ හැටි!

පින්වත් මහණෙනි, ජීවිතාභ්‍යන්තරයෙහි දහඅට ආකාරයකට හැසිරෙන්නේ කවර ආශාවක් ද?

1. “මම වෙමි” යි කියා ආශාව බලපවත්වයි. 2. “මේ නම් ගොත්වලින් යුතු කෙනා මම වෙමි” යි ආශාව බලපවත්වයි. 3. “මේ ආකාරයෙන් යුතු කෙනා මම වෙමි” යි ආශාව බලපවත්වයි. 4. වෙනත් ආකාරයකින් යුතු වුව ද මම වෙමි. 5. “අනිත්‍ය වූයේ නමුත් මම වෙමි” යි ආශාව බලපවත්වයි. 6. “නිත්‍ය වූයේ නමුත් මම වෙමි” යි ආශාව බලපවත්වයි. 7. සැබැවින්ම මම වෙම් ද? 8. මේ නම් ගොත්වලින් යුතුව මම වෙම් ද? 9. මම මේ ආකාරයෙන් ම සිටිම් ද? 10. මම වෙනත් ආකාරයකින් සිටිම් ද? 11. මම ලෙසට සිටිය හැකි වෙම් ද? 12. මේ නම් ගොත්වලින්ම සිටිය හැකි වෙම් ද? 13. මේ ආකාරයෙන් සිටිය හැකි වෙම් ද? 14. වෙනත් ආකාරයකින් සිටිය හැකි වෙම් ද? 15. “මම” වශයෙන් සිටින්නෙම් වේ ද? 16. නම් ගොත් සහිතව සිටින්නෙම් වේ ද? 17. මේ ආකාරයෙන් සිටින්නෙම් වේ ද? 18. වෙනත් ආකාරයකින් සිටින්නෙම් වේ ද?

## බාහිර අරමුණු ඔස්සේ ද ආශාව හැසිරෙයි!

1. මේ දේ තුළින් මම වෙමි. 2. මේ දේ තුළින් මේ නම් වලින් යුතු මම වෙමි. 3. මේ දේ තුළින් මේ ආකාරයට මම වෙමි. 4. මේ දේ තුළින් වෙනත් ආකාරයෙන් හෝ මම වෙමි. 5. මේ දේ තුළින් අනිත්‍ය

sinhalaebooks.com



බවට පත්වන මම වෙමි. 6. මේ දේ තුළින් නිත්‍ය බවට පත්වන මම වෙමි. 7. සැබැවින් ම මේ දේ තුළින් මම වෙම් ද? 8. මේ දේ තුළින් මේ නම් ගොත් ඇතිව මම වෙම් ද? 9. මේ දේ තුළින් මේ ආකාරයෙන් මම වෙම් ද? 10. මේ දේ තුළින් වෙනත් ආකාරයකින් මම වෙම් ද? 11. මේ දේ තුළින් මම වශයෙන් සිටිය හැකි වෙම් ද? 12. මේ දේ තුළින් මේ නම් ගොත් වලින් ම සිටිය හැකි වෙම් ද? 13. මේ දේ තුළින් මේ ආකාරව සිටිය හැකි වෙම් ද? 14. මේ දේ තුළින් වෙනත් ආකාරයකින් සිටිය හැකි වෙම් ද? 15. මේ දේ තුළින් මේ ලෙසට සිටින්නෙම් වේ ද? 16. මේ දේ තුළින් නම් ගොත් සහිතව සිටින්නෙම් වේ ද? 17. මේ දේ තුළින් මේ ආකාරව සිටින්නෙම් වේ ද? 18. මේ දේ තුළින් වෙනත් ආකාරයෙන් සිටින්නෙම් වෙම් ද?

## එකසිය අටයි, ආශාවත්!

"පින්වත් මහණෙනි, මෙ ආකාරයට ජීවිතාභ්‍යන්තරයේ හැසිරෙන දහඅට ආකාර ආශාව ද බාහිර අරමුණු ඔස්සේ හැසිරෙන දහඅට ආකාර ආශාව ද එකතු කළ විට තිස් හය ආකාර වේ. ගෙවී ගිය අතීතයේ ද, හට නොගත් අනාගතයේ ද, හටගත් වර්තමානයේ ද මේ තිස්හය ආකාර තණ්හාව හැසිරෙන කල්හි මේ ආශාව එකසිය අටක් වේ.

පින්වත් මහණෙනි, මේ මුළු මහත් ලෝක සත්වයා ම භවයේ බැඳ තබන්නා වූ, නිරතුරු වෙලා තිබෙන්නා වූ සැඩ පහරක් මෙන් පවතින්නා වූ ආශාව මේ සා පැතිරීමෙකින් යුක්ත වේ. එනිසා ම සත්වයෝ දුක්ඛිත ජීවිත උදාකර දෙන අපායට වැටෙන සුළු සංසාරය ඉක්මවා ගත නොහැකිව සිටිති."

(තණ්හා ජාලිනී සුත්ත – අං. නි. 4)

## කොහිදෝ ඉපදෙන්නේ මේ ආශා?

"පින්වත් මහණෙනි, මේ ආශාව ඉපදුනොත් කොහේද ඉපදෙන්නේ? මේ ආශාව නවාතැන් ගත්තොත් කොහේද නවාතැන්

sinhalaebooks.com



ගන්නේ?"

මේ ලෝකයේ ප්‍රිය ස්වභාවයෙන් පවතින, මිහිරි ස්වභාවයෙන් පවතින යම් දෙයක් වේ ද, අන්න එතැන ය මේ ආශාව ඉපදුනොත් ඉපදෙන්නේ. අන්න එතැන ම ය මේ ආශාව නවාතැන් ගත්තොත් නවාතැන් ගන්නේ.

පින්වත් මහණෙනි, කුමක් ද මේ ලෝකයේ තිබෙන ප්‍රිය ස්වභාවයෙන් යුතු මිහිරි ස්වභාවයෙන් යුතු දෙය?

පින්වත් මහණෙනි, මේ ලොකයේ ප්‍රිය ස්වභාවයෙන් යුතු, මිහිරි ස්වභාවයෙන් යුතු දෙය වනාහී "ඇස"ය. ඇසට පෙනෙන්නා වූ රූපය ද මේ ලෝකයේ ප්‍රිය ස්වභාවයෙන් යුතු මිහිරි ස්වභාවයෙන් යුතු දෙයකි. ඇසෙහි හටගන්නා වූ විඤ්ඤාණය ද මේ ලෝකයේ ප්‍රිය ස්වභාවයෙන් යුතු මිහිරි ස්වභාවයෙන් යුතු දෙයකි. ඇසත් රූපත් විඤ්ඤාණත් එකට එකතු වීම නම් වූ ඇසේ ස්පර්ශයත් මේ ලෝකයේ ප්‍රිය ස්වභාවයෙන් යුතු මිහිරි ස්වභාවයෙන් යුතු දෙයකි. ඇසේ ස්පර්ශයෙන් හටගත්තා වූ යම් විඳීමක් වේ ද එයත් මේ ලෝකයේ ප්‍රිය ස්වභාවයෙන් යුතු මිහිරි ස්වභාවයෙන් යුතු දෙයකි. (කන් – නාසය – දිව – කය – මනස යන ආයතන ගැනත් මේ ආකාරයට තේරුම් ගන්න.)

පින්වත් මහණෙනි, ආශාව ඉපදුනොත් ඉපදෙන්නේ මෙහි ය. ආශාව නවාතැන් ගත්තොත් නවාතැන් ගන්නෙත් මෙහි ය.

(මහා සතිපට්ඨාන සූත්ත – දී. නි. 02)

## ආශාව ද මූට්ටුවකි!

"පින්වත් මහණෙනි, ඇස, කණ ආදී ආධ්‍යාත්ම ආයතනත්, රූප ශබ්දාදී බාහිර ආයතනත්, විඤ්ඤාණයත් එකට එකතු වීම නම් වූ ස්පර්ශය එක අන්තයකි. යළි යළිත් සංසාරයේ පැවැත්ම පිණිස ස්පර්ශයේ හට ගැනීම එහි දෙවන අන්තය වේ. ස්පර්ශයේ ක්‍රියාකාරීත්වය නිරුද්ධ වීම මැදින් තිබේ. (එහෙත් එය සාමාන්‍ය මනුෂ්‍යයාට නිරුද්ධ කළ නොහැකි ය. එයට හේතුව) ආශාව මුල් වී

sinhalaebooks.com



ස්පර්ශයත්, ස්පර්ශයේ යළි හටගැනීමත් යන අන්ත දෙක එකට මූට්ටු කර දෙයි. (තණ්හා සිබ්බනී) ඒ ඒ භවය තුළ (අණ්ඩජ – ජලාබුජ – සංසේදජ – ඕපපාතික යන) සතර ආකාර ඉපදීමකින් එකක් සකස් කරදීම පිණිස ආශාව ම ස්පර්ශය මූට්ටු කර දෙයි."

(මජ්ඣෙ සුත්ත – අං. නි. 06)

ලෝක සත්වයාව ජනිත කරවන්නේ තණ්හාව (තණ්හා ජනේති පුරිසං) බවත්, ලෝක සත්වයාව කෙලෙස් ලෝකයට නංවා දෙන්නේ තණ්හාව (තණ්හා උඩ්ඩිතෝ ලෝකෝ) බවත්, ලෝක සත්වයා ව භවයෙන් භවයට ඇදගෙන යන්නේ තණ්හාව (තණ්හාය නීයතී ලෝකෝ) බවත් අපගේ බුදු සමිඳාණෝ පැහැදිලි ලෙස පෙන්වා දුන් සේක.

## සැබෑම අර්බුදය තණ්හාවයි!

මේ ආකාරයට ලෝකය තුළ ඇති වුන, දැන් පවතින අනාගතයේ ඇති වන්නා වූ සියලු ගැටුම්, කලකෝලාහල, දූෂණ, වංචා, අපරාධ, ප්‍රචණ්ඩත්වය, ත්‍රස්තවාදය, ආදී සියලුම ලාමක අකුසල ධර්මයන්ට ප්‍රධාන කාරණය මේ ආශාව ම ය.

මේ ආකාරයට බාහිරව උපයෝගී කරගත් භෞතික උපකරණයක සහයෝගයෙකින් තොරව, අතිශයින්ම නවීන යයි කිවයුතු විද්‍යානුකූල පරීක්ෂණයන් මගින් ජීවිතයේ සියලු ගැටළු වල උල්පත, මේ මානව ඉතිහාසයේ ප්‍රථම වතාවට බුදුරජාණන් වහන්සේ විසින් සොයා ගන්නා ලදී. මේ සොයා ගැනීම තුළ දේව මැවුම්කාරවාදයට තැනක් නැත. ආත්ම වාදයට තැනක් නැත. හුදු භෞතික වාදයට ද තැනක් නැත.

ඉතාමත් තියුණු ලෙස නිවැරදිව හා ප්‍රායෝගික ලෙස දුක හදන මූලික කරුණ "තණ්හාව" වශයෙන් සොයා ගෙන, තණ්හාව හට ගැනීමට හේතු වූ දෙයත් නුවණින් විමසන්නට පටන් ගත් බුදු සමිඳුන් ගේ ආශ්චර්යවත් ප්‍රඥාව වසාලන්නට සමර්ථ වූ කිසිඳු මැවුම්කාර දෙවියෙක් ලෝකයේ නොසිටියේ ය. අන්තිමේ දී උන්වහන්සේ

sinhalaebooks.com



තණ්හාව හට ගැනීමට මුල් වූ කාරණය ද සොයා ගන්නට සමත් වූහ.

## කුමකින් ද උපදින්නේ මෙ ආශා!

යමක් අන්ධානුකරණයෙන් පිළිගෙන එයට යටත් වී සිටීම බුදුරජාණන් වහන්සේ අනුමත නොකළ දෙයකි. උන්වහන්සේ අගය කළේ වීමංසන බුද්ධිය යි.

"පින්වත් මහණෙනි, කුමක් ඇති කල්හි ද මේ තණ්හාව ඇති වන්නේ? කුමක් හේතු කොට ගෙන ද මේ තණ්හාව හටගන්නේ? කියා මා යෝනිසෝ මනසිකාරයෙන් විමසන්නට පටන්ගත්තෙමි.

එවිට පින්වත් මහණෙනි, මෙසේ නුවණින් විමසා ගෙන යන විට මා හට මේ ගැන අවබෝධ ඤාණයක් ඇති විය. එනම් විඳීමක් තිබෙන කල්හි ය මේ තණ්හාව ඇති වන්නේ. විඳීම හේතු කොට ගෙන ය මේ තණ්හාව හටගන්නේ"

(ගෝතම සුත්ත – සං. නි. 02)

## ආශාවේ හේතුව

"ආශාව" යනු ඉබේ හටගත් දෙයක් නොවේ. සිතේ තිබෙන ස්වාභාවික ලක්ෂණයක් ද නොවේ. විඳීම නම් වූ හේතුව මුල් කර ගෙන ම සකස් වූ දෙයකි. විඳීමක් නැති කිසිවකට කවුරුත් ආශා නොකරති. විඳින දෙයක් ගැන ම යි ආශාවක් උපදින්නේ.

"පින්වත් මහණෙනි, කුමක් මුල් කොට ගෙන ද, කුමක් හේතු කොට ගෙන ද, කුමක ඉපදීමක් මුල් කොට ගෙන ද, කුමක් ප්‍රභව කොට ගෙන ද මේ ආශාව හටගන්නේ.

පින්වත් මහණෙනි, විඳීමක් ම මුල් කොට ගෙන ය, විඳීමක් ම හේතු කොට ගෙන ය, විඳීමක ඉපදීම මුල් කොට ගෙන ය, විඳීමක් ප්‍රභව කොට ගෙන ය මේ ආශාව හටගන්නේ.

(ආහාර සුත්ත – සං. නි. 02)

sinhalaebooks.com



## තේරුම් ගනිමු වේදනාව!

"විඳීම" යන වචනයට පාළි භාෂාවෙන් යොදන්නේ "වේදනා" යන පදයයි. එහෙත් සිංහලෙන් අප වේදනා යන වචනය භාවිතා කරන්නේ බොහෝ විට එකම අර්ථයක් පිණිස ය. එනම් කායිකව හෝ මානසිකව ඇතිවන දුකක්, පීඩාවක්, ශෝකයක්, කණගාටුවක් ගැන පැවසීමට ය. සැබැවින් "වේදනා" යන පාළි වචනයෙන් අදහස් කරන්නේ ඊටත් වඩා ගැඹුරු දෙයකි.

"පින්වත් මහණෙනි, 'වේදනාව' යයි කියන්නේ කුමන දෙයකට ද? විඳින්නේ ය යන අර්ථයෙන් ය 'වේදනාව' කියා කියන්නේ. කුමක් ද විඳින්නේ. සැප ද විඳියි. දුක් ද විඳී. දුක්සැප රහිත බව ද විඳියි."

(ඛජ්ජනීය සුත්ත – සං. නි. 03)

## යකඩ හුලකි වේදනාව!

සැපක් හෝ වේවා, දුකක් හෝ වේවා, දුක්සැප රහිත විඳීමක් හෝ වේවා කවර විඳීමක් හටගත්ත ද සාමාන්‍ය සත්වයා ඒ විඳීමට මුළාවෙයි. රැවටෙයි. එයින් මුසපත් වෙයි. විඳීම කුමක්දැ'යි අවබෝධ නො කළ තැනැත්තාට මුළා වීමත් මුසපත් වීමත් හැර වෙන කළ යුතු දෙයක් නොදනී. ජීවිතවල පවතින මෙම දුක්ඛිත තත්වය නිසා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ යකඩ හුලකට සමකොට "විඳීම" ගැන මෙසේ වදාළ සේක.

"පින්වත් මහණෙනි, ජීවිතාවබෝධය පිණිස සද්ධර්ම ශ්‍රවණය සලසා නොගත් (අශ්‍රැතවත්) පුහුදුන් සත්වයා කටුක ස්පර්ශයකින් යුතු දුක් වේදනාවක් ලද කල්හි ශෝක කරයි. ක්ලාන්ත වෙයි. හඬා වැටෙයි. පපුවෙහි අත් ගසමින් හඬයි. සිහි මුළාවට පැමිණෙයි. එවිට ඔහු කායික වූත් මානසික වූත් වේදනා දෙකක් ම විඳින්නේ වෙයි.

පින්වත් මහණෙනි, එක්තරා පුරුෂයෙකු යකඩ හුළකින් ඇණුම් කෑවේ යයි සිතමු. ඒ පුරුෂයා ඇණුම් කෑ තැනට ම තවත් යකඩ

sinhalaebooks.com



හුළකින් ඇන්නොත්, එවිට ඒ පුරුෂයා යකඩ හුල් දෙකකින් ම දුක් වේදනා විඳින්නේ වෙයි.

පින්වත් මහණෙනි, අන්න ඒ ආකාරයෙන් ම ජීවිතාවබෝධය පිණිස සද්ධර්මය ශ්‍රවණය සලසා නොගත් පුහුදුන් සත්වයා කටුක ස්පර්ශයකින් යුතු දුක් වේදනාවක් ලද කල්හි ශෝක කරයි. ක්ලාන්ත වෙයි. හඬා වැටෙයි, පපුවෙහි අත් ගසමින් හඬයි. සිහි මුළාවට පැමිණෙයි. එවිට ඔහු කායික වූත් මානසික වූත් වේදනා දෙකක් ම විඳින්නේ වෙයි.

## ඇත්ත නොදනී නම්

කටුක පහසින් දුක් වේදනාවක් විඳින ඔහු එනිසාම ද්වේෂ සහගත වෙයි. දුක් විඳීම නිසා ද්වේෂ සහගත වූ ඔහුට චිත්තාභ්‍යන්තරයෙහි සැඟවී තිබෙන ද්වේෂය (පටිඝානුසය) දුක් විඳීම හේතු කොට ගෙන උඩට මතුවෙයි. හේ දුක් වේදනාව බැහැර කිරීමේ අදහසින් කම්සැපය සතුටින් පිළිගනී.

පින්වත් මහණෙනි, එයට හේතුව කුමක් ද? ජීවිතාවබෝධය පිණිස සද්ධර්ම ශ්‍රවණය සලසා නොගත් පුහුදුන් සත්වයා හට කාම සැපයෙන් තොරව දුක් වේදනාවෙන් නිදහස් වීමක් නොදනී.

කාම සැපය සතුටින් පිළිගන්නා ඔහුට චිත්තාභ්‍යන්තරයෙහි සැඟවී තිබෙන රාගය කාම අරමුණු පිළිගැනීම හේතු කොට ගෙන උඩට මතුවෙයි. ඒ සැප විඳීම් මුල් කොට කෙලෙස් හටගන්නා ආකාරය ඔහුට දැනගත නොහැකි ය. විඳීම හේතුවෙන් හටගන්නා වූ කෙලෙස් නැතිවන්නේ කෙසේ දැ'යි හේ නොදනී. විඳීම් නිසා ඇතිවන ආශ්වාදයේ සැබෑ තත්වය කුමක් දැ'යි හේ නොදනී. විඳීම් නිසා ඇතිවන දුක්පීඩාවන් ගේ සැබෑ තත්වය ද හේ නොදනී. ඒ විඳීම්වලින් නිදහස් වීමේ සැබෑ තත්වය ද හේ නොදනී.

මෙසේ වේදනා හේතුකොට සංසාරය සකස් වන ආකාරය හෝ (වේදනානං සමුදයං), වේදනාවන් නොපිළිගැනීමෙන් ඒ සංසාරයෙන් නිදහස් වන ආකාරය හෝ (වේදනානං අත්‍ථංගමං), වේදනාවල ඇති ආශ්වාදයේ සැබෑ තත්වය ද (අස්සාදං), වේදනාවල ඇති දුක් පීඩාවන්

sinhalaebooks.com



ගේ සැබෑ තත්වය ද (ආදීනවං), වේදනාවලින් නිදහස් වීමේ සැබෑ තත්වය ද (නිස්සරණං), නොදන්නා වූ ජීවිතාවබෝධය පිණිස සද්ධර්ම ශ්‍රවණය සලසා නොගත් ඒ පුහුදුන් තැනැත්තා හට දුක් සැප රහිත විඳීමක් ලැබෙන විට චිත්තාභ්‍යන්තරයෙහි සැඟවී තිබෙන මුළාව (අවිජ්ජානුසය) උඩට මතු වෙයි.

හෙතෙම සැප වේදනාවක් විඳියි නම් එය විඳින්නේ කෙලෙසුන් සමඟ එක්වීමෙන් යුතුව ය. දුක් වේදනාවක් විඳියි නම් එය විඳින්නේ ද කෙලෙසුන් සමඟ එක්වීමෙන් යුතුව ය. දුක් සැප රහිත වේදනාවක් විඳියි නම් එය විඳින්නේ ද කෙලෙසුන් සමඟ එක්වීමෙන් යුතුව ම ය.''

## දුක සමඟයි එක්වන්නේ

''පින්වත් මහණෙනි, ජීවිතාවබෝධය පිණිස සද්ධර්ම ශ්‍රවණය සලසා නොගත් මේ පුහුදුන් තැනැත්තා එක් වී සිටින්නේ ඉපදීමත් සමඟ යයි කියමි. එක් වී සිටින්නේ ජරාමරණත් සමඟ යයි කියමි. එක් වී සිටින්නේ කායික මානසික දුක් සමඟ යයි කියමි. එක් වී සිටින්නේ සුසුම් හෙළීම් සමඟ යයි කියමි. එක් වී සිටින්නේ දුක සමඟ යයි කියමි.''

(සල්ල සූත්‍ර – සං. නි. 04)

සාමාන්‍යයෙන් විඳීමක් ඇති වන විට මුළාවීම ලෝක සත්වයා ගේ ස්වභාවය යි. එයට හේතුව මුළුමණින් ම අවිද්‍යා සහගතව ය විඳීම ඇතිවන්නේ. විඳීම ගැන සිහි මුලාවී පවතින විට සැප වේදනාවේ, ඇලීම පමණි සිදුවන්නේ. දුක් වේදනාවේ ශෝක වීමත්, දුක් සැප රහිත වේදනාවේ දී තව තවත් මුළාවීම පමණි සිදුවන්නේ. දුක් විඳීම ඉදිරියේ ජීවිත හඬා වැළපෙන්නේ පුදුම සහගත ලෙස ය. බුදුරජාණන් වහන්සේ එය දුටුවේ පාතාළයකට ඇද වැටීමක් ලෙස ය.

sinhalaebooks.com



## පාතාලයකි වේදනාව!

“පින්වත් මහණෙනි, ජීවිතාවබෝධය පිණිස සද්ධර්මය ශ්‍රවණය සලසා නො ගත් පුහුදුන් සත්වයා මෙබඳු වචනයක් පවසයි “මහා සමුද්‍රයෙහි භයානක පාතාලයක් තිබේ!” යයි. එහෙත් පුහුදුන් සත්වයා ඒ පවසන්නේ සැබෑ ලෙස ම නො පවතින, අවිද්‍යාමාන වූ පාතාලයක් ගැන ය.

එහෙත් පින්වත් මහණෙනි, “පාතාලය” යනු මේ ශරීරයෙහි හටගන්නා දුක් වේදනාවන්ට කියන නමකි. ඒ පාතාලයේ නොගිළී සිටින්නට පුහුදුන් පුද්ගලයාට ශක්තියක් නැත. ඔහු ගේ ශරීරයට ලැබෙන කටුක ස්පර්ශයෙන් දුක් වේදනා හටගන්නා විට හේ ශෝක කරයි. සිහි නැතිව යයි. හඬා වැලපෙයි. පපුවෙහි දෑත් ගසමින් හඬයි. සිහි කල්පනාව පවා නැතිව යයි.”

(පාතාළ සුත්ත – සං. නි. 04)

මෙසේ දුක් දොම්නස් ඉදිරියේ හඬා වැලපෙන්නේ හේතුවක් නිසා ය. සුව සොම්නස ඉදිරියේ එහි මුසපත් වන්නේ ද හේතුවක් නිසා ය. දුක් සැප රහිත විඳීම් ඉදිරියේ ද මුළාවන්නේ හේතුවක් නිසා ය. බුදු සමිඳාණන් අපට පවසන්නේ ඒ හේතු සියල්ල ම නැති කර දමා සියල්ලෙන් ම නිදහස් වන ලෙස ය.

## වේදනාව ඉදිරියේ බුද්ධිමත් වීම

“පින්වත් මහණෙනි, සැප වේදනාවක් විඳින විට සිත ඇතුලෙන් මතු වන්නා වූ රාගානුසය ප්‍රහාණය කළ යුතු දෙයකි. දුක් වේදනාවක් විඳින විට සිත ඇතුලෙන් මතුවන්නා වූ ද්වේෂය හෙවත් පටිඝානුසය ප්‍රහීණ කළ යුතු ය. දුක්සැප රහිත වේදනාවක් විඳින විට සිත ඇතුලෙන් මතුවන මුළාව හෙවත් අවිද්‍යාව ප්‍රහාණය කළ යුතු ය.

පින්වත් මහණෙනි, එසේ කෙලෙසුන් ගෙන් මිදී ගිය භික්ෂුවට කියන්නේ සිත ඇතුලේ සැඟවුන කෙලෙස් ප්‍රහාණය කළ කෙනා කියා ය. ඔහු ය තණ්හාව සිඳ දැම්මේ. ඔහු ය සියලු බැඳීම් මුළිනුපුටා දැම්මේ. මානය ද මැනැවින් අවබෝධ කොට මේ සියලු දුක් අවසන් කළ

sinhalaebooks.com



කෙනා යයි ඔහුට කියනු ලැබේ.”

(පහාන සුත්ත – සං. නි. 04)

සාංසාරික ජීවිතය මුළුමණින් ම නොමගක් කරා ගෙන යන්නේ විඳීම ය. විඳීම ඉදිරියේ සත්වයාට සිදුවන්නේ අසරණ වීම පමණක් නොවේ. සත්වයා කෙලෙස්වලින් කිලිටි වී යයි. බුදුරජාණන් වහන්සේ අපට කියා දුන්නේ මෙය හොඳින් තේරුම් අරගෙන සංසාරය හැදෙන හේතු නසා දමන්නට මිස එම හේතු දිගින් දිගට ම සකස් කරන්නට නොවේ. මනාකොට නුවණ මෙහෙයවා එය අවබෝධ කර ගැනීමේ හැකියාව ඇති තැනැත්තාට මේ ගැටළුව විසඳා ගැනීම කළ හැකි ය.

## අවබෝධ කරන්න වේදනාවද

එසේ නම් “විඳීම” යනු අවබෝධ කරගත යුතු දුක්ඛාර්ය සත්‍යයට අයත් දෙයකි. විඳීම යනු තමා නො වන බවත්, වෙනස් වී යන ධර්මතාවට අයත් බවත් අවබෝධ කරගත යුතු ම ය. ස්පර්ශයෙන් හටගන්නා වූ වේදනා ස්පර්ශයන් නැතිවී යාමත් සමඟම නැතිවී යන දෙයක් බව අවබෝධ කරගත යුතු ම ය.

## දිය බුබුලකි වේදනාව

“පින්වත් මහණෙනි, සරත් කාලයේ මහා වැහි බිඳුවලින් යුතුව වැසි වසින විට ජලය මත දිය බුබුළු හටගන්නේ ද වේ. නැසී යන්නේ ද වේ.

හොඳින් ඇස් පෙනෙන පුරුෂයෙක් ඒ දිය බුබුළු දෙස බලාගෙන ඒවා ගැන නුවණින් විමසයි. ඒ ගැන හොඳින් බලා සිටින, නුවණින් මනාකොට විමසන ඔහුට ඒ දිය බුබුළු පෙනෙන්නේ හිස් වූ දෙයක් ලෙස ය. තුච්ඡ වූ දෙයක් ලෙස ය. හරයෙකින් තොර වූ දෙයක් ලෙස ය. පින්වත් මහණෙනි, දිය බුබුලක කුමන හරයක් දකින්නට ද?”

sinhalaebooks.com



## කාලයට හා අවකාශයට අයත් සියලු වේදනා

"පින්වත් මහණෙනි, ඒ ආකාරයෙන් ම, අතිතයේ නිරුද්ධ වී ගිය විඳීමක් ගැන හෝ, අනාගතයේ හට නොගන්නා වූ විඳීමක් ගැන හෝ, වර්තමානයේ හටගෙන තිබෙන විඳීමක් ගැන හෝ, තමා ගේ යයි සලකන විඳීමක් ගැන හෝ, තමා ගෙන් බාහිර යයි සලකන විඳීමක් ගැන හෝ, ගොරෝසු වූ විඳීමක් ගැන හෝ, සියුම් වූ විඳීමක් ගැන හෝ, ළාමක වූ විඳීමක් ගැන හෝ, උතුම් වූ විඳීමක් ගැන හෝ, දුර තිබෙන විඳීමක් ගැන හෝ, ළඟ තිබෙන විඳීමක් ගැන හෝ, යන මේ යම් ම විඳීමක් ඇත් ද, ඒ විඳීම දෙස ජීවිතාවබෝධය පිණිස සද්ධර්ම ශ්‍රවණය සලසා ගත් ආර්ය ශ්‍රාවකයා මනා අවධානයෙන් යුතු ව බලා සිටී. එහි සබෑ තත්වය අවබෝධ කර ගැනීම පිණිස සිත පිහිටුවයි. විඳීමේ සැබෑ තත්වය නුවණින් විමසා බලයි."

## හිස් ම හිස් දෙයකි!

මෙසේ මනා අවධානයෙන් යුතු ව, විඳීම්වල යථාර්ථය අවබෝධ කරගැනීම පිණිස නුවණින් විමසා බලන ඔහුට ඒ විඳීම් වැටහෙන්නේ ඉතා හිස් වූ දෙයක් ලෙස ය. තුච්ඡ වූ දෙයක් ලෙස ය. හර සුන් දෙයක් ලෙස ය.

"පින්වත් මහණෙනි, විඳීමක කවර නම් හරයක් දැක ගන්නට ද?"

(ඵේණපිණ්ඩූපම සුත්ත – සං. නි. 03)

මේ සැප දුක් විඳීම් මෙන් ම දුක්සැප රහිත විඳීම් ද හටගන්නේ ඉබේ නොවේ. ස්පර්ශය හේතුකොට ගෙන ය.

"පින්වත් මහණෙනි, කුමන විඳීමක් ද තිබෙන්නේ? පින්වත් මහණෙනි, සය ආකාර වූ විඳීමක් ය තිබෙන්නේ. එනම්, ඇසේ ස්පර්ශයෙන් හටගන්නා වූ විඳීම් ය. කණේ ස්පර්ශයෙන් හටගන්නා වූ විඳීම් ය. නාසයේ ස්පර්ශයෙන් හටගන්නා වූ විඳීම් ය. දිවේ ස්පර්ශයෙන් හටගන්නා වූ විඳීම් ය. කයේ ස්පර්ශයෙන් හටගන්නා වූ විඳීම් ය. මනසේ ස්පර්ශයෙන් හටගන්නා වූ විඳීම් ය" වශයෙනි.

(විභංග සුත්ත – සං. නි. 02)

sinhalaebooks.com



## සංඛතයකි වේදනාව!

"පින්වත් මහණෙනි, මේ වේදනා තුන ම අනිත්‍ය ය. (මේ වේදනා තුනේ ම) ඉපදීම පෙනෙයි (උප්පාදෝ පඤ්ඤායති). වැනසීම පෙනෙයි (වයෝ පඤ්ඤායති). පවතින විදීමේ ද වෙනස් වීම පෙනෙයි (ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති). මේවා මෙසේ සංඛත දේවල් වේ. යම් යම් දේ හේතු කොට හටගන්නා වූ පටිච්චසමුප්පන්න දේවල් ය. ගෙවී යන ධර්මතාවට අයත් දේවල් (ඛය ධම්මා) ය. නැසී යන ධර්මතාවට අයත් දේවල් (වය ධම්මා) ය. ඇල්ම දුරු කළ යුතු ස්වභාවයට අයත් දේවල් (විරාග ධම්මා) ය. ඇල්ම නිරුද්ධ කල යුතු ස්වභාවයට අයත් දේවල් (නිරෝධ ධම්මා) ය. ඒ වේදනා තුන වනාහී සැප වේදනාවත්, දුක් වේදනාවත්, දුක්සැප රහිත වේදනාවත් ය."

(අනිච්ච සුත්ත – සං. නි. 04)

## වේදනාව ගැන දහම් පිළිසඳරක්!

දිනක් එක්තරා භික්ෂුවක් භාග්‍යවත් බුදු සමිඳාණන් වෙතට පැමිණ මෙසේ කියා සිටියේය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මා හුදෙකලා භාවනාවෙන් වාසය කරන විට මාගේ සිතේ මේ අදහස ඇති විය.

එනම්, භාග්‍යවතුන් වහන්සේ වේදනාවන් තුනක් තිබෙන බවට අපට උගන්වා වදාළ සේක. ඒවා වනාහී සැප වේදනාව ය, දුක් වේදනාව ය, දුක්සැප රහිත වේදනාව ය වශයෙන් ය භාග්‍යවතුන් වහන්සේ අපට උගන්වා වදාළේ.

විඳින්නා වූ යමක් ඇත්ද එය දුකක් බව භාග්‍යවතුන් වහන්සේ විසින් අපට කියා දෙන ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ කියා දෙන ලද්දේ කුමන පරමාර්ථ ධර්මයක් පිණිස ද?"

එවිට භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂුව ගේ ප්‍රශ්න විචාරීමේ ක්‍රමය ගැන ප්‍රශංසා කළ සේක. යළිති උන්වහන්සේ මෙසේ ද වදාළ සේක.

sinhalaebooks.com



"... පින්වත් භික්ෂුව, විඳින්නා වූ යමක් ඇත් ද එය දුකක් බව මා විසින් පවසන ලද්දේ ම ය.

පින්වත් භික්ෂුව, මා විසින් එය පවසන ලද්දේ මේ සංස්කාර ධර්මයන් ගේ අනිත්‍ය බව පෙන්වා දීම පිණිස ය... මේ සංස්කාර ධර්මයන් ගේ ගෙවී යන ස්වභාවය පෙන්වා දීම පිණිස ය... මේ සංස්කාර ධර්මයන් ගේ ම නැසී යන ස්වභාවය පෙන්වාදීම පිණිසම ය... මේ සංස්කාර ධර්මයන් ගේ ම ඇල්ම දුරු කළ යුතු ධර්මතාව පෙන්වා දීම සඳහා ය... මේ සංස්කාර ධර්මයන් ගේ ම ඇල්ම නිරුද්ධ කළ යුතු ධර්මතාව පෙන්වා දීම සඳහා ය... මේ සංස්කාර ධර්මයන් ගේ වෙනස්වීමේ ධර්මතාව පෙන්වා දීම සඳහා ම ය. විඳින්නා වූ යමක් ඇත් ද එය දුකක් බව පෙන්වා දුන්නේ ඔය අර්ථයෙන් ය."

(රහෝගත සුත්ත – සං. නි. 04)

## වේදනාව පෙර කර්මයක් ද?

සමහරුන් සිතා ගෙන සිටින්නේ සියලු සැප දුක් විඳීම් ඇති වන්නේ කර්මානුරූප ව කියා ය. සියල්ල ම පෙර කර්මයෙන් සිදුවන බව යි. එය බුදුන් වදාළ ධර්මය නොවේ.

එක් කලෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වැඩ සිටියේ රජගහ නුවර වේළුවනාරාමයේ ය. එහි දී "මෝලිය සීවක" නම් වූ තාපසයෙක් උන්වහන්සේ වෙත පැමිණ මේ ප්‍රශ්නය ම ඇසීය.

"මේ ගැන භවත් ගෞතමයන් වහන්සේ ගේ අදහස කුමක්ද? එනම්, මේ සත්වයා යම්කිසි සැපක් හෝ දුකක් හෝ දුක්සැප රහිත වූ හෝ වේදනාවක් විඳී නම්, ඒ සියල්ල පෙර කළා වූ කර්මයන් නිසාම ය."

"පින්වත් සීවක තාපසය, පිත මුල් කොට හටගන්නා වූ සමහර වේදනා තිබේ. පිත මුල් කොට වේදනා හටගන්නා බව තමන්ට ද දැනගත හැකි ය. පිත් කෝපයෙන් වේදනා හට ගැනීම ඇත්තක් බව ලෝ වැසියෝ ද සම්මත කොට සිටිති. එසේ තිබිය දී යමෙක් මෙසේ කීවොත්

sinhalaebooks.com



## ලෝක සම්මතයවත් නො දනී

මේ සත්වයා සැපක් හෝ දුකක් හෝ දුක්සැප රහිත බවක් හෝ යම්කිසි විඳීමක් විඳී නම් ඒ සියල්ල පෙර කළා වූ කර්මයන් නිසා ම යයි කියා, මෙවැනි දේ කියන, මෙවැනි දේවල් වාද වශයෙන් හදාගෙන සිටින උදවිය තමන් දන්නා යමක් වේ නම් එය ද ඉක්මවා යයි. ලෝකයා ඇත්තක් යයි සම්මත කරගත් දේ ද ඉක්මවා යයි. ඒ නිසා සියලු වේදනා පෙර කළ කර්මයෙන් හටගන්නේ යයි කීම ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ගේ අසත්‍ය කථාවක් යයි කියමි.

පින්වත් සීවක තාපසය, සෙම නිසා ද වේදනා හටගනී... වාතයෙන් ද වේදනාවන් හටගනී... රෝගාබාධවලින් ද වේදනා හටගනී... දේශගුණ වෙනස් වීමෙන් ද වේදනාවන් හටගනී... උපක්‍රම හේතුවෙන් ද වේදනාවන් හටගනී... කර්ම විපාක හේතුවෙන් ද වේදනාවන් හටගනී... එනිසා මේ සත්වයා අත්විඳින සියලු වේදනාවන් පෙර කළ කර්ම විපාකයන් ගෙන් හටගන්නේ යයි කීමෙන් තමා දන්නා දෙය ද ඉක්මවා යයි. ලෝකයා විසින් ඇත්තක් යයි සම්මත කොට තිබෙන දෙය ද ඉක්මවා යයි. ඒ නිසා සියලු වේදනා පෙර කර්මයන් ගෙන් හටගන්නේ යයි කීම ඔය ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ අසත්‍ය කථාවක් යයි කියමි.”

(මෝලිය සීවක සුත්ත – සං. නි. 04)

## එකසිය අටයි! වේදනාව

මේ විඳීම් පිළිබඳ ව විවිධාකාර ලෙස පරීක්‍ෂා කරමින් විමසනු ලැබුවේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් ය. වේදනා පිළිබඳ උන්වහන්සේ ගේ අවබෝධය අතිශයින් ම විස්මිත ය. උන්වහන්සේ වේදනා ද එකසිය අටකට බෙදා දක්වති.

“පින්වත් මහණෙනි, මා දැන් ඔබට දේශනා කරන්නට යන්නේ වේදනාවන් එකසිය අටක් වශයෙන් තේරුම් ගත හැකි ධර්ම ක්‍රමයකි.”

sinhalaebooks.com



## වේදනා දෙක

එනම් පින්වත් මහණෙනි, මේ වේදනාවන් කොටස් දෙකක් වශයෙන් ද ගත හැකි ය. ඒ කායික වේදනාවත්, චෛතසික වේදනාවත් ය.

## වේදනා තුන

වේදනා තුනක් වශයෙනුත් ගන්නට පුළුවනි. එනම් සැප වේදනාවත්, දුක් වේදනාවත්, දුක්සැප රහිත වේදනාවත් වශයෙනි.

## වේදනා පහ

මේ වේදනාවන් පහක් වශයෙන් ද ගත හැකිය. එනම් සැප ඉන්ද්‍රිය, දුක් ඉන්ද්‍රිය, සොම්නස් ඉන්ද්‍රිය, දොම්නස් ඉන්ද්‍රිය, උපේක්ෂා ඉන්ද්‍රිය වශයෙනි.

## වේදනා හය

මේ වේදනාවන් හයක් වශයෙන් ද ගන්ට පුළුවනි. ඇසේ ස්පර්ශයෙන් හටගන්නා වූ වේදනාව, කණේ ස්පර්ශයෙන් හටගන්නා වූ වේදනාව, නාසයේ ස්පර්ශයෙන් හටගන්නා වූ වේදනාව, දිවේ ස්පර්ශයෙන් හටගන්නා වූ වේදනාව, කයේ ස්පර්ශයෙන් හටගන්නා වූ වේදනාව, මනසේ ස්පර්ශයෙන් හටගන්නා වූ වේදනාව වශයෙනි.

## වේදනා දහ අට

මේ වේදනාවන් දහඅටක් වශයෙන් ද ගත හැකි ය. (සය වැදෑරුම් ආයතන ඔස්සේ) සොම්නස සමඟ හැසිරෙන විඳීම් සයකි. දොම්නස සමඟ හැසිරෙන විඳීම් ද සයකි. උපේක්ෂාව සමඟ හැසිරෙන විඳීම් ද සයකි. මේ ආකාරයෙන් දහඅට ආකාරයක විඳීම් ද ගත හැකි ය.

## වේදනා තිස්හය

තිස්හය ආකාරයකින් ද මේ විඳීම් ගත හැකි ය. එනම් පංචකාම ගුණ තුළ ඇති වන සොම්නස් විඳීම් සයකි. කාමයන් ගෙන් නික්මීමත්

sinhalaebooks.com



සමඟ ඇතිවන සොම්නස් විඳීම් සයකි. පංචකාම ගුණ තුළ ඇති වන දොම්නස් විඳීම් සයකි. කාමයන් ගෙන් නික්මීමත් සමඟ ඇති වන දොම්නස් විඳීම් සයකි. පංචකාම ගුණ තුළ ඇතිවන උපේක්ෂා විඳීම් සයකි. කාමයන් ගෙන් නික්මීමත් සමඟ ඇති වන උපේක්ෂා විඳීම් සයකි. මේ ආකාරයට විඳීම් තිස් හයක් වේ.

## වේදනා එකසිය අට

වේදනාවන් එකසිය අට ආකාරයකින් ද ගත හැකි ය. එනම් ඔය තිස්හය ආකාර වූ වේදනාවන් අතීතයේ තිස්හයක් ද, අනාගතයේ තිස්හයක් ද, වර්තමානයේ තිස්හයක් ද වශයෙනි.''

(අට්ඨසත පරියාය සුත්ත – සං. නි. 4)

පටිච්චසමුප්පාද ධර්මය තුළ අපගේ ස්වාමී වූ භාග්‍යවත් බුදු සමිඳාණන් පෙන්වා දී තිබෙන ''වේදනාව'' යන වචනයේ මොන තරම් ගැඹුරු අරුතක් තිබේ දැයි මේ තුළින් අපට තේරුම් ගත හැකිය.

අප සැප දුක් විඳින්නේ ද දේව කැමැත්තකින් නොවේ. දෙවිවරුන් පවා සැප දුක් විඳින්නේ දේව කැමැත්තකින් නොවේ. ස්පර්ශය නම් වූ හේතුව නිසා හටගන්නා වූ ඵලයක් වශයෙන් ය. එහෙත් සමහර තාපසවරුන්ට පවා මෙය පැටලී ගිය අවස්ථාවන් දක්නට ලැබේ.

## වේදනාවේ පැටලුන තිම්බරුක,

වරක් තිම්බරුක නම් තාපසයෙක් භාග්‍යවතුන් වහන්සේ ව සොයා ගෙන සැවත් නුවරට පැමිණියේ ය. පැමිණ උන්වහන්සේ ගෙන් මෙසේ ප්‍රශ්න අසන්නට පටන්ගති.

''කිම, භවත් ගෞතමයන් වහන්ස, මේ සැප දුක තමා විසින් කරන ලද දෙයක් ද?''

''තිම්බරුක, ඒ ගැන ඒ විදියට නො කිය යුතු ය''

''එසේනම්, භවත් ගෞතමයන් වහන්ස, මේ සැප දුක අනුන් විසින් කරන ලද දෙයක් ද?''

sinhalaebooks.com



"තිම්බරුක, ඒ ගැන ඒ විදියටත් නො කිය යුතු ය."

"භවත් ගෞතමයන් වහන්ස, එසේනම් මේ සැප දුක තමන් විසිනුත් අනුන් විසිනුත් එකතු වී කරන ලද දෙයක් ද?"

"තිම්බරුක, ඒ ගැන ඒ විදියටත් නො කිය යුතු ය."

"එසේනම් භවත් ගෞතමයන් වහන්ස, මේ සැප දුක තමන් විසිනුත් කළේ නැත්නම්, අනුන් විසිනුත් කළේ නැතිනම්, ඉබේ හටගත් දෙයක් ද?"

"තිම්බරුක, ඒ ගැන ඒ විදියටත් නො කිය යුතු ය"

(භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගෙන් ලද මේ පිළිතුරු තිම්බරුක තවුසා කිසිසේත් බලාපොරොත්තු නොවූ දෙයකි. තිම්බරුකට කර කියා ගන්ට දෙයක් නැති විය. ඉන් පසු ඔහු මේ ප්‍රශ්නය ඇසුවේ ය.)

"භවත් ගෞතමයන් වහන්ස, එසේ නම්, කිම, සැප දුක් කියා දෙයක් නැති ද?"

"පින්වත් තිම්බරුක, සැප දුක් කියා දෙයක් නැතුවා නොවේ. සැප දුක් කියා දෙයක් තිබෙනවා ම යි!"

"එසේනම්, භවත් ගෞතමයන් වහන්සේ ඒ සැප දුක් ගැන නොදනිත් ද?"

"පින්වත් තිම්බරුක, මම වනාහී මේ සැප දුක් ගැන නොදන්නා කෙනක් නො වෙමි. නොදක්නා කෙනෙක් නො වෙමි. පින්වත් තිම්බරුක, මම වනාහී මේ සැප දුක් ගැන ඉතා හොඳින් දන්නා කෙනෙක් වෙමි. දක්නා කෙනෙක් වෙමි."

(අන්තිමේ දී තිම්බරුක හොඳට ම හෙම්බත් වුනේය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තිම්බරුකට ඒ අයුරින් පිළිතුරු දී වදාළේ ඔහුගේ තේරුම් ගැනීම පිළිවෙලකට සකස් කර දීම පිණිස ය. ඔහු දැන් හරි මාවතට පැමිණුනේ ය. අන්තිමේ දී හේ මෙසේ ඉල්ලා සිටියේ ය.)

"... එසේ නම් ගෞතමයන් වහන්ස, මට ද ඒ සැප දුක් ගැන කියා දෙන සේක් වා! මට ද ඒ සැප දුක් ගැන දේශනා කරන සේක් වා!"

sinhalaebooks.com



(සත්වයා මේ සැප දුක ඔස්සේ මිථ්‍යා දෘෂ්ටිවලට පැමිණෙන ආකාරයත්, ඒවායින් නිදහස් වී එහි යථාර්ථය අවබෝධ කරන්නා ආකාරයත් භාග්‍යවතුන් වහන්සේ තිම්බරුක ට කියා දුන් සේක.)

## වේදනාව තුළින් ජීවිතාවබෝධය

"පින්වත් තිම්බරුක, ඒ වේදනාව, ඔහු විඳින්නේ වේ" (සා වේදනා, සෝ වේදියති) වශයෙන් වේදනාවත්, විඳින්නා වූ පුද්ගලයාවත් එකක් වශයෙන් පිළිගත් විට, පටන් ගත් තැනම වරදී. එවිට ඇති වන්නේ මේ දෘෂ්ටියයි.

එනම් සැප දුක යනු තමා විසින් කරන ලද දෙයකි. එහෙත් මම මෙවැනි දෙයක් නො කියමි. (සයං කතං සුඛ දුක්ඛන්ති, ඒවම්පහං න වදාමි).

"වේදනාව වෙනත් දෙයකි. විඳින පුද්ගලයා වෙනත් කෙනෙකි, වශයෙන් දෙකක් වශයෙන් පිළිගත් විට ඒ අදහස පටන් ගත් තැනම වරදී. එතැන දී ඇති වන්නේ සැප දුක යනු අනුන් විසින් කරන ලද දෙයක් කියා ය. එහෙත් මම මෙවැනි දෙයක් නොකියමි. (පරංකතං සුඛ දුක්ඛන්ති, ඒවම්පහං න වදාමි).

පින්වත් තිම්බරුක, තථාගතයන් වහන්සේ දහම් දෙසන්නේ ඔය අන්ත දෙකට නොපැමිණ මධ්‍යම ප්‍රතිපදාවෙනි. එනම් අවිද්‍යාව හේතුකොට ගෙන සංස්කාර හටගනී..."

(තිම්බරුක සුත්ත – සං. නි. 02)

## මුළා නොවන්න වේදනාවට!

විඳීමේ යථා ස්වභාවය අවබෝධ කර නොගත හොත් ශ්‍රී සද්ධර්මය යි අවබෝධ කරගත නො හැකි වන්නේ.

"පින්වත් මහණෙනි, යමෙක් මෙසේ කියන්නට පුළුවනි. එනම්, මේ විඳින්නා වූ දෙය කුමක් ද? මේ විඳින්නා වූ දෙය කාගෙ ද? කියා හෝ, එසේත් නැති නම්, විඳින්නා වූ දෙය වෙන දෙයකි. විඳින්නා වූ පුද්ගලයා වෙන කෙනෙකි කියා. මේ දෙකෙහි ම තිබෙන්නේ එකම

sinhalaebooks.com



අර්ථයෙකි. වෙනසක් තිබෙන්නේ කියන ආකාරයේ පමණි.

පින්වත් මහණෙනි, "එය ජීවය (ආත්මය) වේ. එයම ශරීරය වේ කියා හෝ ජීවය (ආත්මය) අනිකකි. ශරීරය අනිකකි" යන අදහසයි ඒ කථාවල තිබෙන්නේ. එවැනි මතවාද ඇති කල්හි ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් පලයක් නැත.

එනිසා පින්වත් මහණෙනි, ඔය අන්තදෙක අත්හැරීමෙන් ය තථාගතයන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාවෙන් දහම් දෙසන්නේ. එනම් අවිද්‍යාව හේතුකොට ගෙන සංස්කාර හටගනී..."

(දුතිය අවිජ්ජා සුත්ත – සං. නි. 02)

## මේ වේදනාවෝ කුමකින් ද හටගන්නේ?

වේදනාවන් විවිධාකාරයෙන් දැක්ක හැකි බවත්, අවබෝධ කරගත හැකි බවත් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අපට පෙන්වා දුන් සේක. මේ "වේදනා" යනු තමා විසින් නිපදවන ලද්දා වූ දෙයක් නො වන බවත්, දේව නිර්මාණයක් හෝ වෙන කෙනෙක් විසින් කරන ලද්දා වූ දෙයක් නොවන බවත්, ඉබේ හටගත් දෙයක් නො වන බවත් බුදු සමිඳාණෝ සහතික කොට පවසා සිටි සේක.

දෙවියන් බඹුන් සහිත, ශ්‍රමණ බමුණන් සහිත මේ දෙව් මිනිස් ප්‍රජාව ම රැවටී ගිය, මුළාවට පත් වී ගිය, මුසපත් වී ගිය, ඇලී ගිය වේදනාව ට අප ගේ බුදු සමිඳාණෝ මුළා නො වුන සේක. නො රැවටුන සේක. මුසපත් නො වුන සේක. නො ඇලුණ සේක. ඒ සියලු වේදනාවන් ගේ යථාර්ථය අවබෝධ කළ සේක.

"වේදනාව" යනු හේතූන් නිසා හටගන්නා ඵලයක් බව ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කළ සේක. උන්වහන්සේට මෙවැනි අතිශයින්ම සංකීර්ණ ප්‍රශ්න නිරවුල් කරගත හැකි වූයේ තමන් වහන්සේ තුළ පැවති නුවණින් විමසා තේරුම් ගැනීමේ දක්ෂතාව නිසා ම ය.

sinhalaebooks.com



"කුමක් ඇති වීමෙන් ද විඳීම ඇති වන්නේ? කුමක් හේතු කොට ගෙන ද විඳීම ඇති වන්නේ?"

(ගෝතම සුත්ත – සං. නි. 02)

දෙව් මිනිස් ලෝක ප්‍රජාවේ වෙන කිසි ම කෙනෙකුට විසඳාගත නො හැකි වූ මේ ප්‍රශ්නය උන්වහන්සේ සදහට ම විසඳා ගත්හ.

## විඳීම් ඇති වන්නේ ස්පර්ශයෙන් ම ය!

"ස්පර්ශය ඇති කල්හි විඳීම ඇති වේ. ස්පර්ශය හේතු කොට ගෙන ය විඳීම ඇති වන්නේ.

(ගෝතම සුත්ත – සං. නි. 02)

පින්වත් මහණෙනි 'විඳීම' යනු කරුණු සහිතව සකස් වෙන දෙයක් බව මම පවසමි. කරුණු රහිතව නො වේ. විඳීමක් හට ගැනීම පිණිස හේතු වූ කරුණ කුමක් ද? එයට කිව යුතු වන්නේ 'ස්පර්ශය' කියා ය."

(උපනිස සුත්ත – සං. නි. 02)

## කරුණු තුනක එක්වීම ස්පර්ශයයි!

"ස්පර්ශය" යන වචනය බොහෝ දෙනෙක් පටලවා තේරුම් ගෙන තිබෙන වචනයකි. නමුත් එහි තේරුම කරුණු තුනක එක්වීම ය (තිණ්ණං සංගති ඵස්සෝ). කය ගැන කථා කිරීමේ දී කයට අරමුණු වන ඵොට්ඨබ්බයටත්, සිංහලෙන් හඳුන්වන්නේ "ස්පර්ශය" කියා ය. ඒ නිසා ය "ස්පර්ශය" යන වචනයේ තේරුම පැටලී තිබෙන්නේ. "ඵොට්ඨබ්බ" යන වචනයට මෙහි දී අපි භාවිතා කරන්නේ "පහස" කියා ය.

## ස්පර්ශ සයකි

"පින්වත් මහණෙනි, කුමක් ද ස්පර්ශය යනු? පින්වත් මහණෙනි, සය ආකාර වූ ස්පර්ශයක් තිබේ. එනම්, ඇසේ ස්පර්ශය (චක්ඛු සම්ඵස්ස), කණේ ස්පර්ශය (සෝත සම්ඵස්ස), නාසයේ

sinhalaebooks.com



ස්පර්ශය (ඝාන සම්ඵස්ස), දිවේ ස්පර්ශය (ජිව්හා සම්ඵස්ස), කයේ ස්පර්ශය (කාය සම්ඵස්ස), මනසේ ස්පර්ශය (මනෝ සම්ඵස්ස) වශයෙනි.”

(විභංග සුත්ත – සං. නි. 02)

## ස්පර්ශයෙන් ම යි විඳීම

“පින්වත් මහණෙනි, වේදනා තුනකි. ඒ කවර වේදනා තුනක් ද යත්, සැප වේදනාව ය. දුක් වේදනාව ය. දුක් සැප රහිත වේදනාව ය. පින්වත් මහණෙනි, වේදනාවන් හටගන්නේ ස්පර්ශය මුල් වීමෙනි, ස්පර්ශය ම මූලික කාරණය වීමෙන්, ස්පර්ශය හේතු කොට ගෙන ය, ස්පර්ශය ම හට ගැනීමෙන් ය.

## ස්පර්ශය වෙනස් වීමෙන් වේදනාව වෙනස්වෙයි!

පින්වත් මහණෙනි, සැප විඳීමට හේතු වූ ස්පර්ශයක් මුල් කරගෙන හටගන්නේ සැප වේදනාව යි. සැප විඳීම ඇති කරවන ඒ ස්පර්ශය ම නැති වී යාමෙන්, එයින් හටගන්නා වූ යම් විඳීමක් වේ ද, එනම් සැප සහගත ස්පර්ශය හේතුවෙන් හටගන්නා වූ යම් සැප වේදනාවක් වේ ද, එය ද නැති වී යයි. සංසිඳී යයි.

පින්වත් මහණෙනි, දුක් විඳීමට හේතු වූ ස්පර්ශය මුල් කරගෙන හටගන්නේ දුක් වේදනාව යි. දුක් වේදනාව ඇති කරවන ඒ ස්පර්ශය ම නැති වී යාමෙන්, එයින් හටගත්තා වූ යම් විඳීමක් වේ ද, එනම් දුක් සහගත ස්පර්ශය හේතුවෙන් හටගන්නා වූ යම් දුක් වේදනාවක් වේ ද, එය ද නැති වී යයි. සංසිඳී යයි.

පින්වත් මහණෙනි, දුක් සැප රහිත විඳීමට හේතු වූ දුක්සැප රහිත ස්පර්ශයක් මුල් කරගෙන හටගන්නේ දුක්සැප රහිත වේදනාව යි. දුක්සැප රහිත විඳීම ඇති කරවන ඒ ස්පර්ශය ම නැතිවී යාමෙන්, එයින් හටගන්නා වූ යම් විඳීමක් වේ ද, එනම් දුක්සැප රහිත ස්පර්ශය හේතුවෙන් හටගන්නා වූ යම් දුක්සැප රහිත වේදනාවක් වේ ද එය ද නැති වී යයි. සංසිඳී යයි.

sinhalaebooks.com



## එය ගින්න වගේ

පින්වත් මහණෙනි, වියලි දර කැබලි දෙකක් එකිනෙකට ඇතිල්ලීමෙන් උණුසුමක් හටගනී. ගින්න උපදී. එහෙත් වියළි දර කැබලි දෙක වෙන් වූ විට, ඈත් වූ විට, ඒ වියළි දර කැබලි දෙක ඇතිල්ලීම හේතු කොට ගෙන හටගත්තා වූ යම් උණුසුමක් වේ ද, එය නිවී යයි. සංසිඳී යයි.

පින්වත් මහණෙනි, ස්පර්ශය ම මුල් කොට, ස්පර්ශය ම මූලික කාරණය කොට, ස්පර්ශය ම නිසා, ස්පර්ශයෙන් ම හටගත් මේ විඳීම් තුනත් අන්න ඒ ආකාරයෙන් ම තේරුම් ගත යුතු ය.

ඒ ඒ දෙයින් හටගත් ස්පර්ශය හේතුකොට ගෙන ඒ ඒ වේදනාවන් උපදී. ඒ ඒ දෙයින් හටගත් ස්පර්ශය ම නැති ව යාමෙන් ඒ ඒ වේදනාව නැති වී යයි."

(ඵස්සමූලක සුත්ත – සං. නි. 04)

## සංසාරය ම යි ස්පර්ශ වෙන්නේ

"ස්පර්ශය" යනු සම්පූර්ණයෙන් ම ජීවිත පැවැත්ම සංසාරය වෙනුවෙන් සකස් වීමට හේතුවන දෙයකි. ස්පර්ශය ඇතිවන විට වේදනාව ඇති වෙයි. ස්පර්ශය නැතිවන විට වේදනාව නැති වෙයි. ඒකාකාර ලෙස කිසි ම විඳීමක් නො පවතින්නේ මේ නිසා ම ය. එහෙත් විඳීමක් ඇතිවන්නේ කුමක් නිසා දැයි සාමාන්‍ය ජනතාව නො දනිති. එනිසා ම ඔවුන් විඳීම් ගැනත් නො දනිත්. විඳීමට හේතු වූ දේ ගැනත් නො දනිති. නිරන්තරයෙන් ම වේදනාව වෙනස් වන්නේ ස්පර්ශයේ වෙනස් වීම නිසා බව අපි අවබෝධ කර ගත යුතු ම ය.

## ස්පර්ශය ගැන දහම් පිළිසඳරක්!

වරක් "දීඝනඛ" නම් වූ ගිනිපුදන තවුසෙකුට භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මෙ කරුණ පහදා දුන්හ.

"පින්වත, ගිනිපුදන තාපසය, වේදනාවන් තුනක් ඇති වේ.

sinhalaebooks.com



එනම් සැප වේදනාව ය. දුක් වේදනාව ය. දුක්සැප රහිත වේදනාව ය.

පින්වත් ගිනිපුදන තාපසය, යම් වේලාවක සැප වේදනාවක් විඳියි නම්, ඒ වෙලාවට දුක් වේදනාවක් නැත. දුක්සැප රහිත වේදනාවක් ද නැත. සැප වේදනාවක් ම ය ඒ වේලාවට විඳින්නේ.

පින්වත් ගිනිපුදන තාපසය, යම් වේලාවක දුක් වේදනාවක් විඳියි නම්, ඒ වේලාවට සැප වේදනාවක් නැත. දුක් සැප රහිත වේදනාවක් ද නැත. දුක් වේදනාවක් ම ය ඒ වේලාවට විඳින්නේ.

පින්වත් ගිනිපුදන තාපසය, යම් වේලාවක දුක්සැප රහිත වේදනාවක් විඳියි නම්, ඒ වේලාවට සැප වේදනාවක් නැත. දුක් වේදනාවක් ද නැත. දුක්සැප රහිත වේදනාවක් ම ය ඒ වෙලාවට විඳින්නේ.

පින්වත් ගිනිපුදන තාපසය, සැප වේදනාවත්, දුක් වේදනාවත්, දුක් සැප රහිත වේදනාවත්, මෙසේ අනිත්‍ය වූ දෙයකි. හට ගැනීමක් පෙනෙන, වැනසීමක් පෙනෙන, පවතින දේ තුළ වෙනස් වීමක් පෙනෙන සංඛත දෙයකි. හේතූන් නිසා හටගත් දෙයකි. ක්‍ෂය වී යන ස්වභාවයට අයත් දෙයකි. වැනසී යන ස්වභාවයට අයත් දෙයකි. ඇල්ම දුරු වී යන ස්වභාවයට අයත් දෙයකි. ඇල්ම නිරුද්ධ වී යන ස්වභාවයට අයත් දෙයකි.”

(දීඝනඛ සුත්ත – ම. නි. 02)

## මෙන්න ස්පර්ශයේ සැබෑ තත්වය!

“පින්වත් මහණෙනි, ඇසත් රූපත් නිසා ඇසේ විඤ්ඤාණය හටගනී.

ඒ ඇස අනිත්‍ය වූත් වැනසී යන්නා වූත් වෙනස් වී යන ස්වභාවයට අයිති වූත් දෙයකි. රූප ද අනිත්‍ය වූත් වැනසී යන්නා වූත්, වෙනස් වී යන ස්වභාවයට අයිති වූත් දේවල් ය. මේ ඇසත් රූපත් යන දෙක ම චලනය වෙයි. වැනසී යයි. අනිත්‍යයි. වෙනස්වන ධර්මතාවෙන් යුක්තයි.

ඇසේ හටගන්නා වූ විඤ්ඤාණය ද අනිත්‍ය යි. වැනසෙයි.

sinhalaebooks.com



වෙනස් වන ධර්මතාවෙන් යුක්තයි. ඇසේ විඤ්ඤාණය හට ගැනීමට උපකාරී වූ, මූලික වූ යම් දෙයක් වේ නම් මෙසේ එය අනිත්‍ය වෙයි නම්, වැනසෙයි නම්, වෙනස් වන ධර්මතාවට අයිති නම්, ඒ අනිත්‍ය වූ දේවල් මුල් කොට ඇසේ හටගන්නා වූ විඤ්ඤාණය කෙසේ නම් නිත්‍ය වෙයි ද?

පින්වත් මහණෙනි, ඇසත්, රූපත්, ඇසේ හටගන්නා වූ විඤ්ඤාණයත් යන මේ තුනේ යම් එකතුවීමක් වේ ද, එකට එකතුවීමක් වේ ද, ඒකරාශී වීමක් වේ ද, එයට යි "ඇසේ ස්පර්ශය" කියා කියන්නේ.

ඒ ඇසේ ස්පර්ශය හටගැනීමට උපකාරී වූ යම් හේතුවක්, යම් මූලික කාරණයක් වේ ද, එයත් අනිත්‍ය නම්, වැනසී යයි නම්, වෙනස් වන ධර්මතාවෙන් යුක්ත නම් ඒ අනිත්‍ය දේවල් හේතුකොට හටගන්නා වූ ඇසේ ස්පර්ශය කෙසේ නම් නිත්‍ය වෙයි ද?

පින්වත් මහණෙනි, ස්පර්ශය හටගන්නා විට විඳීම ඇති වෙයි. ස්පර්ශය හටගන්නා විට හඳුනා ගැනීම ද ඇති වෙයි. ස්පර්ශය හටගන්නා විට චේතනාව ද ඇති වෙයි.

එසේ නම් මේ විඳීමත්, හඳුනා ගැනීමත්, චේතනාවත් යන මේවා චලනය වන දේවල් ය. වැනසී යන දේවල් ය. අනිත්‍ය දේවල් ය. වෙනස් වී යන ධර්මතාවෙන් යුතු දේවල් ය"

(දුතිය ද්වය සුත්ත – සං. නි. 4)

දැන් ඔබට ස්පර්ශය යනු කුමක් දැයි තේරුම් යන්නට ඇති. ස්පර්ශය යනු සුළු පටු දෙයක් නො වේ. ක්ෂණයකින් ස්පර්ශය ඇති වෙයි. ස්පර්ශය ඇති වූ සැණින් ම වේදනාවත්, සඤ්ඤාවත්, චේතනාවත් ඇති වෙයි. ඉතා ම බරපතළ ලෙස සංසාර ජීවිතයට ස්පර්ශය අනුග්‍රහ කරයි. එනිසා ම අපගේ ස්වාමී වූ සම්බුදු බුදු සමිඳාණන් ස්පර්ශය හඳුන්වා දුන්නේ සාංසාරික ජීවිතය පෝෂණ කරවන ආහාරයක් වශයෙනි.

sinhalaebooks.com



## සංසාරෙට කැමබීම

"පින්වත් මහණෙනි, උපන් සත්වයන් ගේ පැවැත්ම පිණිසත්, උපදින්නට සිටින සත්වයන්ට අනුග්‍රහ පිණිසත් පවතින්නා වූ ආහාර වර්ග සතරකි. ඒ කවර ආහාර වර්ග සතරක් ද යත්.

I. ගොරෝසු වූ හෝ සියුම් වූ හෝ කබලිංකාර ආහාර ය.

II. දෙවැනි ආහාරය ස්පර්ශය යි.

III. තුන්වන ආහාරය මනෝසංචේතනාව ය.

IV. හතරවන ආහාරය විඤ්ඤාණය යි.

"පින්වත් මහණෙනි, ස්පර්ශය නම් වූ ආහාරය කෙරෙහි යම් රාගයක් ඇත්නම්, යම් ආශ්වාදයක් ඇත්නම්, යම් තණ්හාවක් ඇත්නම්, එහි පිහිටන විඤ්ඤාණය වැඩෙන්නේ වෙයි. යම් තැනෙක විඤ්ඤාණය පිහිටන්නේ වේ ද, වැඩෙන්නේ වේ ද එහි තිබෙන්නේ (වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර සහ සතර මහා ධාතූන් ගෙන් හටගත් රූප යන) නාම-රූපයන් ගේ බැස ගැනීම ය. නාම-රූපයන් බැසගන්නේ යම් තැනක ද, එහි තිබෙන්නේ (පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, අනෙඤ්ජාභිසංඛාර යන) සංස්කාරයන් ගේ වර්ධනයයි. සංස්කාරයන් ගේ වර්ධනයක් නම් යම් තැනක තිබෙන්නේ එහි තිබෙන්නේ මතු ඉපදීම පිණිස හේතුවන භවය යි. මතු ඉපදීමට හේතුවන භවය නම් යම් තැනක තිබෙන්නේ, එහි තිබෙන්නේ මතු ඉපදීමත්, ජරාමරණයත් ය. මතු ඉපදීමත්, ජරා මරණත් නම් යම් තැනක තිබෙන්නේ පින්වත් මහණෙනි, එතැන ශෝක සහිත වූ තැනක් යයි කියමි. පීඩා සහිත තැනක් යයි කියමි. සුසුම් හෙළීම් සහිත තැනක් යයි කියමි"

(අත්ථි රාග සුත්ත – සං. නි. 02)

## තාවකාලික විසඳුම් පලක් වේ ද?

එසේ නම් ස්පර්ශය කෙරෙහි රාගය තිබීම යනු මේ සාංසාරික දුක නිර්මාණය වන බලවත් ම අර්බුදයකි. එසේනම් කුමක් ද අප විසින් කළ යුත්තේ? කිසියම් භාවනාවක් තුළින් ස්පර්ශය නොදැනී යන්නට

sinhalaebooks.com



සලස්වා තාවකාලික ව ස්පර්ශයෙන් මගහරිමින් සිටීම ද, සමථ විදර්ශනා මගින් ස්පර්ශයේ යථා ස්වභාවය අවබෝධ කොට ගෙන ස්පර්ශයේ අවිද්‍යාව ප්‍රහාණය කොට රාගයෙන් මිදී යාම ද? කුමක් ද සැබෑ ම පිළිතුර?

## ස්ථිරසාර විසඳුමක් තිබිය යුතු ය.

"පින්වත් මහණෙනි, ස්පර්ශාහාරය කෙරෙහි රාගය නැති විට, ආශ්වාදයෙන් අරමුණු රස විඳීම නැති විට, තණ්හාව නැති විට, විඤ්ඤාණය එහි නො පිහිටයි. නො වැඩෙයි. විඤ්ඤාණය නො පිහිටන්නේ නො වැඩෙන්නේ යම් තැනක ද එහි නාම-රූපයන් ගේ බැසගැනීමක් නැත. නාම-රූපයන් ගේ බැසගැනීමක් නැත්තේ යම් තැනක ද, එහි සංස්කාරයන් ගේ වර්ධනයක් නැත. සංස්කාරයන් ගේ වර්ධනයන් නැත්තේ යම් තැනක ද, එහි මතු ඉපදීම පිණිස හේතුවන භවයේ හට ගැනීමක් නැත. මතු ඉපදීම පිණිස හේතුවන භවයේ හට ගැනීමක් නැත්තේ යම්තැනක ද එහි මතුවට හටගන්නා වූ ඉපදීමක් හෝ ජරාමරණයක් නැත. මතුවට හටගන්නා වූ ඉපදීමත් ජරාමරණත් නැත්තේ යම් තැනක ද, පින්වත් මහණෙනි, අන්න එතැන ශෝක රහිත තැන යයි කියමි. පීඩා රහිත තැන යයි කියමි. සුසුම් හෙළීම් රහිත තැන යයි කියමි.

## නො පිහිටන හිරු රැස්!

පින්වත් මහණෙනි, ගෙයක උතුරු පැත්තේ හෝ දකුණු පැත්තේ හෝ නැගෙනහිර පැත්තේ හෝ ජනේලයක් තිබේ යයි සිතමු. එවිට හිරු පායා එනවිට ඒ ජනේල කවුළුවෙන් ඇතුළු වෙන හිරු රැස් පිහිටන්නේ කොයි පැත්තේ ද?"

"ස්වාමීනි, බටහිර පැත්තේ බිත්තියේ ය"

"පින්වත් මහණෙනි, ඉදින් බටහිර පැත්තේ බිත්තියක් නැත්නම්, පිහිටන්නේ කොහි ද?"

"ස්වාමීනි, එසේ වුනොත් හිරු රැස් පිහිටන්නේ පොළොවෙහි

sinhalaebooks.com



ය.”

“පින්වත් මහණෙනි, පොළොවකුත් නැතිනම් කොහි ද පිහිටන්නේ?”

“ස්වාමීනි, එසේ වුවහොත් හිරු රැස් පිහිටන්නේ ජලයෙහි ය.”

“පින්වත් මහණෙන්, ඉදින් ජලයකුත් නැතිනම් කොහි ද පිහිටන්නේ?”

“ස්වාමීනි, එසේ වුවහොත් හිරු රැස් නො පිහිටයි”

“පින්වත් මහණෙනි, කබලිංකාර ආහාරයෙහි ද, ස්පර්ශ ආහාරයෙහි ද, මනෝසඤ්චේතනා ආහාරයෙහි ද, විඤ්ඤාණාහාරයෙහි ද රාගය නැත්තේ නම්, ආශ්වාද විඳීමක් නැත්තේ නම්, තණ්හාවක් නැත්තේ නම් එහි විඤ්ඤාණය නො පිහිටයි. නො වැඩෙයි...”

(අත්ථිරාග සුත්ත – සං. නි. 02)

ස්පර්ශය කෙරෙහි රාගය තිබීම නිසා සංසාර දුක යළි යළිත් සකස් වීමත් ස්පර්ශය කෙරෙහි රාගය ප්‍රහාණය කිරීමෙන් සංසාර දුකින් නිදහස් වීමත් මනාකොට පෙන්වමින් දේශනා කොට වදාළ භාග්‍යවතුන් වහන්සේ ස්පර්ශයේ ස්වභාවය අවබෝධ කර ගැනීම පිණිස උපමාවක් ද පෙන්වා දුන් සේක.

## හම ගැසූ ගව දෙන

“පින්වත් මහණෙනි, ආහාරයක් වශයෙන් පවතින ස්පර්ශය දැක්ක යුත්තේ කුමන ආකාරයෙන් ද?

පින්වත් මහණෙනි, හොඳින් ඇවිද යා හැකි ගව දෙනක ගේ සම ගලවා දැමුවේ යයි සිතමු. එවිට ඒ ගව දෙන හේත්තු වෙන්නේ බිත්තියකට නම් බිත්තියේ සිටින සතුන් ඇව කන්නට පටන් ගන්නේ ය. ඒ ගව දෙන හේත්තු වන්නේ ගසකට නම් ගසේ සිටින සතුන් ඇව කන්නේ ය. ඒ ගව දෙන ජලයට බසින්නේ නම් දියේ සිටින සතුන් ඇව කා දමන්නේ ය. ඒ ගව දෙන සිටින්නේ එළිමහනේ නම් එළිමහනේ සිටින සතුන් ඇව කන්නේ ය.

sinhalaebooks.com



මෙසේ සම ඉවත් කරන ලද ඒ ගවදෙන යම් යම් දෙයක් ඇසුරු කොට සිටී නම් ඒ ඇසුරු කරන තැන සිටින සතුන් ඇව කා දමන්නාහු ය.

පින්වත් මහණෙනි, ඔන්න ඔය ආකාරයේ ස්පර්ශ ආහාරය දැන ගත යුත්තේ යයි පවසමි.

පින්වත් මහණෙනි, ස්පර්ශ ආහාරයේ තිබෙන මේ යථාර්ය (අවිද්‍යාවත් තණ්හාවත් ප්‍රහීණ වන ආකාරයෙන්) අවබෝධ කරගත් විට ත්‍රිවිධ වේදනාව ම පිරිසිඳ දැන ගත්තේ වේ. ත්‍රිවිධ වේදනාව ම පිරිසිඳ දැන ගත් විට ඒ ආර්ය ශ්‍රාවකයාට නිර්වාණාවබෝධය පිණිස කළ යුතු වෙනත් දෙයක් නැත්තේ යයි කියමි.''

(පුත්තමංස සුත්ත – සං. නි. 02)

## ප්‍රශ්නයෙන් මග හරින්න එපා!

මේ උපමාවෙන් එක දෙයක් ඉතා ම පැහැදිලි ය. එනම් වර්තමානයේ නොයෙක් මාදිලියේ භාවනා ක්‍රම ඔස්සේ උගන්වන ආකාරයට අරමුණු නොදැනී යන්නට සලස්වා ගෙන ස්පර්ශයෙන් මගහරිමින් සිටින්නට පුරුදුවන නමුත් සාංසාරික ප්‍රශ්නයෙන් ඒ ආකාරයෙන් ගැලවෙන්නට නො හැකි බව යි. අරමුණු නොදැනී ගිය පමණින් තාවකාලික සහනයක් ලැබෙන බව නම් සැබෑ ය. එහෙත් එපමණින් ස්පර්ශයේ අවිද්‍යාවත් ස්පර්ශයේ රාගයත් ප්‍රහීණ නොවන්නේ ය. ඒ සඳහා ස්පර්ශයේ යථා ස්වභාවය ම පිරිසිඳ දැක්ක යුතු ම ය.

හම ගැසූ ගව දෙනට සතුන් ගේ ග්‍රහණයෙන් මිදී සිටීම කළ නො හැකි දෙයකි. ඒ ආකාරයෙන් ම ස්පර්ශය හටගත් සැණින් විඳීම හටගන්නේ ම ය.

## හොඳින් විමසන්න.

ඇසත් රූපත් ඇසේ විඤ්ඤාණයත් එක්වුන සැණින් ම සැප හෝ දුක් හෝ දුක්සැප රහිත හෝ වේදනාව උපදියි.

sinhalaebooks.com



කණත් ශබ්දත් කණේ විඥ්ඥාණයත් එක්වුන සැණින් ම සැප හෝ දුක් හෝ දුක්සැප රහිත වූ හෝ වේදනාව උපදියි.

නාසයත් ගඳසුවඳත් නාසයේ විඥ්ඥාණයත් එක්වුන සැණින් ම සැප හෝ දුක් හෝ දුක්සැප රහිත වූ හෝ වේදනාව උපදියි.

දිවත් රසයත් දිවේ විඥ්ඥාණයත් එක්වුන සැණින් ම සැප හෝ දුක් හෝ දුක්සැප රහිත හෝ වේදනාව උපදියි.

කයත් පහසත් කාය විඥ්ඥාණයත් එක්වුන සැණින් ම සැප හෝ දුක් හෝ දුක් සැප රහිත හෝ වේදනාව උපදියි.

මනසත් මනසට දැනෙන අරමුණුත් මනෝ විඥ්ඥාණයත් එකතු වුන සැණින් ම සැප හෝ දුක් හෝ දුක්සැප රහිත වූ හෝ වේදනාව උපදියි. එහි රාගය තිබේ නම්, ආශ්වාදයෙන් විඳීම තිබේ නම්, තණ්හාව තිබේ නම් විඥ්ඥාණය එහි පිහිටා, වැඩෙයි. වෙන කිසිවක් සිදු නො වේ.

එහෙත් ඒ කෙරෙහි රාගයක් හෝ ආශ්වාදයෙන් විඳීමක් හෝ තණ්හාවක් හෝ නැතිනම් පමණක් එහි විඥ්ඥාණය නො පිහිට යි. නො පිහිටන නිසා නොවැඩෙයි. එනිසා ම එයින් නිදහස් වෙයි.

එසේ නම් "ස්පර්ශය" යනු සංසාරික දුක ම සකස්වීම පිණිස පවතින දෙයක් ම බව අපට පැහැදිලි වන්නේ එය ආහාරයක් වශයෙන් පැවැත්මට අනුග්‍රහ කරන බැවින් ය. ස්පර්ශය නිසා ම යි සැප දුක කියා දෙයක් තිබෙන්නේ. ඉතින් ශ්‍රාවකයා මෙ කරුණ හොඳින් තේරුම් ගෙන තිබිය යුතු ය. ස්පර්ශය කෘත්‍රිම ක්‍රම ඔස්සේ තාවකාලිකව නැති කළ පමණින් අරමුණු නොදැනී සමාධියෙන් සිටින්නට පුරුදු කළ පමණින් දැන් ඉතින් ස්පර්ශය ජයගත්තේ ය සිතා මුළාවෙන්නට ඉඩ තිබේ. එවිට ඔහුට නිවන් මග වරදී. කළ යුත්තේ ස්පර්ශයේ යථා ස්වභාවය ම අවබෝධ කිරීම හෙවත් පිරිසිඳ දැනගැනීම ය. දුක වනාහී පිරිසිඳ දැක්ක යුතු (පරිඥ්ඥෙය්‍යා) දෙයකි. ස්පර්ශය කෙරෙහි තිබෙන අවිද්‍යාවත්, තණ්හාවත් දුරු වී යන ආකාරයට ම ස්පර්ශයේ සැබෑ තත්වය අවබෝධ කළ යුතු යි.

sinhalaebooks.com



## සත්‍ය සත්‍ය ලෙස දකිමු!

"පින්වත් ආනන්දය, මේ සැප දුක් පිළිබඳව මා විසින් පවසා තිබෙන්නේ හේතුන් නිසා හටගත් දේ ලෙස ය. ඒ කවර හේතුවකින් ද යත්, ස්පර්ශය හේතුකොට ගෙන ය.

එනිසා යමෙක් මෙසේ කියත් නම් (එනම් ස්පර්ශය හේතු කොට ගෙන සැප දුක් හටගත් බව) එය මා විසින් කියන ලද්දක් ම වන්නේ ය. මා හට අභූතයෙන් චෝදනා නො කරන්නේ ම ය. ධර්මයට අනුකූල දෙයක් ම ප්‍රකාශ කරන්නේ ම ය. කරුණු සහිතව ගැරහීමට ලක්වන වාදයකට නො පැමිණෙන්නේ ම ය."

## කවුරු කොහොම කීවත් ඇත්ත මේකයි!

"පින්වත් ආනන්දය, කර්මය ගැන කථාබස් කරන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණවරු මේ සැප දුක් තමා විසින් කරන ලද්දේ යයි කියන නමුත්, ස්පර්ශය හේතු කොට ගෙන ම ය සැප දුක් හටගන්නේ.

කර්මය ගැන කථාබස් කරන තව ශ්‍රමණ බ්‍රාහ්මණවරු මේ සැප දුක් අනුන් විසින් කරන ලද්දේ යයි කියන නමුත් ස්පර්ශය හේතු කොට ගෙන ම ය ඒ සැප දුක් හටගන්නේ.

කර්මය ගැන කථාබස් කරන තව ශ්‍රමණ බ්‍රාහ්මණවරු මේ සැප දුක් තමා විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේ යයි කියන නමුත් ස්පර්ශය හේතුකොට ගෙන ම ය ඒ සැපදුක් හටගන්නේ.

කර්මය ගැන කථාබස් කරන තව ශ්‍රමණ බ්‍රාහ්මණවරු මේ සැප දුක් තමා විසිනුත් නොව අනුන් විසිනුත් නොව ඉබේ හටගත් දෙයක් යයි කියන නමුත් මේ සැප දුක් හටගන්නේ ස්පර්ශය හේතු කොට ගෙන ම ය.

ඔවුහු ස්පර්ශයකින් තොරව සැබැවින් ම යම් විඳීමක් ඇති කර ගන්නාහු ය යන කරුණ කිසිසේත් ම සිදුවිය හැකි දෙයක් නොවේ.

(භූමිජ සූත්ත – සං. නි. 02)

sinhalaebooks.com



## ස්පර්ශය ඇති වන්නේ කුමක් ඇති කල්හි ද?

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තුළ පැවතියේ අතිශයින් ම විස්මිත අවබෝධයකි. ලෝකයේ කිසි ම මතයකට නො බැඳී, නො රැවටී, නො වසඟ වී, යථාර්ථය අවබෝධ වන තෙක් ම තම බුද්ධිය ඉතා ම ක්‍රමානුකූල ලෙස මෙන් ම ඉතා ම විද්‍යානුකූල ලෙස හසුරුවා ගත හැකි වූයේ උන්වහන්සේ ට පමණි. යම් දෙයක් හට ගැනීමට හේතු වූ කරුණු සොයා ඒ හේතුව මුලිනුපුටා දැමීමේ අතිශයින් ම නවීන වූ විද්‍යාත්මක පරීක්ෂණයක් තුළින් ම ය උන්වහන්සේ තම විස්මිත අවබෝධය ලබා ගත්තේ.

ස්පර්ශයේ ස්වභාවය, ස්පර්ශයෙන් කෙරෙන්නේ කුමක් ද යනාදී ස්පර්ශයේ සියලු දේ සොයාගත් උන්වහන්සේ ඊට පසු යොමු වූයේ ස්පර්ශය ඇති වන්නේ කුමක් නිසාදැ'යි සෙවීමට ය.

"ස්පර්ශය ඇති වන්නේ කුමක් ඇති කල්හි ද? ස්පර්ශය කුමක් හේතු කොට ගෙන ඇති වන දෙයක් ද?"

(ගෝතම සූත්ත – සං. නි. 2)

යෝනිසෝ මනසිකාරයේ යෙදෙන්නට අතිශයින් ම දක්ෂ වූ අපගේ බුදු සමිඳාණන් ගේ ප්‍රඥාවට එය තව දුරටත් රහසක් නො වී ය. උන්වහන්සේ එය සොයා ගත් සේක.

## ආයතන සය නිස යි ස්පර්ශය ඇතිවන්නේ

"ස්පර්ශය ඇති වන්නේ ආයතන හය ඇති කල්හි ය. ආයතන හය හේතු කොට ගෙන ය ස්පර්ශය ඇතිවන්නේ.

(ගෝතම සූත්ත – සං. නි. 02)

පින්වත් මහණෙනි, මේ ආයතන හය යනු මොනවා ද? ඇස නම් වූ ආයතනය ය. කණ නම් වූ ආයතනය ය. නාසය නම් වූ ආයතනය ය. දිව නම් වූ ආයතනය ය. කය නම් වූ ආයතනය ය. මන නම් වූ ආයතනය ය.

(විභංග සූත්ත – සං. නි. 02)

sinhalaebooks.com



## ආයතන හය ගැන දහම් පිළිසඳරක්

වරක් බුදු සම්දාණන් සැප දුක පිළිබඳ ව දේශනා කොට වදාළ ධර්මයක් සැරියුත් තෙරුන් විසින් අන්‍යාගමික පිරිසකට පහදා දෙන ලදී. එය අසා සිටි අනඳ තෙරණුවෝ එම ධර්ම සාකච්ඡාව ගැන බුදු සම්දුට පැවසූහ. එවිට සාධුකාර දෙමින් එය අනුමෝදන් වූ භාග්‍යවතුන් වහන්සේ ලෝකයේ සියලුම දුක් හටගන්නේ ස්පර්ශය මුල් කොට බව වදාළ සේක. ඒ දෙසුම කෙරෙහි අතිශයින් ප්‍රසන්න වූ ආනන්ද තෙරණුවෝ මෙසේ පැවසූහ.

"ස්වාමීනි, අතිශයින් ම ආශ්චර්යයි! ස්වාමීනි, විස්මය ජනක යි! ("ස්පර්ශය" නම් වූ) එක ම එක බණ පදයෙකින් සියලු අර්ථය ප්‍රකාශ කරනු ලබන්නේ ය. මේ අර්ථය ම ස්වාමීනි, විස්තර වශයෙන් කියන විට වඩ වඩාත් ගැඹුරෙන් වැටහෙන්නේ නො වේ ද? ගැඹුරු අවබෝධයක් කරාම යන්නේ නො වේ ද?"

එවිට භගවත් බුදු සම්දාණෝ අනඳ තෙරුන් හට එය විස්තර වශයෙන් වටහා ගන්නා හැටි පැවසූ සේක. එවිට ආනන්ද තෙරණුවෝ... "ස්වාමීනි, යම් කෙනෙක් මගෙන් මෙසේ විමසුවොත්, ආයුෂ්මත් ආනන්දයෙනි, කුමක් මුල් කොට ද ස්පර්ශය හටගන්නේ? කුමක් හේතු කොට ගෙන ද? කුමක් ප්‍රභව කොට ගෙන දැ? යි.

ස්වාමීනි, එවිට මෙසේ අසන ලද මම, මෙසේ විසඳාලන්නෙමි. ආයතන හය මුල් කොට ගෙන ය ස්පර්ශය හටගන්නේ. ආයතන හය හේතු කොටගෙන ය. ආයතන හය ප්‍රභව කොට ගෙන ය.

ප්‍රිය ආයුෂ්මතුනි, මේ ස්පර්ශයට මුල් වූ ආයතන සය කෙරෙහි ඇති තණ්හාව ම ඉතිරි නැතිව, නො ඇල්මෙන් නිරුද්ධ වී යාමෙන් ස්පර්ශය නිරුද්ධ වෙයි. (ඡන්නං ත්වේව ආවුසෝ, ඵස්සායතනං අසේස විරාග නිරෝධා ඵස්ස නිරෝධෝ)"

(භූමිජ සූත්ත – සං. නි. 02)

ස්පර්ශායතන නිරෝධය යනුවෙන් අදහස් කරන්නේ ඇස, කණ, නාසය, දිව, කය, මන යන ආයතන හය කෙරෙහි පවතින

sinhalaebooks.com



තණ්හාව නිරුද්ධ වීම මිසක් ඒවා නො දැනී යාම නොවේ.

## හඳුනා ගන්න ආයතන හය

මේ ආයතන හය කෙරෙහි තිබෙන සැබෑ ම තත්වය ඒ ආකාරයෙන් ම අවබෝධ කළ යුතු බව බුදු සමිඳාණන් විසින් ඉතා ම පැහැදිලිව පෙන්වා දෙන ලදී.

"පින්වත් මහණෙනි, ඇස යනු අනිත්‍ය දෙයකි. අනිත්‍ය වූ යමක් ඇත් ද එය දුකකි. යමක් දුක නම් එය ආත්ම රහිත දෙයකි. යමක් ආත්ම රහිත නම්, "එය මාගේ නොවේ. මම නොවෙමි, මාගේ ආත්මය නොවේ" යයි එහි සැබෑ තත්වය ඒ ආකාරයෙන් ම දියුණු කරන ලද ප්‍රඥාවෙන් දැක්ක යුතු ය.

එමෙන් ම පින්වත් මහණෙනි,

කණ, නාසය, දිව, කය, මනස අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුකකි. යමක් දුක නම් එය ආත්ම රහිත ය. යමක් ආත්ම රහිත නම් "එය මාගේ නො වේ. මම නො වෙමි. මාගේ ආත්මය නො වේ" යයි එහි ඇති සැබෑ තත්වය ඒ ආකාරයෙන් ම දියුණු කරන ලද ප්‍රඥාවෙන් දැක්ක යුතු යි."

(අජ්ඣත්තානිච්ච සුත්තං – සං. නි. 04)

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් මේ ආයතන හය පිළිබඳ ව කරන ලද්දේ අංග සම්පූර්ණ පරීක්ෂණයකි. සමථ - විදර්ශනා ඔස්සේ උන්වහන්සේ විසින් කරන ලද ඒ පරීක්ෂණ ගැන උන්වහන්සේ විසින් ම මෙසේ පවසා සිටි සේක.

## මෙන්න සැබෑ තත්වය

"පින්වත් මහණෙනි, සම්බුද්ධත්වයට පෙර සිට ම සම්බුදු නො වූ බෝධිසත්ව වූ මට මේ ආකාර වූ සිතක් ඇති විය.

ඇසේ ආශ්වාදය කුමක් ද? ඇසේ ආදීනව කුමක් ද? ඇසේ නිස්සරණය කුමක් ද? කණේ... නාසයේ... දිවේ... කයේ... මනසේ... ආශ්වාදය කුමක් ද? මනසේ ආදීනව කුමක් ද? මනසේ නිස්සරණය

sinhalaebooks.com



කුමක් දැ යි.

පින්වත් මහණෙනි, ඒ ආකාරයට නුවණින් විමසන්නා වූ මට මෙය අවබෝධ විය.

ඇස නිසා උපදින යම් සුවයක් සොම්නසක් වේ නම් මෙය යි ඇසේ ආශ්වාදය. යම් ඇසක් අනිත්‍ය වූයේ වේ ද දුක් වූයේ වේ ද, වෙනස් වන ධර්මතාවට අයත් වූයේ වේ ද, මෙය යි ඇසේ ආදීනවය. ඇස කෙරෙහි පවතින යම් ඡන්ද රාගයක් වේ ද, එම ඡන්ද රාගය දුරු කිරීමක් වේ ද, එම ඡන්ද රාගය ප්‍රහාණය කිරීමක් වේ ද මෙය යි ඇසේ නිස්සරණය. (එනම්, ඇසෙන් නිදහස් වීම යි.)

කණ... නාසය... දිව... කය... මනස නිසා උපදින යම් සුවයක් සොම්නසක් වේ නම්, මෙය යි මනසේ ආශ්වාදය. යම් මනසක් අනිත්‍ය වූයේ වේ ද, දුක් වූයේ වේ ද, වෙනස්වන ධර්මතාවට අයත් වූයේ වේ ද මෙය යි මනසේ ආදීනවය. මනස කෙරෙහි පවතින යම් ඡන්ද රාගයක් වේ ද, ඒ ඡන්ද රාගය දුරු කිරීමක් වේ ද, ඒ ඡන්ද රාගය ප්‍රහාණය කිරීමක් වේ ද මෙය යි මනසේ නිස්සරණය."

(සම්බෝධ සුත්තං – සං. නි. 04)

## ආශ්වාදය නිසයි ඇලෙන්නේ

"පින්වත් මහණෙනි, ඉදින් මේ ඇසෙහි ආශ්වාදයක් නොතිබුනා නම් මේ සත්වයෝ ඇස කෙරෙහි නො ඇලෙත් ම ය.

පින්වත් මහණෙනි, යම් හෙයකින් ඇසෙහි ආශ්වාදයක් තිබේ ද එනිසා සත්වයෝ ඇස කෙරෙහි ඇලෙත් ම ය.

## ආදීනව නිසයි එපා වෙන්නේ

පින්වත් මහණෙනි, ඉදින් මේ ඇසෙහි ආදීනවයක් නො තිබුනා නම්, මේ සත්වයෝ නො කළකිරෙත් ම ය. පින්වත් මහණෙනි, යම් හෙයකින් ඇසෙහි ආදීනවයක් තිබේ ද එනිසා ම සත්වයෝ ඇස කෙරෙහි කළකිරෙත් ම ය.

sinhalaebooks.com



## ආශාව දුරුකිරීමෙනුයි නිදහස් වෙන්නේ

පින්වත් මහණෙනි, මේ ඇස කෙරෙන් නිදහස් වීමක් නො තිබුනා නම් මේ සත්වයෝ ඇස කෙරෙන් නිදහස් නො වෙත් ම ය. යම් හෙයකින් ඇසින් නිදහස් වීමක් තිබේ ද එනිසා ම සත්වයෝ ඇස කෙරෙන් නිදහස් වෙත් ම ය.

පින්වත් මහණෙනි, යම් තාක් සත්වයෝ (ඇස, කණ, නාසය, දිව, කය, මනස යන) මේ ආධ්‍යාත්මික ආයතනයන් ගේ ආශ්වාදය ආශ්වාදය වශයෙනුත්, ආදීනවය ආදීනවය වශයෙනුත්, නිස්සරණය නිස්සරණය වශයෙනුත්, ඒ ආකාරයෙන් ම අවබෝධ නො කරත් ද ඒ තාක් ම පින්වත් මහණෙනි, ඒ සත්වයෝ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ මේ සත්ව ප්‍රජාවෙන් නික්ම නො ගියාහු ය. වෙන් නො වූවාහු ය. නො මිදුනාහු ය. කෙළෙස් සීමා සිඳ බිඳ දැමූ සිතින් නො විසුවාහු ය.”

(නෝ චේ අස්සාද සුත්තං – සං. නි. 04)

## ආයතන පිළිගත්තොත් දුක යි පිළිගන්නේ

“පින්වත් මහණෙනි, යමෙක් ඇස සතුටින් පිළිගනී නම්, ඔහු සතුටින් පිළිගන්නේ දුක යි. යමෙක් සතුටින් පිළිගන්නේ දුක නම් ඔහු දුකින් නිදහස් නො වූයේ යයි කියමි. යමෙක් කණ... නාසය... දිව... කය... මනස... සතුටින් පිළිගනී නම්, ඔහු සතුටින් පිළිගන්නේ දුක යි. යමෙක් දුක සතුටින් පිළිගන්නේ නම්, ඔහු දුකින් නිදහස් නො වූයේ යයි කියමි.

## ඒවා නො පිළිගත්තොත් දුක යි නො පිළිගන්නේ

පින්වත් මහණෙනි, යමෙක් ඇස සතුටින් නො පිළිගනී නම් ඔහු සතුටින් නො පිළිගන්නේ දුක යි. යමෙක් දුක සතුටින් නො පිළිගන්නේ නම් ඔහු දුකින් නිදහස් වූයේ යයි කියමි. යමෙක් කණ... නාසය... දිව... කය... මනස සතුටින් නො පිළිගනී නම්, ඔහු සතුටින් නො පිළිගන්නේ දුක යි. යමෙක් දුක සතුටින් නො පිළිගන්නේ නම්

sinhalaebooks.com



ඔහු දුකින් නිදහස් වූයේ යයි කියමි.''

(අභිනන්ද සුත්තං – සං. නි. 04)

## දුකෙහි උපත!

"පින්වත් මහණෙනි, ඇසෙහි යම් උපතක්, පැවතීමක්, විශේෂයෙන් සකස් වීමක්, පහළවීමක් වේ නම් එය යි දුකේ උපත. එය යි රෝගයන් ගේ පැවැත්ම. එය යි ජරාමරණයේ පහළ වීම. කණෙහි... නාසයේ... දිවෙහි... කයෙහි... මනසෙහි යම් උපතක්, පැවතීමක්, විශේෂයෙන් සකස්වීමක්, පහළවීමක් වේ නම් එය යි දුකේ උපත. එය යි රෝගයන් ගේ පැවැත්ම. එය යි ජරාමරණයන් ගේ පහළවීම.''

(උප්පාද සුත්තං – සං. නි. 04)

## විද්‍යාව පහළ කරගැනීමට නම්...

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි එක්තරා භික්ෂුවක් උන්වහන්සේ ගෙන් මේ ප්‍රශ්නය ඇසී ය.

"ස්වාමීනි, කුමන අයුරුන් දැනගන්නා විට ද, කුමන අයුරින් දැක ගන්නා විට ද අවිද්‍යාව ප්‍රහීණ වී යන්නේ?''

"පින්වත් භික්ෂුව, ඇස අනිත්‍ය වශයෙන් දැන ගන්නා විට, දැක ගන්නා විට අවිද්‍යාව ප්‍රහීණ වෙයි. විද්‍යාව පහළ වෙයි. ඇසට පෙනෙන රූපයන් අනිත්‍ය වශයෙන් දැන ගන්නා විට, දැක ගන්නා විට අවිද්‍යාව ප්‍රහීණ වෙයි. විද්‍යාව පහළ වෙයි. ඇසේ හටගන්නා විඤ්ඤාණය (චක්ඛු විඤ්ඤාණය) අනිත්‍ය වශයෙන් දැනගන්නා විට දැකගන්නා විට අවිද්‍යාව ප්‍රහීණ වෙයි. විද්‍යාව පහළ වෙයි. ඇසේ ස්පර්ශය අනිත්‍ය වශයෙන් දැනගන්නා විට දැකගන්නා විට අවිද්‍යාව ප්‍රහීණ වෙයි. විද්‍යාව පහළ වෙයි. ඇසේ ස්පර්ශයෙන් හටගන්නා වූ යම් සැප විඳීමක් හෝ දුක් විඳීමක් හෝ දුක් සැප රහිත විඳීමක් හෝ වේ ද එයත් අනිත්‍ය වශයෙන් දැනගන්නා විට දැකගන්නා විට අවිද්‍යාව ප්‍රහීණ වෙයි. විද්‍යාව පහළ වෙයි.

කණ... නාසය... දිව... කය... මනස අනිත්‍ය වශයෙන් දැන

sinhalaebooks.com



ගන්නා විට දැක ගන්නා විට අවිද්‍යාව ප්‍රහීණ වෙයි. විද්‍යාව පහළ වෙයි. මනසට සිතෙන දේවල් අනිත්‍ය වශයෙන් දැනගන්නා විට දැකගන්නා විට අවිද්‍යාව ප්‍රහීණ වෙයි. විද්‍යාව පහළ වෙයි. මනසේ හටගන්නා විඤ්ඤාණය (මනෝ විඤ්ඤාණය) අනිත්‍ය වශයෙන් දැනගන්නා විට දැකගන්නා විට අවිද්‍යාව ප්‍රහීණ වෙයි. විද්‍යාව පහළ වෙයි. මනසේ ස්පර්ශය අනිත්‍ය වශයෙන් දැනගන්නා විට දැකගන්නා විට අවිද්‍යාව ප්‍රහීණ වෙයි. විද්‍යාව පහළ වෙයි. මනසේ ස්පර්ශයෙන් හටගන්නා වූ යම් සැප විඳීමක් හෝ දුක් විඳීමක් හෝ දුක් සැප රහිත විඳීමක් හෝ වේ ද එයත් අනිත්‍ය වශයෙන් දැනගන්නා විට දැකගන්නා විට අවිද්‍යාව ප්‍රහීණ වෙයි. විද්‍යාව පහළ වෙයි.”

(අවිජ්ජා පහාන සුත්තං – සං. නි. 04)

ඇස, කණ, නාසය, දිව, කය, මනස යන මේ ආයතන හය මුල් කරගෙන මොන තරම් දුරකට මේ සත්වයාව රැගෙන යන්නේදැ යි, අපට දැන් සිතා ගත හැකි ය. මේ ආයතන හය කෙරෙහි පවතින තණ්හාව දුරු කර ගත් දා ට අපටත් දුකින් නිදහස් විය හැකි ය. මේ ආයතන හය කෙරෙහි තණ්හාව පවතින තාක් අපට දුකින් වසන්නට සිදු වේ.

## රැවටෙන්න එපා!

මේ ආයතන හය හටගන්නේ ඊනියා ලෝක නිර්මාපක දෙවියන් වහන්සේ කෙනෙකු ගේ කැමැත්තෙන් නො වේ. දෙවියන් වහන්සේ යයි යම් කෙනෙකුට පවසත් නම් ඒ දෙවියන්ට ද තිබෙන්නේ කාටත් තිබෙන අනිත්‍ය වූ ඇස, කණ, නාසය, දිව, කය, මන යන මේ ආයතන හය ම ය. ඒ දෙවියන් ද අයිති වන්නේ දුකට ය, එම නිසා ඒ දෙවියන් ද දුකින් මිදී නැත. ඒ දෙවියන් ද ආත්ම රහිත හේතු - ඵල දහමේ ම නිර්මාණයකි. ඒ දෙවියන්ට පවා දුකින් නිදහස් විය හැක්කේ අපගේ බුදු සමිඳාණන් විසින් පෙන්වා දෙන ලද ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් පමණි.

sinhalaebooks.com



## නුවණ ම දියුණු කරන්න.

එම නිසා අන්ධ භක්තියට ඉඩ නො දී අපත් ඉගෙන ගත යත්තේ නුවණින් විමසීමට ය. අප ඉතා ම බුද්ධිමත් ව මේ කරුණ තේරුම් ගත යුතු ය. එනම් ඇස, කණ, නාසය, දිව, කය, මනස යන මේ ආයතන හය තමා ගේ කැමැත්තට අනුව සැදී තිබෙන්නා වූ දෙයක් ද නොවේ. වෙනත් කෙනෙකුට වුවමනා පරිදි තමාට හදා දෙන ලද දෙයක් ද නොවේ. ඉබේ හටගත් දෙයක් ද නො වේ. එසේ වූයේ නම් ඉවසා සිටීම හැර අපට කළ හැකි කිසි ම දෙයක් නැත. අප, තම තමා විසින් තම තමා ගේ කැමැත්ත පරිදි නම් මේ ආයතන හය හදාගන්නේ, කිසි ම කෙනෙකුන් කිසිදාක විරූපී ඇස් කන්, කොර වූ අතපය, අවලස්සන සිරුරු හදා නොගන්නේ ම ය. අනන්ත දුක් දොම්නස් පිරී ගිය සිතක් ඇති කර ගැනීමට කිසිවෙකුත් කැමැති නැත. සියලු දෙනා ම ඒකාන්තයෙන් ම කැමැති වන්නේ තම තමන් ගේ අභිමතය පරිදි වයසට නොයන්නා වූ රෝග පීඩා දුක් කරදර රහිත වූ ජීවිතයක් ඇති කරගැනීම නො වේ ද?

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ජීවිතයේ යථාර්ථය ගැන සොයා මතු කරගන්නා මේ විස්මිත හෙළිදරව්ව වසා දැමිය හැකි කිසිවෙක් මේ ලෝකයේ නැත්තේ ම ය. උන්වහන්සේ ගේ වීර්යය, සිහිය, සමාධිය, ප්‍රඥාව ආදී සියල්ල යොමු වී තිබුනේ ජීවිතාවබෝධය පිණිස ම ය.

## කුමකින් ද සැදුනේ මේ ආයතන සය?

ඇස, කණ, නාසය, දිව, කය, මන යන මේ ආයතන හයට වසඟ වූ ලෝකයා මේවා හටගත්තේ කුමක් හේතු කොට ගෙන දැ'යි මොහොතකටවත් නො විමසති. ඔවුන්ට ඒ ගැන විමසන්ට වෙලාවක් ද නැත. ඒ ඒ ආයතනයන්ට අරමුණු වන රූප ශබ්ද ගන්ධ ආදිය ගැනත් ඒවායින් ලබන්නා වූ ආශ්වාදයත් ගැන පමණි ඔවුන් බොහෝ වේලාවට සිත සිතා සිටින්නේ. එහෙත් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මේවාට වසඟ වූයේ නැත. උන්වහන්සේ ආයතන හය හට

sinhalaebooks.com



ගැනීමට මුල් වූ හේතුව නුවණින් විමසන්ට පටන් ගත්හ.

## නාම-රූප වලිනුයි ආයතන සැදුනේ

"ආයතන හය ඇති වන්නේ කුමක් ඇති කල්හි ද? ආයතන හය හටගන්නේ කුමක් හේතුකොට ගෙන ද?"

ඉතා ම නිවැරදි ලෙස උන්වහන්සේ පිළිතුරු සොයා ගත්හ.

"ආයතන හය ඇති වන්නේ නාම-රූප ඇති කල්හි ය. ආයතන හය හටගන්නේ නාම-රූප හේතු කොට ගෙන ය."

(ගෝතම සුත්ත – සං. නි. 02)

## කුමක් ද මේ නාම-රූප?

සාමාන්‍යයෙන් නාම-රූප ගැන විවිධාකාර තේරුම් දීමට බොහෝ දෙනෙක් පුරුදු වී සිටිති. බොහෝ විට ඔවුන් ඒ තේරුම් දෙන්නේ තම තමන් ගේ හිතුමනාපෙට හිතාගත් දේවල්වලට අනුව ය. එවිට භාග්‍යවතුන් වහන්සේ නාම-රූප යනුවෙන් අපට තේරුම් කර දුන් දේ ගැන දැන ගැනීමේ අවස්ථාව අපට මග හැරී යයි.

සමහරුන් නාම-රූප විස්තර කිරීමේ දී "නාම" යන්නෙන් අදහස් කරන්නේ "සිත" බවත්, "රූප" යන්නෙන් අදහස් කරන්නේ "කය" බවත් විස්තර කරති. එහෙත් ධර්මයේ සඳහන් වන්නේ සිත - කය අයිති වන්නේ නාම-රූපවලට නොව නාම-රූප හේතුවෙන් හටගත් ආයතනවලට බව යි.

තවත් සමහරුන් පඤ්චුපාදානස්කන්ධය දෙකට බෙදා නාම-රූප විස්තර කරති. එනම්, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, නාම ස්කන්ධය යි. රූප, රූපස්කන්ධය යි වශයෙනි. එහෙත් මේ ආකාරයට නාම-රූප බෙදා දැක්වූ තැනක් බුද්ධ දේශනාවකින් සොයා ගත නො හැකි ය. "විඤ්ඤාණය" නාමයට අයත් කොට නො වේ උන්වහන්සේ දක්වා තිබෙන්නේ.

බුදුරජාණන් වහන්සේ නාම-රූප යනුවෙන් අදහස් කළේ කුමක් දැ'යි තේරුම් ගත හැක්කේ උන්වහන්සේ ගේ ම දේශනාවන්

sinhalaebooks.com



තුළින් ය.

## දැනගන්න නාම-රූප

"පින්වත් මහණෙනි, නාම-රූප යනු මොනවා ද?

වේදනා – සඤ්ඤා – චේතනා – ඵස්ස – මනසිකාර යන මේවාට ය 'නාම'යයි කියන්නේ. පඨවි – ආපෝ – තේජෝ – වායෝ යන සතර මහා භූතයින්ට ද සතර මහා භූතයින් ගෙන් හටගත් රූප යන මෙයට ය 'රූප' යයි කියන්නේ.

පින්වත් මහණෙනි, මෙසේ මේ නාමයටත් රූපයටත් ය නාම-රූප යයි කියන්නේ."

(විභංග සුත්ත – සං. නි. 02)

## හොඳින් තේරුම් ගන්න

මෙතැන දී භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් නාම-රූප ගැන විස්තර කළ ආකාරය හොඳින් තේරුම් ගන්න. එනම් "නාම" වශයෙන් උන්වහන්සේ කරුණු පහක් ඉදිරිපත් කර දෙන සේක. 1. වේදනා. 2. සඤ්ඤා. 3. චේතනා. 4. ඵස්ස. 5. මනසිකාර යන කරුණු පහයි. "රූප" වශයෙන් පෙන්වා දෙන්නේ සතර මහා භූතයන් ද ඒවායින් හටගත් දේවල් ය.

සිත හා කය ගැනත් පඤ්චුපාදානස්කන්ධය ගැනත් උන්වහන්සේ නොයෙක් ආකාරයෙන් විස්තර කොට තිබේ. එහෙත් ඒවා නාම-රූප වශයෙන් නො වේ විස්තර කොට තිබෙන්නේ. සිත හා කය ගැන විස්තර වන දේශනාවක් ගැන තේරුම් ගත යුත්තේ සිත, කය වශයෙන් පමණි. එයට නාම-රූප යන නම භාවිත නොකිරීම වැදගත් ය. පඤ්චුපාදානස්කන්ධය ගැන කථා කරන විට එය නාම-රූප වශයයෙන් දෙකට නො බෙදා තේරුම් ගැනීම මැනවි.

sinhalaebooks.com



## නාම-රූප පැහැදිලි කර ගනිමු

දැන් අපි "නාම" යන වචනයෙන් බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් කරුණු පහ දනිමු. එනම්, වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර යන කරුණු පහ යි. මෙහි වේදනාවත්, සඤ්ඤාවත්, චේතනාවත් යන තුන ම ස්පර්ශය හේතු කොට ගෙන හටගන්නා බව උන්වහන්සේ ඉතා ම පැහැදිලි ලෙස පෙන්වා දී තිබේ. ඒ තුන ම හටගැනීමට ස්පර්ශය ම ප්‍රධාන වන නිසා ස්පර්ශය සිව්වැනි තැනට සඳහන් කරන්නට ඇතැයි අපට සිතා ගත හැකි ය. එහි මනසිකාරය හඳුන්වා තිබෙන්නේ පස්වන තැනටයි. මනසිකාරයේ ක්‍රියාකාරිත්වය මේ සියල්ලට ම බලපාන බව පහත සඳහන් දේශනයෙන් අපට තේරුම් ගත හැකි ය. මෙය සද්ධර්ම සේනාධිපති සැරියුත් තෙරුන් විසින් භික්ෂූන් සමඟ කරන ධර්ම සාකච්ඡාවකි.

## මනසිකාරයේ ස්වභාවය

"ප්‍රිය ආයුෂ්මතුනි, ඉදින් ආධ්‍යාත්මික ව (තමා ගේ යයි සලකන) ඇස නො බිඳී හොඳින් පවතින නමුත්, බාහිර රූප ඇස් හමුවට දර්ශනය පිණිස නො එත් නම්, රූප දර්ශනයට හේතුවන මනසිකාරයකුත් නැති නම් චක්ඛු විඤ්ඤාණයේ පහළ වීමක් නැත.

ඉදින් ආධ්‍යාත්මික ඇස නො බිඳී හොඳින් පවතින්නේ නමුත්, බාහිර රූප ද ඇස් හමුවට දර්ශනය පිණිස පැමිණෙන නමුත් රූප දර්ශනය හේතුවන මනසිකාරයක් නැත් නම්, චක්ඛු විඤ්ඤාණයේ පහළ වීමක් නැත.

එහෙත් ප්‍රිය ආයුෂ්මතුනි, යම් කලෙක ආධ්‍යාත්ම ඇස නො බිඳී හොඳින් පවතින්නේ නම්, බාහිර රූපත් ඇස් හමුවට දර්ශනය පිණිස පැමිණෙත් නම්, රූප දර්ශනයට හේතු වන මනසිකාරය ද තිබේ නම් චක්ඛු විඤ්ඤාණය පහළ වෙයි. (කණ... නාසය... දිව... කය...) ප්‍රිය ආයුෂ්මතුනි, ආධ්‍යාත්මික මනස නො බිඳී හොඳින් පවතින නමුත්, මනසට සිතෙන බාහිර අරමුණු නො පැමිණෙයි නම්, මනසින් ඒවා දැන ගැනීමට හේතු වන මනසිකාරය ද නැති නම් මනෝ

sinhalaebooks.com



විඤ්ඤාණයේ පහළ වීමක් නැත.

එහෙත් ආයුෂ්මතුනි, එම කලෙක ආධ්‍යාත්මික ව මනස නො බිඳී හොඳින් පවතී නම්, බාහිර අරමුණු ද පැමිණෙයි නම්, මනසින් ඒවා දැන ගැනීමට හේතුවන මනසිකාරයක් ද තිබේ නම්, මනෝ විඤ්ඤාණය පහළ වෙයි.”

(මහා හත්ථිපදෝපම සූත්‍ත – ම. නි. 01)

විඤ්ඤාණයේ පහළ වීම පිණිස මනසිකාරයේ උපකාරය කොතරම් ප්‍රබල දැ'යි දැන් අපට පැහැදිලි කර ගත හැකි ය. මනසිකාරයක් නැති තැන විඤ්ඤාණයේ පහළ වීමක් නැත. විඤ්ඤාණයේ ක්‍රියාකාරිත්වයක් නැති තැන ස්පර්ශයක් කොයින් ද? ස්පර්ශයක් නැති තැන වේදනා, සඤ්ඤා, චේතනා කොයින් ද? එසේ නම් “මනසිකාරය” මේ සියල්ලට ම උපකාරී වන දෙයකි.

ආයුෂයත් උණුසුමත් යුතුව මේ ඇස – කණ – නාසය – දිව – කය හා මනස යන මේ ආයතන පවතින්නේ නාම-රූපයන් හේතු කොට ගෙන ය. මේ සත්ව සන්නිවාසයේ කොහේ නමුත් මේ ආයතන හය හටගන්නේ නාම-රූප හේතුවෙන් මිසක් වෙන හාස්මකින් නො වේ.

## නාම-රූප ගැන විශේෂ විග්‍රහයක්

නාම-රූප පිළිබඳ ව පරම ගම්භීර විස්තරයක් මහානිදාන සූත්‍රයේ සඳහන් ව තිබේ. එහි දී අපගේ භාග්‍යවතුන් වහන්සේ එක්තරා සුවිශේෂී ක්‍රමයකට ය නාම-රූප පිළිබඳ විග්‍රහයේ යෙදෙන්නේ. සාමාන්‍යයෙන් අප ඉගෙන ගෙන තිබෙන්නේ ආයතන හේතුකොට ගෙන ස්පර්ශය ඇති වන බවත්, නාම-රූප හේතු කොට ගෙන ආයතන හය ඇති වන බවත් ය.

එහෙත් මෙතැන දී ධර්මස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේ ආයතන හය ගැන කතා නොකොට කෙළින් ම නාම-රූප හේතු කොට ගෙන ස්පර්ශය හටගන්නා බව පෙන්වා දෙති. උන්වහන්සේ මෙතැන දී ස්පර්ශය යන වචනය භාවිතා කරන්නේ නාම-රූපයන් ගේ අන්තර්

sinhalaebooks.com



සම්බන්ධතාවයෙහි ඇති සමීප බව පෙන්වා දීම පිණිස ය. උන්වහන්සේ අවධාරණයෙන්ම පෙන්වා දෙන්නේ ව්‍යවහාරික ලෝකය සම්පූර්ණයෙන්ම පවතින්නේ නාම-රූප ධර්මයන්ගේ එක්වීම මත බවයි. මේ නාම-රූප ධර්මයන් ගේ එක්වීම සම්බන්ධයෙන් දෙයාකාරයක ස්පර්ශයක් උන්වහන්සේ අපට හඳුන්වා දෙන සේක.

## නාම-රූපයේ ස්පර්ශය

එනම්: 1. රූප කායේ අධිවචන සම්ඵස්ස

2. නාම කායේ පටිඝ සම්ඵස්ස වශයෙනි.

**රූප කායේ අධිවචන සම්ඵස්ස** යනු කුමක් දැ'යි පළමු කොට පැහැදිලි ව තේරුම් ගෙන තිබිය යුතු ය. රූප යනු සතර මහා ධාතූන් හා සතර මහා ධාතූන් ගෙන් හටගත් දේ වශයෙන් ධර්මය තුළින් අපි දැන ගෙන සිටිමු.

එම රූප ධර්මයන් අප හඳුනා ගන්නේත් ඒ ගැන අප කථා බස් කරන්නේත් ඒ රූප ධර්මයන් පිළිබඳ ගොඩ ගැහෙන, භාවිතා වන නාම ධර්මයන් මුල් කොට ගෙන ය. එනම් රූප ධර්මයන් පිළිබඳ ව අප තුළ ඇති වන දැනීම ගොඩ නැගෙන්නේ වේදනා – සඤ්ඤා – චේතනා – ඵස්ස – මනසිකාර මුල් කොට ගෙන ය. රූප කායේ අධිවචන සම්ඵස්ස යනුවෙන් පෙන්වා දෙන්නේ එයයි.

**නාම කායේ පටිඝ සම්ඵස්ස** ද මනා ඉවසිල්ලෙන් යුතුව තේරුම් ගත යුතු ය. නාම කාය යනු වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර යන නාම ධර්මයන් ය. මේ නාම ධර්මයන් තුළින් කථා බස් කරන්නා වූ යම් දෙයක් වේ නම් එය වනාහී සතර මහාධාතූන් හෝ එම ධාතූන් ගෙන් හටගත් දෙයකි. එය ධර්මයේ හඳුන්වන්නේ නාම කායේ පටිඝ සම්ඵස්ස වශයෙන් ය.

එම නිසා රූප කායේ අධිවචන සම්ඵස්සයකින් හා නාම කායේ පටිඝ සම්ඵස්සයකින් තොරව ලෝකයේ කිසිවක් නැත. නාම-රූප ධර්මයන් ගේ අන්තර් සම්බන්ධතාව එතරම් ම සූක්ෂ්ම ලෙස පවතී.

ආනන්ද තෙරුන් හට මේ අසිරිමත් ධර්මතාව ගැන

sinhalaebooks.com



භාග්‍යවතුන් වහන්සේ මේ ආකාරයෙන් හෙළිදරව් කරන සේක.

ස්පර්ශය වනාහී නාම-රූප හේතු කොට ගෙන ඇති වන්නේ ය යන කරුණ ද මෙලෙසින් පවසන ලදී. පින්වත් ආනන්ද, එනම් ස්පර්ශය වනාහී නාම-රූප හේතු කොට ගෙන ඇති වන්නේ යම් ආකාරයෙකින් ද ඒ බව මෙම ධර්ම විවරණය තුළින් තේරුම් ගත යුතු ය.

## රූප කායේ අධිවචන සම්ඵස්ස

පින්වත් ආනන්ද, යම් යම් ආකාරවලින් (යේහි ආකරේහි), අනන්‍යතාව හඳුන්වන යම් යම් ලක්‍ෂණවලින් (යේහි ලිංගේහි), යම් යම් සටහන්වලින් (යේහි නිමිත්තේහි), යම් යම් ප්‍රකාශන වලින් (යේහි උද්දේසේහි) නාම ධර්මයන් ගේ යම් ව්‍යවහාරයක් ඇති වන්නේ වේ ද,

ඒ ඒ ආකාර තුළ, අනන්‍යතාව හඳුන්වන ඒ ඒ ලක්‍ෂණ තුළ, ඒ ඒ සටහන් තුළ, ඒ ඒ ප්‍රකාශන තුළ නාම ධර්මයන් ගේ ව්‍යවහාරයක් නැති නම් එයට අදාළ රූප ගැන වෙන් වශයෙන් හඳුනාගෙන කථා බස් කළ හැකි බවක් තිබේ ද?

ස්වාමීනි, එසේ නැත්තේ ම ය.

## නාම කායේ පටිඝ සම්ඵස්ස

පින්වත් ආනන්ද, යම් යම් ආකාරවලින්, අනන්‍යතාව හඳුන්වන යම් යම් ලක්‍ෂණවලින්, යම් යම් සටහන්වලින්, යම් යම් ප්‍රකාශවලින්, රූප ධර්මයන් ගේ යම් ව්‍යවහාරයක් ඇති වන්නේ වේ ද,

ඒ ඒ ආකාර තුළ, අනන්‍යතාව හඳුන්වන ඒ ඒ ලක්‍ෂණ තුළ ද, ඒ ඒ සටහන් තුළ, ඒ ඒ ප්‍රකාශන තුළ රූපය ගැන ව්‍යවහාරයක් නැති නම් නාමයෙන් හැඳින්වෙන රූපයක් (නාම කායේ පටිඝ සම්ඵස්ස) ගැන කථා බහ කළ හැකි ද?

ස්වාමීනි, එසේ නැත්තේ ම ය.

sinhalaebooks.com



## නාම-රූපයේ ව්‍යවහාරය නැතිනම්

පින්වත් ආනන්ද, යම් යම් ආකරවලින්, අනන්‍යතාව හඳුන්වන යම් යම් ලක්‍ෂණවලින්, යම් යම් සටහන්වලින්, යම් යම් ප්‍රකාශනවලින්, නාමයේත් රූපයේත් ව්‍යවහාර ඇතිවන්නේ වේ ද,

ඒ ඒ ආකාර තුළ අනන්‍යතාව හඳුන්වන ඒ ඒ ලක්‍ෂණ තුළ ඒ ඒ සටහන් තුළ, ඒ ඒ ප්‍රකාශන තුළ, නාමයේත් රූපයේත් ව්‍යවහාරයක් නැති නම් රූපය ගැන නාමයෙන් ඇතිවන දැන ගැනීමක් (රූපකායේ අධිවචන සම්ඵස්ස) හෝ නාමයෙන් කථා කළ දෙය රූපයෙන් හඳුනා ගැනීමක් (නාමකායේ පටිඝ සම්ඵස්ස) හෝ ව්‍යවහාරයට පැමිණෙන්නේ ද?

ස්වාමීනි, එසේ නොවන්නේ ම ය.

## ස්පර්ශයකුත් නැත

පින්වත් ආනන්ද, යම් යම් ආකාරවලින්, අනන්‍යතාව හඳුන්වන යම් යම් ලක්‍ෂණවලින්, යම් යම් සටහන්වලින්, යම් යම් ප්‍රකාශනවලින් නාම-රූපයේ ව්‍යවහාරය ඇති වන්නේ වේ ද,

ඒ ඒ ආකාර තුළ, ඒ අනන්‍යතාව හඳුන්වන ඒ ඒ ලක්‍ෂණ තුළ, ඒ ඒ සටහන් තුළ, ඒ ඒ ප්‍රකාශන තුළ නාම-රූපයේ ව්‍යවහාරයක් නැති නම් ස්පර්ශයක් ගැන කථා කළ හැකි ද?

ස්වාමීනි, මෙය නොවන්නේ ම ය.

(මහා නිදාන සූත්ත – දී. නි. 02)

සංසාරික ජීවිතය සකස් වීම පිණිස නාම-රූප ධර්මයන් ගේ බලපෑම කොතරම් ප්‍රබලව පවතින්නේ දැ'යි මේ තුළින් අපට සිතා ගත හැකි ය. අනිත්‍ය වූ නාමත් අනිත්‍ය වූ රූපත් යන මෙම නාම-රූපයන් ගේ එක් වී පැවතීම ජීවිත ගැටළුව වේ.

එසේ නැතිව කය නාමය යි සිත රූපය යි වශයෙන් සාමාන්‍ය ලෝකයා නාම-රූප තෝරා ගන්නා හැටි කොතරම් බොළඳ දැ'යි වැටහෙන්නේ භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනා තුළින් අපගේ දැනීම පුළුල් වන විට ය.

sinhalaebooks.com



## නාම-රූපයෙන් හැදෙන දේ

එසේ නම් ඇස යනු අනිත්‍ය වූ නාම-රූපයෙන් හටගත් දෙයකි. කණ යනු අනිත්‍ය වූ නාම-රූපයෙන් හටගත් දෙයකි. නාසය යනු අනිත්‍ය වූ නාම-රූපයෙන් හටගත් දෙයකි. දිව යනු අනිත්‍ය වූ නාම-රූපයෙන් හටගත් දෙයකි. කය යනු අනිත්‍ය වූ නාම-රූපයෙන් හටගත් දෙයකි. මනස යනු අනිත්‍ය වූ නාම-රූපයෙන් හටගත් දෙයකි.

අනිත්‍ය වූ නාම-රූපයෙන් හටගත්තා වූ මේ ඇස – කණ – නාසය – දිව – කය – මනස කෙසේ නම් නිත්‍ය වන්නේ ද?

## කුමකින් සැදුනේ ද මේ අනිත්‍ය වූ නාම-රූප?

තමන් වහන්සේ ගේ අසහාය බුද්ධිය ඉතා ම සූක්ෂ්ම ලෙස හැසිරවීමේ විස්මිත හැකියාවෙන් යුතු අප ගේ ශාස්තෘන් වහන්සේ වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ජරාමරණවලින් ජීවිතය සදහට ම නිදහස් කර ගැනීමේ ලොව්තුරු පර්යේෂණය මෙසේ කෙමෙන් කෙමෙන් නිරවුල් කරගෙන තිබිණ. මේ නාම-රූප දක්වා ම හේතු ඵල දහමේ සැබෑ ම ක්‍රියකාරීත්වය අවබෝධ කරගන්නට සමත් වූ උන්වහන්සේ නාම-රූපයන් ගේ ද හේතුව විමසන්නට පටන් ගත් සේක.

## විඤ්ඤාණය හේතුවෙන් නාම-රූප

“නාම-රූප ඇති වන්නේ කුමක් ඇති කල්හී ද? නාම-රූප හටගන්නේ කුමක් හේතු කොට ගෙන ද?”

උන්වහන්සේ ට පිළිතුර හමුවිය. උන්වහන්සේ ගේ අසිරිමත් ප්‍රඥාව ඉදිරියේ විවෘත නො වූ කිසිවක් නැත.

“විඤ්ඤාණය ඇති කල්හි ය නාම-රූප ඇතිවන්නේ. නාම-රූප හටගන්නේ විඤ්ඤාණය හේතු කොට ගෙන ය”

(ගෝතම සුත්ත – සං. නි. 02)

sinhalaebooks.com



## කුමක් ද මේ විඤ්ඤාණය?

"පින්වත් මහණෙනි, විඤ්ඤාණය යනු කුමක් ද? පින්වත් මහණෙනි, විඤ්ඤාණයේ ආකාර හයකි. එනම් ඇසේ විඤ්ඤාණය, කණේ විඤ්ඤාණය, නාසයේ විඤ්ඤාණය, දිවේ විඤ්ඤාණය, කයේ විඤ්ඤාණය, මනසේ විඤ්ඤාණය වශයෙනි."

(විභංග සුත්ත – සං. නි. 02)

## මුළා නොවෙන්න විඤ්ඤාණයට...

මෙම "විඤ්ඤාණය" යන වචනය බොහෝ දෙනෙක් කථා බස් කරත්. එහෙත් බොහෝ දෙනෙක් නොදන්නේත් ඒ විඤ්ඤාණය ගැන ම ය. විඤ්ඤාණය යනු කුමක් දැ'යි ඇසූ විට ඒ ගැන විවිධාකාර මති මතාන්තර කියති. "විඤ්ඤාණය" යනු කුමක් දැ'යි බොහෝ දෙනෙකුන් නොදන්නා බව අපට වැටහෙන්නේ විඤ්ඤාණය ගැන ඔවුන් පවසන විවිධ විචිත්‍ර කතන්දර ඇසෙන විට ය. බුදු රජුන් ගේ විඤ්ඤාණය අහසේ පාවෙමින් තිබෙන්නේ යයි කෙනෙක් පවසති. රහතන් වහන්සේ ගේ විඤ්ඤාණය අනන්තයට යතැ'යි කෙනෙක් පවසති. ගස් වැල්වලට පවා විඤ්ඤාණය තිබේ යයි තවෙකෙක් පවසති. එවැනි කියුම් දෙස බලන විට පෙනෙන්නේ ඔවුන් යාන්තමින් වත් විඤ්ඤාණය ගැන නොදන්නා බව යි.

## මෙන්න විඤ්ඤාණය!

"පින්වත් මහණෙනි, විඤ්ඤාණය යයි කියන්නේ මක් නිසා ද? පින්වත් මහණෙනි, විශේෂයෙන් දැන ගන්නේ ය යන අර්ථයෙන් ය විඤ්ඤාණය යයි කියනු ලබන්නේ (විජානාතී'ති බෝ භික්ඛවේ තස්මා විඤ්ඤාණන්ති වුච්චති)."

(ඛජ්ජනීය සුත්ත – සං. නි. 03)

sinhalaebooks.com



## තේරුම් ගන්න විඤ්ඤාණය!

"පින්වත් මහණෙනි, විඤ්ඤාණය යනු හේතුන් නිසා හටගත් දෙයක් බවත්, හේතුන් ප්‍රත්‍යයන් ගෙන් තොරව විඤ්ඤාණය නො හටගන්නා බවත්, මා විසින් ඔබලාට නොයෙක් ආකාරයෙන් පවසන ලදී.

පින්වත් මහණෙනි, යම් යම් හේතූන් ගේ උපකාරයෙන් විඤ්ඤාණය හටගන්නා විට ඒ ඒ හේතූන් නමින් විඤ්ඤාණය හඳුන්වනු ලැබේ. ඇසත් රූපත් නිසා විඤ්ඤාණය හටගනී. එවිට එය හඳුන්වන්නේ ඇසේ විඤ්ඤාණය නමින් ය. කණත් ශබ්දයත් නිසා විඤ්ඤාණය හටගනී. එය හඳුන්වන්නේ කණේ විඤ්ඤාණය නමින් ය. නාසයත් ගඳ සුවඳත් නිසා විඤ්ඤාණය පහළ වේ. එය හඳුන්වන්නේ නාසයේ විඤ්ඤාණය නමින් ය. දිවත් රසයත් නිසා විඤ්ඤාණය හටගනී. එය හඳුන්වන්නේ දිවේ විඤ්ඤාණය නමින් ය. කයත් පහසත් නිසා විඤ්ඤාණය හටගනී. එය හඳුන්වන්නේ කයේ විඤ්ඤාණය නමින් ය. මනසත් අරමුණුත් නිසා විඤ්ඤාණය හටගනී. එය හඳුන්වහන්නේ මනසේ විඤ්ඤාණය හෙවත් මනෝ විඤ්ඤාණය නමින් ය.

පින්වත් මහණෙනි, ගින්නක් ඇවිලෙන්නේ යම් යම් හේතූන් ගේ උපකාරයෙන් යයි සිතමු. එවිට ඒ ගින්න ඒ ඒ හේතු ප්‍රත්‍යයන් ගේ නාමයෙන් ම හඳුන්වනු ලැබේ.

## ගින්නට නම් තැබීම

ගින්න දර නිසා ඇවිලෙන විට එය දර ගින්න නම් වේ. ගින්න ලී කැබලි නිසා ඇවිලෙන විට එය ලී ගින්න නම් වේ. ගින්න තණකොළ නිසා ඇවිලෙන විට එය තණ ගින්න නම් වේ. ගින්න ගොම නිසා ඇවිලෙන විට එය ගොම ගින්න නම් වේ. ගින්න දහයියා නිසා ඇවිලෙන විට එය දහයියා ගින්න නම් වේ. ගින්න කසල නිසා ඇවිලෙන විට එය කසල ගින්න නම් වේ.

sinhalaebooks.com



මේ ආකාරයෙන් ම පින්වත් මහණෙනි, විඤ්ඤාණය හට ගැනිමට උපකාර වන්නේ යම් යම් හේතු ප්‍රත්‍යයන් ද, ඒ හේතු ප්‍රත්‍යයන් ගේ නාමයෙන් විඤ්ඤාණය හඳුන්වනු ලැබේ.”

(මහා තණ්හාසංඛය සුත්ත – ම. නි. 01)

භාග්‍යවත් බුදුසමිඳාණන් වදාළ ධර්මයෙහි විඤ්ඤාණං, මනෝ, චිත්තං යන වචන තුනක් දක්නට ලැබේ. මේ වචන තුන ම එක තැනක දී වදාළ දෙසුමක් අපට හමු වේ.

## චිත්ත + මනෝ + විඤ්ඤාණ

“පින්වත් මහණෙනි, යම් දෙයකට සිත යයි කියනු ලැබේ ද, මනස යයි කියනු ලැබේ ද, විඤ්ඤාණය යයි කියනු ලැබේ ද, අන්න ඒ දෙය ගැන අශ්‍රැතවත් පෘථග්ජනයාට කළකිරීමට පත් වීමේ හැකියාවක් නැත. එහි නො ඇලී සිටින්නට හැකියාවක් නැත. ඒ දෙයින් නිදහස් වෙන්නට හැකියාවක් නැත.

පින්වත් මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනයා විසින් එය බොහෝ කාලයක් මුළුල්ලේ මමත්වයෙන් බැසගන්නා ලදී. මෙය මාගේ ය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මය යයි දැඩි ලෙස පිළිගන්නා ලදි. එනිසා ම අශ්‍රැතවත් පෘථග්ජනයා ඒ කෙරෙහි කළකිරෙන්නට හැකියාවක් නැත. එහි නො ඇලී සිටින්නට හැකියාවක් නැත.

පින්වත් මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනයා හට “ආත්මයක්” කියා යමක් අල්ලා ගන්නට ඕනම නම් සතර මහා භූතයන් ගෙන් හටගත් මේ කය අල්ලාගැනීම හොඳ ය. එහෙත් ඒ ආකාරයෙන් සිත අල්ලා ගැනීම හොඳ නැත.

මක් නිසා ද යත්,

පින්වත් මහණෙනි, සතර මහා භූතයින්ගෙන් හටගත් මේ කය එක් වර්ෂයක් හෝ පවතිනු දක්නට ලැබේ. වර්ෂ සියයක් හෝ ඊට ස්වල්පයක් වැඩියෙන් හෝ පවතිනු දක්නට ලැබේ.

sinhalaebooks.com



## වහ වහා වෙනස් වෙයි.

එහෙත් පින්වත් මහණෙනි, යම් දෙයක් ගැන ‘සිත’ යයි කියනු ලැබේ ද, ‘මනස’ යයි කියනු ලැබේ ද, ‘විඤ්ඤාණය’ යයි කියනු ලැබේ ද, එය වනාහී රාත්‍රියෙහි ද දවල් ද වෙනත් එකක් ම උපදී. වෙනත් එකක් ම නැති වෙයි.

පින්වත් මහණෙනි, වනාන්තරයේ හැසිරෙන වඳුරෙක් ගැන සිතමු. ඒ වඳුරා අත්තක් අල්ලා ගනී. එය අතහැර වෙන අත්තක් අල්ලා ගනී. එය අතහැර වෙන අත්තක් අල්ලා ගනී.

පින්වත් මහණෙනි, ඒ ආකාරයෙන් ම යම් දෙයකට ම මේ සිත යයි කියනු ලැබේ ද, මනස යයි කියනු ලැබේ ද, විඤ්ඤාණය යයි කියනු ලැබේ ද, රාත්‍රියෙහි ද දහවල් ද වෙනත් එකක් ම උපදී. වෙනත් එකක් ම නැති වෙයි.”

(අස්තුතවන්තු සුත්ත – සං. නි. 02)

## නාම-රූපයෙන් “මනෝ”

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් “මනස” ගැන පෙන්වා දුන්නේ නාම-රූප හේතුවෙන් හටගත් දෙයක් වශයෙන් ය. “නාම-රූප පච්චයා සළායතනං” යන තැන කියවෙන ආයතන හයට මනස ද අයිති වේ.

## නාම-රූපයෙන් “විඤ්ඤාණය”!

එසේ නම් “විඤ්ඤාණය” යනු කුමක් හේතුවෙන් හටගන්නා දෙයක් ද?

“පින්වත් මහණෙනි, විඤ්ඤාණය හටගන්නේ නාම-රූප හේතු කොට ගෙන ය. විඤ්ඤාණය නිරුද්ධ වන්නේ නාම-රූප නිරුද්ධ වීමෙනි.”

(සත්තට්ඨාන සුත්ත – සං. නි. 03)

sinhalaebooks.com



## නාම-රූපයෙන් "චිත්ත"

"පින්වත් මහණෙනි, සිත (චිත්ත) හටගන්නේ ද නාම-රූප හට ගැනීමෙනි. චිත්තය නිරුද්ධ වන්නේ නාම-රූප නිරුද්ධ වීමෙනි."

(සමුදය සුත්ත – සං. නි. 05 - 01)

එසේ නම් අප එක දෙයක් ගැන ඉතා ම පැහැදිලිව තේරුම් ගෙන සිටිය යුතු ම ය. එනම්, මේ විඤ්ඤාණය, මනස ය, චිත්තය කියන දෙය නාම-රූප ප්‍රත්‍යයෙන් හටගන්නා වූත්, නාම-රූප නිරුද්ධ වීමෙන් නිරුද්ධ වන්නා වූත් ස්වභාවයට අයත් දේ බවයි.

වරක් කොට්ඨිත තෙරණුවෝ සැරියුත් තෙරුන් ගෙන් "විඤ්ඤාණය" කුමක් හේතු කොට ගෙන හටගන්නේ දැ'යි විමසූහ. එවිට සැරියුත් තෙරුන් පිළිතුරු දුන්නේ විඤ්ඤාණය නාම-රූප ප්‍රත්‍යයෙන් හටගන්නා දෙයක් වශයෙනි.

යළිත් කොට්ඨිත තෙරණුවෝ තවත් ප්‍රශ්නයක් ඇසූහ. එනම් "නාම-රූප හටගන්නේ කුමක් ප්‍රත්‍යයෙන් ද?" යනුවෙනි. සැරියුත් තෙරුන් පිළිතුරු දී වදාළේ "නාම-රූප විඤ්ඤාණය ප්‍රත්‍යයෙන් හටගන්නා දෙයක් බවයි." එය පැහැදිලි ව තේරුම් ගන්නා ආකාරය සැරියුත් තෙරුන් ගෙන් විමසූ විට උන්වහන්සේ උපමාවකින් එය තෝරා දුන්හ.

## එකට හේත්තු කළ බට මිටි දෙක

"ප්‍රිය ආයුෂ්මතුනි, බට මිටි දෙකක් එකිනෙකට හේත්තු කිරීමෙන් නොවැටෙන ලෙස සිටුවා තැබුවේ යයි සිතමු.

ප්‍රිය ආයුෂ්මතුනි, අන්න ඒ ආකාරයෙන් ම ය නාම-රූප හේතු කොට ගෙන විඤ්ඤාණය හටගන්නේ. විඤ්ඤාණය හේතු කොට ගෙන නාම-රූප හටගන්නේ. එවිට නාම-රූප හේතු කොට ගෙන ආයතන හය වේ. ආයතන හය හේතු කොට ගෙන ස්පර්ශය වේ... මේ ආකාරයට ය සමස්ත දුක් සියල්ලේ ම හට ගැනීම සිදුවන්නේ.

sinhalaebooks.com



## එකක් ඇද්දොත් අනිකත් වැටෙයි.

ප්‍රිය ආයුෂ්මතුනි, ඒ බට මිටි දෙකින් එකක් ඉවතට අදින්නේ නම් අනිත් බට මිටිය වැටෙන්නේ ම ය. එමෙන් ම අනිත් බට මිටිය ඉවතට අදින්නේ නම් ඊළඟ බට මිටිය වැටෙන්නේ ම ය.

ඒ ආකාරයෙන් ම ප්‍රිය ආයුෂ්මතුනි, නාම-රූප නිරුද්ධ වීමෙන් ය විඤ්ඤාණය නිරුද්ධ වන්නේ. එමෙන් ම විඤ්ඤාණය නිරුද්ධ වීමෙන් නාම-රූප නිරුද්ධ වේ. නාම-රූප නිරුද්ධ වීමෙන් ආයතන හය නිරුද්ධ වේ. ආයතන හය නිරුද්ධ වීමෙන් ස්පර්ශ නිරුද්ධ වේ... මේ ආකාරයට ය සමස්ත දුක් රැසේ ම නිරුද්ධ වීම සිදුවන්නේ''

(නළකළාපී සුත්ත – සං. නි. 02)

## යෝනිසෝ මනසිකාරය

විශේෂයෙන් ම භාග්‍යවත් බුදු සමිඳාණන් විසින් වදාරණ ලද ශ්‍රී සද්ධර්මය අවබෝධ කර ගනු කැමැති ශ්‍රාවකයා තුළ තිබිය යුතු ප්‍රධානතම සුදුසුකම වන්නේ යෝනිසෝ මනසිකාරයයි. යෝනිසෝ මනසිකාරය තුළින් ය යථාභූත ඥාණය ඇති වන්නේ. යථාභූත ඥාණයට උපකාරී වන අනෙක් ප්‍රධාන ධර්මය නම් සමාධිය යි.

සාගර ජලයේ පතුළට ම කිමිදී පිහිනනු කැමති කෙනෙකුට ඒ සඳහා ඔක්සිජන් ටැංකියකින් යුතු කිමිදුම් කට්ටලයක් අත්‍යවශ්‍ය වේ. ඒ තැනැත්තා සාගර ජලයේ ගැඹුරට කිමිදී ගොස් යළි ගොඩබිමට පැමිණ සාගර පතුලේ තොරතුරු කී විට එය අසා දැක ගැනීමේ කැමැත්ත තව කෙනෙකුට ඇති වෙයි. එවිට ඒ තැනැත්තා ද කළ යුත්තේ යට කී පරිදි කිමිදුම් කට්ටලයක් භාවිතා කොට සාගර ජලයේ කිමිදී තමා ඇසූ තොරතුරු තමා ගේ ම අත්දැකීමක් වශයෙන් දැක ගැනීම යි. එවිට එහි සත්‍යාසත්‍යතාව තමාට ම අවබෝධ කර ගත හැකි ය.

එහෙත් ඒ කිසිදු ආකාරයක මහන්සියක් නො දරා, වෙන කෙනෙක් පැවසුවොත් සාගර ජලයේ පතුළට යා නො හැකි බවත්, එහි

sinhalaebooks.com



ඔය ආකාරයේ කිසිවක් නැති බවත්, ඔහු සත්‍යවාදියෙක් නො වේ. ඔහු කටක් තිබෙන නිසා වචන තිබෙන නිසා කතා කරන කෙනෙක් පමණි. ඔහු එහි දී ප්‍රදර්ශනය කරන්නේ තමන් ගේ මෝඩකමත් මුරණ්ඩුකමත් පමණි.

එමෙන් ම බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රී සද්ධර්මය අවබෝධ කර ගැනීම පිණිස උන්වහන්සේ පෙන්වා වදාළ ක්‍රමෝපායයන් අනුගමනය කළ යුතු ම ය. සීලයත්, ඉන්ද්‍රිය සංවරයත්, යෝනිසෝ මනසිකාරයත්, සමාධියත් ඇති කර ගත යුතු ම ය. ඒ කිසිවෙකින් තොරව සම්බුදු දහම ගැන උඩින් පල්ලෙන් නොයෙක් දහම් පද අහුලා ගෙන උන්වහන්සේ ගේ මහාප්‍රඥාව හෑල්ලුවට ලක් කොට නිග්‍රහ කිරීමට ගත් ඉතා ම මෝඩ උත්සායන් ගැන තොරතුරු පානදුරා වාදයෙන් දැන ගත හැකි ය. එහිදී දාවිත් සිල්වා නම් පාදිලි තැන මේ පටිච්චසමුප්පාද ධර්මයට නින්දා කිරීම පිණිස යොදා ගත් තර්කයන් අපට දැක්ක හැකි ය.

## මිථ්‍යා දෘෂ්ටියේ තරම!

"මෙසේ එකිනෙකට විරුද්ධ වූ කීම් ඇති බුදුන් ගේ මේ ඉගැන්වීම කෙලෙස ද කීවොත් 'අප්පා නිසා පුතා උපදිනවා ය. පුතා නිසා අප්පා උපදිනවා ය', කීවා හා සමාන ය"

(සතරමහාවාදය – 149 පිට)

**අප්පා නිසා පුතා...**

අප්පා නිසා පුතාලා උපදින බව සැබෑ ය. ඒ පුතාලා ද අප්පලා වන දවසක් තිබේ. එසේ වන්නේ ඒ පුතාලා නිසා දරුවන් ලැබුන දාට ය. අප්පා නිසා උපදින පුතාලා වැඩිමහළු වී නමුත් දරුවන් හැදීමට කටයුතු නොකරත් නම් ඔවුන් ගේ පරපුර අභාවයට පත් වී යනු ඇත.

## ගෙඩි නිසා ගස්...

එමෙන් ම ගෙඩි නිසා ගස් හැදෙයි. ඒ නිසා ය යළිත් ගෙඩි හටගන්නේ. එහෙත් ඒ ගසේ කුඩා මුලක් වත් ඉතිරි නොකොට ඒ ගස මුළුමණින් ම උදුරා දමා කැබලි කැබලිවලට කපා දමා, වියළා දමා,

sinhalaebooks.com



සම්පූර්ණයෙන් ම පුළුස්සා දමා, අළු ටික ද සුළඟේ පා කොට හැරිය විට ඒ ගස හේතු කොට ගෙන ගෙඩි හට ගැනීම සහමුලින් ම නැති වී යයි. කොටින් ම ඒ ගස ද සහමුලින් ම අභාවයට පත් වූයේ ය. හේතූන් නිසා හටගන්නා වූ ඵලවල ස්වභාවයත් ඒ ආකාර ම වේ. හේතූන් හැදෙන විට ඒ හේතූන් නිසා ඵල ඇති වෙයි. ඒ හේතූන් නැති වන විට ඒ හේතූන් නිසා හටගන්නා වූ ඵල ද නැති වී යයි. ඒ හේතූන් සහමුලින් ම නැති වී ගිය විට, හේතූන් නිසා හටගන්නා වූ ඵල ද සහමුලින් ම නැති වී යයි.

පටිච්චසමුප්පාදය ගැන භාග්‍යවතුන් වහන්සේ විසින් පෙන්වන ලද ක්‍රමය අප ඉගෙන ගත යුත්තේ ද ඒ ආකාරයට ම ය. ඒ මුළු පටිච්චසමුප්පාදය ම හකුළා පඤ්චුපාදානස්කන්ධයක් වශයෙන් දේශනා කරන විට එය තේරුම් ගත යුත්තේ පටිච්චසමුප්පාදය වශයෙන් නොව පඤ්චුපාදානස්කන්ධ වශයෙන් ම ය. ධර්මස්වාමී වනාහී උන්වහන්සේ ය. අපි වනාහි උන්වහන්සේ ගේ ශ්‍රාවකයෝ වෙමු. එම නිසා අප නුවණින් විමසීමේ දී අප ගේ ශාස්තෘන් වහන්සේ පෙන්නා දුන් ක්‍රම ඔස්සේ මිස වෙනත් හිතුවක්කාර පිළිවෙලවල් ඔස්සේ ධර්මය විමසීමක් ශ්‍රාවකයන් තුළ නොමැත.

## විඤ්ඤාණය හටගන්නා හේතුව?

පටිච්චසමුප්පාද විස්තරයේ දී බුදුරජාණන් වහන්සේ “විඤ්ඤාණය හටගන්නා හේතුව වශයෙන් සංස්කාර” පෙන්වා දුන් තැන අපට හමු වේ. අප එය තේරුම් ගැනීමට මහන්සි ගත යුත්තේ උන්වහන්සේ අපට පෙන්වා දෙන ආකාරය අනුව ය.

## පටලවා නොගෙන තේරුම් ගන්න

“විඤ්ඤාණය ඇති වන්නේ කුමක් ඇති කල්හි ද? විඤ්ඤාණය හටගන්නේ කුමක් හේතු කොට ගෙන ද?”

sinhalaebooks.com



විඤ්ඤාණය ඇති වන්නේ සංස්කාර ඇති කල්හි ය. විඤ්ඤාණය හටගන්නේ සංස්කාර හේතු කොට ගෙන ය.”

(ගෝතම සූත්ත – සං. නි. 02)

## සංස්කාර නිසා විඤ්ඤාණය ඇති වේ

සංස්කාර යන වචනය පාළි භාෂාවේ “සංඛාර” යන පදයට අප විසින් දැන් භාවිත කරන වචනයයි. සංස්කාර යන වචනයේ හැඩය දෙස බලා බොහෝ දෙනෙක් “සකස් කිරීම” යන අර්ථයෙන් එය විස්තර කරත්.

එහෙත් සංඛාර යන වචනය විවිධ තේරුම් ඔස්සේ ධර්මය තුළ භාවිත වන බව අප දැන සිටිය යුතු ය.

පංච උපාදානස්කන්ධය විස්තර කරන තැන ද “සංඛාර” යන වචනය හමුවේ. ඒ ගැන භාග්‍යවතුන් වහන්සේ මෙසේ පවසන සේක.

## පංච උපාදානස්කන්ධයේ සංස්කාර වෙනස්

“පින්වත් මහණෙනි, සංස්කාර යනු මොනවා ද? පින්වත් මහණෙනි, එය වනාහී සය ආකාර වූ චේතනා සමූහයයි.

එනම් රූප සංචේතනාව ය. ශබ්ද සංචේතනාව ය. ගන්ධ සංචේතනාව ය. රස සංචේතනාව ය. පහස සංචේතනාව ය. (මනසේ ඇතිවෙන) අරමුණු සංචේතනාව ය.

පින්වත් මහණෙනි, මේවාට ය සංස්කාර කියා කියන්නේ. ස්පර්ශයේ හට ගැනීමෙන් සංස්කාරයෝ හටගනිත්. ස්පර්ශ නිරුද්ධ වීමෙන් සංස්කාර නිරුද්ධ වෙත්.”

(උපාදාන පරිවත්ත සූත්ත – සං. නි. 03)

මෙතැන දී ඉතාම පැහැදිලි ව “සංඛාර” යන වචනයට “චේතනාව” යන අර්ථය දී තිබේ. ඒ චේතනාව ද අවිද්‍යාසහගත වූ චේතනාවක් ය. මෙතැන විස්තර වන සංස්කාර හා පටිච්චසමුප්පාදයේ විස්තර වන සංස්කාරත් අතර පැහැදිලි වෙනසක් තිබේ. පළමුව අපි “චේතනාව” නම් වූ සංස්කාර තේරුම් ගනිමු.

sinhalaebooks.com



ඒ චේතනාව තුළ තිබෙන්නේ යළි යළිත් මේ භව පැවැත්ම සකස් වීම යි. එවිට ඒ තුළින් යළි යළිත් සකස් වෙන්නේ පංච උපාදානස්කන්ධයන් ම ය. එම නිසා එය භාග්‍යවතුන් වහන්සේ වදාළේ "අභිසංස්කරණයක්" වශයෙනි.

## අභිසංස්කරණ සංස්කාර!

"පින්වත් මහණෙනි, සංස්කාර යයි කියන්නේ කවර කරුණක් නිසා ද? පින්වත් මහණෙනි, සංඛතයක් අභිසංස්කරණය කරත් ය, යන අර්ථයෙන් ය, 'සංඛාර' යයි කියන්නේ.

කුමන සංඛතයක් ද අභිසංස්කරණය කරන්නේ?

පින්වත් මහණෙනි, රූපය නම් වූ සංඛතය යළිත් රූපය වීම පිණිස අභිසංස්කරණය කරති. වේදනාව නම් වූ සංඛතය යළිත් වේදනාවක් පිණිස අභිසංස්කරණය කරති. සඤ්ඤාව නම් වූ සංඛතය යළිත් සඤ්ඤාවක් පිණිස අභිසංස්කරණය කරති. සංස්කාර නම් වූ සංඛතය යළිත් සංස්කාරයන් පිණිස අභිසංස්කරණය කරත්. විඤ්ඤාණය නම් වූ සංඛතය යළිත් විඤ්ඤාණයක් පිණිස අභිසංස්කරණය කරත්. සංඛතයක් අභිසංස්කරණය කරත් ය, යන අර්ථය නිසා ම 'සංඛාර' යයි කියනු ලැබේ."

(ඛජ්ජනීය සුත්ත – සං. නි. 03)

"සංඛත" යනුවෙන් හඳුන්වන්නේ "හටගැනීමක් පෙනෙන, වැනසීමක් පෙනෙන, පවතින දේ තුළ වෙනස් වීමක් පෙනෙන දේවල් ය. රූප – වේදනා – සඤ්ඤා – සංඛාර – විඤ්ඤාණ යන පඤ්චුපාදානස්කන්ධයේ තිබෙන්නේ ද එම ලක්ෂණය පමණි. එම නිසා එයට "සංඛත" යයි කියනු ලැබේ. සංඛාරවලින් යළි යළිත් එය ම සකස් වන නිසා ය සංඛාරවලට අභිසංස්කරණ කරනවාය යන අදහස දී තිබෙන්නේ.

මේ අදහසට ම ගැළපී යන තවත් දේශනාවක් අපට දැක්ක හැකි ය.

sinhalaebooks.com



## අවිජ්ජාගත පුද්ගලයා ගේ සංස්කාර!

"පින්වත් මහණෙනි, අවිජ්ජාගත වූ මේ පුරුෂ පුද්ගලයා ඉදින් පුණ්‍ය සංස්කාරයක් අභිසංස්කරණය කරන්නේ නම් විඤ්ඤාණය පිනට අනුව සකස් වෙන්නේ වේ. ඉදින් අපුණ්‍ය සංස්කාරයක් අභිසංස්කරණය කරන්නේ නම් විඤ්ඤාණය පවට අනුව සකස් වෙන්නේ වේ. ඉදින් ආනෙඤ්ජ (රූප – අරූප ධ්‍යාන) සංස්කාරයක් අභිසංස්කරණය කරන්නේ නම් විඤ්ඤාණය ආනෙඤ්ජයට අනුව සකස් වෙන්නේ වේ."

(පරිවීමංසන සුත්ත – සං. නි. 02)

## තවත් සංස්කාර!

එමෙන් ම සංස්කාර යන වචනය වදාළ තවත් තැනක් අපට දැක්ක හැකි ය.

"පින්වත් මහණෙනි, කවර ආකාරයෙන් දැන ගන්නා විට ද කවර ආකාරයෙන් දැක ගන්නා විට ද මේ ජීවිතයේ දී ම ආශ්‍රවයන් ක්‍ෂය වීම වන්නේ?

පින්වත් මහණෙනි, මෙ කරුණෙහි ලා අශ්‍රැතවත් පෘථග්ජනයා 'රූපය ආත්මය වශයෙන් මුළාවෙන් දකී' පින්වත් මහණෙනි, එසේ මුළාවෙන් වූ යම් දැකීමක් වේ ද, එය සංස්කාරයකි. ඒ සංස්කාරය වනාහී කුමක් නිදාන කොට, කුමක් හේතු කොට, කුමක් ප්‍රභව කොට හටගත් දෙයක් ද?

පින්වත් මහණෙනි, අවිජ්ජා සහගත වූ ස්පර්ශයෙන් හටගත් විඳීමෙන් පහස ලබන අශ්‍රැතවත් පෘථග්ජනයාට හටගන්නා ව යම් තණ්හාවක් ඇත්ද, අන්න ඒ තණ්හාවෙන් ය ඒ සංස්කාරය හටගත්තේ.

මෙසේ පින්වත් මහණෙනි, ඒ සංස්කාරය ද අනිත්‍ය වූ දෙයකි. සංඛතයකි. හේතූන් ගෙන් හටගත් දෙයකි. ඒ තණ්හාව ද අනිත්‍ය වූ දෙයකි. සංඛතයකි. හේතූන් ගෙන් හටගත් දෙයකි. ඒ විඳීම ද අනිත්‍ය දෙයකි. සංඛතයකි. හේතූන් ගෙන් හටගත් දෙයකි. ඒ ස්පර්ශය ද අනිත්‍ය වූ දෙයකි, සංඛතයකි. හේතූන් ගෙන් හටගත් දෙයකි. ඒ

sinhalaebooks.com



අවිද්‍යාව ද අනිත්‍ය වූ දෙයකි. සංඛතයකි. හේතූන් ගෙන් හටගත් දෙයකි.

පින්වත් මහණෙනි, ඔය ආකාරයෙන් දැනගන්නා විට, ඔය ආකාරයෙන් දැක ගන්නා විට, මේ ජීවිතයේ දී ම ආශ්‍රවයන් ගේ ක්‍ෂයවීම වේ.''

(පාරිලෙය්‍යක සුත්ත – සං. නි. 03)

## සංස්කාර නැතිවීම!

මේ කියන ලද රූප – වේදනා – සඤ්ඤා – සංඛාර – විඤ්ඤාණ යන සංඛතයන් අභිසංස්කරණය කරන්නා වූ අවිද්‍යා සහගත චේතනාව ම ය මේ දේශනාවල සංස්කාර වශයෙන් හඳුන්වන්නේ. ඒ සංස්කාර නිරුද්ධ වීම ගැන ''විසංඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා'' වශයෙන් අපගේ ධර්මස්වාමී වූ බුදුසමිඳාණන් වදාළ උදන වාක්‍යයක් ද තිබේ.

භව පැවැත්ම සකස් වන ස්වභාවයෙන් සිත නිදහස් වීම ම යි ''විසංඛාර ගතං චිත්තං'' යනුවෙන් පෙන්වා තිබෙන්නේ. මෙම අර්ථය පටලවා ගත් සමහරුන් ''චිත්තය'' යනු සංඛතයක් නොව අසංඛතයක්! යයි කියමින් ශාස්වත දෘෂ්ටියට පැමිණෙමින් වාදාභිමුඛව ගෝරණාඩු කරන අයුරු ද වර්තමානයේ දක්නට ලැබේ. ඒ සියලු දෙනා ම කැරකෙන්නේ සක්කාය දිට්ඨිය තුළ ම ය.

සිත විමුක්තියට පත් වීම ම ය, තණ්හාවෙන් නිදහස් වීම ම ය ''විසංඛාර ගතං චිත්තං'' යනුවෙන් හඳුන්වන්නේ.

## විමුක්ත සිත

මහාකච්චාන තෙරුන් ඒ ගැන ඉතා ම සුන්දර විවරණයක් හාලිද්දිකානි ගෘහපතියාට ඉදිරිපත් කරන ලදී.

''පින්වත් ගෘහපතිය, රූප ධාතුව කෙරෙහි, වේදනා ධාතුව කෙරෙහි, සඤ්ඤා ධාතුව කෙරෙහි, සංඛාර ධාතුව කෙරෙහි, විඤ්ඤාණ ධාතුව කෙරෙහි යම් ඡන්දයක්, යම් රාගයක්, යම්

sinhalaebooks.com



ආශ්වාදයක්, යම් තණ්හාවක්, තණ්හා සහගත යම් බැසගැනීමක්, බැඳීයාමක්, සිතින් කරන ලද අදිටනක්, දෘෂ්ඨිගතික ව බැසගැනීමක්, අභ්‍යන්තරික ව කෙලෙස් සැඟවී පැවතීමක් වේ ද, ඒවා සියල්ල ගෙවී යාමෙන්, නො ඇලීමෙන්, නිරුද්ධ වීමෙන්, අත්හැරීමෙන්, දුරින් ම දුරු වීමෙන් 'චිත්තය' (සිත) විමුක්තියට පත්වූයේ යයි කියනු ලැබේ."

(දුතිය හාලිද්දිකානි සුත්ත – සං. නි. 03)

## ඉගෙන ගන්න පටිච්චසමුප්පාදයේ සංස්කාර

දැන් අප ඊළඟට දැන ගන්නට සූදානම් වන්නේ පටිච්චසමුප්පාදයේ "සංඛාර" යන වචනය තෝරා ඇති ආකාරය යි. මේ විස්තරය ද හොඳින් තේරුම් ගන්න.

"පින්වත් මහණෙනි, සංස්කාර යනු මොනවා ද? පින්වත් මහණෙනි, සංස්කාර තුනක් තිබේ. එනම් කාය සංස්කාර, වචී සංස්කාර, චිත්ත සංස්කාර වශයෙන් ය."

(විභංග සුත්ත – සං. නි. 02)

මෙම "සංස්කාර" ගැන ඉතා පැහැදිලි විස්තරයක් මජ්ඣිම නිකායේ පළමු වන කොටසට අයත් චූලවේදල්ල සූත්‍රයේ දක්නට ලැබේ.

## ආශ්වාස – ප්‍රශ්වාස, විතර්ක – විචාර, සඤ්ඤා – වේදනා

"පින්වත් ආර්යාවෙනි, කාය සංස්කාර යනු මොනවා ද? වචී සංස්කාර යනු මොනවා ද? චිත්ත සංස්කාර යනු මොනවා ද?

"පින්වත් ආයුෂ්මත් විශාඛ, කාය සංස්කාර කියන්නේ ආශ්වාස – ප්‍රශ්වාසයට යි. වචී සංස්කාර කියන්නේ විතර්ක – විචාරවලට ය. චිත්ත සංඛාර කියන්නේ සඤ්ඤා – වේදනාවලට ය."

"පින්වත් ආර්යාවෙනි, ආශ්වාස – ප්‍රශ්වාස කාය සංස්කාර වශයෙන් හඳුන්වන්නේ මක් නිසා ද? විතර්ක – විචාර වචී සංස්කාර වශයෙන් හඳුන්වන්නේ මක් නිසා ද? සඤ්ඤා – වේදනා චිත්ත සංස්කාර වශයෙන් හඳුන්වන්නේ මක් නිසා ද?"

sinhalaebooks.com



## බැඳී තිබෙන නිසා "සංස්කාර" කියයි.

"පින්වත් ආයුෂ්මත් විශාඛ, ආශ්වාස – ප්‍රශ්වාස අයත් වන්නේ කායට යි. ආශ්වාස – ප්‍රශ්වාස කය හා බැඳි (ඒතේ ධම්මා කාය පටිබද්ධා) තිබේ. එම නිසා ආශ්වාස – ප්‍රශ්වාසය කාය සංස්කාර නම් වේ.

පින්වත් ආයුෂ්මත් විශාඛ, කලින් ම විතර්ක කොට විචාර කොට (සිතුවිලි හසුරවා) පසුව යි වචන කථා කරන්නේ. එම නිස යි විතර්ක – විචාර වචී සංස්කාර වන්නේ.

සඤ්ඤා – වේදනා අයිති වන්නේ සිතට යි. සඤ්ඤා – වේදනා සිත හා බැඳී පවතී (ඒතේ ධම්මා චිත්ත පටිබද්ධා). එනිස යි සඤ්ඤා – වේදනා චිත්ත සංස්කාර වන්නේ."

(චූළ වේදල්ල සුත්ත – ම. නි. 01)

## පටිච්චසමුප්පාදය දකින්නා ධර්මය දකී.

යම් කෙනෙක් පටිච්චසමුප්පාදය අවබෝධ කරගැනීමෙන් අවබෝධ කරන්නේ දුක්ඛාර්ය සත්‍යය යි. එමෙන් ම පඤ්ච උපාදානස්කන්ධ අවබෝධ කර ගැනීමෙන් ද අවබෝධ කරන්නේ දුක්ඛාර්ය සත්‍යය යි.

වරක්, පංච උපාදානස්කන්ධය ආයතන ඔස්සේ හටගන්නා ආකාරය විස්තර කළ සැරියුත් තෙරණුවෝ තව දුරටත් මෙසේ පැවැසූහ.

"මේ ආකාරයට ය මේ පංච උපාදානස්කන්ධයන් ගේ එකට එකතු වීම, එකට මුසු වීම, එකට රැස්වීම සිදුවන්නේ. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ වදාරණ ලදී. 'යමෙක් පටිච්චසමුප්පාදය දකී නම්, ඔහු ධර්මය දකියි. යමෙක් ධර්මය දකී නම්, ඔහු පටිච්චසමුප්පාදය දකියි' යනුවෙනි. මේ පංච උපාදානස්කන්ධයන් ද පටිච්චසමුප්පන්න හෙවත් හේතු ප්‍රත්‍යයන් ගෙන් හටගත් දේවල් ය. මේ පඤ්චුපාදානස්කන්ධයන් කෙරෙහි යම් කැමැත්තක්, යම් ආලයක්,

sinhalaebooks.com



යම් සෙනෙහසක්, යම් බැස ගැනීමක් වේ ද, එය දුකේ හටගැනීම යි. මේ පඤ්චුපාදානස්කන්ධයන් කෙරෙහි තිබෙන ඡන්දරාගයේ යම් දුරු වීමක් වේ ද, ඡන්දරාගයේ යම් ප්‍රහාණයක් වේ ද, එය දුකේ නැතිවීම යි.''

(මහාහත්ථිපදෝපම සුත්ත – ම. නි. 01)

## නිරෝධ සමාපත්තිය

පටිච්චසමුප්පාදය විස්තර කරන ලද කාය සංස්කාර, වචී සංස්කාර, චිත්ත සංස්කාර යන සංස්කාර තුන ම ප්‍රායෝගිකව නිරුද්ධ වන සමාපත්තියක් ද තිබේ. එය හඳුන්වන්නේ නිරෝධ සමාපත්තිය වශයෙනි.

''පින්වත් ආර්යාවෙනි, සඤ්ඤා – විඳීම් නිරුද්ධ වන සමාපත්තියට සමවදින්නා වූ භික්ෂුවට කවර ධර්මයන් ද පළමුව නිරුද්ධ වන්නේ? කාය සංස්කාර ද, එසේත් නැති නම් වචී සංස්කාර ද, එසේත් නැතිනම් චිත්ත සංස්කාර ද?''

''පින්වත් ආයුෂ්මත් විශාඛ, සඤ්ඤා – විඳීම් නිරුද්ධ වන සමාපත්තියට සමවදින්නා වූ භික්ෂුවට පළමුවෙන් නිරුද්ධ වන්නේ වචී සංස්කාරයන් ය. ඊළඟට නිරුද්ධ වන්නේ කාය සංස්කාරයන් ය. ඊළඟට නිරුද්ධ වන්නේ චිත්ත සංස්කාරයන් ය.''

(චූළ වේදල්ල සුත්ත – ම. නි. 01)

මෙම විස්තර කිරීම් තුළින් ''සංස්කාර'' යන වචනයේ විවිධ තේරුම් තිබෙන බව දැන් අපට වටහා ගත හැකිය. දැන් අප කථා කළ නිරෝධ සමාපත්තියට සියලු දෙනාට ම සමවැදිය නො හැකි ය. ඒ තැනැත්තා පළමු කොට රූපාරූප ධ්‍යානයන් නේවසඤ්ඤානාසඤ්ඤා මට්ටම ට දියුණු කර ගත යුතු ය. එය කරන්නේ සමථය මුල් කොට ය. ඊ ළඟට විදර්ශනාවෙන් අනාගාමී ඵලය දක්වා දියුණු කොට තිබිය යුතු ය. ඒ තැනැත්තාටත්, එමෙන් ම විදර්ශනාවෙන් අරහත්වය දක්වා දියුණු කළ තැනැත්තාටත් පමණි නිරෝධ සමාපත්තියට සමවැදිය හැක්කේ. එම නිසා සමාධිය හතර වන ධ්‍යානය දක්වා පමණක් දියුණු කළ පඤ්ඤා විමුක්ත රහතන් වහන්සේට නිරෝධ සමාපත්තියට

sinhalaebooks.com



සමවැදිය හැකි බවක් ධර්මයේ සඳහන් නො වේ.

මෙය වරදවා තේරුම් ගැනීමෙන් ය සමහරුන් තුළ ශුෂ්ක විදර්ශනාවෙන් රහත් විය හැකි ය යන වැරදි මතය ඇති වී තිබෙන්නේ. ඔවුන් ගේ අදහසට අනුව හුදෙක් විදර්ශනාවෙන් අරහත් වීමට වත් සම්මා සමාධිය අවශ්‍ය නැත. ක්‍ෂණික සමාධිය නම් වූ කුමක්දෝ දෙයක් ගැන ඔවුහු පවසති. එහෙත් සම්මා සමාධිය ගැන සෑම දේශනයකම විස්තර වන්නේ ධ්‍යාන සතර ගැන ය. සමාධිස්කන්ධය පිණිස ආර්ය මාර්ගයේ සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන අංග තුනක් දක්වා තිබේ. සම්මා සමාධිය ප්‍රතික්‍ෂේප කළවිට මේ මාර්ග අංග තුන ම ප්‍රතික්‍ෂේප වේ. එවිට ආර්ය අෂ්ටාංගික මාර්ගය මාර්ගාංග පහක් දක්වා පහළ වැටේ.

ධ්‍යානවලින් තොරව අරහත් විය හැකි ය යන මතයේ භයානක කම මේ තුළින් මනාව තේරුම් ගත හැකිය.

## ධර්ම ගෞරවයෙන් ඉගෙන ගන්න.

මේ ආකාරයට ශ්‍රී සද්ධර්මයේ පැහැදිලිව කරුණු දක්වා තිබෙන නිසා පළමු කොට කළ යුත්තේ ධර්ම ගෞරවයෙන් යුතුව එම ධර්මය හොඳින් ඉගෙන ගැනීම යි. එසේ නැතිව තම තමන් හිතුවක්කාර විදියට ගොඩ නගා ගත් නොයෙකුත් තර්කයන් ඉස්මතු කොට පෙන්නීම පිණිස ධර්මය ඉගෙන නො ගත යුතු ය. එසේ උඩින් පල්ලෙන් බණ පද අහුලා ගෙන පණ්ඩිතමානීව, ධර්මධර විශාරදයන් ලෙස පෙනී සිටින්නට වෑයම් කරන බොහෝ දෙනා ගෙන් පැතිරෙන්නේ අධර්මය මිස ධර්මය නො වේ.

විශේෂයෙන් ම ශ්‍රී ලාංකික බෞද්ධ සමාජය වර්තමානයේ මුහුණ දෙන බලවත් ම අන්තරාය නම් මහායාන මතිමතාන්තර අගය කරමින්, මහායාන මතිමතාන්තර ම හුවා දක්වමින් ශ්‍රී සද්ධර්මයේ නියම අගය නො දකින ගිහි - පැවිදි උගතුන් බිහිවී සිටීමයි. පණ්ඩිතමානීව පෙනී සිටින මේ උදවිය මොන තරම් ථෙරවාද වේශයෙන් සිටියත්, ථෙරවාදීහු නොවෙත්. මහායානිකයෝ ම වෙති.

sinhalaebooks.com



මහායානය යනු "ස්වාක්ඛාත" ධර්මයක් නොවේ. "ස්වාක්ඛාත" යන්නෙහි තේරුම "භාග්‍යවතුන් වහන්සේ විසින් මුල – මැද – අග යහපත් කොට වදාරණ ලද, අර්ථ සහිත, ව්‍යඤ්ජන සහිත හෙවත් පැහැදිලි ප්‍රකාශන මාධ්‍යය සහිත, (සියලු කෙලෙසුන් ප්‍රහීණ වීම පිණිස පවතින) පරම පිවිතුරු උතුම් බඹසරට ය. එහෙත් මහායානය ස්වාක්ඛාත ධර්මයක් නොව "දුරාක්ඛාත" ධර්මයකි. හිතින් මවා ගන්නා ලද ලාභ ප්‍රයෝජන පතා ගෙන මහායාන සූත්‍රයන් අගය කරන්නට පටන් ගැනීම රත්‍රන් ළඟ තිබිය දී ඇළුමිණියම්වලින් කරන ලද ආභරණ සෙවීමක් වැන්න.

## සැරියුත් තෙරණුවෝ අනුශාසනා කරති!

වරක් සැරියුත් තෙරණුවෝ භික්ෂූන් වහන්සේලා පිරිසක් පශ්චිම දේශයට චාරිකාවේ වඩින්නට සූදානම් ව සිටිය දී උන්වහන්සේලාට මෙසේ අනුශාසනා කළහ.

## ධර්මය නිවැරදි ව ඉගෙන ගත්තා ද?

"ප්‍රිය ආයුෂ්මතුන් වහන්ස, භාග්‍යවත් බුදුරජාණන් විසින් වදාරණ ලද ඒ ශ්‍රී සද්ධර්මය ඔබලා විසින් මනා කොට අසා දැන ගෙන තිබේ ද? එසේ අසා දැනගත් ධර්මය මනා කොට ග්‍රහණය කරගෙන තිබේ ද? මනා කොට නුවණින් මෙනෙහි කොට තිබේ ද? මනා කොට ධාරණය කොට ගෙන තිබේ ද? මනා කොට නුවණින් අවබෝධ කරගෙන තිබේ ද?

## මේ ගැන සිතිය යුතුම යි.

ප්‍රිය ආයුෂ්මතුන් වහන්ස, ශ්‍රී සද්ධර්මය අන් අයට තෝරා දීමේ දී පහත දැක්වෙන කරුණු හතර ස්ථිර වශයෙන් ම තිබිය යුත්තේ ම ය.

I. එය භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලද ධර්මයක් ම විය යුතු යි.

II. (බුදු සමිඳුන් නොවදාළ දේ තම තමන් ගේ හිතුමතයේ පවසමින්) භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට අභූතයෙන්

sinhalaebooks.com



චෝදනා නො කරන දෙයක් විය යුතු යි.

III. බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලද ශ්‍රී සද්ධර්මයට මනා ලෙස ගැලපී යන දෙයක් ම විය යුතු යි.

IV. කරුණු සහිත ව කිසියම් වාදයක් නගා ගැරහීමක් කළ නො හැකි දෙයක් විය යුතු යි. (එනම් අසන්නා වූ ධර්මය ගැන ශ්‍රද්ධාව උපදවා ගෙන එම ධර්මයේ හැසිරෙන්නට සිතෙන දෙයක් විය යුතු යි.)"

(දේවදහ සුත්ත – සං. නි. 03)

දැන් අපි පටිච්චසමුප්පාදය ගැන සංස්කාර දක්වා ඉගෙන ගත්තෙමු. මෙම හේතු ඵල දහම මේ ආකාරයෙන් අවබෝධ වූයේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට ය. උන්වහන්සේ ගේ ශ්‍රාවකයන් වශයෙන් අප ද උන්වහන්සේ කියා දෙන ආකාරයෙන් ම ඉගෙන ගැනීමට තරම් නිහතමානී විය යුතු ය.

## සංස්කාර හටගන්නේ කුමක් නිසා ද?

"සංස්කාර ඇති වන්නේ කුමක් ඇති කල්හි ද? සංස්කාර හටගන්නේ කුමක් හේතු කොට ගෙන ද?

සංස්කාර ඇති වන්නේ අවිද්‍යාව ඇති කල්හි ය. සංස්කාර හටගන්නේ අවිද්‍යාව හේතු කොට ගෙන ය."

(ගෝතම සුත්ත – සං. නි. 02)

මෙම සංස්කාර හටගන්නේ අවිද්‍යාව හේතු කොට ගෙන බව භාග්‍යවතුන් වහන්සේ විසින් සොයා ගන්නා ලදී. එතැන් සිට භාග්‍යවතුන් වහන්සේ මෙම පටිච්චසමුප්පාද න්‍යාය ම මනාකොට පෙන්වා දෙන්නේ මෙසේ ය. එනම් අවිද්‍යාව හේතු කොට ගෙන සංස්කාර හටගනී. සංස්කාර... විඤ්ඤාණය හටගනී... නාම-රූප... ආයතන හය... ස්පර්ශය... විඳීම... ආශාව... බැඳීම... විපාක පිණිස කර්ම සකස් වීම (භවය)... ඉපදීම (අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික වශයෙන්) හටගනී. ඉපදීම හේතු කොට ගෙන ජරා මරණ

sinhalaebooks.com



සෝක වැළපීම් දුක්, දොම්නස්, සුසුම් හෙළීම් ආදිය හටගනී.

මේ ආකාරයෙන් ය මුළු මහත් දුක්ඛස්කන්ධයා ගේ ම හට ගැනීම සිදුවන්නේ (ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති).

මෙලෙසින් දක්වන ලද පටිච්චසමුප්පාදය තුළින් පෙන්වා තිබෙන්නේ සත්වයා ගේ සාංසාරික දුක සකස්වන ආකාරය ම ය.

මෙහි සඳහන් "අවිද්‍යාව" යනු සුළු පටු දෙයක් නොවේ.

## කුමක් ද මේ අවිද්‍යාව?

"පින්වත් මහණෙනි, කුමක් ද මේ අවිද්‍යාව? පින්වත් මහණෙනි, අවබෝධ කළ යුතු දුක්ඛාර්ය සත්‍යය ගැන ඤාණයක් නැත්තේ වේ ද, ප්‍රහාණය කළ යුතු දුක්ඛ සමුදයාර්ය සත්‍යය පිළිබඳ ව ඤාණයක් නැත්තේ වේ ද, සාක්ෂාත් කළ යුතු දුක්ඛ නිරෝධාර්ය සත්‍යය පිළිබඳ ඤාණයක් නොමැත්තේ වේ ද, ප්‍රගුණ කළ යුතු දුක්ඛ නිරෝධගාමිනී පටිපදා ආර්ය සත්‍යය පිළිබඳ ඤාණයක් නැත්තේ වේ ද, මෙය වනාහී 'අවිද්‍යාව' යයි කියනු ලැබේ."

(විභංග සුත්ත – සං. නි. 02)

## චතුරාර්ය සත්‍යාවබෝධය නැතිකම ම අවිද්‍යාව යි!

එසේ නම් "අවිද්‍යාව" යනු චතුරාර්ය සත්‍යය පිළිබඳ කිසි ම ආකාරයක අවබෝධයක් නොමැතිකම ය. ඒ අවිද්‍යාව තුළ පිහිටා සිටින නිසා, සාංසාරික සත්වයා ගේ සංස්කාර හටගන්නේ අවිද්‍යාව හේතු කොට ගෙන ය. එනම් ආශ්වාස – ප්‍රශ්වාස කරන්නේත් අවිද්‍යාව හේතු කොට ගෙන ය. විතර්ක – විචාර ඇති කර ගන්නේත් අවිද්‍යාව හේතු කොට ගෙන ය. සඤ්ඤා (හැඳිනීම්) – වේදනා (විඳීම්) හටගන්නේත් අවිද්‍යාව හේතු කොට ගෙන ය. එවිට මේ අවිද්‍යා සහගත සංස්කාර තිබෙනා තාක් චක්ඛු විඤ්ඤාණය හටගන්නේත් අවිද්‍යා සහගත ව ය. සෝත... ඝාණ... ජිව්හා... කාය... මනෝ විඤ්ඤාණය හටගන්නේත් අවිද්‍යා සහගතව ය. ඒ නිසා හටගන්නා (වේදනා – සඤ්ඤා – චේතනා – ඵස්ස – මනසිකාර යන) නාම මෙන් ම (සතර

sinhalaebooks.com



මහාභූත හා එයින් හටගත්) රූප හටගන්නේ ද අවිද්‍යා සහගතව ය. එසේ අවිද්‍යා සහගත නාම-රූපයෙන් සකස් වී තිබෙන ආයතන හය අවිද්‍යා සහගත වූ ම ලෝකයක් පිණිස සකස් වෙයි.

## සියලු දුක් දුරුවීමට අවිද්‍යාව ම දුරුවිය යුතු යි.

"පින්වත් මහණෙනි, මුදුන් වහළයක් ඇති ගෙයක මුදුන් ලී සියල්ල ම එකට එකතුවන මුදුන් කැණිමඩලක් (මුදුනේ පිහිටි තනි ලීය) වේ ද, ඒ කැණිමඩල ම පිහිට කොට ගෙන ය මුළු කූටාගාරය ම තිබෙන්නේ. එම කැණිමඩල බිඳීයාමෙන් ඒ සියල්ල ම විනාශයට පත්වෙයි.

ඒ ආකාරයෙන් ම පින්වත් මහණෙනි, අකුසල් මුල් යම් කිසිවක් තිබේ නම්, ඒ සියල්ල ම අවිද්‍යාව තුළට පැමිණ, අවිද්‍යාව ම පිහිට කොට තිබෙන්නේ වේ.

අවිද්‍යාව ම මුළුමණින් ම වැනසී යාමෙන් ඒ අකුසල් මුල් සියල්ල ම වැනසී යන්නේ ය.

(කූට සුත්ත – සං. නි. 02)

## බලවත් ම නීවරණය!

"පින්වත් මහණෙනි, මේ ආකාර වූ වෙනත් එක ම නීවරණයක් වත් මම නො දකිමි. යම් නීවරණයකින් වැසී ගිය මේ සත්ව ප්‍රජාව බොහෝ කලක් මුළුල්ලේ සංසාරයෙහි නොයෙක් ආකාරයෙන් සැරිසරත් නම්, පින්වත් මහණෙනි, එය වනාහී මේ අවිද්‍යා නීවරණය යි. පින්වත් මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී ගියා වූ මේ සත්ව ප්‍රජාව බොහෝ කලක් මුළුල්ලෙහි මේ සංසාරයෙහි නොයෙක් ආකාරයෙන් සැරිසරමින් සිටිත්."

(අවිජ්ජා නීවරණ සුත්ත – ඉති වුත්තක)

sinhalaebooks.com



## අවිද්‍යාවෙන් වැසී ගිය ජීවිත

අප ගේ ජීවිත සියල්ල ම සසර දුකට වැටී තිබෙන්නේ හේතු සහිත ව මිස හේතු රහිත ව නො වේ. යම් තාක් කල් සංසාරයේ ඉපදීම පිණිස හේතු සකස් වන්නේ ද, ඒ තාක් කල් ම අනන්ත දුක් දොම්නස් විඳින්නට සිදු වේ. එම හේතූන් නසා දැමූ විට යළි යළිත් සංසාරය සකස් වීම නවතින්නේ ය. "අවිද්‍යාව" ගැන වුවත් අප තේරුම් ගත යුත්තේ පටන් ගත් තැන සෙවීම නො වේ. අවිද්‍යාව නොනැසී පවතින්නා වූ හේතුව සෙවීම යි. දැන් අප තුළ අවිද්‍යාව තිබේ නම් සමස්ත පටිච්චසමුප්පාදය ම අප තුළ ක්‍රියාත්මක වේ.

## පටන් ගත් තැන සෙවීම

"පින්වත් මහණෙනි, 'මීට පෙර අවිද්‍යාව තිබුනේ නැත. අවිද්‍යාව බිහිවුනේ මෙතැනින් පසුව යයි' අවිද්‍යාවේ ආරම්භක කෙළවරක් පෙන්වා දිය නො හැක්කේ ය. පින්වත් මහණෙනි, මේ ගැන මේ ආකාරයෙන් කියනු ලැබේ. එසේ නමුත් 'අවිද්‍යාව වනාහී හේතූන් නිසා හටගත් දෙයකැ'යි පෙන්වා දිය හැක.

## අවිද්‍යාවේ ආහාර

පින්වත් මහණෙනි, මම අවිද්‍යාව ද ආහාර සහිත යයි කියමි. ආහාර රහිත යයි නො කියමි. අවිද්‍යාව පෝෂණය වන දෙය (ආහාර) කුමක් ද? එයට කිව යුත්තේ පඤ්ච නීවරණ කියා ය."

(අවිජ්ජා සුත්ත – අං. නි. 10 නිපාත)

## මිථ්‍යා මාර්ගය පටිච්චසමුප්පාදය යි

මෙම අවිද්‍යාව මුල් කොට ගත් පටිච්චසමුප්පාදය භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් හඳුන්වා දී තිබෙන්නේ මිථ්‍යා මාර්ගය වශයෙන් ය. ඉතින්, යම් ජීවිතයක් තුළ මිථ්‍යා මාර්ගයක් තිබේ නම් එය ඉතාමත් අනතුරුදායක වේ. මිථ්‍යා මාර්ගයකින් සැපතක්, ආරක්ෂාවක්, සැනසිල්ලක් ලබාගත නො හැකි ය. මිථ්‍යා මාර්ගය දුරින් ම දුරු කළ යුතු ය. මේ සඳහා එම මිථ්‍යා වැඩ පිළිවෙළ වන පටිච්චසමුප්පාදය

sinhalaebooks.com



සකස් වන ආකාරයත් නැති වී යන ආකාරයත් තේරුම් ගත යුතු ම ය. එවිට යි එයින් නිදහස් විය හැක්කේ.

## අවබෝධ කර ගැනීමෙන් නිදහස් වෙයි!

“පින්වත් මහණෙනි, අවබෝධ ඤාණය ඇති වීමට වුවමනා කරන්නා වූ කරුණු හතළිස් හතරක් ගැන ඔබට දැන් කියා දෙන්නෙමි. එය අසා දැන ගන්න. මනා කොට නුවණින් සිහි කරන්න. පවසන්නෙමි.

පින්වත් මහණෙනි, අවබෝධ ඤාණය ඇති වීමට වුවමනා කරන්නා වූ කරුණු හතළිස් හතර මොනවා ද?

## එකක් සතර බැගින් අවබෝධ කරන්න

I. ජරා මරණ පිළිබඳ අවබෝධ ඤාණය

II. ජරා මරණ හටගන්නේ කුමක් නිසා ද යන්න ගැන අවබෝධ ඤාණය

III. ජරා මරණ නැතිවීම ගැන අවබෝධ ඤාණය

IV. ජරා මරණ නැතිවීම පිණිස ප්‍රගුණ කළ යුතු වැඩ පිළිවෙළ ගැන අවබෝධ ඤාණය

මේ ආකාරයට පටිච්චසමුප්පාදයේ අනික් අංග ගැනත් එකක් එකක් ගානේ ම තේරුම් කරගත යුතු ය. එනම් 1. ජරාමරණ 2. ජාති (ඉපදීම) 3. භවය (විපාක පිණිස කර්ම සකස් වීම) 4. උපාදාන (බැඳීයාම) 5. තණ්හාව (ආශාව) 6. වේදනා (විඳීම) 7. ස්පර්ශය (කරුණු තුනක එකතුවීම) 8. සළායතන (ආයතන හය) 9. නාම-රූප (වේදනා – සඤ්ඤා – චේතනා – ඵස්ස – මනසිකාර, සතර මහා භූතයන් ගෙන් හටගත් දේ) 10. විඤ්ඤාණය 11. සංස්කාර (ආශ්වාස – ප්‍රශ්වාස, විතර්ක – විචාර, සඤ්ඤා – වේදනා) යන මේවා ගැනයි කලින් පෙන්වා දුන් සතර ආකාරයෙන් තේරුම් ගත යුත්තේ. එවිට මේ අවබෝධය හතලිස් හතර ආකාරයක් වේ. මේ අවබෝධ ඤාණය හඳුන්වා තිබෙන්නේ “ධම්මේ ඤාණය” වශයෙනි (ඉදමස්ස ධම්මේ

sinhalaebooks.com



ඤාණං). මේ තුළින් ඒ තැනැත්තාට ඇති වී තිබෙන්නේ චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධ ඤාණය යි.

## මෙය ධම්මේ ඤාණය යි!

"මෙය වනාහී ඔහු ගේ ධම්මෙ ඤාණය යි. ඒ තැනැත්තා විසින් එසේ දැක ගන්නා ලද, අවබෝධ කරන ලද, අකාලික වූ, පැමිණෙන ලද, බැස ගන්නා ලද මේ ධර්මය පිළිබඳ ඤාණයෙන් අතීතය ගැනත් අනාගතය ගැනත් මෙම ආර්ය න්‍යාය ම අවබෝධ කර ගනී (සෝ ඉමිනා ධම්මේන දිට්ඨේන, විදිතේන, අකාලිකේන, පත්තේන, පරියෝගාළ්හේන, අතීතානාගතේන නයං නේති).

## මෙය අකාලික යි!

අතීතයේ යම්කිසි ශ්‍රමණවරු හෝ බ්‍රාහ්මණවරු හෝ වෙත්වා, ජරාමරණ ගැන අවබෝධ කළාහු නම්, ජරාමරණ හටගන්නා ආකාරය අවබෝධ කළාහු නම්, ජරාමරණ නැති වී යාම ගැන අවබෝධ කළාහු නම්, ජරාමරණ නැතිවීමේ ප්‍රතිපදාව ගැන අවබෝධ කළාහු නම්, දැන් මම යම් ආකාරයෙකින් අවබෝධ කරයි නම්, අන්න ඒ ආකාරයෙන් ම ය.

එමෙන් ම අනාගතයේ යම්කිසි ශ්‍රමණවරු හෝ බ්‍රාහ්මණවරු හෝ ජරාමරණ ගැන අවබෝධ කරන්නාහු නම්, ජරාමරණ හටගන්නා වූ ආකාරය අවබෝධ කරන්නාහු නම්, ජරාමරණ නැතිවීම ගැන අවබෝධ කරන්නාහු නම්, ජරාමරණ නැතිවීමේ ප්‍රතිපදාව ගැන අවබෝධ කරන්නාහු නම් දැන් මම යම් ආකාරයකින් අවබෝධ කරම් නම් අන්න ඒ ආකාරයෙන් ම ය. මෙය වනාහී ඔහුගේ අන්වයේ ඤාණයයි (ඉදමස්ස අන්වයේ ඤාණං).

පින්වත් මහණෙනි, ආර්ය ශ්‍රාවකයා හට යම් කලෙක මේ ඤාණ දෙක, ඉතා පිරිසිදු ලෙස, පැහැදිලි ලෙස ප්‍රත්‍යක්ෂ වෙයි ද, එනම් මේ ධම්මේ ඤාණයත්, අන්වයේ ඤාණයත් ගැන,

පින්වත් මහණෙනි, මේ ආර්යශ්‍රාවකයා සම්මාදිට්ඨියෙන් යුක්ත වූයේ යයි ද සම්‍යක් දර්ශනයෙන් යුක්ත වූයේ යයි ද, මේ

sinhalaebooks.com



සද්ධර්මයට පැමිණියේ යයි ද, මේ සද්ධර්මය දැකගත්තේ යයි ද, සේඛ ඤාණයෙන් යුක්ත වූයේ යයි ද, සේඛ විද්‍යාවෙන් යුක්ත වූයේ යයි ද, දහම් සැඩපහරට පැමිණියේ යයි ද, ආර්ය වූ කළකිරීමේ ප්‍රඥාවෙන් යුක්ත වූවෙක් යයි ද, අමා දොරටුවේ හැපී සිටින්නේ යයි ද කියනු ලැබේ.”

(ඤාණවත්ථු සුත්ත – සං. නි. 02)

මේ දේශනාවෙන් එක දෙයක් ඉතා ම පැහැදිලිව තේරුම් ගත හැකි ය. එනම් එය කාලානුරූපව වෙනස් නොවන්නා වූ සත්‍යයක් බව යි. අතීතයේ පහල වූ සියලු බුදුවරයන් වහන්සේලා ද අනාගතයේ පහළ වන සියලු බුදුවරයන් වහන්සේලා ද අවබෝධ කරගන්නේ වර්තමානයේ අපගේ බුදුසමිඳුන් අවබෝධ කොට වදාළ ධර්මය මිස වෙන දෙයක් නො වේ.

## කාලවලට නො බෙදන්න!

ඇතැම් බෞද්ධ පොත්පත්වල පටිච්චසමුප්පාදය විස්තර වන්නේ සද්ධර්මයේ සඳහන් වන ආකාරයට නො වේ. පසුකාලීන ග්‍රන්ථ වන විසුද්ධි මාර්ගය වැනි පොත්පත්වල පටිච්චසමුප්පාද – අතීත – අනාගත – වර්තමාන වශයෙන් කොටස් තුනකට බෙදා දක්වයි. එනම් අතීත හේතු පහයි. වර්තමාන ඵල පහයි. වර්තමාන හේතු පහයි. අනාගත ඵල පහයි වශයෙනි. එහෙත් කිසි ම බුද්ධ දේශනාවක මෙවැනි බෙදීමක් පෙන්වා දී නැත. මෙය පටිච්චසමුප්පාදය අවබෝධ කරගැනීමේ හැකියාව අවුලෙන් අවුලට පත්කරවන ක්‍රමයකි. හිතුවක්කාර පිළිවෙලවල් ඔස්සේ ධර්මය විග්‍රහ කරන්නට යාමෙන් හටගත් අධර්මයක් හැටියට මෙය සැලකිය හැකි ය.

එහෙත් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාදය පෙන්වා දෙන්නේ සියලු කාලයට ම පොදු වූ ධර්මතාවක් වශයෙනි. ධර්ම නියාමයක් වශයෙනි. පටිච්චසමුප්පාදය අවබෝධ කරගත යුත්තේ කාලවලට කොටස් කිරීමෙන් නො වේ. “හැම කාලයක ම පවතින්නේ මෙම ධර්ම නියාමය ම යයි” අවබෝධ කර ගැනීමෙනි.

sinhalaebooks.com



ඒ සඳහා උපකාරී වන ඉතා වටිනා දේශනාවක් අපට හමු වේ.

## ඤාණ හැත්තෑහතක්!

"පින්වත් මහණෙනි, අවබෝධ ඤාණය ඇති කරවන කරුණු හැත්තෑහතක් (සත්තසත්තති ඤාණවත්ථූනි) ගැන ඔබට දැන් කියා දෙන්නෙමි... පින්වත් මහණෙනි, කුමක් ද ඒ ඤාණවත්ථු හැත්තෑහත?"

එකක් හත බැගින්

I. ජරා මරණ ඇති වන්නේ ඉපදීම හේතු කොට ගෙන බව අවබෝධ කරගැනීම ඤාණයකි.

II. ඉපදීමක් නැත්නම් ජරාමරණ නැති බව අවබෝධ කර ගැනීම ඤාණයකි.

III. අතීත කාලයේ ද ජරාමරණ හටගත්තේ ඉපදීම හේතු කොට ගෙන බව අවබෝධ කර ගැනීම ඤාණයකි.

V. අතීතයේ ද ඉපදීම නැතිවීමෙන් ජරාමරණ නැති වූ බව අවබෝධ කරගැනීම ඤාණයකි.

VI. අනාගත කාලයේ ද ජරාමරණ හටගන්නේ ඉපදීම හේතු කොට ගෙන බව අවබෝධ කරගැනීම ඤාණයකි.

VII. අනාගත කාලයේ ද ඉපදීම නැතිවීමෙන් ජරාමරණ නැති වී යන බව අවබෝධ කරගැනීම ඤාණයකි.

VIII. මේ හේතුඵල ධර්ම ස්වභාවයේ පැවැත්ම අවබෝධ කර ගැනීම නම් වූ ඤාණයක් ඇත් ද, එය ද ක්ෂය වී යන දෙයකි. වැනසී යන දෙයකි. ඇල්ම දුරු කළ යුතු දෙයකි. ඇල්ම නිරුද්ධ කළ යුතු දෙයකි. වශයෙන් අවබෝධ කර ගැනීම ද ඤාණයකි.

(දුතිය ඤාණවත්ථු සුත්ත – සං. නි. 02)

sinhalaebooks.com



## තුන් කාලයට ම එකම න්‍යාය යි!

විශේෂයෙන් මේ පටිච්චසමුප්පාද දේශනයේ සඳහන් කරුණු කාලවලට බෙදන්නට යාමෙන් ඇති වී තිබෙන අවුල සුළු පටු නො වේ. ඔවුන් "විඤ්ඤාණය" හැටියට ගණන් ගන්නේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය යි. එහෙත් "ප්‍රතිසන්ධි විඤ්ඤාණය" යන වචනය වත් මූලික බුද්ධ දේශනාවන් වන සූත්‍ර දේශනාවල නැත! කොටින්ම කාල තුනට බෙදීම තර්කයක් වශයෙන් මිස අවබෝධයකට ගළපා ගත නො හැකි ය. අවබෝධයකට ගළපා ගත හැක්කේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් කාල තුන තුළ ම එක ම අයුරින් සම්පූර්ණ පටිච්චසමුප්පාදය ම අවබෝධ කරගන්නා ආකාරය පෙන්වා දුන් "දුතිය ඤාණවත්ථු" සූත්‍රයෙන් ය.

## අතීතයටත් එකම න්‍යාය යි!

දැන් මේ පෙන්වා දුන් ක්‍රමය ඔස්සේ පටිච්චසමුප්පාදයේ අනිත් අංගත් ගලපා බලන්න. එවිට කාල තුනකට කොටස් කර පටිච්චසමුප්පාදය විස්තර කිරීමේ ක්‍රමය කොතරම් අසාර්ථක දැයි ඔබට ම ප්‍රත්‍යක්ෂ වනු ඇත. එවිට අතීතයේ ද ඉපදුනේ භවය හේතු කොට ගෙන ය. අතීතයේ ද භවය හටගත්තේ උපාදාන හේතු කොට ගෙන ය. අතීතයේ ද උපාදාන හටගත්තේ තණ්හාව හේතු කොට ගෙන ය. අතීතයේ ද තණ්හාව හටගත්තේ විඳීම හේතු කොට ගෙන ය. අතීතයේ ද විඳීම හටගත්තේ ස්පර්ශය හේතු කොට ගෙන ය. අතීතයේ ද ස්පර්ශය හටගත්තේ ආයතන හය හේතු කොට ගෙන ය. අතීතයේ ද ආයතන හය හටගත්තේ නාම-රූප හේතු කොටගෙන ය. අතීතයේ ද නාම-රූප හටගත්තේ විඤ්ඤාණය හේතු කොටගෙන ය. අතීතයේ ද විඤ්ඤාණය හටගත්තේ සංස්කාර හේතු කොට ගෙන ය. අතීතයේ ද සංස්කාර හටගත්තේ අවිද්‍යාව හේතු කොට ගෙන ය.

අතීතයේ ද අවිද්‍යාව නැති වීමෙන් සංස්කාර නැති විය... මේ ආකාරයට අනාගතයටත් ගළපා බලන විට පටිච්චසමුප්පාදය වඩ වඩාත් හොඳින් තේරුම් ගත හැකි ය.

sinhalaebooks.com



## නව මහා විදර්ශනා ඤාණ?

එමෙන් ම වර්තමානයේ නව මහා විදර්ශනා ඤාණ නාමයෙන් භාවිත වන හංග ඤාණ, හය ඤාණ ආදී ඤාණ පිළිවෙලක් කිසි ම බුද්ධ දේශනයක අපට හමු වී නැත. මූලික බුද්ධ දේශනාවකට අයත් නො වන කරුණු පිරිසිදු බුද්ධ වචනයක් වශයෙන් එක එල්ලේ පිළිගැනීමට පෙර විමසා බැලීම සුදුසු බව අප සිහි තබා ගත යුතු ය. අප කාහටත් අවශ්‍ය වන්නේ සත්‍යය මිස සත්‍යය මෙන් පෙනෙන වෙනත් දේවල් නොවේ.

## ධර්මය හඳුනාගන්නා හැටි

බුද්ධ වචනයක් වශයෙන් යමෙක් යම් දෙයක් පවසත් නම්, එහිලා කළ යුතු හොඳ ම දෙය වන්නේ එය මූලික බුද්ධ දේශනාවකට ගළපා බැලීම යි. විනයෙහි ලා සසඳා බැලීම යි. එවිට එය සූත්‍ර දේශනා සමඟ මනා කොට ගැළපේ නම් පමණක්, විනය සමඟ මනා කොට සැසඳේ නම් පමණක් “මෙය වනාහී අපගේ ධර්මස්වාමී වූ ඒ භාග්‍යවත් බුදු සම්දාණන් ගේ ශ්‍රී සද්ධර්මය යයි” ඉතා ප්‍රීතියෙන් යුතුව පිළිගත යුතු ය.

## අධර්මය බැහැර කළ යුතු ය.

එහෙත් යම් ධර්මයක් සූත්‍ර දේශනාවලට බහා බලද්දී නො ගැළපේ නම්, විනයෙහි ලා සසඳද්දී නො සැසඳේ නම් එය බැහැර කළ යුතු ම ය. “මෙය වනාහී අපගේ ධර්මස්වාමී වූ ඒ භාග්‍යවත් බුදුසමිඳුන් ගේ ධර්මය වේශයෙන් තිබෙන අධර්මයක් යයි” සලකා බැහැර කළ යුතු ය. කෙනෙකුට එම කාර්යය ඉතා ම නිවැරදි ආකාරයට කළ හැකි වන්නේ බුදුන් වදාළ ධර්මය පිරිසිදු ලෙස දන්නේ නම් පමණි. එම සද්ධර්මය මහායාන සූත්‍රවල නැත. පසුකාලීන ග්‍රන්ථවල ද නැත. ආකාශයේ ද රැඳී නැත. ඒ උතුම් ශ්‍රී සද්ධර්මය ජීවමානව වැඩ සිටින්නේ දීඝ නිකාය, මජ්ඣිම නිකාය, අංගුත්තර නිකාය, සංයුක්ත නිකාය යන උතුම් ධර්ම පුස්තකවලත්, ඛුද්දක නිකායේ ධම්ම පද, උදාන, ඉතිවුත්තක, සුත්ත නිපාත, ථේරථේරී ගාථා, විමාන වත්ථු,

sinhalaebooks.com



පේත වත්ථු, ජාතක ගාථාවලය. එමෙන් ම විනය පිටකයේ පාරජිකා පාළි, පාචිත්තය පාළි, මහාවග්ග පාළි, චුල්ලවග්ග පාළි, පරිවාර පාළි යන උතුම් විනය ග්‍රන්ථවල ය.

## ශ්‍රී සද්ධර්මය මෙන්න!

"ස්වාක්ඛාතෝ භගවතෝ ධම්මෝ" යයි අප ගෞරවාදර දක්වන්නේ ඒ ශ්‍රී සද්ධර්මයට යි. "ස්වාක්ඛාත" යන වචනයේ තේරුම "ඉතාම සොඳුරු ලෙස දේශනා කරන ලද" යන්න ය. මේ ලෝකයේ ස්වාක්ඛාත ධර්මයකට තිබෙන්නේ අප ගේ බුදු සමිඳුන් වදාළ ධර්මය පමණි. ඒ ධර්මයට "ස්වාක්ඛාත" යයි කියන්නේ මේ නිසා ය. එනම් අපගේ බුදු සමිඳුන් විසින් වදාරණ ලද මේ ශ්‍රී සද්ධර්මයේ පටන් ගැනීමත් ඉතාමත් යහපත් ය (ආදි කල්‍යාණං). මැදත් ඉතා ම යහපත් ය (මජ්ඣේ කල්‍යාණං). අවසානයත් ඉතාම යහපත් ය (පරියෝසාන කල්‍යාණං). ඉතා ම අර්ථ පූර්ණ වේ (සාත්ථං). ඉතා ම පිරිසිදු ප්‍රකාශන මාධ්‍යයකින් ද යුක්ත වේ (සබ්‍යඤ්ජනං). ඉතාමත් පවිත්‍ර වූ පරිපූර්ණ වූ අරහත්වය නම් වූ පාරිශුද්ධ බ්‍රහ්මචරිය උගන්වයි (කේවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදති) .

මේ නිසා ධර්මය, ධර්මය වශයෙන් තෝරා බේරා ගැනීමට තරම් අප භාග්‍යවන්ත විය යුතු ය. එසේ නොවුනහොත් මේ ජීවිතයේදීත් සද්ධර්මය අවබෝධ කරගැනීමේ උත්තරීතර අවස්ථාව අපට අහිමි වී යනු ඇත!

## පාඩම් කර ගනිමු!

පටිච්චසමුප්පාදය පාළි භාෂාවෙන් ද කටපාඩම් කරගෙන දරා ගන්න. අර්ථ විස්තර ද මනා කොට ගළපා ගන්න. ටිකෙන් ටික ඔබේ වටහා ගැනීමේ හැකියාව දියුණු වී යනු ඇත.

sinhalaebooks.com



## පටිච්චසමුප්පාද පාළි

"අවිජ්ජා පච්චයා සංඛාරා

සංඛාර පච්චයා විඤ්ඤාණං

විඤ්ඤාණ පච්චයා නාමරූපං

නාමරූප පච්චයා සළායතනං

සළායතන පච්චයා ඵස්සෝ

ඵස්ස පච්චයා වේදනා

වේදනා පච්චයා තණ්හා

තණ්හා පච්චයා උපාදානං

උපාදාන පච්චයා භවෝ

භව පච්චයා ජාති

ජාති පච්චයා ජරාමරණං, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්සුපායාසා සම්භවන්ති. එවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති."

## එය සිංහලෙන් ද පාඩම් කරගන්න.

"අවිද්‍යාව හේතු කොට ගැන සංස්කාර ඇති වේ.

සංස්කාර හේතු කොට ගෙන විඤ්ඤාණය ඇති වේ.

විඤ්ඤාණය හේතු කොට ගෙන නාම-රූප ඇති වේ.

නාම-රූප හේතු කොට ගෙන ආයතන හය ඇති වේ.

ආයතන හය හේතු කොට ගෙන ස්පර්ශය ඇති වේ.

ස්පර්ශය හේතු කොට ගෙන විඳීම ඇති වේ.

විඳීම හේතු කොට ගෙන ආශාව ඇති වේ.

ආශාව හේතු කොට ගෙන බැඳීම ඇති වේ.

බැඳීම හේතු කොට ගෙන විපාක පිණිස කර්ම සකස් වේ.

විපාක පිණිස කර්ම සකස් වීම හේතු කොට ගෙන ඉපදේ.

sinhalaebooks.com



ඉපදීම හේතු කොට ගෙන ජරා මරණ, ශෝක, වැළපිම්, දුක්, දොම්නස්, සුසුම් හෙළීම් හටගනී.

මේ ආකාරයෙන් ය මුළු මහත් දුක් රැසේ ම හට ගැනීම සිදුවන්නේ.”

මේ පටිච්චසමුප්පාද ධර්මය අපගේ බුදුරජාණන් වහන්සේට අවබෝධ වූ මොහොතේ ඇති වූ හැඟීම මෙසේ පෙන්වා දී තිබේ.

“පින්වත් මහණෙනි, දුකේ හට ගැනීම! දුකේ හට ගැනීම! කියා මේ ගැන මා හට පෙර කිසිදා නො ඇසූ විරූ මේ ධර්මයන් ගැන දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.”

(ගෝතම සූත්ත – සං. නි. 02)

## පටිච්චසමුප්පාදය අනිත්‍යයි!

පටිච්චසමුප්පාදය යනු අනිත්‍ය වූ හේතූන් ගෙන් සකස් වූ දෙයක් මිස වෙනත් කිසි ම නිත්‍ය දෙයක් නැත. මේ සා දීර්ඝ කාලයක් මුළුල්ලේ යම් සත්වයෙක් සසරේ වැටී සිටී නම් එහි හේතුව දිගින් දිගට ම පටිච්චසමුප්පාදය සකස් වීම මිස වෙන කිසිම හේතුවක් නො වේ.

“දුකේ හට ගැනීම” වශයෙන් අපගේ ධර්මස්වාමී වූ බුදු සමිඳුන් අවබෝධ කොට වදාළේ පටිච්චසමුප්පාදය යි.

එසේ නම් “දුකේ නැතිවීම” තිබෙන්නේ පටිච්චසමුප්පාදය නැති තැන ය. හේතූන් නිසා නම් ඵල හටගන්නේ හේතූන් නැති වීමෙන් ඵල නැති වී යාම ස්වභාව සිද්ධියකි. දැන් උන්වහන්සේ නුවණින් විමසන්නේ පටිච්චසමුප්පාදය නැති වී යන ක්‍රමය යි.

## පටිච්චසමුප්පාදයත් නිරුද්ධ වෙයි!
## ජරාමරණ නැතිවෙයි!

“ජරාමරණ නැත්තේ කුමක් නැති විට ද? ජරාමරණ නිරුද්ධ වී යන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?”

sinhalaebooks.com



උන්වහන්සේ ගේ අසිරිමත් ප්‍රඥාව සකල විධ ඝනාන්ධකාරය ම නසාලන්නට සමත් එක ම ආලෝකය විය.

"ජරාමරණ නැති වන්නේ අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික යන මේ සතර ආකාරයේ ම ඉපදීම නැති කල්හි ය. ජරාමරණ නිරුද්ධ වන්නේ ඉපදීම නිරුද්ධ වීමෙන් ය."

ජරාමරණ හටගන්නේ ඉපදීම හේතු කොට ගෙන නිසා ජරාමරණ නැතිවීම පිණිස ඉපදීම නැති විය යුතු ම ය.

## ඉපදීමත් නැතිවෙයි!

"ඉපදීම නැතිවන්නේ කුමක් නැති විට ද? ඉපදීම නිරුද්ධ වන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?"

මෙම ප්‍රශ්නය ලෝක සත්වයා ගේ සැබෑම වූ දැවෙන ප්‍රශ්නයයි. එහෙත් ඔවුහු ඒ බව නොදනිති. මේ ප්‍රශ්නය විසඳා ගත් විට සියලුම ප්‍රශ්න විසඳී යන්නේ ය.

"ඉපදීම නැතිවන්නේ කාම – රූප – අරූප යන ධාතුවල විපාක විඳීම පිණිස කර්ම සකස් වීම නැති වූ විට ය. එනම් කාම – රූප – අරූප යන භවය නැතිවිට ය. ඉපදීම නිරුද්ධ වන්නේ භවය නිරුද්ධ වීමෙන් ය."

## භවය ද නැති වෙයි!

"භවය" ද සකස් වන්නේ හේතුවක් නිසා ය. එම නිසා භවය නැති වීම පිණිස භවය සකස් වන්නා වූ හේතුව නැති විය යුතුම ය.

"භවය නැති වන්නේ කුමක් නැති විට ද? භවය නිරුද්ධ වන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?"

"භවය නැති වන්නේ කාම උපාදාන, දිට්ඨි උපාදාන, සීලබ්බත උපාදාන, අත්තවාද උපාදාන යන උපාදාන නැති විට ය. භවය නිරුද්ධ වන්නේ උපාදාන නිරුද්ධ වීමෙන් ය."

sinhalaebooks.com



## උපාදානය ද නැති වෙයි!

"උපාදානය" ද හේතූන් නිසා හටගත් දෙයකි. හේතූන් නැති වීමෙන් නැතිවී යන දෙයකි.

"උපාදාන නැතිවන්නේ කුමක් නැති විට ද? උපාදාන නිරුද්ධ වන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?"

"උපාදාන හෙවත් බැඳීයාම නැතිවන්නේ ආශාව නැති විට ය. උපාදාන නිරුද්ධ වන්නේ රූප කෙරෙහි ඇති ආශාව, ශබ්ද කෙරෙහි ඇති ආශාව, ගන්ධ කෙරෙහි ඇති ආශාව, රස කෙරෙහි ඇති ආශාව, පහස කෙරෙහි ඇති ආශාව, සිතිවිලි හෙවත් මානසික අරමුණු කෙරෙහි ඇති ආශාව නිරුද්ධ වීමෙන් ය."

## ආශාව ද නැති වෙයි!

"ආශාව හෙවත් ඇලීම නැති වන්නේ කුමක් නැතිවිට ද? ආශාව නිරුද්ධ වන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?"

"ආශාව නැති වන්නේ ඇසේ ස්පර්ශයෙන් හටගන්නා විඳීම, කණේ ස්පර්ශයෙන් හටගන්නා විඳීම, නාසයේ ස්පර්ශයෙන් හටගන්නා විඳීම, දිවේ ස්පර්ශයෙන් හටගන්නා විඳීම, කයේ ස්පර්ශයෙන් හටගන්නා විඳීම, මනසේ ස්පර්ශයෙන් හටගන්නා විඳීම නැති විට ය. ආශාව නිරුද්ධ වන්නේ විඳීම් නිරුද්ධ වීමෙන් ය."

## විඳීම් ද නැති වෙයි!

"විඳීම් නැති වන්නේ කුමක් නැතිවිට ද? විඳීම් නිරුද්ධ වන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?"

"විඳීම් නැති වන්නේ ඇසේ ස්පර්ශය, කණේ ස්පර්ශය, නාසයේ ස්පර්ශය, දිවේ ස්පර්ශය, කයේ ස්පර්ශය, මනසේ ස්පර්ශය යන ස්පර්ශය නැතිවිට ය. විඳීම් නිරුද්ධ වන්නේ ස්පර්ශය නිරුද්ධ වීමෙන් ය."

sinhalaebooks.com



## ස්පර්ශයත් නැති වෙයි!

"ස්පර්ශය නැති වන්නේ කුමක් නැති විට ද? ස්පර්ශය නිරුද්ධ වන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?"

"ස්පර්ශය නැති වන්නේ ඇස, කණ, නාසය, දිව, කය, මනස යන ආයතන සය නැති විට ය. ස්පර්ශය නිරුද්ධ වන්නේ ආයතන හය නිරුද්ධ වීමෙන් ය."

## ආයතන හයත් නැති වෙයි!

"ආයතන හය නැති වන්නේ කුමක් නැතිවිට ද? ආයතන හය නිරුද්ධ වන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?"

"ආයතන හය නැති වන්නේ වේදනා – සඤ්ඤා – චේතනා, ඵස්ස, මනසිකාර යන නාමත්, සතර මහා ධාතූන් ගෙන් හටගත් රූපත් නැති විට ය. ආයතන හය නිරුද්ධ වන්නේ නාම-රූප නිරුද්ධ වීමෙන් ය."

## නාම-රූපත් නැති වෙයි!

"නාම-රූප නැති වන්නේ කුමක් නැති විට ද? නාම-රූප නිරුද්ධ වන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?"

"නාම-රූප නැති වන්නේ ඇසේ විඤ්ඤාණය, කණේ විඤ්ඤාණය, නාසයේ විඤ්ඤාණය, දිවේ විඤ්ඤාණය, කයේ විඤ්ඤාණය, මනසේ විඤ්ඤාණය යන විඤ්ඤාණය නැතිවිට ය. නාම-රූප නිරුද්ධ වන්නේ විඤ්ඤාණය නිරුද්ධ වීමෙන් ය."

## විඤ්ඤාණයත් නිරුද්ධ වෙයි!

"විඤ්ඤාණය නැති වන්නේ කුමක් නැති විට ද? විඤ්ඤාණය නිරුද්ධ වන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?"

"විඤ්ඤාණය නැති වන්නේ ආශ්වාස – ප්‍රශ්වාස නම් වූ කාය සංස්කාරත්, විතර්ක – විචාර නම් වූ වචී සංස්කාරත්, සඤ්ඤා – වේදනා නම් වූ චිත්ත සංඛාරත් නැති විට ය. විඤ්ඤාණය නිරුද්ධ වන්නේ

sinhalaebooks.com



කාය – වචී – චිත්ත සංස්කාර නිරුද්ධ වීමෙන් ය.”

## සංස්කාරත් නිරුද්ධ වෙයි!

“සංස්කාර නැති වන්නේ කුමක් නැති විට ද? සංස්කාර නිරුද්ධ වන්නේ කුමක් නිරුද්ධ වීමෙන් ද?”

“සංස්කාර නැති වන්නේ චතුරාර්ය සත්‍යාවබෝධ නොවීම නම් වූ අවිද්‍යාව නැති විට ය. සංස්කාර නිරුද්ධ වන්නේ අවිද්‍යාව නිරුද්ධ වීමෙන් ය.”

## අවිද්‍යාවත් නිරුද්ධ වෙයි!

අවිද්‍යාව නිරුද්ධ වන්නේ චතුරාර්ය සත්‍යාවබෝධය පරිපූර්ණ වශයෙන් ම ඇති වීම නිසා ය. චතුරාර්ය සත්‍යාවබෝධය යනු විද්‍යාවේ පහළවීම යි. අවිද්‍යාවේ දුරුවීම යි. විද්‍යාව තිබෙන තැන තණ්හාව නැත. තණ්හාවෙන් නිදහස් වෙයි. එය විමුක්තිය යි. විද්‍යාවත් විමුක්තියත්, සාක්ෂාත් වීම සියලු දුකෙන් නිදහස් වීම යි!

එවිට පටිච්චසමුප්පාදය සදහට ම නිරුද්ධ වෙයි. සියලු දුක් දොම්නස් සදහට ම නිමා වෙයි! පටිච්චසමුප්පාදය නැති වීම සම්‍යක් මාර්ගය වශයෙන් හඳුන්වා තිබේ.

## සම්‍යක් මාර්ගය නම් වූ පටිච්චසමුප්පාද නිරෝධය සිංහලෙනුත් පාඩම් කර ගනිමු!

“එම අවිද්‍යාව ම ඉතිරි නැතිව නො ඇල්මෙන් නිරුද්ධ වීමෙන් සංස්කාර නිරුද්ධ වේ.

සංස්කාර නිරුද්ධ වීමෙන් විඤ්ඤාණය නිරුද්ධ වේ.

විඤ්ඤාණය නිරුද්ධ වීමෙන් නාම-රූප නිරුද්ධ වේ.

නාම-රූප නිරුද්ධ වීමෙන් ආයතන හය නිරුද්ධ වේ.

ආයතන හය නිරුද්ධ වීමෙන් ස්පර්ශය නිරුද්ධ වේ.

ස්පර්ශය නිරුද්ධ වීමෙන් විඳීම් නිරුද්ධ වේ.

sinhalaebooks.com



විඳීම් නිරුද්ධ වීමෙන් ආශාව නිරුද්ධ වේ.

ආශාව නිරුද්ධ වීමෙන් බැඳීම් නිරුද්ධ වේ.

බැඳීම් නිරුද්ධ වීමෙන් විපාක පිණිස කර්ම සකස් වීම නිරුද්ධ වේ.

විපාක පිණිස කර්ම සකස් වීම නිරුද්ධ වීමෙන් ඉපදීම නිරුද්ධ වේ.

ඉපදීම නිරුද්ධ වීමෙන් ජරා මරණ, ශෝක, වැලපීම්, දුක්, දොම්නස්, සුසුම් හෙළීම් නිරුද්ධ වේ. මේ ආකාරයෙන් ය මුළු මහත් දුක් රැස ම නිරුද්ධ වී යන්නේ.''

## දැන් අපි පාළි භාෂාවෙනුත් ඉගෙන ගනිමු.

''අවිජ්ජායත්වේය අසේස විරාග නිරෝධා සංඛාර නිරෝධෝ,

සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ,

විඤ්ඤාණ නිරෝධා නාමරූප නිරෝධෝ,

නාමරූප නිරෝධා සළායතන නිරෝධෝ,

සළායතන නිරෝධා ඵස්ස නිරෝධෝ,

ඵස්ස නිරෝධා වේදනා නිරෝධෝ,

වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ,

තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ,

උපාදාන නිරෝධා භව නිරෝධෝ,

භව නිරෝධා ජාති නිරෝධෝ,

ජාති නිරෝධා ජරාමරණං, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්සුපායාසා නිරුජ්ඣන්ති. ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධෝ හෝති.''

මේ ආකාරයට මුළු මහත් දුක් රැසේ ම නිරෝධය සාක්ෂාත් කළ මොහොතේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට මේ හැඟීම ඇතිවිය.

''දුකේ නැති වීම! දුකේ නැති වීම! යන මේ කාරණය ගැන පින්වත් මහණෙනි, මා හට පෙර කිසිදා නො ඇසූ විරූ ධර්මයන්

sinhalaebooks.com



පිළිබඳ ව දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.''

(ගෝතම සුත්ත – සං. නි. 02)

## අපට පරම පිවිතුරු නායකත්වයක් තිබේ!

ධර්මස්වාමී වූ තථාගත බුදුසමිඳුන් ගේ ශ්‍රාවක වූ අපි ද ඒ ශ්‍රී සද්ධර්මය මහත් ගෞරවයෙන් ඉගෙන ගත යුතු වෙමු. ඒ ධර්මය ම පිහිට කරගත යුතු වෙමු. ඒ ධර්ම විනයේ නායකත්වය ලබා ගත යුතු වෙමු. අපට තරම් පාරිශුද්ධ වූ උත්තරීතර වූ පූජනීය වූ නායකත්වයක් ලෝකයේ කිසිවෙකුටත් නොමැත. ඒ නායකත්වය නම් මේ ධර්ම විනයේ නායකත්වය ම ය.

එහෙත් යම් භික්ෂුවක් හෝ ගිහියෙක් හෝ පැවසුවොත් ''අනේ අපට බෞද්ධ නායකත්වයක් නැතැ'යි ඒ තැනැත්තා ධර්ම විනය ගැන නොදන්නා කෙනෙක් ම විය යුතු ය. අපට නැත්තේ බෞද්ධ නායකත්වය නො වේ, බෞද්ධ ශ්‍රාවකත්වය යි! බෞද්ධ ශ්‍රාවකයා යනු ධර්ම විනයේ නායකත්වය පිළිගත් කෙනෙකි!

## ආර්ය න්‍යාය

භගවත් බුදු සමිඳාණෝ මේ පටිච්චසමුප්පාද ධර්මය අවබෝධ කර ගන්නා ක්‍රමය ''ආර්ය න්‍යාය'' වශයෙන් හඳුන්වා දුන් සේක. මේ ක්‍රමය සංයුක්ත නිකායේ දෙවන කොටසේ පංචභයවේර සූත්‍රයේ මෙසේ සඳහන් ව තිබේ.

''පින්වත් ගෘහපතිය, මෙ කරුණෙහි ලා ආර්ය ශ්‍රාවකයා පටිච්චසමුප්පාදය ම මනාකොට නුවණින් මෙනෙහි කරන්නේ වෙයි.''

එනම් ''මෙය ඇති කල්හි මෙය වෙයි (ඉමස්මිං සති ඉදං හෝති). මෙය උපදින විට ය මෙය උපදින්නේ (ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති)''.

දැන් ''මෙය'' යනුවෙන් මුලින් ඇති පදය වෙනුවට එතැනට ''අවිද්‍යාව'' යන පදය දමන්න. ඊළඟට තිබෙන ''මෙය'' යන පදය

sinhalaebooks.com



වෙනුවට "සංස්කාර" යන පදය එක්කරන්න.

එවිට "අවිද්‍යාව" ඇති කල්හි "සංස්කාර" වෙයි. "අවිද්‍යාව උපදින විට ය සංස්කාර උපදින්නේ" කියා ගලපා ගත හැකි ය.

ඒ ආකාරයෙන් සකස් කරගත් විට මෙසේ ගළපා ගත හැකි ය.

## දුක ඇතිවීමේ න්‍යාය

"අවිද්‍යාව ඇති කල්හි සංස්කාර වෙයි.

අවිද්‍යාව උපදින විට ය සංස්කාර උපදින්නේ."

"සංස්කාර ඇති කල්හි විඤ්ඤාණය වෙයි

සංස්කාර උපදින විට ය විඤ්ඤාණය උපදින්නේ..."

## දුක නැති වීමේ න්‍යාය

දුක නැති වන ආකාරය ද අවබෝධ කරගත හැකි න්‍යාය ක්‍රමයක් භාග්‍යවතුන් වහන්සේ විසින් අපට පෙන්වා දුන් සේක.

එනම්,

"මෙය නැති කල්හි මෙය නොවේ (ඉමස්මිං අසති ඉදං න හෝති). මෙය නිරුද්ධ වීමෙන් ය මෙය නිරුද්ධ වන්නේ. (ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති)."

මේ න්‍යාය ක්‍රමය ද කලින් පරිද්දෙන් ම හේතු ඵල දහමට ගළපාගන්න.

"අවිද්‍යාව නැති කල්හි සංස්කාර නොවෙයි.

අවිද්‍යාව නිරුද්ධ වීමෙන් ය සංස්කාර නිරුද්ධ වන්නේ."

"සංස්කාර නැති කල්හි විඤ්ඤාණය නො වේ.

සංස්කාර නිරුද්ධ වීමෙන් ය විඤ්ඤාණය නිරුද්ධ වන්නේ."

"විඤ්ඤාණය...

භවය නැති කල්හි ඉපදීම නො වේ. භවය නිරුද්ධ වීමෙන් ය ඉපදීම නිරුද්ධ වන්නේ.

ඉපදීම නැති කල්හි ජරාමරණ නො වේ.

sinhalaebooks.com



ඉපදීම නිරුද්ධ වීමෙන් ය ජරාමරණ නිරුද්ධ වන්නේ.''

මේ ධර්මය තේරුම් ගැනීමේ මුල සම්මා දිට්ඨියයි. සම්මා දිට්ඨිය ඇතිවීම පිණිස මෙම හේතු ඵල දහම ගැන ඉතා ම නිරවුල් අවබෝධයක් ඇති කර ගත යුතු ම ය. විශේෂයෙන් ම ''යෝනිසෝ මනසිකාරය'' මේ සඳහා මහෝපකාරී වේ. කොටින්ම සමථ - විපස්සනා ආදී භාවනාවන් දියුණු කර ගැනීම පිණිසත් උපකාරීවන්නේ යෝනිසෝ මනසිකාරය ම ය. ශ්‍රී සද්ධර්මය යනු හුදෙක් ශ්‍රවණ මාත්‍රයකින් හෝ ප්‍රකාශන මාත්‍රයකින් අවබෝධ වන දෙයක් නොවේ.

## ප්‍රත්‍යක්ෂ අවබෝධය යනු කුමක් ද?

ප්‍රත්‍යක්ෂ අවබෝධය යනු නො වෙනස් වන දෙයකි. පුද්ගලයෙකු ගේ අතක් හෝ පාදයක් කපා දැමූ විට ඔහු ගේ අත හෝ පාදය නොමැති බව ඔහුට ප්‍රත්‍යක්ෂ දෙයකි. එසේ ඉවත් කළ අත හෝ පාදය අනාගතයේ යළිත් ඒ ආකාරයෙන් ම ලියලා වැඩෙන්නේ ය යන්න නො සිදුවන දෙයකි.

ඒ ආකාරයෙන් ම යමක් ප්‍රත්‍යක්ෂව අවබෝධ වූයේ නම් ඒ අවබෝධය කලක් යන විට නැතිවී යාම නො සිදුවන දෙයකි. කිසිසේත් සිදු නොවන දෙයකි. නමුත් සමහර කෙනෙක් ප්‍රත්‍යක්ෂ අවබෝධය යනු කුමක් දැ'යි නොදැන සුළු සුළු අත්දැකීම් මුල් කරගෙන තමන්ට ද ප්‍රත්‍යක්ෂ අවබෝධයක් තිබේ යයි නිශ්චයකට පැමිණේ. එහෙත් කාලයාගේ ඇවෑමෙන් තමන් ගේ ඒ වැටහීම නිකම් ම නිකං සිහිනයක් දුටුවාක් මෙන් මතකයක් පමණක් වෙයි. එවිට ඒ තැනැත්තා සිතන්නේ ප්‍රත්‍යක්ෂ අවබෝධය ද පිරිහී යන දෙයක් බවයි. එහෙත් සැබැවින් ම සිදු වී තිබෙන්නේ වෙනත් දෙයකි. එනම් ප්‍රත්‍යක්ෂ අවබෝධයකින් තොරව ම ප්‍රත්‍යක්ෂ අවබෝධයක් ලද බවට සිතින් සිතා ගෙන සිටීම පමණි.

sinhalaebooks.com



## ප්‍රත්‍යක්ෂය මේ දෙයින් තොර විය යුතු ය.

වරක් සවිට්ඨ තෙරණුවෝ ද, මූසිල තෙරණුවෝ ද, නාරද තෙරණුවෝ ද, ආනන්ද තෙරණුවෝ ද කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි පින්වත් සවිට්ඨ තෙරණුවෝ පින්වත් මූසිල තෙරුන් ගෙන් මෙසේ විමසූහ.

"පින්වත් ආයුෂ්මත් මූසිල, හුදෙක් අදහා ගැනීමෙන් තොරව, හුදෙක් රුචියෙන් පිළිගැනීමෙන් තොරව, පරම්පරාවෙන් ආ පමණින් ගැනීමෙන් තොරව, කල්පනා කොට කරුණු ගළපා ගැනීමෙන් තොරව, දෘෂ්ටියකට බැස ගැනීමෙන් තොරව, ආයුෂ්මත් මූසිලයන් හට තමා තුළින් ම ඇති වූ අවබෝධ ඤාණයක් තිබේ ද 'ඉපදීම හේතු කොට ගෙන ජරා මරණ වන' බවට?"

එවිට මූසිල තෙරණුවෝ මෙසේ පිළිතුරු දුන්හ.

"පින්වත් ආයුෂ්මත් සවිට්ඨ, හුදෙක් අදහා ගැනීමෙන් තොරව ම, හුදෙක් රුචියෙන් පිළිගැනීමෙන් තොරව ම, පරම්පරාවෙන් ආ පමණින් ගැනීමෙන් තොරව ම, කල්පනා කොට කරුණු ගළපා ගැනීමෙන් තොරව ම, දෘෂ්ටියකට බැස ගැනීමකින් තොරව ම,

'ඉපදීම හේතු කොට ගෙන ජරාමරණ වන බව' යන මෙ කරුණ මම දනිමි. මම දකිමි"

(කෝසම්බිය සුත්ත – සං. නි. 02)

මේ ආකාරයට පටිච්චසමුප්පාදයේ හටගන්නා ආකාරය ගැනත්, නිරුද්ධ වන ආකාරය ගැනත් සවිට්ඨ තෙරුන් මූසිල තෙරුන් ගෙන් ප්‍රශ්න අසන විට ඒ සියල්ලට ඉහත දැක් වූ පිළිවෙලට පිළිතුරු ලැබිණ. එසේ නම් ආයුෂ්මත් මූසිල තෙරුන් රහතන් වහන්සේ නමක් නේදැ'යි සවිට්ඨ තෙරණුවෝ යළිත් ඇසූහ. එවිට මූසිල තෙරණුවෝ නිශ්ශබ්දව වැඩ සිටියහ. සැබවින් ම ඒ මූසිල තෙරණුවෝ රහතන් වහන්සේ නමක් වන සේක.

ප්‍රත්‍යක්ෂාවබෝධයට පළමුව පහත සඳහන් ක්‍රම පහ ඔස්සේ ම පමණි දැනුම ලබා ගැනීමට තිබෙන්නේ. ඒ පහ මෙසේ ය.

sinhalaebooks.com



I. හුදෙක් අදහා ගැනීම් පමණකින් දැනුම ලැබීම (සද්ධා)

II. හුදෙක් රුචියෙන් පිළිගෙන දැනුම ලැබීම (රුචි)

III. පාරම්පරිකව ආ දේ ගැනීමෙන් දැනුම ලැබීම (අනුස්සව)

IV. කල්පනා කොට කරුණු ගළපාගැනීමෙන් දැනුම ලැබීම (ආකාර පරිවිතක්ක)

V. දෘෂ්ටියකට බැසගැනීමෙන් දැනුම ලැබීම (දිට්ඨි නිජ්ඣානක්ඛන්ති)

ප්‍රත්‍යක්ෂ අවබෝධය මෙම කරුණු පහම ඉක්මවා ගිය දෙයකි. මේ තරම් නවීන, මේ තරම් විද්‍යානුකූල ලෙස ප්‍රත්‍යක්ෂ අවබෝධය විස්තර කරන වෙන ක්‍රමයක් වර්තමාන ලෝකයේ පවා තිබේ ද යනු සැක සහිත ය. බුදුරජාණන් වහන්සේ ගේ අවබෝධය මොන තරම් නවීන දැ'යි, මොන තරම් විද්‍යානුකූල දැ'යි මේ තුළින් වුවත් බුද්ධිමත් කෙනෙකුට සිතාගත හැකි ය.

## රහතන් වහන්සේ ගේ ප්‍රත්‍යක්ෂ ඥාණය

ප්‍රත්‍යක්ෂය යනු දැන් සඳහන් කළ දැනුම ලැබීමේ ක්‍රම පහ වන සද්ධා, රුචි, අනුස්සව, ආකාර පරිවිතක්ක, දිට්ඨි නිජ්ඣානක්ඛන්ති යන මේවා ඉක්ම ගිය දෙයක් බව අපට පැහැදිලි ය. පටිච්චසමුප්පාදයේ නිරෝධය සාක්ෂාත් කළ තැනැත්තා නිවන ද සාක්ෂාත් කළ කෙනෙකි. එය අයිති වන්නේ ප්‍රත්‍යක්ෂයටයි.

ඒ බව ඒ සූත්‍රයේ ම මෙසේ සඳහන් වේ.

"පින්වත් ආයුෂ්මත් මූසිල, හුදෙක් අදහා ගැනීමෙන් තොරව, හුදෙක් රුචියෙන් පිළිගැනීමෙන් තොරව, පරම්පරාවෙන් ආ පමණින් ගැනීමෙන් තොරව, කල්පනා කොට කරුණු ගළපා ගැනීමෙන් තොරව, දෘෂ්ටියකට බැස ගැනීමෙන් තොරව ආයුෂ්මත් මූසිලයන් හට තමා තුළින්ම ඇති වූ අවබෝධ ඥාණයක් තිබේ ද 'භවය නිරුද්ධ වීම නිර්වාණය' යයි".

තමන් වහන්සේ භව නිරෝධය නිර්වාණය වශයෙන් සාක්ෂාත්

sinhalaebooks.com



කළ බව ආයුෂ්මත් මූසිල තෙරණුවෝ පවසා සිටියහ.

## අද්භූත පුද්ගලයෙක් නොවේ!

රහතන් වහන්සේ යනු තමා සිටි තැනින් සැණෙකින් අතුරුදහන් වන, අහසේ ගමන් කරන, රැස් විහිදුවමින් සිටින අද්භූත බලයන් උපදවා ගත් කෙනෙක් නොවේ. ඒ අත්භූත බලයන් අයිති වන්නේ ඉද්ධිවිධ ඤාණයට යි. කෙනෙකු අරහත්වයට පත්වන්නේ ඉද්ධිවිධ ඤාණය ලැබීමෙන් නොවේ. ආසවක්ඛය ඤාණය ලබා ගැනීමෙනි. සියලුම රහතන් වහන්සේලාට ඍද්ධි බල නැත. එහෙත් ආර්ය අෂ්ටාංගික මාර්ගය පරිපූර්ණ වශයෙන් දියුණු කළ උතුමෝ ය.

උන්වහන්සේලා බුදු සම්දාණන් වදාළ ධර්මය මුළුමනින් ම සාක්ෂාත් කළාහු වෙති. පරම ශාන්ත භාවයට පත් වූ පරම සුඛය වන අමා නිවන සාක්ෂාත් කළාහු වෙති. බුදු සම්දුන් ගේ ශාසනයේ සාරය ලබාගත් ශ්‍රාවකයන් වහන්සේලා වනාහී රහතන් වහන්සේලා ම වෙති.

## ප්‍රධාන වෙනස කුමක් ද?

මිනිස් ප්‍රජාව තුළ ගුරුපදේශ රහිතව ප්‍රථමයෙන් අරහත්වයට පත් වූයේ අපගේ ස්වාමී වූ බුදු සම්දාණෝ ය. ශ්‍රාවක පිරිස අරහත්වයට පත් වූයේ ගුරුපදේශ සහිතව ය. මේ ගැන වරක් බුදු සම්දුන් තම ශ්‍රාවකයන් ගෙන් මෙසේ විමසූ සේක.

“පින්වත් මහණෙනි, අරහත් වූ සම්මා සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ම රූප – වේදනා – සඤ්ඤා – සංඛාර – විඤ්ඤාණ යන පඤ්චුපාදානස්කන්ධයන් කෙරෙහි අවබෝධයෙන් ලත් කළකිරීමෙන් යුක්තව නො ඇල්මෙන්, තණ්හාව නිරුද්ධ වීමෙන්, කිසිවකට නො බැඳී නිදහස් වූ නිසා සම්මා සම්බුද්ධ යයි කියනු ලැබේ.

එමෙන් ම පින්වත් මහණෙනි, භික්ෂුවට ද රූප – වේදනා – සඤ්ඤා – සංඛාර – විඤ්ඤාණ යන පඤ්චුපාදානස්කන්ධයන් කෙරෙහි අවබෝධයෙන් ලත් කළකිරීමෙන් යුක්තව, නො ඇල්මෙන්, තණ්හාව නිරුද්ධ වීමෙන්, කිසිවකට නො බැඳී නිදහස් වූ නිසා ‘පඤ්ඤා විමුත්ත’ යයි කියනු ලැබේ.

sinhalaebooks.com



ඉතින් පින්වත් මහණෙනි, මෙ කරුණෙහි ලා අරහත් වූ සම්මා සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේගේත් පඤ්ඤා විමුත්ත භික්ෂුවගේත් වෙනස කුමක් ද? විශේෂත්වය කුමක් ද?"

එවිට ඒ භික්ෂූහු මෙසේ පවසා සිටියහ.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, අප ඉගෙන ගෙන තිබෙන මේ සද්ධර්මය වනාහී භාග්‍යවතුන් වහන්සේ නායකත්වයෙන් පවතින සේක. භාග්‍යවතුන් වහන්සේම පිළිසරණ කොට පවතින සේක.

දැන් වදාළ ධර්මයේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ ම මැනවින් දන්නා සේක. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දැන ගෙන භික්ෂූහු සිත් හි ලා දරාගන්නාහු ය."

## මෙන්න ඒ වෙනස!

එවිට භාග්‍යවතුන් වහන්සේ රහතන් වහන්සේ ගේ හා තමන් වහන්සේ ගේ වෙනස මෙසේ පෙන්වා දුන් සේක.

"පින්වත් මහණෙනි, අරහත් වූ සම්මා සම්බුදු වූ තථාගතයන් වහන්සේ නූපන් නිවන් මග උපදවා දෙන සේක. හට නොගත් නිවන් මඟ සකස් කොට දෙන සේක. (දෙවියන්, බඹුන්, මරුන් සහිත වූ ශ්‍රමණ - බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ වෙන කිසිවෙකු විසිනුත්) ප්‍රකාශ නො කළ මාර්ගය පවසාලන සේක. ඒ නිවන් මග මැනවින් දන්නා සේක. ඒ නිවන් මග මැනවින් ප්‍රත්‍යක්ෂ කළ සේක. ඒ නිවන් මග පෙන්වා දෙන්නට අතිශයින් ම දක්ෂ වන සේක.

පින්වත් මහණෙනි දැන් ශ්‍රාවකයෝ වනාහී එසේ පෙන්වා දෙන ලද නිවන් මගෙහි ගමන් කරමින් තථාගතයන් වහන්සේ පසු පස යමින් වාසය කරන සේක.

පින්වත් මහණෙනි, මෙයයි වෙනස. මෙයයි විශේෂත්වය අරහත් වූ සම්මා සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේගේත්, පඤ්ඤා විමුත්ත රහත් භික්ෂුවගේත්."

(සම්බුද්ධ සුත්ත – සං. නි. 03)

sinhalaebooks.com



## තුන් ලොවට ම අග්‍ර පිරිස

"පින්වත් මහණෙනි, යම්තාක් සත්තාවාසයන් වේ ද, යම්තාක් භවාග්‍රය වේ ද, ඒ තාක් වූ ලෝකයෙහි මොවුහු අග්‍ර වෙත් ම ය. මොවුහු ශ්‍රේෂ්ඨ වෙත් ම ය. එනම් රහතන් වහන්සේලා ය."

(අරහත්ත සුත්ත – සං. නි. 04)

## පටිච්චසමුප්පාද රහිතයි

රහතන් වහන්සේ යනු පටිච්චසමුප්පාදයෙන් නිදහස් වූ උත්තමයන් වහන්සේ ය. උන්වහන්සේ වැඩ සිටින්නේ පටිච්චසමුප්පාද රහිතව ය. අවිද්‍යාව මුළුමණින් ම ප්‍රහාණයට පත් වීමෙන් ආසවක්ඛය ඤාණය ලබා ගෙන තණ්හාවෙන් මිදී ගිය රහතන් වහන්සේ තුළ අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගන්නා වූ පටිච්චසමුප්පාදය යළි කෙසේ නම් හටගන්නට ද? හට නොගන්නේ ම ය.

## නිදහස් මනස

එබඳු රහතන් වහන්සේ ගේ ස්වභාවය දක්වන ආයුෂ්මත් සෝණ තෙරණුවෝ මෙසේ පෙන්වා දෙන සේක.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ ආකාරයට මනාකොට තණ්හාවෙන් නිදහස් වුන සිත් ඇති භික්ෂුව ගේ ඇස් හමුවට ඇසින් දත යුතු රූපයන් බොහෝ සෙයින් පැමිණෙන නමුත් ඒ රූප ඔහු ගේ සිත නො මඩිත්. ඔහු ගේ සිත ඒ රූප හා මිශ්‍ර නොවූයේ ම වේ. ඔහු ගේ සිත අකම්පිත ස්වභාවයෙන් ස්ථිරව පවතින්නේ වේ. ඔහු ගේ ඒ සිත පවා අනිත්‍ය භාවයට පත් වෙන ආකාරය දකින්නේ වේ.

සිතේ පවතින මේ ස්වභාවය වනාහී සිදුරු රහිත, පතුරු රහිත ඒක ඝන කළුගල් පර්වතයක් වැන්න. කවර දිසාවකින් නමුත් කොපමණ වේගයෙන් සුළං හමා ආව ද කම්පා නොවන්නාක් මෙනි."

(සෝණ සුත්ත – අං. නි. නිපාත)

sinhalaebooks.com



## වරදවා ගන්න එපා

බුද්ධ දේශනාවන් කණපිට පෙරලා ගෙන වැරදියට අර්ථ තෝරන බොහෝ පිරිස් මේ රටේ සිටිති. ඔවුනට වුවමනා වී තිබෙන්නේ ධර්මය ධර්මය වශයෙන් කථා කිරීමට නොවේ. අයෝනිසෝ මනසිකාරයෙන් ඇති කරගත් නා නා මතවාදයන් කරපින්නා ගනිමින් ඒවා ම තහවුරු කර ගැනීමට කරුණු සෙවීමයි බොහෝ විට සිදුවන්නේ. එම නිසා සූත්‍ර දේශනාවල පැහැදිලි ව තිබෙන කරුණු පවා ඔවුහු නොසලකා හරිති. ඒ වෙනුවට වෙන වෙන මතවාද ඉදිරිපත් කරති. බුදුරජාණන් වහන්සේ වෙතින් පටිච්චසමුප්පාදය ශ්‍රවණය කොට ධර්මාවබෝධ කළ සුසීම නම් භික්ෂුවක් ගැන සංයුක්ත නිකායේ සඳහන් වේ. ඒ සූත්‍රයේ සඳහන් වන්නේ ශුෂ්ක විදර්ශක හෙවත් ධ්‍යාන නොලබා රහත් වූ භික්ෂුවක් ගැන යයි වරදවා අර්ථ දක්වන අවස්ථා අපට හමුවේ. එම නිසා ඒ සූත්‍රයේ සඳහන් කරුණු නිවැරදිව දැන ගැනීම අප කාටත් ප්‍රයෝජනවත් ය.

## සුසීම ගේ කථාව

එක්තරා අන්‍යාගමික පූජකයෙක් වූ සුසීම නම් තැනැත්තෙකුට බරපතල වගකීමක් තම ආගමික නිකායෙන් පැවරුනි. එනම් බුදු සසුනේ පැවිදි බව ලබා ගෙන භික්ෂූන් අතර ගැවසෙමින් ඒ ධර්මය ඉගෙන ගෙන යළිත් තම ආගමට පැමිණ තමන් ගේ ධර්මයක් ලෙස එය ප්‍රචාරය කොට ජනතාව ගේ සිත් දිනා ගැනීමයි. මේ කූට උපක්‍රමය භාරගත් සුසීම තෙමේ ආනන්ද තෙරුන් ළඟට පැමිණ පැවිදි බව ඉල්ලා සිටියේ ය. බුදු සමිඳුන් ගෙන් අවසර ලබාගත් ආනන්ද තෙරනුවෝ සුසීමයන් පැවිදි කරවූහ.

## සුසීම පැටලෙයි

පැවිදි වූ දා සිට සුසීම කළේ ධර්මය සොරකම් කිරීමයි. එනිසා ම අන් අයටත් වඩා ධර්මය ඉගෙන ගැනීමේ උනන්දුවක් සුසීම තුළ

sinhalaebooks.com



පැවතුනි. එහෙත් භික්ෂූන් ගේ ජීවිත ගැන නිරන්තර විමසිල්ලෙන් සිටි සුසීමයන් හට බලවත් ප්‍රශ්නයක් මතුවිය.

එනම් බොහෝ භික්ෂූහු බුදු සමිඳාණන් වෙත පැමිණ අරහත්වය ප්‍රකාශ කරති. එහෙත් ඔවුහු ඍද්ධි ප්‍රාතිහාර්යය නොකරත්, දිවැස් ලබාගත් බව නො පවසත්, පරසිත් දන්නා බවක් නො පවසත්, පෙර ජීවිත ගැන දන්නා බවක් නො පවසත්, සත්වයන් ගේ චුත වන උපදින ස්වභාවය දන්නා බවක් නොපවසත්, එමෙන් ම රූපී ධ්‍යානයන් ඉක්මවා ගිය අරූපී වූ ශාන්ත විමෝක්ෂයක් කයින් ස්පර්ෂ කොට ඇති බවක් නොපවසත්, එහෙත් ඔවුහු රහතන් වහන්සේලා වශයෙන් ප්‍රතිඥා දෙත්.

## සිතා සිටි දෙය නොවේ

සුසීමට බලවත් ම ගැටළුව වූයේ මෙයයි. රහතන් වහන්සේ පිළිබඳ ඔහු ගොඩනගා සිටි චිත්‍රයට හාත්පසින් ම වෙනස් දෙයකි ඔහුට අසන්නට දකින්නට ලැබුනේ. සුසීම කළේ අරහත්වය ප්‍රකාශ කළ භික්ෂූන් පසු පස ගොස් ඔබ වහන්සේලා මේ මේ අභිඥාවන් සාක්ෂාත් කළාහු දැ'යි විමසා සිටීමයි. සුසීම ලද පිළිතුර වූයේ උන්වහන්සේලා ඒ කිසිදු විශේෂයක් නො ලැබූ බවයි. එසේ නම් ඔබ වහන්සේලා රහත් වූයේ කෙසේ දැ'යි හේ අසා සිටියේ ය.

"ආයුෂ්මත් සුසීම, අපි වනාහී පඤ්ඤා විමුත්ත වෙමු" යි ඒ රහතන් වහන්සේලා පිළිතුරු දුන්හ. (රහතන් වහන්සේලා ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. උභතෝභාග විමුත්ත හා පඤ්ඤා විමුත්ත වශයෙනි.

උභතෝභාග විමුත්ත යනු සමථයෙන් රූපී ධ්‍යාන ද ඉක්මවා අරූපී ධ්‍යානයන් නේවසඤ්ඤානාසඤ්ඤායතන දක්වා දියුණු කොට අරහත්වය සාක්ෂාත් කිරීමයි.

පඤ්ඤා විමුත්ත යනු සම්මා සමාධිය වන රූපී ධ්‍යාන හතර දියුණු කොට අරහත්වය සාක්ෂාත් කිරීමයි.)

sinhalaebooks.com



## බුදු සමිඳුගේ පිහිට

අන්තිමේ දී සුසීම තීරණය කළේ වෙන කාගෙන් වත් අසනවාට වඩා බුදුරජාණන් වහන්සේ ගෙන් ම මෙ කරුණ විමසා නිරවුල් කරගත යුතු බවයි. හේ බුදු සමිඳුන් වෙත ගියේ ය. භික්ෂූන් සමඟ තමන් කළ කතා බස් සියල්ල පවසා සිටියේ ය. එවිට බුදුරජාණන් වහන්සේ ශ්‍රාවක ජීවිතය තුළ ධර්මාවබෝධය සිදුවන ආකාරය ඉතා ම කෙටියෙන් මෙසේ වදාළ සේක.

## මෙයයි අවබෝධය

“පින්වත් සුසීම, පළමුව ඇති වන්නේ ධම්මට්ඨිති ඤාණයයි (පුබ්බේ ඛෝ සුසීම ධම්මට්ඨිති ඤාණං). නිවන පිළිබඳ ඤාණය ඇති වන්නේ පසුවයි (පච්ඡා නිබ්බාණේ ඤාණං).”

(සුසීම සුත්ත – සං. නි. 02)

මේ වදාළ දෙසුමේ අරුත විස්තර වශයෙන් පවසන ලෙස සුසීම ඉල්ලා සිටියේ ය. දැන් සුසීම ගේ මානසිකත්වය තුළ තිබෙන්නේ ධර්මය සොරකම් කර ගැනීමේ අදහස නොවේ. තමා ගේ ගැටළුව විසඳා ගැනීමේ අවශ්‍යතාව යි. මේ බව අවබෝධයෙන් ම දැන ගත් භාග්‍යවතුන් වහන්සේ පංච උපාදානස්කන්ධයේ යථා ස්වභාවයත්, පටිච්චසමුප්පාදය ඇති වන ආකාරයත්, පටිච්චසමුප්පාදය නැති වී යන ආකාරයත් පහදා දුන් සේක.

## සුසීමටත් අවබෝධ වේ

මේ දෙසුම අවසානයේ සුසීමට සිදු වූයේ නොසිතූවිරූ දෙයකි. එනම් සද්ධර්මය සොරකම් කර ගැනීමට පැමිණි හේ සැබැවට ම ඒ ධර්මය අවබෝධ කිරීමයි. එනමුදු ඔහුට ද රහතන් වහන්සේ නමක ගෙන් ඔහු අපේක්ෂා කළ කිසිදු අභිඥාවක් හෝ අරූපී ධ්‍යානයක් හෝ නොලැබුනි. එපමණකින් රූපී ධ්‍යාන රහිතව ශුෂ්ක විදර්ශකව සුසීම තෙරුන් අරහත් වූයේ යයි සහේතුකව නොපැවසිය හැකි ය.

sinhalaebooks.com



අරහත්වය ප්‍රකාශ කළ භික්‍ෂූන් ගෙන් සුසීම ප්‍රශ්න අසන්නට පටන් ගත්තේ යම් ආකාරයෙකින් ද ඒ ආකාරයෙන් ම බුදු සමිඳාණෝ සුසීම ගෙන් ප්‍රශ්න කළ සේක.

බුදු සමිඳු ගේ සිරිපතුල් අබියස වැඳ වැටුණු සුසීම තෙරණුවෝ තමන් තුළ කලින් තිබූ වංචනික අභිප්‍රායයන් හෙළි කොට සමාව ඉල්ලා සිටියහ.

## සුසීමත් පඤ්ඤා විමුත්ත කෙනෙකි

සුසීම ගේ මේ ජීවිත පෙරළිය ගැන බොහෝ දෙනෙකු සිතා ගෙන සිටින්නේ ඔහු ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ නමක් බවයි. එයට හේතුව

"අපි නු ත්වං සුසීම, ඒවං ජානන්තෝ ඒවං පස්සන්තෝ යේ තේ සන්තා විමොක්ඛා රූපේ ආරුප්පා, තේ කායේන ඵුසිත්වා විහරසීති?

නෝහේතං භන්තේ" යන පාඨය වරදවා තේරුම් ගැනීමෙනි. එම පාඨයේ සිංහල තේරුම මෙසේ ය. බුදු සමිඳාණෝ සුසීම ගෙන් මෙසේ විමසන සේක.

"ඉදින් පින්වත් සුසීම, ඔබ පවා මේ ආකාරයෙන් ධර්මය දැන ගනිමින්, මේ ආකාරයෙන් ධර්මය දැක ගනිමින්, රූපී ධ්‍යානයන් ඉක්මවා ගිය යම් ඒ අරූපී විමෝක්‍ෂයන් වේ නම් ඒවා කයින් ස්පර්ශ කොට වාසය කරනවා ද?

ස්වාමීනි, එසේ නැත්තේ ම ය."

## ධ්‍යාන නැති රහතුන් නැත

මේ ප්‍රකාශ තුළින් සුසීම තෙරුන් ධ්‍යාන ලාභියෙකු නොවන බවක් කිසිසේත් සඳහන් නොවේ. ශීල – සමාධි – ප්‍රඥා පූර්ණත්වයට පත් නොවී කිසිවෙකුට අරහත් විය නොහැකි ය.

ඒ සඳහා ප්‍රඥා වර්ධනයට අතිශයින් ම උපකාරී වන්නේ පටිච්චසමුප්පාදය පිළිබඳ නිරාකූල අවබෝධ ඤාණය යි. ධම්මට්ඨිති

sinhalaebooks.com



ඥාණය වශයෙන් ධර්මයේ සඳහන් වහන්නේ ද එයයි. “ධම්මට්ඨිති ධම්මනියාමතා. ඉදප්පච්චයතා පටිච්චිසමුප්පාදෝ” වශයෙන් ධර්මයේ සඳහන් වන්නේ එනිසා ය.

## පටිච්චසමුප්පාද රවුම?

බොහෝ මෑත කාලීන පොත් පත්වල පටිච්චසමුප්පාදය විස්තර කරන්නේ රවුමක ඇතුලේ දමමිනි. රවුමක කොයි පැත්තෙන් ගත්තත් තේරුම් ගත හැකි ය යන අර්ථයටත් වඩා එහි විස්තර වන්නේ කාල තුනට කොටස් කරන ලද පටිච්චසමුප්පාදයකි.

## ශාසනය අතුරුදන් වෙයි

එහෙත්, දැන් අප ශ්‍රී මුඛ බුද්ධ දේශනා ඇසුරෙන් පටිච්චසමුප්පාදය ඉගෙන ගනිද්දී රවුමක් හමුවූයේ නැත! රවුම් අඳිමින්, සටහන් අඳිමින්, පින්තූර අඳිමින් පටිච්චසමුප්පාදය නම් අවබෝධ කරගත නොහැකි ය. මේ දක්වා අවබෝධ කළ කෙනෙක් ද නැත. මේ නිසා පටිච්චසමුප්පාදය යනු රෝද ඇතුළේ අඳින දෙයක් නොව ආර්ය න්‍යායක් වශයෙන් අවබෝධ කරගත යුතු දෙයක් බව තේරුම් ගන්න.

විශේෂයෙන් ම වර්තමාන බෞද්ධ සමාජයට ධර්මය කියා දීම අන්‍යාගමික සමාජයකට ධර්මය කියාදීමටත් වඩා දුෂ්කර දෙයකි! ඊට හේතුව බෞද්ධ සමාජය තුළ ධර්මයේ නාමයෙන් විවිධාකාර ලෙස දූෂණයට ලක් වූ මති මතාන්තර පැතිරී තිබීම යි. එම නිසා බොහෝ දෙනෙක් කරන්නේ ධර්මය අවබෝධ කර ගැනීමට මහන්සි ගැනීම නො වේ. ධර්මයට විරුද්ධව මති මතාන්තර ගොඩ නගමින් ධර්මය ම පහළට හෙළා දැමීම යි! මේ මිථ්‍යා දෘෂ්ටික වැඩ පිළිවෙලේ ඇතැම් භික්ෂූන් වහන්සේලා ද ඉදිරියෙන් සිටිති.

බෞද්ධ සමාජයට පටිච්චසමුප්පාදය, චතුරාර්ය සත්‍යය ආදී අති උතුම් දහම් කොටස් කියා දීම ගැන ඒ භික්ෂූහු විරුද්ධ වෙති. අසරණ ජනතාව හැමදා ම අවිද්‍යා අන්ධකාරයේ ගත කිරීම ගැන ඔවුන්

sinhalaebooks.com



සතුටු වන බව පෙනේ. එවිට ඔවුන් ගේ විකාර පිංකම්වලට ජනතාව එක් රොක් කර ගැනීම ඉතා ම පහසු ය. ඔවුන් ගේ වැඩ පිළිවෙළ මහා වටිනා ශ්‍රේෂ්ඨ දෙයක් බවට මතු කොට පෙන්වීම පහසු ය.

බුද්ධ ශාසනයේ නාමයෙන් ඒ භික්ෂූන් වහන්සේලා මොන ආකාරයෙන් පෙනී සිටිය ද ඔවුහු බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවකයින් ලෙස පිළිගත නො හැකි ය. බුද්ධ ශාසනය යනු එක් එක්කෙනා ගේ මති මතාන්තර නො වේ. බුද්ධ ශාසනය යනු බුදුරජාණන් වහන්සේ ගේ අනුශාසනය යි. දැන් අප මේ උතුම් ශාසන යි මෙතෙක් පටිච්චසමුප්පාදයෙන් ඉගෙන ගත්තේ.

## ධර්මයේ සතුරන් හඳුනා ගන්න

ධර්මය විනාශ කිරීමේ වැඩ පිළිවෙළට ඇතැම් ගිහි පිරිස් ද ඉදිරිපත් වී සිටිති. සමහර ගිහියෝ තම තමන් මාර්ගඵල ලාභීන් ලෙස පෙනී සිටිති. බුද්ධ දේශනාවලින් තොරව, බුදුන් වදාළ ධර්මයෙන් තොරව තම තමන් බුද්ධත්වයට පත් වූ බවට මහත් ගර්වයෙන් පුරසාරම් දොඩති. ඔවුන් හිතුමනාපයේ ශ්‍රී මුඛ බුද්ධ වචන කීතු කීතු කරමින් අර්ථ විකෘති කරති. දැන් තිබෙන්නා වූ ධර්ම-විනය යනු භික්ෂූන් ගේ ගැටයෙකැ'යි කියමින් ඒ ධර්ම විනයට ගරහන්නට ජනතාව පොළඹවති. ඔවුන් ගේ දේශනාවලට සවන් දී ගෙන සිටින විට පමණක් මාර්ග ඵල ලබා ගත හැකි බව පවසමින් අඥාන ජනයාව මුළාවට පත් කරති. ඔවුන් ගේ දේශනා අසා මාර්ගඵල ලැබුවේ යයි සිතා සිටින සමහර අඥාන කාන්තාවන් හා පුරුෂයින් ධර්මය දේශනා කිරීමේ නාමයෙන් ධර්මය තව තවත් විකෘති කරමින් සිටිති.

## පණ්ඩිතයන් ගේ ඒදණ්ඩ

මේ යුගයේ දී උගත් යයි සම්මත පිරිස කරපින්නා ගෙන සිටින්නේ මහායාන ධර්මයයි. "මේ ධර්මයේත් හොඳ දේවල් තිබේ. ජපානය, කොරියාව, තායිවානය දියුණු වී තිබෙන්නේ මහායානය නිසා ය. ඒ නිසා මේ ධර්මය ද කියවා බලා ඉගෙන ගැනීමේ කිසි වරදක් නැතැ" යි කියමින් තම තමන් ගේ මහායාන මති මතාන්තරයන්

sinhalaebooks.com



ම නුවණ මඳ ජනතාවට පිළිගන්වති.

## නුවණින් කටයුතු කරන්න!

මේ ශාසන භ්‍රෂ්ටයින් හඳුනා ගෙන තථාගත ශ්‍රී සද්ධර්මය මොවුන් ගෙන් විකෘති වී යන ආකාරය ද හඳුනා ගෙන ඒ විනාශයට ඉඩ නො දී, ඒ භයානක අපරාධයට හවුල් නො වී ශ්‍රී සද්ධර්මය ම බොහෝ කලක් මේ මිනිස් සමාජය තුළ පවතින ආකාරයට අප කටයුතු කළ යුතු ය. එය මේ යුගයේ ශාසන මාමක ගිහි - පැවිදි උතුමන් ගේ පරම උදාර යුතුකම යි.

## සම්මා දිට්ඨියේ වටිනාකම!

“පින්වත් මහණෙනි, මෙම සද්ධර්මය අවබෝධ කර ගැනීම මහත් වූ යහපත පිණිස හේතු වන්නේ ය. දහම් ඇස පහළ වීම පිණිස හේතු වන්නේ ය”

(නඛසිඛා සුත්ත – සං. නි. 02)

“පින්වත් මහණෙනි, සම්මා දිට්ඨිය ඇති කරගත් ආර්ය ශ්‍රාවකයා ගේ ජීවිතාවබෝධය අන්‍යාගමික තාපසයින් ගේ අවබෝධය හා සසඳන කල්හි, ආර්ය ශ්‍රාවකයා ගේ ජීවිතාවබෝධයෙන් සියයෙන් කොටසක වටිනාකමක් වත් ඔවුන් ගේ අවබෝධය තුළ නැත. දහසකින්... ලක්ෂයකින් කොටසක් වත් ඔවුන් ගේ අවබෝධය තුළ නැත.

පින්වත් මහණෙනි, මෙසේ බලන විට සම්මා දිට්ඨිය ඇති කර ගත් ආර්ය ශ්‍රාවකයා වනාහී ජීවිතය පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කෙනෙකි. මහත් අභිඤ්ඤා (වටහා ගැනීමේ ශක්තිය) ඇති කෙනෙකි”.

(තතිය පබ්බතූපම සුත්ත – සං. නි. 02)

## ශාසනය බොහෝ කලක් පැවතීමට නම්...

“පින්වත් මහණෙනි, ශ්‍රී සද්ධර්මය චිරාත් කාලයක් පැවතීම පිණිස, සද්ධර්මයෙහි මුළා නොවීම පිණිස, සද්ධර්මය අතුරුදන්

sinhalaebooks.com



නොවීම පිණිස හේතු වන ප්‍රධාන කරුණු දෙකක් තිබේ.

I. සද්ධර්ම දේශනාවන් ඉතා ම නිවැරදි ලෙස ඉගෙන ගෙන තිබීමත්, එහි අර්ථ ඉතා නිවැරදි ලෙස තේරුම් ගෙන තිබීමත් පළමු කරුණ යි.

II. එසේ නිවැරදි ලෙස අසා දැනගත් ධර්මය ගැන නිවැරදි ලෙස අර්ථ තේරුම් ගෙන තිබ්මෙන් ඉතා ම පැහැදිලි ලෙස ධර්මාර්ථ මතුවීම දෙවන කරුණ යි.

පින්වත් මහණෙනි, මේ ප්‍රධාන කරුණු දෙක සද්ධර්මය චිරාත් කාලයක් පැවතීම පිණිසත්, සද්ධර්මයෙහි මුළා නොවීම පිණිසත්, සද්ධර්මය අතුරුදන් නොවීම පිණිසත් හේතු වේ.”

(අ. නි. 03 දෙවන අධිකරණ වර්ගය)

## පරිස්සම් වන්න!

“පින්වත් මහණෙනි, බුදුරජාණන් වහන්සේ නමක් විසින් දේශනා නො කරන ලද, දුරක්ඛාත වූ යම්කිසි ආගමක් ගැන යම් කෙනෙක් ව සමාදන් කරවයි නම්, තමාත් සමාදන් වෙයි නම්, තවත් අයව ඒ අධර්මයේ යොදවයි නම් ඒ සියලු දෙනා ම බොහෝ පව් රැස්කර ගනිත් ම ය. එයට හේතුව කුමක් ද? ඒ සමාදන් වන්නා වූ ධර්මය අධර්මයක් නිසා ම ය.”

(අං. නි. 01 නිපාත)

“පින්වත් මහණෙනි, යම් භික්ෂූහු අධර්මය ධර්මය වශයෙන් මතු කොට පෙන්වත් ද, අවිනය විනය වශයෙන් මතුකොට පෙන්වත් ද, තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද දෙය ප්‍රකාශ නො කරන ලදැ’යි පවසත් ද, තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ නො කරන ලද දෙය ප්‍රකාශ කරන ලදැ’යි පවසත් ද තථාගතයන් වහන්සේ විසින් පුරුදු නො කරන ලද දෙය පුරුදු කරන ලදැ’යි පවසත් ද, තථාගතයන් වහන්සේ විසින් පුරුදු කරන ලද දෙය පුරුදු නො කරන ලදැ’යි පවසත්ද, තථාගතයන් වහන්සේ පණවන ලද දෙය නො පණවන ලදැ’යි පවසත් ද, තථාගතයන් වහන්සේ විසින් නො පණවන

sinhalaebooks.com



ලද දෙය පණවන ලදැ'යි පවසත් ද,

පින්වත් මහණෙනි, ඒ සියලු භික්ෂූන් වහන්සේලා බොහෝ ජනයාට අහිත පිණිස, බොහෝ ජනයාට නො සුව පිණිස දෙව් මිනිස් ලෝකයාට ම අහිත පිණිස පිළිපන්නාහු වෙති. ඔවුහූ බොහෝ පව් රැස්කර ගනිත්. ඒ භික්ෂූන් වහන්සේලා ම මේ සද්ධර්මය අතුරුදහන් කර දමන්නාහු ය."

(අං. නි. 01)

## සසුන රැකුමට මෙන්න විසඳුම!

"පින්වත් මහණෙනි, යම් ඒ භික්ෂූන් වහන්සේලා අධර්මය අධර්මය වශයෙන් මතුකොට පෙන්වත් ද, ධර්මය ධර්මය වශයෙන් මතුකොට පෙන්වත් ද, අවිනය අවිනය වශයෙන් මතු කොට පෙන්වත් ද, විනය විනය වශයෙන් මතුකොට පෙන්වත් ද, තථාගතයන් වහන්සේ නො වදාළ දෙය නො වදාළ දෙයකැ'යි පවසත් ද, තථාගතයන් වහන්සේ වදාළ දෙය වදාරණ ලදැ'යි පවසත් ද, තථාගතයන් වහන්සේ විසින් පුරුදු නො කරන ලද දෙය, තථාගතයන් වහන්සේ විසින් පුරුදු නො කරන ලදැ'යි පවසත් ද, තථාගතයන් වහන්සේ විසින් පුරුදු කරන ලද දෙය පුරුදු කරන ලදැ'යි පවසත් ද, තථාගතයන් වහන්සේ විසින් නො පණවන ලද දෙය, නො පණවන ලදැ'යි පවසත් ද, තථාගතයන් වහන්සේ විසින් පණවන ලද දෙය පණවන ලදැ'යි පවසත් ද ඒ සියලු භික්ෂූන් වහන්සේලා බොහෝ ජනයාට හිත පිණිස, බොහෝ ජනයාට සුව පිණිස දෙව් මිනිස් ලෝකයාට ම හිත සුව පිණිස පිළිපන්නාහු වෙති. ඒ භික්ෂූන් වහන්සේලා බොහෝ පින් රැස් කර ගනිත්. ඒ භික්ෂූන් වහන්සේලා ම මේ සද්ධර්මය ආරක්ෂා කර නගා සිටුවන්නාහු ය."

(අං. නි. 01)

sinhalaebooks.com



## දුප්පත් කම පිටුදකිමු!

"පින්වත් මහණෙනි, යමෙක් ධන ධාන්‍යවලින් පිරිහීමට පත්ව දුප්පත් වේ නම් එය සුළු දෙයකි. එහෙත් යමෙක් ප්‍රඥාවෙන් පිරිහී අවබෝධ ඤාණයෙන් දුප්පත් වේ නම් එය වනාහී අවාසනාවන්ත දුප්පත්කමකි!

පින්වත් මහණෙනි, ධන ධාන්‍යවලින් ආඪ්‍ය වී ධනවත් වේ නම් එය සුළු දෙයකි. එහෙත් යමෙක් ප්‍රඥාවෙන් දියුණු වී අවබෝධ ඤාණයෙන් ධනවත් වේ නම් එය වනාහී අතිශ්‍රේෂ්ඨ වූ ධනවත්කමකි!

එනිසා පින්වත් මහණෙනි, ප්‍රඥාවෙන් ම අවබෝධ ඤාණයෙන් ම දියුණු වීම පිණිස උත්සාහ කළ යුතු ය."

(අං. නි. 01)

## අතිශයින් ම දුර්ලභ යි!

"පින්වත් මහණෙනි... තථාගතයන් වහන්සේ විසින් අවබෝධයෙන් ම දේශනා කරන ලද ධර්ම - විනය අසා දැනගන්නට යම් කෙනෙකුට අවස්ථාව ලැබෙත් ද, ඒ පිරිස ඉතා ම ස්වල්පයකි.

එහෙත් යමෙකුට තථාගතයන් වහන්සේ විසින් අවබෝධයෙන් ම දේශනා කරන ලද ධර්ම - විනය අසා දැන ගන්නට අවස්ථාව නො ලැබෙත් ද, ඒ පිරිස වනාහී බොහෝ දෙනෙක් ම ය."

(අං. නි. 01)

## ඔබ කළ යුතු ඔබ ගේ කොටස

එම නිසා මෙම සද්ධර්මය ගෞරවාදරයෙන් යුතුව ඉගෙන ගන්න. ශ්‍රද්ධාවෙන් යුතුව ධර්මය සාකච්ඡා කරන්න. හිතුවක්කාර මතිමතාන්තර පටලවා ගැනීමෙන් වළකින්න. ධර්මය ධර්මය හැටියට ම අසා දරා ගෙන අවබෝධය පිණිස නුවණ මෙහෙයවන්න.

අධර්මයක් අනුගමනය කරමින් විපතේ වැටෙමින් සිටින බෞද්ධ ජනතාවට අනුකම්පාවෙන් ඔබ ඉගෙන ගන්නා සද්ධර්මය කියා දෙන්න. එමෙන්ම අධර්මය ම බලය කරගත් අන්‍යාගමිකයන් ට ද

sinhalaebooks.com



මේ ධර්මය කියා දී ඔවුන් ගේ ජීවිතවලටත් සැනසීම උදාකර දෙන්න.

ඔබේ බිරිඳට, ඔබේ ස්වාමියාට, ඔබේ දරුවන්ට, ඔබේ සොයුරු සොයුරියන්ට, ඔබේ මිතුරු මිතුරියන්ට, ඔබේ නෑදෑයින් හට, දන්නා හඳුනන සියලු දෙනාට ම ශ්‍රී සද්ධර්මය කියා දෙන්න. ඔවුන් කෙරෙහි අනුකම්පාවෙන් ඔවුන් ව අධර්මයෙන් මුදවා ගන්න. සියලු දෙනාට ම ශක්ති පමණින් ඇප උපකාර කරන්න. ඊර්ෂ්‍යා කිරීම නම් කිසිසේත් ම කරන්න එපා! ඔබට යමක් අවබෝධ කර ගැනීමේ හැකියාව තිබේ නම්, ඔබ ලද මේ මනුෂ්‍ය ජීවිතය අපතේ හරින්න එපා! මේ ජීවිතයේ දී ම සෝතාපන්න වීමට වත් උත්සාහ දරන්න.

තරුණ ඔබට සිතේ නම් මේ දුර්ලභ බුද්ධ ශාසනයේ උතුම් පැවිදි බව ලබා ගෙන, ශ්‍රී සද්ධර්මය හොඳින් ඉගෙන ගෙන, පුරුදු පුහුණු කරගෙන ශ්‍රී සද්ධර්මය ලෝකය පුරා පතුරා හරින්නට, ඒ සඳහා ඔබේ ජීවිතය කැප කරන්න. ශ්‍රී සද්ධර්මය ඉගෙන ගැනීමත්, අවබෝධ කර ගැනීමත්, පැතිරවීමත් ජීවිතයේ ඒකායන පැතුම කරගන්න!

## ඔබ රැකුනොත් සසුන රැකේ!

ඔබ රැකෙන්නේ ශ්‍රද්ධාවෙන් ය. ඔබට ශ්‍රද්ධාවක් නැති නම් ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැන, ඔබට ශ්‍රද්ධාවක් නැති නම් ඒ බුදු සම්දුන් විසින් දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මය ගැන, ඔබට ශ්‍රද්ධාවක් නැති නම් ඒ බුදුසම්දුන් ගේ ශ්‍රාවක වූ මාර්ග - ඵල ලාභී සංඝරත්නය ගැන, එවිට ඔබට රැකවරණයක් නැත.

ශ්‍රද්ධාවෙන් හීන වූ තැනැත්තාට තෙරුවනේ වටිනාකමක් නොපෙනේ. එවිට හේ පුද්ගලික කරුණු මත තෙරුවනට දොස් නගයි. ගරහා පිටුදකියි. ඒ ශ්‍රද්ධා රහිත තැනැත්තා, පිහිට උපකාර සොයා ගෙන මිථ්‍යා දෘෂ්ටික ඇදහිලි පස්සේ යාම වැළැක්විය නො හැකි ය. අන්න ඒ තැනැත්තා හෝ තැනැත්තිය ඉතා ම පහසුවෙන් අන්‍යාගමික ආක්‍රමණවල ගොදුරක් බවට පත් වේ.

එහෙත් ඔබට තෙරුවන් කෙරෙහි ස්ථිරසාර ශ්‍රද්ධාවක් තිබේ නම් ජීවිතය පිණිසවත් තෙරුවන් අත් නොහරී. එහි තේරුම ඔබේ

sinhalaebooks.com



ශ්‍රද්ධාව විසින් ඔබව මිථ්‍යා දෘෂ්ටියෙන් මුදවා ගන්නා බවයි!

ඔබ එවිට ටිකෙන් ටික ශ්‍රී සද්ධර්මය තුළට ම පිවිසෙන්නේ වේ. ධර්මයෙන් ම සැනසෙන්නේ වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන්නෙක් බවට පත් වේ. ලෝකයේ ජීවත්වන ඉතා ම යහපත් අදහස්වලින් යුතු සත්පුරුෂයෙක් බවට පත් වේ. එවිට ඔබ තුළින් ය මේ සද්ධර්මය පැතිරෙන්නේ. ඔබ පිරිහී ගියොත් සද්ධර්මය පිරිහී යන්නේ ය. ඔබ දහම තුළ රැකුණොත් පමණක් සද්ධර්මය බබළන්නේ ය.

## මේ අවසන් මොහොත යි!

ඔබ ගත කරන මේ මොහොත ජීවිතයේ ඉතා ම වටිනා මොහොත බවට පත් කරගත හැක්කේ ශ්‍රී සද්ධර්මය තුළින් ය. මනුෂ්‍ය වර්ගයා ගේ උත්තරීතර ප්‍රඥා නිධානය වන ශ්‍රී සද්ධර්මය දස දිසාවට පතුරවා හැරීම පිණිස ඔබේ ජීවිතයෙන් සුළු කාලයක් හෝ කැප කරන්න. අනිවාර්යයෙන් ම කැප කරන්න! ඔබේ දහම් සේවාව මිනිස් වර්ගයා ගේ සනාතන රැකවරණය උදෙසා යොමු කරන්න!

අපගේ ධර්මස්වාමී වූ ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගේ විස්මිත අවබෝධය නම් වූ සදහම් සයුරෙන් දිය දෝතක් පමණි මෙහි ඇත්තේ. විමුක්ති රසයෙන් අනූන වූ මේ ශ්‍රී සද්ධර්මය ඔබටත් මටත් ඉතා ම ඉක්මණින් ප්‍රත්‍යක්ෂ කර ගැනීම පිණිස, අමා නිවන් සුවය ම සාක්ෂාත් කිරීම පිණිස මේ පින හේතු වාසනා වේවා!

සාදූ! සාදූ!! සාදූ!!!

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!**

sinhalaebooks.com

අපගේ ස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේගේ අසම සම වූ විස්මිත අවබෝධයේ අසිරිමත් බව අපට යන්තමින් හෝ වටහා ගත හැක්කේ උන්වහන්සේ වදාළ පටිච්චසමුප්පාදය අවබෝධ කර ගැනීමෙනි.

**පටිච්චසමුප්පාදය** වනාහී අනිවාර්යයෙන්ම ඉතාමත් නිරවුල් වූ සුවිශේෂී ධර්මයකි. තෙරුවන් සරණ ගිය ආර්ය ශ්‍රාවක වූ අපගේ බුද්ධියේ නිම්වළලු පුළුල් කර දෙන්නේ පටිච්චසමුප්පාදයෙන් ය. පටිච්චසමුප්පාදය අවබෝධ කර ගැනීම වනාහී අමා නිවන් පුරට පිවිසෙන ස්වර්ණ ද්වාරයෙහි යතුර ලබා ගැනීම වැන්න.

එම නිසා ඔබගේ බුද්ධිමය හැකියාව උරගා බැලීමට අතිශයින්ම දුර්ලභ අවස්ථාවක් මේ ශුද්ධ ග්‍රන්ථයෙන් ඔබටත් උදාකර දෙයි. සැබවින්ම මේ බුදු සසුනේම බුද්ධිමත් ශ්‍රාවකයෙකු වීමේ භාග්‍යවන්තයා ඔබ විය හැකිය.

sinhalaebooks.com



කිරිබත්ගොඩ ඥානානන්ද හිමි

# විස්මිත අවබෝධය

## පටිච්ච සමුප්පාදය

අපගේ ස්වාමි වූ
භාග්‍යවතුන් වහන්සේගේ
අසම සම වූ විස්මිත අවබෝධයේ
අසිරිමත් බව අපට යන්තමින් හෝ
වටහා ගත හැක්කේ උන්වහන්සේ වදාළ
පටිච්ච සමුප්පාදය අවබෝධ කර
ගැනීමෙනි.

**පටිච්ච සමුප්පාදය** වනාහි
අනිවාර්යයෙන්ම ඉතාමත්
නිරවුල් වූ සුවිශේෂී ධර්මයකි.
තෙරුවන් සරණ ගිය ආර්ය ශ්‍රාවක වූ
අපගේ බුද්ධියේ නිම්වලලු
පුළුල් කර දෙන්නේ
පටිච්ච සමුප්පාදයෙන්ය.
පටිච්ච සමුප්පාදය අවබෝධ
කර ගැනීම වනාහි අමා නිවන් පුරට
පිවිසෙන ස්වර්ණ ද්වාරයෙහි යතුර
ලබා ගැනීම වැන්න.
එම නිසා ඔබගේ බුද්ධිමය හැකියාව
උරගා බැලීමට අතිශයින්ම
දුර්ලභ අවස්ථාවක්
මේ ශුද්ධ ග්‍රන්ථයෙන් ඔබටත්
උදාකර දෙයි.
සැබැවින්ම මේ බුදු සසුනේම
බුද්ධිමත් ශ්‍රාවකයකු වීමේ
භාග්‍ය වන්තයා ඔබ විය හැකිය.

ISBN 955 - 551 - 261 - 2

දයාවංශ ජයකොඩි සහ සමාගම